
මැලෝරි ටවර්ස්
පාසල 5
WASANA PUBLICATIONS
ගාමිණී සමරකෝන්

# 01

"ෆෙලිසිටි...! අන්න - අර බලන්න මැලෝරි ටවර්ස්." ඩැරල් කෑ ගැසුවා. "මේ වංගුවේදි හැම සැරේම මම ඒක බලනවා. මෙතැනදි තමයි මුලින්ම ඒක එක සැරයක් පෙනෙන්නේ."

මුහුද අසබඩ කඳු ශිඛරයක් මත තැනුන සමචතුරස්‍රාකාර අළුපැහැ ගොඩනැගිල්ල දෙස ෆෙලිසිටි ඇස් දල්වා බලා සිටියා. ගොඩනැගිල්ලෙහි සිව් කොණෙහි උස් රවුම් කුලුනු තිබුණා.

"උතුරු කුලුන, දකුණු කුලුන, බටහිර කුලුන, නැගෙනහිර කුලුන." ෆෙලිසිටි කිව්වා. "මම ආසයි උතුරු කුලුනේ ඉන්න ලැබුණ එක ගැන. ඒකට මුහුද ලස්සනට පෙනෙනවා. ආපසු එන්න ලැබුණ එක ගැන සතුටු නැද්ද ඩැරල්?"

"ඇයි නැත්තේ, හුඟක් ආසයි. ඔයා?" තවමත් ඈත එපිටින් පෙනෙන චමත්කාරජනක ගොඩනැගිල්ලෙන් ඇස මුදවා ගැනීමට නොහැකිව ෆෙලිසිටිගේ අක්කා, ඩැරල් ඇසුවා.

"ඔව්, ඇත්තෙන්ම ආසයි. ඒත් අම්මයි තාත්තයි දාලා එන්න දුකයි. ගෙදර වැඩ කරන ජේන්, බල්ලෝ, පූසා මතක් වෙද්දී දුක හිතෙනවා. තව...."

"ඔව්, මිදුලට එන පොල්කිච්චොයි, කිකිළියෝ හය දෙනායි, ඉස්තෝප්පුවට බඩ ගාගෙන එන කත් වැයොයි, ගෝල්ඩ් ෆිෂ්ලයි...!" හඬ නඟා සිනාසුන ඩැරල් එය අවසාන කළා. "බොරු කතා කියන්න එපා ෆෙලිසිටි. ඔයා දන්නවානේ ඔයා මැලෝරි ටවර්ස්වලට අඩිය තියපු ගමන් ඔය හැමදේම අමතකයි."

"ඒක ඇත්ත. මම දන්නවා ඒක" ෆෙලිසිටි කිව්වා. "ඒත් එහේ ගෙදරට වඩා අමුතු ලෝකයක්. එක ලෝකයක ඉඳලා තවත් ලෝකයකට යද්දී ටිකක් අමාරුයි."

"හරි, මට කියන්න පුළුවන් දේ මේකයි - ඒ වගේ ලෝක දෙකක ජීවත් වෙන්න තරම් අපි වාසනාවන්තයි...!" ඩැරල් කිව්වා.

"ගෙදර - ඊට පස්සේ මැලෝරි ටවර්ස්...! අන්න, කවුද අර කාර් එකේ ඉන්නේ?"

එය බැලීමට ෆෙලිසිටි ජනේලය අසලට හිස නැඹුරු කළා.

"ජූන් - එයාගේ නෑදෑ අක්කා ඇලිසියා...!"

ඩැරල් නාසයෙන් පිඹ හඬක් නැගුවා. පළමු පන්තියේ සිටින ජූන්ට ඈ ඇලුම් කළේ නැහැ.

"ලැජ්ජා නැති හොර කෙල්ල, ගිහින් ජූන් එක්ක යාළු වෙන්න එහෙම හදන්න එපා." ඈ ෆෙලිසිටිට අනතුරු ඇඟෙව්වා. "මතකනේ ගිය වාරයේ සිද්ධ වුණ දේවල්. ඔයා සූසන් එක්ක ඉන්න."

"මම ඒක තමයි කරන්නේ." ෆෙලිසිටි කිව්වා. "ඒ වගේ දේවල් ඔයා මට කියන්න ඕනැ නැහැ. මම දැන් අලුත් ළමයෙක් නොවෙයි. මේක මගේ දෙවැනි වාරය."

"මටත් එහෙම වුණා නම් හොඳයි. හැම වාරයක්ම ගෙවෙද්දී මට අස්වෙන්න දිනය ළඟ බව මතක් කරන්නවත් මම කැමති නැහැ."

"මටත් එහෙම වෙයි - ඒත් මට තව පහු කරන්න හුඟක් වාර තියෙන නිසා දැන්ම ඒ ගැන හිතන්නේ නැහැ. බලන්නකෝ - දැන් ඔයා පහේ පන්තියේ කියලා හිතන්නවත් පුළුවන්ද? මැලෝරි ටවර්ස් ඉස්කෝලේ පහේ පන්තියේ - අපොයි, ඒක හරි ලොකු දෙයක් වගේ. ඒත් මම තවමත් පළමු පන්තියේ."

"ඔව්, පළමු පන්තියේ ඔයාලා මට පෙනෙන්නේ තවම බබාලා වගේ." ඩැරල් කිව්වා. "ඇත්තටම පොඩි එවුන්. මම පළමු පන්තියේ ඉද්දි පහේ පන්තියේ ළමයි දිහා බලපු හැටි මතක් වෙද්දි හිනා යනවා. එයාලා එක්ක කතා කරන්නත් බයේ බැහැ. එයාලා කවුරුහරි කතා කළොත් කලන්තෙ ආලා වැටෙන්න යනවා. ඒත් ඔයාට නම් එහෙම දෙයක් නැහැ වගේ ෆෙලිසිටි...!"

"ඕ, හරි - ඒ ඔයා මගේ අක්කා නිසා වෙන්න ඕනැ." ෆෙලිසිටි කිව්වා. "මම වැටෙන්නේ නැත්තේ ඔයා මා ළඟම ඉන්න නිසා. අනික ඔයා මේ වාරයේදී පහේ පන්තියේ නායිකාව වුණොත් මට තවත් ලොකු හයියක් වෙයි...!"

"හරි, මම මේ සැරේ නායිකාව වෙන එකක් නැහැ." ඩැරල් කිව්වා. "මම ගිය වාරේ හතර පන්තියේ ඉද්දි මගේ වගකීම් ටික හරියට ඉවර කළා. කොහොම වුණත් මේ වාරයේ පැත්තකට වෙලා, වගකීම් කරට ගන්නේ නැතිව මට නිදහසේ ඉන්න ඕනැ. ගිය වාරයේ පාසල් සහතික විභාගයට වැඩ කරලයි, පන්ති නායිකාවගේ වැඩ කරලයි මට හුඟක් මහන්සි වෙන්න සිද්ධ වුණා...!"

"ඒත්, දෙවියන්ගේ පිහිටෙන්, ඔයා සමත් වෙලා...!" ෆෙලිසිටි ආඩම්බරයෙන් කිව්වා. "සම්මානත් එක්කම...! හතර පන්තියේ හැමෝම සමත් වෙලාද කියලා ඔයා දන්නවාද?"

"ග්වේන්වත්, ඇලිසියාවත් නැහැ." ඩැරල් කිව්වා. "ඔයාට මතකද විභාග දවස්වල ඇලිසියාට සරම්ප හැදුණා? කොනී, රූත්ගේ නිවුන්නි, එයත් සමත් නැහැ. දෙවියන්ගේ පිහිටයි, එයත් හතර පන්තියේම ඉතුරු වෙනවා. දැන් රූත්ට පුළුවන් වෙයි තමන්ගේම කියලා වචනයක් දෙකක් කතා කරන්න."

කොනී හා රූත් දෙදෙනාම පසුගිය වාරේ හතර පන්තියේ සිටි අතර රූත්ට කිසිවක් කතා කිරීමට හෝ කිසිවක් කිරීමට කොනී ඉඩ නොදී මූලික වීම ගැන දැරියෝ තරමක කේන්තියෙන් පසු වුණා. කිසිවිට කොනී රූත්ට සුළු ප්‍රශ්නයකට උත්තර දීමට හෝ ඉඩ නොදී ඇයම සියලු දේ බලා ගත්තා. දෙදෙනාම වයස අවුරුදු දහසයක් වුව ද කොනී රූත්ව බලාහදා ගත්තේ ළදරු නැගණියක ලෙසයි. නමුත් දැන් කොනී එක් පන්තියකින් පහළට වැටී ඇති නිසා කොනීගේ සෙවණැල්ල වනු වෙනුවට රූත්ට තමාගේම දෙපයින් නැඟී සිටීමට අවස්ථාව ලැබෙනු ඇත. මෙය කාගේත් උනන්දුව ඇති කරවන කාරණයක් වනු ඇත.

"මෙන්න, අපි ආවා - පඩිපෙළ ළඟටම...!" ෆෙලිසිටි කිව්වා. "අම්මා, අර බලන්නකෝ මැලෝරි ටවර්ස්. ඒක හරිම ලස්සන නැද්ද?"

"හරිම ලස්සනයි. ඔයා කිව්ව විදියටම." ඇගේ මව කිව්වා.

"ඇත්තෙන්ම, අනර්ඝයි...!" රියදුරු අසුනේ සිටි රිවර්ස් මහතා කිව්වා. "එහෙම නේද කියන්න ඕනැ, ෆෙලිසිටි. අනර්ඝයි කියන වචනය තමයි ඔයා නිවාඩු කාලය පුරාම කියපු දේවල්වල හැටියට මට තෝරාගන්න වෙන්නේ."

දැරියෝ හඬ නගා සිනාසුනා.

"පහළ පන්තිවල ළමයින්ට මොනවා කිව්වත් තේරුමක් නැහැ." ඩැරල් තරමක ගරු ගාම්භීර ස්වරයකින් කිව්වා.

"අනේ, ඉහළ පන්තිවල ළමයි නම් බොරුවට හුරතල් වෙනවා." එකට එක කීමට උනන්දු වූ ෆෙලිසිටි කිව්වා.

එහෙත් ඒ කිසිවක් කනට නෑසුණේ රිවර්ස් මහතා ඇවැන්ත පඩි පෙළ අසල මෝටර් රථය නවත්වන විටම මෝටර් රථවලින් හ බස්වලින් බැස ගත් දැරියන් කඩි ගුලක් මෙන් ඒ මේ අත දුවමින සෝෂා කරන්නට වූ හෙයිනි. දුම්රියෙන් එන දැරියන්ව රැගෙන ඒම දුම්රිය පොළට ගිය බස් රථ ඒ වන විට පැමිණ තිබූ අතර ඔවුන සතුටින් කෑ ගසන හඬ හා මෝටර් රථවල නළා හඬින් අවට පරිසරය මහත් සෝෂාකාරී වූ නිසා කිසිවෙකු කියන දෙයක් කිසිවෙකු ඇසුණේ නැත.

# 02

වාරයේ පළමු දිනය මෙන්ම අවසාන දිනය ද නිතර ඇඩි කලබලකාරී මෙන්ම විනෝදජනක දිනයක් වුණා. නීති රීති කිසිවක් නොතැකූ ඔවුන් හඬ නඟා කතා කරමින් කොරිඩෝ ඔස්සේ යන්නට හෝ තරප්පුව නැඟීමට බැසීමට හෝ පුරුදුව සිටිය මුත් වඩාත් හික්මුණ හය වසර ඇරියන් හා ගුරුවරියන් පමණක් ඉන් වෙනස් වුණා.

නිඳන කාමරවලට ගොස් තමාටම හිමිව ඇති ඇඳ හා තමාට යාබද ඇඳෙහි සිටින්නේ කවුදැයි දැන ගැනීම හරිම අපූරු විනෝදයක් වුණා. තමන්ට හිමි වන පන්ති කාමරයට ගොස් එය වෙනස් එකක් දැයි දැන ගැනීම ද විනෝදයක් වුණා. සියලු ගුරුතුමියන්ට කතා කර සුබ පතා විශේෂයෙන් මම්සලී ඩූපොන්ට්ට කවටකමක් කිරීම ද විනෝදයක් වුණා.

පස්වන පන්තියේ සිටින තම අනෙක් මිතුරියන් සොයා ඩැරල් ගියා. පස්වන පන්තිය...! එය කොතරම් උසස් ලෙස පෙනුණේ ද...? තවත් එක් පන්තියක් පමණක් ඉහළින් තිබියදී ඈ කෙතරම් උසස් මට්ටමකට පැමිණ තිබුණි ද...? සැබැවින්ම ඇය දැන් පහ පන්තියේ දැරියක වූ අතර දැන් ඇය වැඩිහිටි දැරියක්.

අයිරින් හා බෙලින්ඩා සමග ඇලිසියා පැමිනුණා.

"අපි යමු ද අපේ අලුත් පන්ති කාමරය බලන්න?" ඩැරල් යෝජනා කළා. "පහේ පන්තිය...! මගේ දෙවියනේ...!"

ඔවුන් සියලු දෙනාම එක්ව ගමන් කළා. ඉහළ මාලයක සිට කඳු ශිඛර දර්ශනය වන එම පන්ති කාමරය සැබැවින්ම පියකරු තැනක් වුණා. පහත වූවේ නිල්වන් සාගරයයි. නිල් ජල රළ මත හිම සුදුවන් පෙණ පිඩු නැඟී එය ඈතට දිස් වූවේ මල් හට ගත් තිරිඟු යායක් ලෙසයි.

"මේ.... මේක නම් හරිම අපූරු තැනක්, නේද?" වටපිට කැරකී

බලමින් ඇලිසියා කිව්වා. "මේ ලස්සන ජනේල්වලින් පෙනෙන්නේ අපූරු ලස්සන දර්ශනයක්. අපූරු චිත්‍රයක්. හැමතැනම කහ පාටයි කොළ පාටයි ගාලා."

"අලුත් ළමයි කවුරුවත් ආවද කියලා දන්නවද?" ජනේලයෙන් පිටතට නැඹුරු වී නැවුම් මුහුදු සුළඟ ආශ්වාස කරමින් ඩැරල් කිව්වා.

"මොරීන් කියලා ළමයෙක් එන කතාවක් කියනවා." අයිරින් කිව්වා. "මට ආරංචි විදියට එයා ගිය ඉස්කෝලේ ප්‍රින්සිපල් මැරුණ නිසා හදිසියේම ඉස්කෝලය වහලා. ඉතින් එයා මෙහාට එනවා. ඒ වුණත් එයා ගැන මම මොකවත් දන්නේ නැහැ."

"මම හිතන්නේ ඔයාත් පහේ පන්තියට එනවා කියලයි, ඇලිසියා." සැලී කිව්වා. "මම කියන්නේ, කොනී හරියට විභාගය කරලා නැති නිසා එයාට හතර පන්තියේම ඉන්න වෙයි. ඉතින් මම හිතුවා ඔයාත් සරම්ප නිසා හරියට උත්තර ලිව්වේ නැති නිසා ඔයාත් හතර පන්තියේම නවතියි කියලා. ඒත් ඇත්තටම ඔයාට එහෙම වෙන එකක් නැහැ, නේද?"

"අපොයි නැහැ. මම ඉහළට එනවා." ඇලිසියා කිව්වා. "අයියෝ, ඔයාලත් එක්ක එකටම මාව ඉහළට නොදැම්මා නම් මම ආපසු ඉස්කෝලෙට නොඑන්න තිබුණා. මිස් ග්‍රේලින් අපේ අම්මාට ලියුමක් එවලා තිබුණා. ඕනෑම වෙලාවක මට පාසල් සහතික විභාගය සමත් වෙන්න පුළුවන්, මටත් ඔයාලා එක්ක පහේ පන්තියට යන්න පුළුවන්, ඒ එක්කම විභාගයත් ආයෙත් කරන්න පුළුවන් කියලා."

"පරණ පහේ පන්තියෙන් අපිට එකතු වෙන්න කවුරු හරි ඉතිරි වෙලා ඉන්නවාද?" ඩැරල් ඇහුවා.

"ඔව්, කැතරින් ග්‍රේ. එතකොට, මොරියා ලික්මන්." අයිරින් ඉක්මනින් කිව්වා.

අනෙක් ඇරියෝ කෙඳිරි ගාන්නට වුණා.

"අයියෝ, මේ.... නරකම දෙන්නා...!" සැලී කිව්වා. "මම නම් මොරියාට කොහොමටවත් කැමති නැහැ. මුරණ්ඩුයි, අනිත් අයව පාගාගෙන ඉන්න හදන්නේ. ඇයි එයාව පහළට දැම්මේ?"

"ඇත්තෙන්ම එයා අවුරුද්දක් බාලයි." අයිරින් කිව්වා. "ඒ නිසා

එයා තව අවුරුද්දක් පහළ පන්තියේ හිටියට කමක් නැහැ කියලයි කියන්නේ. ඒත් මම නම් හිතන්නේ එයා ඒ තරම් හොඳ කෙනෙක් නොවන නිසා පහළට දාලා කියලයි."

"හරි, එතකොට කැතරින් කොහොමද?" සැලී ඇසුවා.

"එයා අසනීප වෙලා ඉඳලා තියෙනවා." අයිරින් කිව්වා. "ඕනෑවට වඩා වැඩ කරලා හරි මොනවා හරි දෙයක්. එයා නම් හරිම තැන්පත් ළමයෙක් නේද? මම එයා ගැන ඒ තරම් දන්නේ නැහැ. එයා අනිත් අය වගේ නෙවෙයි. ඒ තරම් ජනප්‍රිය චරිතයක් නොවෙයි කියලයි කියන්නේ."

"හරි, එහෙමනම් දැන් අපිට අලුත් ළමයි තුන් දෙනෙක්ව හම්බ වෙනවා." ඩැරල් කිව්වා. "කැතරින්, මොරියා, එතකොට මොරීන්, කවුද පන්ති නායිකාව වෙන්නේ?"

"ඔයා නැත්නම් සැලී" අයිරින් එක්වරම කිව්වා.

"නැහැ, මම එහෙම හිතන්නේ නැහැ." ඩැරල් කිව්වා. "මට හිතෙන්නේ කැතරින් නැති නම් මොරියා, දෙන්නාගෙන් එක් කෙනෙක් කියලයි. කොහොම වුණත් ඒ අය එදා ඉඳලම පහේ පන්තියේ අයනේ. හතර පන්තියෙන් ආව එක් කෙනෙක්ව එක පාරටම එයාලට ඉහළින් නායිකාව කරන එක ඒතරම් සාධාරණ නැහැ කියලා මට හිතෙනවා."

"ඔව්, ඔයා හරි." ඇලිසියා කිව්වා. "අපොයි, එහෙම නම් ඒ මොරියා නම් වෙන්නට එපා. එයා කැමති එයාට ඕනෑ දේවල් කරන්න. ඔයාලට මතකද ගිය වාරයේ දෙකේ පන්තියේ කවුද කෙනෙක් එයා ගැන කවියක් ලියලා ඒ ලියපු කෙනා කවුද කියලා ඉදිරි පත් වුණේ නැහැ කියලා එයා දෙකේ පන්තියේ හැමෝටම දිග කවියක් පාඩම් කරගෙන ඒක නායිකාවන්ගේ රැස්වීමේදී කියන්න කියලා වැඩ සැලැස්වූ හැටි? එයාලා හැම කෙනෙකුටම ඒ කවිය පාඩම් කරන්න සිද්ධ වුණා. එයාලා ඒ ගැන හරියට කෑ ගැහුවා...!"

"ඔව්, දැන් මට මතකයි" ඩැරල් කිව්වා. "හරි, මම බය නැතිව කියන්නේ අපිට පුළුවන් මොරියාව මට්ටු කරන්න."

"හැබැයි එයත් එක්ක ඔයා නිතරම කුකුල් කේන්ති ගන්නේ නැති නම් විතරයි...!" අයිරින් රහස් සිනාවක් නගමින් කිව්වා.

ඩැරල්ගේ ඉක්මන් කෝපය ප්‍රසිද්ධ දෙයක්. සෑම වාරයක් පාසාම ඈ එය පාලනය කර ගැනීමට වෙහෙසුණ අතර තමා එය ජය ගත් බව සිතා ආඩම්බර වන්නට පටන්ගත් විටම අවසානයේ නැවතත් එය ඇයව පරාජය කළා. ඩැරල් කනස්සල්ලෙන් යුතුව අනෙක් අය දෙස බැලුවා.

"ඔව්, මට ප්‍රවේසම් වෙන්න සිද්ධ වෙනවා. ගිය වාරයේදීත්, මට ඇත්තටම තරහා ගිහින් හිටියා නේද ඇලිසියා, ඔයාගේ අර ලැජ්ජා නැති නෑදෑ නංගි, ජූන් එක්ක. මම හිතනවා එයා මේ වාරයේදිවත් හොඳින් හැසිරෙයි කියලා."

"එයා නිවාඩු කාලයේ දී අපේ ගෙදර නවතින්න ආවා." ඇලිසියා කිව්වා. "මට සහෝදරයෝ තුන් දෙනෙක් ඉන්නවා, ඔයාලා දන්නවා නේ? එයා සෑම් කියන දේ අහන්නේ නැතිව මුරණ්ඩු වුණ හැම වෙලාවකම සෑම් එයාට තෝරගන්න දුන්නා විසි පාරක් ජූන්ගේම පනාවෙන් ගුටි කනවා ද නැතිනම් විසි පාරක් මිදුල වටේ දුවනවා ද කියලා...?"

"ඉතින් මොකක්ද එයා තෝරා ගත්තේ?" සෑම කෙනෙක්ම ඇසුවා.

"ඕ, මිදුල වටේ දුවන එක තමයි." ඇලිසියා කිව්වා. "ඉතින් එයා හැමදාම රවුම රවුම දුවනවා දැකලා අපේ අම්මා හිතුවේ එයා තරගයකට දුවන්න පුරුදු වෙනවා කියලයි...! සෑම් ඉවර වෙනකම්ම හිනාවෙවී බලාගෙන ඉන්නවා. මේ වාරයේ නම් එයා ටිකක් හැදිලා ඇති."

"එයා උත්සාහ කළොත් හොඳට වැඩ කරන්න පුළුවන්." ඩැරල් කිව්වා.

මේ අතරේ එක්වරම හඬක් නැගෙන්නට වුණා.

"මේ... මොකක්ද දෙවියනේ ඒ?"

එය අකුණු හඬ නගමින් අස් කුර පොළොවේ ගැටෙන හඬ වූ අතර එය පාසලට පිවිසෙන මාර්ගය දෙසින් ඇසෙන්නට වුණා. මැලෝරි ටවර්ස් හි පසු පස පිහිටි පන්ති කාමරයේ සිටි පස්දෙනාට ඇසෙන තරමට එය මහත් හඬක් වුණා.

"මම දන්නවා....! ඒ අපේ විල් ආපසු එනවා. වෙනදා වගේම එයාගේ සහෝදරයෝ එයාව එක්ක එනවා. හැමෝම අශ්වයෝ

පිට...!" යැයි කෑ ගැසූ බෙලින්ඩා කාමරයෙන් පිටතට පැන දිව්වා. "එන්න...! අපි චිත්‍ර කාමරයට ගිහින් ජනේලයෙන් බලමු. එතැනට පාර හොඳටම පෙනෙනවා."

වැඩි වෙලා නොගොස් ඔවුන් උස් ජනේලයෙන් එබී සිටියා. ඔවුන් දුටුවේ මින් පෙර දෙතුන් වතාවක් දැක තිබූ නමුත් කිසිදින එපා නොවෙන දර්ශනයක්...!

කෙටියෙන් විල් ලෙස අමතනු ලබන විල්හෙල්මිනා ඇගේ අශ්වයා වූ තන්ඩර් පිට නැග පැමිණ තිබුණා. ඇයගේ සහෝදරයන් ද අශ්වයින් පිට නැග ඇය සමග පැමිණ තිබුණා.

"හෝව්, ඔන්න...! දැන් හරි, අහා.... දඟලන්න එපා...!"

"විල්, මෙන්න ඔයාගේ බෑග් එක."

'ටිපටි - ටොප්, ටිපටි - ටොප්' යනුවෙන් පිම්මේ එන අසුන්ගේ කුරවලින් හඬක් නැගුණ අතර එක් අශ්වයෙක් 'හර්ර්ර්ම්ප්' යනුවෙන් හඬක් නිකුත් කළ අතර උදාරම් අශ්වයෝ හත් දෙනාම එකවර හේෂාරවය කළා.

"බෙලින්ඩා, කෝ ඔයාගේ චිත්‍ර පොත? අනේ මෙයාලව අඳින්නකෝ...!" අයිරින් කිව්වා.



තමා ළඟ නිතර තියෙන කටු සටහන් චිත්‍ර පොත ඒ වන විට ද බෙලින්ඩා අතට ගෙන තිබුණා. ඇගේ ක්ෂණික පැන්සල් ඉර වරින් වර පසු කර යන අශ්වාරෝහකයින්ගේ දළ සටහන් පිටු මත සිතුවම් කරන්නට වුණා. ඒ අතර අනෙක් ඇරියෝ මහත් ඇගයීමෙන් යුතුව ඇය දෙස බලා සිටියා. බෙලින්ඩාට එවැනි දක්ෂතාවයක් ලැබීම මොන තරම් වාසනාවක්ද? ඇයට ඕනෑම දෙයක් හෝ ඕනෑම කෙනෙක් ඇඳීමට තිබුණේ අරුම පුදුම හැකියාවක්.

"අන්න, එයාලා යනවා." ඩැරල් කිව්වා. "අන්න, තන්ඩර් ඒ පස්සෙන්ම යන්න හදනවා. ඌව අලා යනවාට අකමැතියි වගේ...!"

නොඉවසිල්ලෙන් දඟලන තන්ඩර් සමග විල් පාසල් මාවතේ තනි වූ අතර සියලු අසුන් තමාව දමා මාවතේ පහළට යනු දැක තමාව මාවතේ ඉහළට දක්කාගෙන යාමට විරෝධය පාමින් තන්ඩර් ඉදිරි පා ඔසවා නාසයෙන් පිඹ ආපසු ඇදෙන්නට වුණා.

අස් කුර හඬත් සමග දූවිලි වලාවක් නගමින් අශ්වයින් හය දෙනා පිට නැඟ ගත් සහෝදරයින් නොපෙනී ගියා. බැරෑරුම් පෙනුමක් සහිතව විල් තන්ඩර්ව ඉස්තාල දෙසට දක්කාගෙන ගියා. තම පවුලට අයත් අසුන්ගෙන් සමු ගැනීම ඇයට දැරිය නොහැකි දුකක් වුණා. එහෙත් මේ වන විට මැලෝරි ටවර්ස්වලට ඇය හොඳින් හුරුව සිටි හෙයින් හා ඇයට තම අශ්වයා රැගෙන විත් තබා ගැනීමට අවසර තිබූ හෙයින් ඇයට කිසිසේත් මෙම නේවාසික පාසල අතහැරීමට නොහැකි වුණා.

තවත් අස් කුර ගැටෙන හඬක්, මෙවර මාවතේ පහළින් ඇසුණා. එම හඬින් විල් තෝන් ලණුව ඇද තම අසු නවතා වට පිට බැලුවා. චිත්‍ර කාමරයේ සිටි පස්දෙනාම ඇයට කෑ ගැසුවා. "විල්...! විල්...! මෙන්න ක්ලැරිසා එනවා. එයා එන්නෙත් අශ්වයා පිටේ...!"

එය සැබෑවකි, මාවත ඔස්සේ ඉහළට පැමිණියේ පාදවල සුදු මේස් පැලඳ අහංකාර ලෙස හිස ගස්සමින් හැල්මේ එන මනරම් කුඩා අශ්වයෙකි. ඌව පැදෙව්වේ ක්ලැරිසා කාටරුයි. ඇය ඝන උපැස් යුවළක් පැලඳි, දත් දෙපළ වටා කම්බියක් දමනු ලැබූ අශෝභන පෙනුමක් තිබූ කුඩා ඇරියක් ලෙසයි පසුගිය වාරයේ පළමුව පාසලට පැමිණියේ. එහෙත් මේ වන විට ඇයගේ උපැස් යුවළ හෝ දත් වටා

තිබූ කම්බිය නොතිබුණ අතර තඹවන් කෙස් කළඹ සුළගේ පාවෙද්දී දිදුලන කොළ පැහැ දීප්තිමත් දෙනෙතින් යුතුව ඈ අසු හැල්මේ පන්නාගෙන ආවා.

"විල්...! විල්...! මම මෙරිලෙග්ව අරගෙන ආවා...! එයා හොඳයි නේද? මෙයාට තන්ඩර්ව අඳුන්වලා දෙන්නකෝ. එයාලා හොඳ යාළුවෝ වෙයි."

"අස්ස-පිස්සු දෙන්නෙක්." හඬ නගා සිනාසෙමින් ඇලිසියා කිව්වා. "ක්ලැරිසා එනතුරුම විල්ට යාළුවෙක් හිටියේ නැහැ. දැන් මේ වාරයේම අශ්වයෝ ගැන කතා කර කර දෙන්නට එකට ඉන්නයි, රේස් දුවන්නයි, උන්ව නාවන්න, කවන්න, පොවන්න වගෙ හැම දෙයක්ම කරන්න පුළුවන්"

"ඇයි, උන්ගේ කුරවල මඩ අයින් කරන්න, වලිග පීරන්න වගේ දේවලුත් කරන්න වෙයි" අයිරින් තවත් ටිකක් එකතු කළා. "අපොයි, මේ අශ්ව කුරවල ශබ්දයත් එක්ක මට අලුත් තාලයක් ගැන අලුත් අදහසක් ආවා. මෙන්න මේ වගේ අශ්වයෝ දුවන තාලයක්."

ඈ අශ්ව කුර ගැටෙනවා හා සමාන හඬක් මුමුණන්නට වුණා.

"ටයිරටි - ටයි - රටි - ටයිරටි - ටූ"

"අනේ අපේ අයිරින්, මෙයාට අස්ස පිස්සුව. නැහැ,- මෙයාට සංගීත පිස්සුව." තම චිත්‍ර කටු සටහන් පොත පසෙකට දමමින් බෙලින්ඩා කිව්වා. "දැන් මේ වාරය පුරාම අපිට වෙන මොකවත් නෙමේ අහන්න සිද්ධ වෙන්නේ අශ්වයින්ගේ දුවන ශබ්දය. අපි යමු, ටයිරටි - ටූ...!"

03

අලුත් ළමුන් හැර අනෙක් සියලු දෙනාම හැන්ඳෑ වන විට නැවතත් පරිසරයට හුරු වුණා. පහළ පංතිවල දැරියන්ගෙන් සෞඛ්‍ය සහතික හා ඔවුන්ගේ එදිනෙදා වියදමට මුදල් ද ඉහළ පන්තිවල දැරියන්ගෙන් මුදල් හැර සෞඛ්‍ය සහතික ද නේවාසිකාගාර පාලිකාවට ලැබුණා. ඉහළ පන්තිවල දැරියන්ට මුදල් ළඟ තබා ගැනීමට අවසර තිබුණා. ඔවුන්ට මුදල් ඉල්ලා නිතර පාලිකාව ළඟට යාමට සිදු වුණේ නැහැ.

"අයිරින්ගේ සෞඛ්‍ය සහතිකය හරියටම ආව ද?" ඩැරල් ඇසුවා.

නිතරම සෑම වාරයකම අයිරින්ගේ සෞඛ්‍ය සහතිකය කොහේ හෝ අමතක වීම සිරිතක් බව ඇයට සිහි වුණා. සැලී හඬ නගා සිනාසුනා.

"ඕ, කවුරු හරි 'සෞඛ්‍ය සහතිකය' කියලා ලියපු ලියුම් කවරයක් අයිරින්ගේ බෑග් එකට දාලා. ඉතින් එයා හිතුවා අම්මා සෞඛ්‍ය සහතිකය තැපෑලෙන් එවන්නේ නැතිව ඒක බෑග් එකට දාලා කියලා. එයා ඒක මේට්‍රන් ළඟට අරගෙන ගිහින් කිව්වා. 'මෙන්න මේට්‍රන්, මේ සැරේ නම් මම අමතක නොකර ගෙනාවා' කියලා."

"ඉතින් මොකක්ද ඒකේ තිබුණේ?" ඩැරල් ඇහුවා.

"අමතක වීමට බෙහෙත් තුණ්ඩුවක්" සැලී සිනා නැඟුවා. "ඒක ලියලා තිබුණ හැටි නම් මට මතක නැහැ. මතකය කෝප්පයකුයි, බෑණුම් තේ හැන්දකුයි බොන්න.... අන්න ඒ වගේ දෙයක්. ඒක කියවද්දී මේට්‍රන්ගේ මුහුණට වුණ දේ ඔයා දකින්නයි තිබුණේ. අයිරින් ඇත්තටම තුෂ්ණිම්භූත වුණා. එහෙම වෙනවනේ...! කොහොම හරි ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. ඒ මොකද ඒ වෙද්දි මේට්‍රන්ට සහතිකය තැපෑලෙන් ලැබිලා."

"මොන තරම් දක්ෂ වුණත් අයිරින් නම් අලි මෝඩියක්." ඇලිසියා කිව්වා. "ඒ වගේමයි බෙලින්ඩාත්. චිත්‍රවලටයි, සංගීතයටයි දක්ෂ අය සාමාන්‍ය දේවල් ගැන මේ තරම් මෝඩ වෙන්න මොකක් හරි අමුතු දෙයක් තියෙනවා ඇති. හැම තිස්සේම අයිරින්ගේ මොනවා හරි දෙයක් නැති වෙනවා. බෙලින්ඩා මොනවා හරි අමතක වුණොත් අමතක වුණාමයි. මතකද දවසක් උදේ කෑම වෙලාවේ බ්ලවුස් එක නැතිව එයා පහළට ආව හැටි?"

"අන්න, රෑ කෑමට බෙල් එක වදිනවා." කෑම සිහිපත් වී සතුටින් ඩැරල් කිව්වා. "මට නම් හරිම බඩගින්නක් තියෙන්නේ. හොඳම හොඳ කෑම වේලක් ඇති කියලයි මට හිතෙන්නේ. හැමදාම පළවෙනි රෑට අපට ලැබෙන්නේ හොඳම කෑමක්...! මේ වාරයේදී ෆෙලිසිටි හොය හොයා පස්සෙන් යන්න වෙන්නේ නැති එක මට ලොකු සහනයක්. එයා දැන් අලුත් ළමයෙක් නොවෙයි. දැන් එයාගේ දේවල් එයාට තනියම කර ගන්න පුලුවන්."

රාත්‍රී භෝජනය සඳහා ඔවුන් පහළට බැස විශාල කෑම කාමරය වෙතට ආවා. කල්පනාවකින් තොරව සැලී හතර පන්තියේ මේස වෙතට පියවර නඟද්දි ඩැරල් ඇගේ අතින් අල්ලා ඇද්දා.

"මෝඩි...! ඔයාට අර පොඩි උන් එක්ක එකට ඉන්න ඕනැද?" ඈ යටපත් කර ගත් නපුරු හඬකින් ඇසුවා. "පහේ පන්තියේ මේස තියෙන්නේ මෙන්න මේ පැත්තේ...!"

ඔවුන් තම අසුන් ගන්නා අතරම ඒ වන විට තවත් පහේ පන්තියේ දැරියන් තිදෙනෙකු වාඩි වී සිටින බව දුටුවා. දෙදෙනෙකු පහ පන්තියේම රැඳෙන අය වූ අතර අනෙක් දැරිය නවක කෙනෙක් වුණා. පහ පන්තියේ සිටි දැරියන් වූ මොරියා හා කැතරින් හිස සැලූ අතර අලුත් දැරිය මොරීන් පුළුල් සිනාවකින් ඔවුන්ට සංග්‍රහ කළා. මොරියා සිනාවකින් තොරව දෙතොල් තදින් පියාගෙන සිටියේ මුළු පාසලේම වගකීම් තම කර මත පැටවී ඇති බවක් පළ කරමිනුයි.

අලුත් දැරිය - මොරීන්, දීප්තිමත් සිනාවකින් මුව සරසාගෙන හිටියා. පිම්බුණ මුහුණක් හා නොසැලකිල්ලෙන් කටයුතු කරන කම්මැළි දැරියක් ලෙස පෙනුණ ඇගේ අපිළිවෙළ දත් දෙපළ මඳක් ඉදිරියට නෙරා තිබීම නිසා ඇයට තිබුණේ හාවෙකුගේ වැනි මුහුණක්.

"මම මොරීන් ලිට්ල්." ඈ මෘදු කටහඬකින් සෙමින් කිව්වා. "මම හිතන්නේ මැලෝරි ටවර්ස්වලට මම ආව එක ඔයාලට කරදරයක් නැහැ කියලයි." කී ඈ සිහින් සිනාවක් නැඟුවා.

"අපි මොකටද එහෙම හිතන්නේ?" පුදුමයට පත් වූ ඩැරල් ඇසුවා. "අපිට ආරංචියි ඔයාගේ පරණ ඉස්කෝලය වැහුණා කියලා. ඒක නම් හරි අපරාධයක්."

"ඔව්" කී ඇය කල්පනාවක වැටුණ බවක් පෙනුණා. "ඒක හරිම පුදුම ඉස්කෝලයක්. බලන්න එපායැ අපේ සෙල්ලම් පිටිය. තව අපිට පිහිනුම් තටාක දෙකක් තිබුණා. අපිට කැමති සුරතල් සතෙක් තියාගන්න අවසර තිබුණා."

"හරි, ඔයාට තේරෙයි මැලෝරි ටවර්ස් වුණත් ඒ තරම් නරක නැහැ කියලා." කතාවට එකතු වෙමින් ඇලිසියා කිව්වා.

"ඕ, ඒක ඇත්ත." සිනා මුහුණින් යුතුව කී මොරීන් ඇගේ හා දත් ප්‍රදර්ශනය කළා. "මම හිතනවා මෙහේ හුඟක් හොඳයි කියලා. ඒ නිසා තමයි අම්මා මාව මෙහාට දැම්මේ. එයා කියන්නේ මම මුලින් ගිය මැසිලි මැනර් ඉස්කෝලය ළඟට තියෙන හොඳම ඉස්කෝලය මැලෝරි ටවර්ස් කියලයි. දන්නවනේ, මැලෝරි ටවර්ස් හොඳටම හොඳයි."

"අපොයි - එයා හරිම අපූරුයි." ඇලිසියා තම මෘදු කට හඬින් කිව්වා.

"මැසිලි මැනර් කියලා ඉස්කෝලයක් ගැන මම අහලා තියෙනවද කියලා මට මතකයක් නැහැ. ඒ ඉස්කෝලයේ ළමයිනුත් පාසල් සහතික පත්‍ර විභාගය හැමදාම අසමත් වෙනවාද?"

මොරීන් ලැජ්ජාවෙන් රතු වුණා.

"ඕ, නැහැ." ඈ කිව්වා. "එහෙම වෙන්න බැහැ. අපේ පන්තියේ භාගයක් විතර සමත් වුණා. ඉතින් බලන්න මමත් සමත් වුණානේ.

මෙලෙස ඈ සැහැල්ලු කටහඬින් ගිරවෙකු සේ දොඩමළු වූ අතර අලුත් දැරියන් මෙහි ඇති දේ ඇගයීමෙන් යුතුව බලා සිටිනවා මිස පම්පෝරි ගැසිය යුතු නැති බව ඇයට අවබෝධ වුණේ නැහැ. අනෙක් දැරියන් ඇගෙන් ඉවතට හැරී යන බව පැහැදිලිව පෙනෙනතුරුම හා කිසිවෙක් ඇයට ඇහුම් කන් නොදී ඔවුන්

එකිනෙකා සමග කතාව පටන් ගන්නා තුරුම තම කතාව නතර කළ යුතු බව ඇයට හැඟුණේ නැහැ.

පළමු පන්තියේ දැරියක මෙලෙස හැසිරුණේ නම් කෙනෙකු ඇය මට්ටු කිරීමට පෙර කට වසා ගැනීම හොඳ බව සෘජුවම පළමු පන්තියේ දැරියෝ පෙන්වා දීමට ඉඩ තිබුණා. එහෙත් පහ පන්තියේ දැරියෝ එතරම් රළු වූයේ නැහැ. තමාව ගණන් නොගන්නා බවත්, තමා වැරදි ආරම්භයක් ගෙන නරක ලෙස හැසිරී ඇති බවත් ඇයටම තේරෙන තුරු ඔවුන් නිහඬව සිටියා.

"අපේ හැමෝම ආපසු ඇවිදින් ද?" මේසය වටා බලමින් ඩැරල් ඇසුවා.

"ඕ, මෙන්න මෙල්විස්. කොහොමද ඔයාගේ කට හඬ, මෙල්විස්? මම හිතන්නේ දැන් හොඳටම සනීප ඇති."

මෙල්විස් හිස සැළුවා. ඇයට තිබුණේ ලස්සන කටහඬක් වූ අතර වාර කීපයකට ඉහත දී ඇයට එය අහිමි වුව ද මේ වන විට සුපුරුදු මිහිරි බවින් යුතු කට හඬ ඇයට ආපසු ලැබී තිබුණා. ඇය සතුටින් සිටිනු පෙනුණා.

"තව, අන්න... මේරි ලෝව් - ඩැෆනි - රූත් - හලෝ රූත්...! කොහොමද ඔයාගේ නිවුන්නි?"

"හොඳින් ඉන්නවා. ඔයා දන්නවනේ එයා හතර පන්තියේ ඉතුරු වුණා කියලා." රූත් කිව්වා. "එයා නැතිව ටිකක් අමුතුයි. ඉස්කෝලයේ කොයි පන්තියක හිටියත් එයා හිටියේ මා එක්කමයි. මම හිතන්නේ මා නැතිව එයාට හුඟක්, පාළු දැනෙන එකක් නැහැ.

"ඕ, ඔයාව බලා හදා ගන්නයි, ඔයා වෙනුවෙන් කතා කරන්නයි පුරුදු වෙලා හිටපු එයා ඉක්මනින්ම ඒ විදියට බලා හදා ගන්න කෙනෙක් හොයා ගනීවි." ඇලිසියා කිව්වා. "ඔයා එයාගේ හෙවණැල්ල. රූත්, මේ වාරයේ දී අපිට බලා ගන්න පුළුවන් වෙයි ඇත්තටම ඔයා මොන වගේ කෙනෙක් ද කියලා. මුලදි අපිට කිසිම දෙයක් ඇන ගන්න බැරි වුණා...!"

"ඕ...!" මොරීන් කතාවට මැදිහත් වුණා. "රූත් නිවුන්නියක්ද? මගේ පරණ ඉස්කෝලෙත් නිවුන්නියෝ හිටියා, ඉතින් එයාලා........"

අලුත් දැරියක් මෙසේ මැදිහත් වී කතා කිරීම මින් පෙරදීත්

නොරිස්සූ බැවින් ඇය කියන්නේ කුමක්දැයි කාටත් නෑසෙන පරි
ඔවුන් සියලු දෙනාම හඬ නගා එකිනෙකා සමග කතා කරන්න
පටන් ගත්තා. මොරීන් පුදුම වී බලා සිටියා. මේසයේ මුල් කෙළව
සිටි මම්සලී ඩූපොන්ට්ට ඇය ගැන දුක හිතුණා. ඇය පුෂ්ටිමත් රුව
ගත් දැරියට ඇලුම් කළ අතර සිත සැනසෙන පරිදි කතා කළා.

"එයාලට හුඟක් සතුටුයි, ජේනවනේ කාලයකට පස්සේ ආප
ඇවිදින්. ඔයාට ඉක්මනින්ම එයාලා එක්ක යාළු වෙන්න පුළුව
බලන්නකෝ, හෙට එයාලා..... ඔව්, හෙට එයාලා ඔයාවත් එයාලගෙ
කෙනෙක් කර ගනියි. අපරාදේ, අහිංසක ළමයා - ගොන්ඩොලින්
තවම ආපහු ඇවිදින් නැහැ. ඔයා එයාට කැමති වෙයි. මොරීන්
එයාගේ හිසකෙස් රත්තරන් පාටයි, ඔයා වගේ........"

මෙහි කොටසක් කන වැකුණ ඇලිසියා සැලීට ඇසක් ඉඟ
මැරුවා.

"ඕනෑම ඔට්ටුවක්, ගොන්ඩොලින් තමයි මොරීන්ට ගැළපෙන
කෙනා." ඈ කිව්වා. කටහඬ උස් කළ ඈ මම්සලීට කතා කළා.

"හුරතල් ගොන්ඩොලින් මේරිට මොනවා වෙලා ද, මම්සලී
එයා විතරයි ආපහු ඇවිදින් නැත්තේ."

"එයා අදයි ප්‍රංශයේ ඉඳලා ආපහු ආවේ." මම්සලී කිව්වා. "එයා
හෙට මෙහේ එනවා. අපූරු ළමයා - මගේ ආදරණීය රට ගැන කතා
කරන්න එයාට පුළුවන් වෙයි. අපි දෙන්නට එකතු වෙලා හොඳ
කවියක් කියාගෙන ඉන්න පුළුවන්."

"කයියක් ගහගෙන ඉන්න මම්සලී, කවි කියන්න නෙමෙයි."
සිහින් සිනාවක් නැඟූ සැලී කිව්වා.

"ඕ, මමත් ප්‍රංශයට ගිහින් තියෙනවා." සතුටින් ඉපිළ මොරීන්
කිව්වා.

"එහෙනම් ගොන්ඩොලින්ටයි, මම්සලීටයි, ඔයාටයි එකතු
වෙලා කවි කිය කියා ඉන්න පුළුවන්. අපූරු තුන්දෙනෙක් වෙයි.
සුන්දර ප්‍රංශය ගැන කවි...!"

"බූරුවෙක් වෙන්න එපා, අයිරින්?" මොරියාගේ කට හඬ
පැමිනුණා. "මතක තියාගන්න, දැන් ඔයාලා ඉන්නේ පහේ පන්තියේ,
හතර පන්තියේ නොවෙයි."

"ඕ...! බොහෝම ස්තුතියි, අපිට ඒක මතක් කරලා දුන්නට මොරියා."

"මේ.... අපිත් එක්ක එකට ජීවත් වෙන එකනම් ඔයාලාට හුඟක් අමාරු වෙයි. හය පන්තියේ රජකම් කරගෙන ඉන්න යනවාට වඩා පරණ හතර පන්තියේ අයත් එක්ක ඉන්න පහළට වැටුණ එක නම් හරි අපරාධයක්." ඇලිසියා ඉතාම මෘදු කට හඬින් කිව්වා.

"මොරියායි, මමයි ඒක ටිකක්වත් ගණන් ගන්නේ නැහැ." කැතරින් කිව්වේ ඇවිළෙන ගින්නට පිදුරු දමමින්, කොතරම් අහංකාර ලීලාවකින් ද යත් ඇරියන් එකිනෙකාට වැලමිටිවලින් ඇන ගෙන හිනා වුණා. "කොහොම වුණත් පහළට වැටෙන අයත් ඉන්න ඕනැනේ. අනික, ඒක අලුතින් එන අයට උදව්වක්. මේ පන්තියේ සිරිත් විරිත් කියලා දෙන්න කවුරු හරි ඉන්න එක හොඳයි."

"බොහොම හොඳයි." මම්සලී කිව්වා. "හරියට හරි, කැතරින්."

එහෙත් වෙනත් කිසිවෙක් එසේ සිතුවේ නැහැ.

"කපටි හෙර...!" ඇලිසියා අයිරින්ට කෙඳිරුවා. "කාටද කැතරින්ගේ උදව් ඕනැ වෙන්නේ? පූසෙකුට කිරි බොන හැටිවත් එයාට උගන්වන්න බැහැ...! අපොයි, එයා ඔය විදියට නටන්න ආවොත් මම අස්වෙලා හයේ පන්තියට යනවා...!"

අයිරින් සිනහව නතර කර ගැනීමට ගොස් සුපුරුදු ලෙස නාසයෙන් මහත් හඬක් නැගූ අතර කැතරින් මවිතයෙන් බැලුවා.

"අපිටත් කියන්නකෝ විහිළුව මොකක්ද කියලා." සතුටු සිනාවකින් යුතුව ඈ කිව්වා.

"ඒක ඉවරයි." අයිරින් ද සතුටු සිනා පිරි මූණින් යුතුව කිව්වා.

ඩැරල් සැලීට ඇසක් ඉඟි මැරුවා. එම වාරය විනෝදජනක එකක් වන්නට යන බව පහසුවෙන්ම පෙනී ගියා. ඈ බුම්මාගෙන රවා බලන මොරියා දෙසට බැල්මක් හෙළුවා.

"ඔයාගේ චිත්‍ර පොතට ඔරවන පින්තූර එකතු කර ගන්න ඕනැද, බෙලින්ඩා?" ඩැරල් සෙමින් ඇසුවා.

මොරියා දෙස බැලූ බෙලින්ඩා හිස සැළුවා. වාරයක් පුරාම ගොන්ඩොලින් පසුපස රහසේ යමින් ඇය ගොන්ඩොලින් රවා බලන අවස්ථා චිත්‍රයට නගා තිබූ අතර දැරියන් එයට 'ගොන්ඩොලින් චිත්‍ර එකතුව' ලෙස කියන්නට පුරුදුව සිටි අතර එය ඔවුන්ට මහත් විනෝදයක් වුණා. දැන් බෙලින්ඩාට තවත් අපූරු චිත්‍ර එකතුවක් සඳහා ඔරවන මුහුණක් සහිත කෙනෙක් ලැබිලා...!

විල් හා ක්ලැරිසා මේසයේ සිටින හැමගේම කතා බස් පසෙක ලා අශ්වයින් පිළිබඳව සතුටු කතා බහක නියැළී සිටියා.

"තව ටිකකින් දෙන්නා අශ්වයෝ වගේ විරිත්තගෙන කෑ ගහයි කියලා මට බයයි." ඇලිසියා කෝපයෙන් කිව්වා. "විල්...! ක්ලැරිසා...! ඔයාලා හිතාගෙන ඉන්නේ තාම ඉස්තාලයේ ඉන්නවා කියල ද?"

"ඕ...! අමතක වුණා." තම දිදුලන කොළ පැහැ දෙනෙත් දල්වා මේසය වටා බලමින් ක්ලැරිසා කිව්වා. "ඉන්නේ කොහේද කියලා විනාඩියකට අමතක වුණා. ඒත් ආයෙත් විල් එක්ක අශ්වයෝ ගැන කතා කරන්න ආපහු එන්න ලැබුණ එක මොන තරම් හොඳද...?"

"අපොයි, අශ්ව කතා...? මට ඒවා තේරෙන්නේ නැහැ." මම්සලී හඬ නැඟුවා. "අපොයි, මම නම් අශ්වයෙකු ළඟටවත් යන්නේ නැහැ. ඌ අඩි පොළොවේ හප්පන සතෙක්."

"ඔයා දවසක ඇවිදින් ඔයාගේ අතින්ම තන්ඩර්ට සූකිරි කැබැල්ලක් දෙන්න ඕනෑ, මම්සලී." දඟකාර සිනාවක් නඟමින් විල් කිව්වා. "එනවා නේද මම්සලී?"

මම්සලී බියපත් හඬක් නැඟුවා.

"ඔයා නිතරම මට ඕක කියනවා, විල්...! ඔයා හරිම නරකයි. ඔයාගේ ලොකු අශ්වයා උගේ ලොකු නියපොතුවලින් මගේ කකුල පාගයි."

"කුර, මම්සලී, කුර...!" කුරවලට නියපොතු කියනු ඇසී මදක් කම්පනයට පත් විල් කිව්වා.

"උගේ දිග ඉසකෙයා මගේ ඇඟ පුරාම ගසයි." මම්සලී හිස වනමින් අඩි හප්පන බියකරු සත්ත්වයෙකුගේ රුවක් මවා පාමින් දිගටම කියා ගෙන ගියා.

"උගේ ලෝම." විල් එය නිවැරදි කළා. "ඕ, මම්සලී, ඔයා අශ්වයින්ට හරි බයයි. මම ඔයාව තන්ඩර් ළඟට ඇදගෙන ගිහින් ඌ ගැන හොඳ පාඩමක් කියලා දෙන්න ඕනෑ."

"මේ යක්ෂ විල්...!" මම්සලී සීලිම දෙසට දෙනෙත් උඩ යවමින් කිව්වා. "මෙයාට ඉගෙන ගන්න ඕනෑ එකම දේ අශ්වයෝ නම් මම මොනවාට ද මෙයාට ප්‍රංශ උගන්වන්නේ? ඇයි ඔයාලා හිනා වෙන්නේ, ළමයි? මේක හරි බරපතළ දෙයක්, මම විහිළු කරනවා නොවෙයි...!"

"ආපහු එන්න ලැබුණ එක කොයිතරම් හොඳද, නේද?" ඩැරල් සැලීට කිව්වා. "ඉස්කෝලයේදී හිනා වෙන තරම් මට වෙන කොහේදිවත් හිනා වෙන්න ලැබෙන්නේ නැහැ."

# 04

ප්‍රථම සැඳෑවේදී තම නැගණිය, ෆෙලිසිටි, නැවතත් ඇලිසියාගේ ඥාති සොයුරිය, ජූන් විසින් පොළඹවාගෙන නැවතත් නරක ආශ්‍රයකට තල්ලු කරගෙන ගොස් ඇතිදැයි සොයා බැලීමට ඩැරල් කාලය සොයා ගත්තා. ඇගේ සැනසිල්ලට මෙන් ෆෙලිසිටි ගිය වාරයේ ඇගේ මිතුරිය, සූසන් හා අතිනත අල්ලාගෙන සිටිනු ඈ දුටුවා.

පළමු පන්තියේ කුඩා දැරියන් සමූහයක් අසල කෙළවරක ජූන් හුදෙකලාව හිටගෙන හිටියා. ඇගේ මුහුණේ තිබුණේ මහත් අධිෂ්ඨාන පූර්වක බැල්මක්. ඇය කුමක් කල්පනා කරනවා ඇතිදැයි ඩැරල් කල්පනා කළා.

'එයා මොනවා හරි සැලසුම් කරනවා වගේ.' ඩැරල් හිතුවා. 'ෆෙලිසිටිව අතහැරලා මොනවා සැලසුම් කළත් කමක් නැහැ...! මට මේ ළමයා මොනතරම් පිළිකුල් ද?'

පහ පන්තිය නින්දට ගියේ හතර පන්තියට නින්දට ගොස් පැය කාලකට පසුවයි. වැඩිපුර විනාඩි පහළොවක් තිබීම මහත් වාසියක් ලෙස සැලකුනා. ඇඳුම් මාරු කරන අතරේ ඔවුන් දොඩමළු වී එළඹෙන වාරයේ සිදුවීම් ගැන සතුටින් අනුමාන කරන්නට වුණා.

"මට මිස් විලියම්ස්ගෙන් ආයෙත් ඉගෙන ගන්නට ලැබෙන්නේ නැහැ." සැලී කිව්වා.

ඇය හතර පන්ති භාර ගුරුතුමියට බොහෝ සේ ඇලුම් කළා.

"සමහර විට මට හිතෙනවා.........."

නිදන කාමරයේ දොර විවෘත වී මුහුණක් ඇතුළට එබුණා. ඒ කොනී, රූත් ගේ අනෙක් නිවුන්නිය.

"රූත්...! ඔයා හොඳින් ඉන්නවා ද?" ඈ ඇසුවා. "ඔයා ළඟ නැතිව මහ මොකක්ද වගේ. ඔයා තනියම වැඩ කර ගන්නවා ද? ඔයා හොයා ගත්තා ද ඔයාගේ........"

"කොනී...!" ඇලිසියා කෝපයෙන් පිපිරුණා. "ඔයා මොනවාද පහේ පන්තියේ නිදන කාමරයේ කරන්නේ? මේ වෙද්දි ඔයාලා නිදාගෙන ඉන්න ඕනැ. මෙතැනින් යන්න."

කොනී දොර අසල මුරණ්ඩුව හිටගෙන හිටියා. ඇය වාද කිරීමට ඉතා දක්ෂ කෙනෙක්.

"මම ආවේ රූත් හොඳින් ඉන්නවාද කියලා බලන්නයි." ඈ කිව්වා. "අපි මීට ඉස්සර කවදාවත් වෙන් වෙලා ඉඳලා නැහැ, ඉතින්........"

"යනවා යන්න...!" සැම කෙනෙක්ම කෑ ගැසූ අතර අයිරින් ලොකු පනාව ඉතා දරුණු ලෙස අතට ගන්නා අතරේ එම පහර වැදුනේ නම් බෙලින්ඩාගේ ඇසක් එළියට පනින්නට තිබුණා. එහෙත් කොනී නොසැළුණා. ඇගේ දෑස අවවාදාත්මක බැල්මක් සහිත රූත් ගේ මුහුණ දකින තුරු වටයක් කැරකුණා.

"රූත්...!" කොනී හදිසියේම කතාව ආරම්භ කළා. "මොනවා හරි කියන්න. ඔහොම හිටගෙන ඉන්න එපා. මම ආවේ........"

"යන්න කිව්වාම යන්න!" රූත් කී අතර සියලු දෙනාම නිශ්ශබ්ද වුණා.

පුදුම වූ ඔවුන් කිසිවෙක් එවැනි දෙයක් බලාපොරොත්තු වුණේ නැහැ. රූත් කොතරම් නම් කොනීගේ සෙවණැල්ල මෙන් නිහඬව අක්‍රියව සිටියා ද කියනවා නම් තමාට තනිව නැඟී සිට තම ප්‍රතිරූපය ගොඩනඟා ගැනීම ආරම්භ කරන මුල් අවස්ථාවේම රූත් කොනීට එලෙස අණ කරනු ඇතැයි කිසිවෙක් සිහිනෙන් හෝ සිතුවේ නැහැ.

"මම දන්නවා, අපි නිවුන්නියෝ හින්දා හැම තිස්සේම එකට හිටියා කියලා." රූත් තරමක් අනවශ්‍ය ලෙස හඬ නඟා කිව්වා. "ඒත්, දැන් මම ඉන්නේ පහේ, ඔයා හතරේ. ඔයා දන්නවානේ ඔයා පහේ පන්තියේ අය පස්සේ එල්ලී ගෙන එන්න හොඳ නැහැ කියලා. මට ඉන්න දීලා ඔයා දැන් යන්න...!"

කොනීව පරාජය කළ හැක්කේ රූත්ට පමණයි. කොනී ආපසු යන්නේ රූත් කිව්වොත් පමණයි. කිසිවක් කතා නොකළ කොනී අයා ගත් මුවින් යුතුව ආපසු හැරී යන්නට ගියා. රූත් හදිසියේම ඇඳ මත වාඩි වුණා.

"එහෙම හොඳයි...!" ඩැරල් උණුසුම් ලෙස කිව්වා. "ඔයාට තනිවම වැඩ කරගන්න සිද්ධ වෙයි රූත්. එහෙම නැතිනම් කොනී හැම තිස්සේම ඔයාගේ වැඩවලට ඇඟිලි ගහයි."

"මම දන්නවා." රූත් සියුම් හඬින් කිව්වා. "ඒත් මම... මම එයාට හරිම ආදරෙයි කියලා ඔයාලා දන්නවානේ. මට එයාට බනින්න බැහැ. ඒත් වෙන කවුරුවත් කියන දෙයක් එයා අහන්නේ නැහැ. අනිත් එක මට බැහැ එයාට පහේ පන්තියේ ගැවසෙන්න ඉඩ දෙන්න, නේද? අහිංසක කොනී...!"

"අහිංසක නැහැ කොහොමවත්." ඩැරල් කිව්වා. "ඔයාට විශ්වාස නැද්ද? එයා දස ගුණයක් කපටියි...! අනික කිසි දෙයක් ලේසියෙන් අත හරින්නේ නැහැ. එයා ඔයාගෙයි, අපෙයි ඇඟේ එල්ලිලා ඉන්නමයි හදන්නේ."

"ඒක නම් හරි." රූත්ට නොඇසෙන තරම් වූ කට හඬකින් ඇලිසියා කිව්වා. "අපි මොනවාද කරන්න යන්නේ කියන එක ගැන එයාට කිසිම හැඟීමක් නැහැ, එයාට ටොකු ඇනලා කෑ ගහලා කියලා දෙන තුරු...!"

"මටත් හතර පන්තියේ ඒ වගේම නංගි කෙනෙක් ඉන්නවා." හදිසියේම කතාවට එක්වෙමින් මොරියා කිව්වා. "හරිම කපටි හෙරක්. එයා රබර් බෝලයක් වගේ. හුළං බහිනකම් තද කරගෙන ඉඳලා අතහැරිය ගමන් ආයෙත් ඉස්සර වගේමයි. නරක කෙල්ලක්."

"එයාගේ නම මොකක්ද?" ඩැරල් ඇසුවා. "ටිකක් ඉන්න, එයා බ්‍රිජට් ද?"

"ඔව්," මොරියා කිව්වා. "එයයි, කොනියි හොඳට ගැළපෙයි...!"

"හොඳයි, අපි හිතමු කොනියි, එයයි එකතු වෙයි කියලා." ඇලිසියා කිව්වා. "හරිම අපූරු ජෝඩුවක් වෙයි. දෙන්නාට දෙන්නා හැප්පිලා හැදෙයි...!"

ඉක්මනින්ම ඔවුන් ඇඳන්වලට ගිය අතර ඩැරල් සිටියේ

මොරීන්ට යාබද ඇඳෙයි. අලුත් දැරියටත්, අනෙක් පස ඇඳෙහි සිටි සැලීටත් සුබ රාත්‍රියක් පැතූ ඩැරල් තම දෙනෙත් පියා ගත්තා. නිවසේ වූ තම ඇඳට වඩා ඇගේ ඇඳ තරමක් රළු බවක් ගත්ත ද තමා ඉක්මනින්ම එයට හුරු වන බව ඈ දැන සිටියා. ඈ තම පොරෝනය මදක් පහතට ඇද ගත්තා. එය තරමක් උණුසුම් රාත්‍රියක්. ඇයට යාබද ඇඳෙන් හඬ නඟා සුසුම් ඉහළට අදින හඬක් ඇසුණා.

'දෙවියනේ...! පළමු පන්තියේ පොඩි එකෙක් වගේ ඉකි ගහන්නේ මොරීන් නම් වෙන්න බැහැ.' ඩැරල්ට සිතුණා.

පුදුම වූ ඈ හැරී කන් දුන්නා.

"හුස්...! හුස්...!" ඔව්, නැවතත් සුසුම් ඉහළට අදින හඬ.

"මොරීන්...! මේ මොනවා වෙලාද?" ඩැරල් කොඳුරා ඇසුවා. "ඔයා අඬන ළමයෙක් වෙන්න බැහැ, මේ වයසේදී?



මොරීන්ගේ වෙව්ලන කටහඬ ඩැරල්ට ඇසුණා.

"හැමදාම මුල් දවසේදී මෙහෙම තමා. "මට අම්මයි, තාත්තයි මතක් වෙනවා, එයාලා ගෙදර මොනවා කරනවා ඇතිද කියලා. ඔයා දන්නවා නේ මම හුඟක් සංවේදියි."

"එහෙම නම් ඒ තරම් සංවේදී නොවී ඉන්න බලන්න." ඩැරල් කෙටියෙන් කිව්වා.

ඇගේ අත්දැකීම්වලට අනුව කුඩා පන්තිවලදී නම් එවැනි අයට ඔච්චම් කර සිනාසී ඉන් මුදවා ගත හැකි බවත්, මෙවැනි වයසකදී ඔවුන්ට තදින් කතා කර ඉන් මුදවා ගත යුතු බවත් ඈ දැන සිටියා.

"ඒත්, එහෙම ඉන්නේ කොහොමද? ඔයා දන්නේ නැහැ." ඉහළට අදිමින් මොරීන් කිව්වා.

"අපොයි, මම දන්නවා. ඔයාට ඒක කරන්න පුළුවන්." ඩැරල් කිව්වා. "දැන් නිඳා ගන්න. හොටු පිහා ගන්න ලේන්සුවක් නැති කෙනෙක් ඉහළට අදිනවා වගේ ඔයා සද්ද කරද්දි මට අහගෙන ඉන්න බැහැ."

ඩැරල් ඉතා අකාරුණික බවක් මොරීන්ට දැනුණා. ඇගේ අනෙක් පස ඇඳෙහි තවත් කෙනෙකු සිටියේ නම් හොඳ යැයි ඈ සිතුවා. මීට වඩා අනුකම්පා සහගත කෙනෙක්. එහෙත් එය හිස් ඇඳක්. එය ගොන්ඩොලින්ගේ ඇඳ වූ අතර ඈ තවම ආපසු පැමිණ තිබුණේ නැහැ.

අඳුරේම ඩැරල්ගේ මුහුණේ සිනාවක් ඇඳුණා. මොරීන් හා ග්වේන් එකතු වන්නේ නම් කොතරම් අපූරුදැයි ඇය සිතුවා. මොරීන්ට තිබුණේ ද ග්වේන්ගේම පෙනුම වූ අතර ඇයට තිබුණේ ද එවන්ම වූ අනුවණ, දුර්වල ගතිගුණ හා හැසිරීමක්. කෙසේ හෝ ඔවුන්ට මොරීන්ව ග්වේන් වෙතට තල්ලු කර ඔවුන් ජෝඩු කිරීමෙන් පසු සිදුවන දේවල් බලා ගැනීමට ලැබෙන්නේ නම් එය කෙතරම් අපූරු විනෝදජනක දෙයක් වනු ඇති ද...?"

"ඉන්නකෝ හෙට ගොන්ඩොලීන් මේරි ආපහු එනකම්." ඩැරල් මොරීන්ට නපුරු ලෙස කිව්වා. "එයත් ඔයාගේ පන්තියේමයි. එයත් සංවේදියි. ඔයාගේ හැඟීම් එයාට නම් තේරේවි කියලා මට විශ්වාසයි. තවමත් එයා පළමු රාත්‍රියේ ඔයා වගේම දුක් වෙනවා. ඔයා බලන්නකෝ එයා හෙට ආවට පස්සේ. මොරීන්, එයත් ඔයා වගේමයි කියලා මට හිතෙන්නේ."

යාබද අනෙක් ඇඳෙහි සිටි සැලී තද කර ගත් සිනාවක් සෙමින් පිට කළා. තමා මෙන්ම කෙනෙක් තම පන්තියේ සිටීම, තමා මෙන්ම උඩඟු ලෙස විශිෂ්ට යැයි සිතන, තමා මෙන්ම නිතර අන් අයගේ

ප්‍රසාදය හා අනුකම්පාව අපේක්ෂා කරන කෙනෙකු පන්තියේ සිටීම දැක ගොන්ඩොලින් කෙතරම් උමතු වනු ඇති ද? මෙලෙස මොරීන්ව දැන් සිටම ග්වේන් වෙතට තල්ලු කිරීමට ඩැරල් මොන තරම් නපුරු වූව ද එය කෙතරම් යෝග්‍ය ද?

"තවත් කතා එපා." මොරියාගේ කට හඬ අඳුර තුළින් නැඟුණා. "දැන් වෙලාව හරි."

පරණ හතර පන්තියේ දැරියෝ මෙම හදිසි නියෝගයට උරණ වුණා. මොරියා පන්ති නායිකාව නොවෙයි. කෙසේ වෙතත් තවම ඇයව පත් කෙරුණේ නැහැ. නිල වශයෙන් තවම එවන් කිසිම දෙයක් ප්‍රකාශ වී නැහැ. කිසිවෙක් ඒ ගැන කතා නොකළ නමුත් නොයෙක් ආකාරයට 'පුහ්' හා 'පොහ්' ආකාරයෙන් ඇඳන් කීපයකින් හඬවල් නැඟුණා. එමෙන්ම ඒ වන විට ඉතා වෙහෙසට පත්ව සිටි හෙයින්, මොරීන් හැර වෙනත් කිසිවෙකුට අවදිව සිටීමට වුවමනාවක් තිබුණේ නැහැ. මොරීන්ගේ ඇඳෙන් කීප වතාවක් ඉහළට අදින හඬ ඇසුණ නමුත් ඉන් අනතුරුව නිහඬ බවක් පැතිරුණා.

අයිරින් සෙමින් ගොරවන්නට වුණා. උඩුබැල්ලෙන් නිඳා ගන්නා විට ඈ නිතරම එසේ කළා. ඇගේ ඇඳට යාබද ඇඳේ නිඳා සිටි බෙලින්ඩා අතින් තද කර ඇයව අනෙක් පසට තල්ලු කළා. අයිරින් අවදි වීමට මැලිකමක් දක්වමින් කිකරුව ඇලයකට හැරී නැවතත් නින්දට වැටුණා. මේ වන විට ඇගේ පුරුදු ගැන බෙලින්ඩා මනා පුහුණුවක් ලබා තිබුණා.

ඊළඟ උදයේ, නැවතත් කොනී දබරකාරී හා මුරණ්ඩු පෙනුමකින් යුතුව නිදන කාමර දොර ළඟ දිස් වුණා.

"ඔයා තවත් මෙතැන." ඇලිසියා කිව්වා. "මුළු රෑම මෙතැන හිටගෙන ඉඳලා වගේ මට පෙනෙන්නේ. රූත් හොඳට හීන දැක දැක නිඳියනව ද කියලා කල්පනා කර කර ඉන්න ඇති...!"

"උදේට මම ඇවිදින් රූත් එක්ක කතා කරන්න එපා කියලා නීතියක් නැහැ, නේද?" කොනී ඇහුවා. "ඔහොම නපුරු වෙන්න එපා ඇලිසියා. මම ආවේ රූත්ගේ මේස් දෙක මගේ බෑග් එකේ තිබුණ නිසා ඒක දීලා යන්න."

"බොහොම ස්තුතියි." කී රූත් මේස් කුට්ටම අතට ගත්තා.

කොනි රූත්ගේ කණ්ණාඩි මේසය මත තිබූ දේවල් පිළිවෙ
තබන්නට වුණා. රූත් හදිසියේම ඒවා නැවත අවුල් කළා.

"එහෙම කරන්න එපා කොනී" රූත් කිව්වා. "මට කර ගන්න
දෙන්න. මම ඔයාට කිව්වා, දැන් මම ඉන්නේ පහේ පන්තියේ කියලා."

"මම පහළ පන්තියට වැටුණා කියලා, ඔයා මට මෙහෙම
ගහයි කියලා මම කවදාවත් හිතුවේ නැහැ." ඇඩි කම්පනයට
කොනී කිව්වා.

"මම කෑ ගැහුවා නෙවෙයිනේ, දැන් යන්න." රූත් කීවේ
පහත් ස්වරයකින්. ඒ ඇය දැන සිටියා කාමරයේ සිටින බො
දෙනෙකු නොදුටුවා හෝ නොඇසුණා මෙන් තම තමන්ගේ වැඩවල
නිරත වන බව අඟවමින් සිටිය ද ඔවුන් මහත් වුවමනාවෙන්
සිද්ධිය ගැන අවධානයෙන් සිටින බව. ඔවුන් මෙය දුටුවේ කුඩා
යුද්ධයක් ලෙසයි. මෙයට මැදිහත් වීමට ගිය ඇලිසියාව බොහෝ
අමාරුවෙන් ඩැරල් නවතා ගත්තා. රූත් සියල්ල තනිව නිරාකරණ
කර ගත්තාවේ...! මොරියා හදිසියේම කතා කළා.

"ඔයාට පුළුවන්ද අපේ නංගි, බ්‍රිජට්ට, මේ පොත දෙන්න?"
ඈ එක් වරම ඇසුවා.

ඈ කුඩා පොතක් දිගු කළා.

"එයා ඉන්නෙත් හතර පන්තියේ, මේ වාරයේදී තුනේ පන්තියෙන්
ආව කෙනෙක්. මම හිතන්නේ ඔයා දන්නවා ඇති එයාව."

"ඔව්, මම දන්නවා." කොනී කිව්වා. "මම එයාට දෙන්නම්."

පොත ගත් කොනී රූත් දෙස නැවතත් නොබලාම කාමරයෙන්
පිටව ගියා. ඩැරල් රූත් දෙස බැල්මක් හෙළුවා. ඇය තරමක් දුකින්
නොසන්සුන්ව සිටියා. කොනී මෙලෙස ඇයව අපහසු තත්ත්වයකට
ඇද දැමීම කොතරම් ලැජ්ජාවක්ද?

උදේ ආහාරය සඳහා සීනුව නාද වුණා. මොරීන් වැලපිලි
හඬක් නැඟුවා.

"ඕ, මේ... ආයෙත් බෙල් එක ගැහුවා ද? මම හිතාගෙන හිටියේ
මම තවම මැසිලි මැනර්වල ඉන්නවා කියලයි. හුඟක් වෙලාව යනතුරු
ආයෙත් බෙල් එක වදින්නේ නැහැ...!"

"මැසිලි මැනර් ගැන හුඟක් දේවල් අපිට අහන්න වෙයි වගේ." ඩැරල් සැලීගේ කනට කොඳුරා කියන අතරම ඔවුන් තරප්පුව පහළට බැස ගියා.

"ඒත්, සමහරවිට ග්වේන් නම් ඒ හැම දෙයක්ම අහගෙන ඉඳීවි." සැලී කිව්වා. "ඔයාගේ සැලසුමත් ඒක නේද? වැඩේ මේකයි.... ග්වේන් පහේ පන්තියට වැටෙයිද? එයා විභාගයක් අසමත් වුණා කියලා ඔයා දන්නවනේ. එයාවත් කොනි එක්කම හතර පන්තියේ නවත්වා ගනීවි."

"අපොයි, නැහැ. කොහෙත්ම නැහැ." ඩැරල් කිව්වා. "එයාට වයස වැඩියි. තව මාස කීපයක දී පහේ පන්තියේ ඉන්න ඕනෑ සාමාන්‍ය වයසත් එයාට පහු වෙනවා. කොහොම වුණත් කොනි එයාට වඩා හුඟක් බාලයි. ඒ නිසා එයාට ඒක ඒතරම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ."

උදේ ආහාර වේලාවේදී ඔවුන් මම්සලීගෙන් ග්වේන් ගැන ඇසුවා.

"එයත් අපි එක්ක පහේ පන්තියේ ඉන්නවාද?" ඩැරල් ඇසුවා.

"ඔව්, ඔව්," මම්සලී කිව්වා "ඇත්තෙන්ම...! එයා අසමත් වුණ එක ඇත්ත, අහිංසක ළමයා. ඔයාලට තිබුණේ හරිම අමාරු විභාගයක්නේ. ඒත් එයා හදිසියේම අසනීප වුණා. ඔව්, එයාට පපුවේ අමාරුවක් හැදුණා, අහිංසක ගොන්ඩොලින්."

පහේ පන්තියේ දැරියෝ එකිනෙකාට වැලමිටිවලින් ඇන ගත්තා. විභාගය මඟ හැර සිටීමට ග්වේන් බොරු පපුවේ අමාරුවක් මවා පෑවා. පපුව වේගයෙන් ගැහෙන බව හා නිතර හතිය හැදෙන බවට ඇය මැසිවිලි නැඟුව ද, මම්සලී හැර අන් කිසිවෙක් එය විශ්වාස කළේ නැහැ. කෙසේ වෙතත් ගොන්ඩොලින්ට විභාගයට වාඩි වීමට සිදුව තිබුණ අතර ඈ ඉන් අසමත්ව තිබුණා.

"හරි, පපුවේ අමාරුව ඇතිව හරි නැතිව හරි, එයා අපිත් එක්ක පහේ පන්තියේ ඉන්න බව පෙනෙනවා." ඇලිසියා කිව්වා. "හුරතල් ගොන්ඩොලින් මේරි, අද ඉඳලා එයා ආයෙත් අපි එක්ක ඉන්න එක මොන තරම් වටිනවාද?"

05

උදෑසන නවයට මඳකට පෙර පහ පන්තියේ දැරියෝ පන්ති කාමරයට ගියා. චමත්කාර දර්ශනයෙන් ඔවුන් මහත් සොම්නසට පත් වුණා. ජනෙල් පියන්පත් ඇර ඇමූ ඩැරල් සැප්තැම්බර් හිරු කිරණින් උණුසුම් වූ නැවුම් වාතය කාමරයට ගලා ඒමට සැලසුවා.

"දිව්‍ය ලෝකයට ගියා වගේ." ඈ කිව්වා. "මම හිතන්නේ අපට නාන්න යන්න ඉඩ ලැබෙයි කියලයි. ගල් තලාවේ තියෙන පිහිනුම් තටාකය මේ වෙන කොට හොඳ ගණනට ඇවිදින් ඇති."

මොරීන් කලබල වී වට පිට බැලුවා.

"ඇත්තටම, ශීත ඍතුවේදී නම් ඔයාලට නාන්න ඉඩ දෙන්නේ නැතිව ඇති!" ඈ කිව්වා. "ඒ, මැසිලි මැනර්වලදී, අපි......."

"එහේ හරිම අපූරු ඇති නේද?" ඇලිසියා ඉතා මෘදු හඬින් ඇසුවා.

"ඕ, ඔව් - අපි ඒ දවස්වල......." මොරීන් කියවන්නට වුණා.

"ඒක වහන්න වුණ එක ගැන තමයි දුක." අයිරින් මැදිහත් වී බාධා කළා.

"ඔව්, හුඟක් දුකයි." මොරීන් එකඟ වුණා. "බලන්නකෝ, අපි හැමෝම හරිම....."

"ඒ වගේ අපූරු තැනක ඉඳලා ආවාට පස්සේ, ඔයාට මැලෝරි ටවර්ස් පෙනෙනවා ඇත්තේ කිසි වැඩකට නැති දෙකේ පන්තියේ තැනක් වගේ වෙන්න ඇති." බෙලින්ඩා ඉතා අනුකම්පා සහගත ස්වරයකින් කිව්වා.

"ඒකට කමක් නැහැ. මෙහෙදිත් අපි හොඳට වැඩ කරමු." සැලී ඇයව දිරි ගැන්වූවා. මෙම බාධා කිරීම් කරුණාවන්ත බවක් පෙන්නුම් කළ ද මොරීන්ට ඒ ගැන සැක මුසුව සිතන්නට සිදු වුණා. තමා

නිසි පරිදි මේ පරිසරයට හැඩ ගැසෙන තුරු යමක් නොකියා සිටීම සමහර විට නුවණට හුරුවනු ඇත. මේ කෙල්ලෝ මැසිලි මැනර් අයට වඩා හුඟක් වෙනස්.

"අපේ පන්ති භාර අලුත් ටීචර්, මිස් ජේම්ස්, කොහොමද?" ඩැරල් කැතරින්ගෙන් හා මොරියාගෙන් ඇසුවා. "එයා වාර කීපයක් ඔයාලට ඉගැන්නුවා. එයා හොඳද?"

"කිසිම දෙයක් වැඩිය ගණන් ගන්නේ නැහැ, එක වෙලාවකට." මොරියා කිව්වා. "ඒත් පරිස්සමින්...! ඇහි පිහ ගහන්න ඉස්සර එයා වෙනස් වෙන්න පුළුවන්. ඉක්මනින්ම ඒ වෙනස තේරුම් නොගත්තොත් ඒක ඔයාලගේ නරකට හිටීවි. ඒ වුණාට, ජිමී නරක කෙනෙක් නොවෙයි."

"එයාට තරහා ගියාම එයා මිස් ජේම්ස්, හොඳින් ඉන්නවා නම් එයා ජිමී." පුළුල් සිනාවෙන් යුතුව කැතරින් පැහැදිලි කළා. "ඇත්තෙන්ම එයා හරි හොඳ කෙනෙක්."

"ඕ, කැතරින්ට හුඟක් අය 'හරි හොඳයි' නැති නම් 'හරිම අහිංසකයි' වගෙයි පෙනෙන්නේ." මොරියා කිව්වා. "එයා කවදාවත් කාගේවත් නරක කතා කරන්නේ නැහැ. ඔයාලට මොනවා හරි කරවා ගන්න ඕනැ නම් කැතරින් ඕනෑ වෙලාවක ඒකට ලෑස්තියි. එයා හරි කැමතියි අනිත් අයට උදව් කරන්න."

කැතරින් ලැජ්ජාවෙන් රතු වුණා.

"බොරු කතා කියන්න එපා, මොරියා" ඈ කීව ද මහත් උද්‍යෝගී පෙනුමක් ඇගේ මුහුණට ආරූඪ වුණා. මොරියා ඇයට විහිළු කරනවාද? ඇයව සිනාවට ලක් කරන්න උත්සාහ කරනවාද? අනෙක් අය ඒ ගැන පුදුම වුණේ නැහැ. ඔවුන් දැන ගත්තා මොරියා කැතරින්ව වර්ණනා කරනවා නොවෙයි. ඇයව හාස්‍යයට ලක් කරනවා. මොරියා කිසි දිනක කිසිවෙකුව හදවතින්ම වර්ණනා කරන අයෙක් නොවෙයි.

ඇරියෝ තම තමන්ගේ ඩෙස්ක තෝරාගෙන තිබුණා. කවුරුත් වඩාත් කැමති පසු පෙළ ඩෙස්ක හිමි වුණේ පහ පන්තියේ සිටි පරණ දෙදෙනාටයි. පසුගිය වාරයේ පන්ති නායිකාවන් වූ ඩැරල්ට හා සැලීටත් අයිරින් හා බෙලින්ඩාටත් පසු පෙළ ඩෙස්ක හිමි වුණා.

මේ වනවිට අනෙක් ඇරියෝ ද පන්තියට පැමිණ තිබුණා. ඔවුන් අනෙකුත් කුලුනුවලින් පහ පන්තියට පැමිණි අය. ටෙසා, ජෙන්ට්, පෙනිලෝපා, කැටී, ඩෝරා හා ග්ලාඩියා. ඔවුන් අනෙක් කුලුනුවලින් පහ පන්තියට පැමිණි අය වූ අතර ඇරියෝ ඔවුන්ව නම්වලින් මෙන්ම රූපයෙන් ද හඳුනන අය. උතුරු කුලුනේ ඇරියන් සමග ඔවුන් සියලු දෙනා පාඩම්, ක්‍රීඩා හා නොයෙක් ක්‍රියාකාරකම්වලදී මිශ්‍ර වුව ද ඉන්පසුව කෑම, විවේකය හා නින්ද සඳහා වෙන්ව ගොස් තම තමන්ගේ කුලුනුවල කාලය ගත කළා.

"ෂ්... ෂ්....!" යමෙක් හඬ නැගුවා. "ජිමී එනවා...!"

ඉන් පසුව පන්තියට ඇතුළු වූවේ ජිමී හෙවත් ජේම්ස් ගුරුතුමියයි. ඇය පනස් වියැති පමණ වූ සිහින් උස් කාන්තාවක්. කරුණාවන්ත නමුත් තීක්ෂණ බුද්ධිමත් බවක් පළ කරන දුඹුරු දෙනෙතකින් යුතු ප්‍රඥා සම්පන්න බවක් පළ කරන මුහුණකින් යුතු ඇගේ අක් බඹරු හිස කෙස් මඳක් පැසී තිබුණා.

"වාඩි වෙන්න." ඇය කී අතර වාඩි වූ ඇරියෝ දෙපා බිම වද්දන්නත්, ඩෙස්ක පුටු ඒ මේ අත ඇද සකස් කර පොත් පත් පිටතට ගන්නටත් පටන් ගත්තා.

සම්පූර්ණ නිශ්ශබ්දතාවය ඇතිවන තුරු ජේම්ස් ගුරුතුමිය බලා සිටියා.

"හොඳයි, නැවත වතාවක් මට අලුත් පන්තියක්." ඇය කතාව ආරම්භ කළේ තම තියුණු දෙනෙත එක් ඇරියක් වෙත රඳවා නැවත තවත් ඇරියක් වෙතට යොමු කරමින්. "ඔයාලගෙන් තුන් දෙනෙක් විතරක්, මම හිතන්නේ යම් හොඳ හේතුවක් නිසා ගිය වාරයේ මේ පන්තියේ හිටියා වගේම මේ වාරයේත් මේ පන්තියේම රැඳෙනවා. එයාලා හයේ පන්තියට නොගිහින් නැවත මේ පන්තියේ රැඳෙන එක, ඇත්තෙන්ම මට වගේම අපි කාටත් ලොකු සහයෝගයක් වෙනවා. එතකොට, මට පහසු වෙනවා මේ අලුත් අය මගෙ ක්‍රමයට හැඩ ගන්වා ගන්න."

පස් වන පන්තියේම රැඳෙන තුන් වැන්නිය කවුදැයි දැක ගැනීමට ඇරියෝ වටපිට බැලුවා. ඕ.... ඒ කුඩා ජෙනට්. ඇත්තෙන්ම හය පන්තියට යාමට ඇයට තවත් බොහෝ කාලයක් තිබුණා. ඇයව පහ පන්තියට දමා තිබුණේ මීට වසරකට ඉහතදීයි. ඒ ඇය කල්

ඇතිවම පාසල් සහතික පත්‍ර විභාගය සමත් වීමට සුවිශේෂ ලෙස දස්කම් දැක්වූ නිසයි. ඇයට තිබුණේ ඉතා ළාබාල පෙනුමක් වූ අතර ඇය තවමත් හතර පන්තියේ සිටින දැරියකගේ පෙනුමින් යුතු යැයි ඩැරල්ට සිතුණා.

එම පන්තියේම රැඳී සිටීමට ලැබීම ගැන ජෙනට් සතුටු වුණා. හය පන්තිය ගැන ඇයට බියක් තිබුණා. මොරියා රවාගෙන සිටියා. ඈ තමාව අතහැර දමනු ලැබීම ගැන කෝපයෙන් පසු වුණා. කැතරින් සතුටු සිනාවෙන් යුතු වුණා. ඔව්, ඇත්තෙන්ම, ජේම්ස් ගුරුතුමිය කී පරිදිම හැකි සෑම අයුරින්ම ඇය උපකාරී වන අතර ගුරුතුමියට ඇය ගැන විශ්වාසයක් තැබිය හැකි පරිදි ඇය උපරිමයෙන් වැඩ කරනවා. ඈ ගුරුතුමියගේ දෙනෙත් දෙස බැලීමට උත්සාහ කළ ද කුමක් හෝ හේතුවක් නිසා එම බැල්ම මඟ හරින ගුරුතුමිය ඇගේ දෙනෙත් වුවමනාවෙන්ම වෙන අතකට යොමු කළා.

බලාපොරොත්තුවෙන් යුතුව ජේම්ස් ගුරුතුමිය දෙස ඇස දල්වා බලාගෙන, කැතරින් ටික වේලාවක් තම දීප්තිමත් සිනාව මුහුණේ රඳවා ගෙන සිටියා. එහෙත් එම කතාව එතැනින් නතර කළ ගුරුතුමිය වෙනත් දෙයක් පටන් ගත්තා. කැතරින්ට තම සිනහව නිවා දමන්න සිද්ධ වුණා. ඇගේ කම්මුල්වල මාංස පේශීන් වේදනාව ගෙන දුන්නා.

"අපි මුලින්ම පන්ති නායිකාවක් පත් කර ගන්න ඕනා. මම පහේ පන්තියේ නායිකාව විදිහට මොරියාව පත් කරනවා. ඇයගේ අත්දැකීම් අනුව හොඳින් ඒ කටයුත්ත කරාවි යැයි මා විශ්වාස කරනවා." ජේම්ස් ගුරුතුමිය කිව්වා.

මොරියාගේ මුහුණ සතුටින් බැබළුණා.

"ඒ වගේම ඩැරල් පහ පන්තියේ ක්‍රීඩා නායිකාව වෙන්නයි යන්නේ." ජේම්ස් ගුරුතුමිය කිව්වා. "සැලී ඉන්නවා එයාගේ සහායට. තේරෙනවා නේද, ඩැරල්? පහේ පන්තියේ ක්‍රීඩා නායිකාවට තමයි ඉස්කෝලයේ පහළ පන්තිවල ක්‍රීඩා පුහුණුව භාර වෙන්නේ. හොඳ කණ්ඩායම් හදන්න කාලය මිඩංගු කරන්න සිද්ධ වෙනවා. නමුත් සැලී උදව්වට ඉන්නවා."

ඩැරල් සතුටින් බැබළුණා. මැලෝරි ටවර්ස්හි තුන හා හතර කණ්ඩායම් සැකසීමට පළමු හා දෙවැනි පන්තිවල කුඩා දැරියන්

තෝරා, පුහුණු කර, ඔවුන් හැඩ ගැස්වීමට ලැබීම කොතරම් අපූරු දෙයක් ද? පාසල තුළත්, පාසල් අතරත් පැවැත්වෙන තරගවලින් ජය ලැබීමට හැකි කණ්ඩායම් පුහුණු කිරීමට ඇයටත්, සැලීටත් හැකි වුවහොත්? එය මොන තරම් අපූරු වාර්තාවක් වනු ඇති ද? පහළ පන්තිවල කණ්ඩායම් එක පිට එක තරග දිනනු පෙනෙන දවල් හීනයකට ඩැරල් සෙමින් ඇද වැටුණා.

'මම, ඇත්තටම ෆෙලිසිටිවත් පුහුණු කරනවා.' ඈ සිතුවා. 'එයා දැනටමත් හුඟක් හොඳයි. මට එයාව සුපිරි මට්ටමට ගෙන එන්න පුළුවන්. ඒ වගේම සූසනුත් හොඳයි. ඒ වගේම මට ජූන්වත් ටිකක් හැඩ ගස්වා ගන්න පුළුවන්. අපොයි, එයාට මෙහේ නීති රීතිවලට අනුව වැඩ කරන්න වෙයි. එයාගේ විකාර නම් මම ඉවසන්නේ නැහැ. එතකොට දෙකේ පන්තියේ ඉන්න හැරියට්, ඒ වගේම ලූසී ඉන්නේත් දෙකේ පන්තියේ.....'

සුපිරි ලැක්රෝස් කණ්ඩායමක් හදන සිහිනයක අතරමංව සිටි නිසා ජේම්ස් ගුරුතුමිය ඊළඟට කී දේවල් ඇයට ඇසුණේ නැහැ.

"ගිය වාරයේ ඔයාලා හුඟක් මහන්සි වෙලා වැඩ කළා." ජේම්ස් ගුරුතුමිය කිව්වා. "විශේෂයෙන්ම, මේ පන්තියේ ඉන්න සියලු දෙනා සමත් වුණ අය. ඒ වගේම පාසල් සහතික පත්‍ර විභාගය හොඳින් සමත් වුණ අය. යම් යම් කාරණා නිසා විභාගය අසමත් වුණත් මේ පන්තියට ආව අයට නැවත පසුව අවස්ථාවක් ලැබෙනවා. ඒ අයට විශේෂ ඉගැන්වීම් සිදුවන නිසා මේ පන්තියේ සුපුරුදු පාඩම් ඒ අයට කරන්න ලැබෙන්නේ නැහැ, ඒ විභාගය අවසාන වනතුරු විතරයි."

ඇලිසියා සුසුමක් හෙළුවා. විභාගය මේ වාරයේදී නොපැවැත්වෙනු ඇත. එහෙත් අනෙක් අය හැර දමා ගොස් විශේෂ පන්තිවලට සහභාගී වීමේ අදහසට ඇය කිසිසේත් මනාප වූවේ නැහැ. අපොයි...! ගිය වාරයේ විභාගය පැවැත්වෙන සතියේම ඇයට සරම්ප සෑදෙන්නට සිදු වූයේ කුමක් නිසාද?

"දැන්, ගිය වාරය ඔයාලට හුඟක් වැඩ තිබුණ වාරයක් නිසා මම මේ වාරයේදී ඔයාලව මහන්සි කරවන්නේ නැහැ." ජේම්ස් ගුරුතුමිය කී අතර කුඩා මඳ සුළඟක් ලෙස පන්තිය සතර දෙසින් සැනසුම් සුසුම් නැඟුණා.

"මම අදහස් කළේ, දීර්ඝ සූදානම් පන්ති හෝ ඔයාලා වෙහෙසට

පත්වෙන පාඩම් හෝ කරන්න මගේ අදහසක් නැහැයි කියන එක. ඒත් ඔයාලට කාලයෙන් ප්‍රයෝජනය ගන්න තවත් වැඩ කටයුතු රාශියක් තියෙනවා. උදාහරණයක් හැටියට, මට සිද්ධ වෙනවා පහේ පන්තියේ අය එක්ක නත්තල් ප්‍රසංගය කරන්න."

මේ සමගම සියලු දෙනා සිරුරු ඍජුව තබාගෙන උනන්දුවෙන් සවන් යොමු කළා. අපොයි...! හරිම අපූරු විනෝදයක් වෙයි. කොහොමද නාට්‍යයක් කළොත්...? නැතිනම් මුද්‍රා නාට්‍යයක් හරි වෙනත් නර්තනයක්...? නොයෙක් ආකාරයේ අදහස් ඇරියන්ගේ සිත් තුළට ගලා ආවා. ඔවුන් එකිනෙකා දෙස බැලුම් හෙළුවා. හැමෝම ඒ අදහස්වලින් කුල්මත් වී සිටියා.

"ඔයාලා ඒක කරන්නේ තනිවමයි. අවශ්‍ය වෙලාවකදී සංගීත මාස්ටර් යං මහත්මයාගෙන් හෝ ගායනා මිස් ග්‍රීනින්ගෙන් උපදෙස් ගන්න පුළුවන්." ඇරියන් පෙන්වූ උද්දාමය දැක සතුටට පත් ජේම්ස් ගුරුතුමිය කියාගෙන ගියා.

ආහ්...! ඔවුන් පහ පන්තියට පැමිණි විට කිසිවෙකුගේ මැදිහත් වීමකින් තොරව තනිවම තම දේවල් කර ගන්නට ලැබීම කොතරම් අපූරු දෙයක් ද? ඔවුන් එයට ඉතා ආශා කළේ එය නිවැරදි දෙයක් නිසයි. ඔවුන් දැන් සිටම තම කටයුතු තනිවම කර ගෙන, තම දෙපයින් සිටීමට ඉගෙන නොගතහොත් නැවත ඒ සඳහා ඔවුන්ට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

"සංවිධායකයින්ව ඔයාලම තෝර ගන්න."ජේම්ස් ගුරුතුමිය කිව්වා. "ප්‍රධාන වශයෙන් දෙන්නෙක් වත් ඉන්න ඕනැ. හුඟක් වැඩ තියෙනවා. එක්කෙනෙකුට තනිවම කරන්න අමාරුයි. ඔයාලා තනිවම කරන තරමට ඒක හොඳයි. ඒත් මම, ප්‍රින්සිපල් මැඩම්, මිස් ග්‍රේලින් හුඟක් සතුටු වෙනවා ඒ ගැන. ඒ වගේම ඔයාලට අවශ්‍ය කරන වෙලාවක ඕනෑම උපදෙසක් දෙන්න අපි ලෑස්තියි."

පන්තියේ සෑම සිසුවියක්ම බාහිරින් කිසිදු උපදෙසක් ලබා නොගැනීමට දැඩි ලෙස අධිෂ්ඨාන කර ගත්තා. එය කුමන ආකාරයක වුවත්, නත්තල් ප්‍රසංගය වෙන කාගේවත් නොවෙයි, ඔවුන්ගේම පමණක් විය යුතුයි.

'අපි කරන එක මැලෝරි ටවර්ස්වල මෙතෙක් කරලා තියෙන ඒවායින් හොඳම එක වෙයි...!' ඩැරල් දිව්රුවා.

'අපි ඔක්කෝගෙම දෙමව්පියෝ කැඳවා ගන්න ඕනෑ. එයාලට මොන තරම් පුදුමයක් වෙයි ද?' සැලී සිතුවා.

'හොඳම අවස්ථාවක්...!' සිතූ ඇලිසියාගේ ඕනෑම දෙයකට හැඩ ගැසෙන සිතුවිලි නොයෙක් ආකාරයේ දේවල් වෙත ගමන් කරන්නට වුණා.

ඈ පළමු රැස්වීම ගැන මහත් ආශාවෙන් බලා සිටියා. ඔවුන් ඇයව ප්‍රධාන සංවිධායක කෙනෙක් කරනවා නම්...! ඇයට සෑම දෙයක්ම හොඳින් සංවිධානය කළ හැකියි. ඕනෑම කෙනෙකුට වඩා දක්ෂ ලෙස ඇයට සැලසුම් කළ හැකියි. ඇයට හැකි බව ඈ දැන සිටියා.

ජේම්ස් ගුරුතුමිය විසින් ඔවුන්ගේ හිසට දමන ලද අදහස් ගැන සාකච්ඡා කරනු පිණිස විවේකය එළඹෙන තුරු ඔවුන් මහත් ආශාවෙන් බලා සිටියා.

අවසානයේ විවේකය එළඹුණා. එක පොදියට පහේ පන්තියේ දැරියෝ දුව ගොස් මිදුලේ කොනක රැස් වුණා. සෑම කෙනෙක්ම එකවර කතා කරන්නට පටන් ගත්තා.

"අපිට ඉස්සරලාම රැස්වීමක් තියන්න වෙනවා." ඩැරල් කිව්වා. "අපොයි, මට නම් හරිම සතුටුයි. නත්තල් ප්‍රසංගය අපිට තනිවම කරන්න පුළුවන් කිව්වා. මම ක්‍රීඩා නායිකාව කරලා. මට තමයි පහළ පන්තිවලින් ළමයි තෝරාගෙන එයාලගේ කණ්ඩායම් හදන්න සිද්ධ වෙන්නේ...! අයියෝ, මට කිසිම වැඩක් කරන්න වෙලාවක් ඉතුරු වෙන එකක් නැහැ."

"හරි, මේ වෙද්දී අපි වැඩ කරන්න ඕනෑ කොහොමද කියලා ඉගෙන ගෙන තියෙනවා." සැලී කිව්වා. "එහෙම නොවුණා නම්, අපිට කවදාවත් මේ වගේ දෙයක් කරන්න බැරි වෙනවා...! මේකෙන් අපිට ඉගෙන ගන්න තවත් දේවල් තියේවි. මම කියන්නේ, අපේම දේවල් සැලසුම් කර ගන්න, ඒවා ප්‍රායෝගික කරන්න, එහෙම කරද්දී එකතු වෙලා හරියට වැඩ කරන්නේ කොහොමද කියන එක වගේ හුඟක් දේවල්."

"ඕ, ඔයා කියන්නේ ඔය කියන හැම දෙයක්ම අපිට තනිවම ඉගෙන ගන්න ඉඩ දෙන්න ජීමී මේක සැලසුම් කරලා කරපු දෙයක් කියල ද?" ඩැෆනි ඇසුවා.

"ඒ වගේ තමා." ඇලිසියා කිව්වා. "ඉතින් ඒකට මොකද? ගීත නාටකයක් කරලා අපි මොනවා හරි ඉගෙන ගන්නවා නම් කොහොම හරි අපි ඒක කරලා බලමු...! මම නම් ඕනෑම දෙයකට ලෑස්තියි...!"

"අපිට කාරක සභාවක් පත් කර ගන්න වෙයි." මූලිකයා වෙමින් මොරියා හදිසියේ හඬ නැඟුවා. සැලී, ඩැරල් හා ඇලිසියා මඳකට හිත කලබල කර ගත්තා. මේ තාක් වනතුරු හතර පන්තියේ තීන්දු තීරණ ගැනීමේ දී ප්‍රමුඛව කටයුතු කළ ඔවුන්ට මොරියාගේ අණසක පතුරන මැදිහත් වීමට එකඟ විය නොහැකි වුණා. කෙසේ වුව ද ඇය පන්ති නායිකාවයි. පාලනය කිරීමේ අයිතිය ඇයට තිබුණා. එමෙන්ම එසේ කළ හැකි හැකියාව ඇයට තිබුණා. ඒ ගැන සැක සිතීමට කිසිවෙකුට ඉඩක් තිබුණේ නැහැ.

ඇරියන්ට මොරියාගේ ඇඩි අණසක පතුරන පෞරුෂය තදින් බලපෑවා. එවැනිම චරිතයක් වූ ඇලිසියාගේ බලවත් දරදඬු චරිතය ද ඔවුන් මත යම් බලපෑමක් ඇති කළා. එහෙත් ඇලිසියාට හාස්‍ය ඉපිදවීමේ හැකියාව තිබුණ ද මොරියාට එවැනි දෙයක් තිබුණේ නැහැ. ඔවුන් අතර තිබුණු ප්‍රධානම වෙනස එයයි.

'මේ වගේ අය දැන හඳුනාගැනීමයි වඩාත් අපූරු.' ඩැරල් තමාටම කියා ගත්තා.

"අපි හත් දෙනෙක් හෝ අට දෙනෙක් ඉන්න කමිටුවක් තෝරා ගන්නවා නම් හොඳයි." මොරියා තව දුරටත් කිව්වා. "අපි තෝරා ගැනීම සාමාන්‍ය ක්‍රමයට කරමු. අපි හැම කෙනෙක්ම කමිටුවට තෝරා ගන්න කැමති අයගේ නම් ලියලා පෙට්ටියකට දාමු. ඊට පස්සේ අපි ඒවා අරගෙන, දිග ඇරලා ගණන් කරලා බලමු කවුද වැඩියෙන්ම ඡන්දය අරගෙන තියෙන්නේ කියලා. අපි අද රෑට ඒක කරමු."

'ඕ, මම හිතනවා මාවත් කමිටුවට තේරේවි කියලා' ඩැරල් සිතුවා.

එමෙන්ම ඇලිසියා ද ඒ දෙයම සිතුවා. ඇලිසියාට මෙයට සම්බන්ධ වීමට ඇඩි උවමනාවක් තිබුණා. ඇයට අවස්ථාව ලැබුණොත් ඇයට සම්පූර්ණ ප්‍රසංගය මෙහෙය විය හැකියි.

"අපේ හුරතල් ගොන්ඩොලින් මේරි එන්නේ කවදාද?" ඇලිසියා ඇසුවේ දිවා ආහාරයෙන් පසුව හවස දෙකට පැය කාලක් තිබියදී ඔවුන් අව්ව තපමින් සිටින අතරතුරයි. එය ගිම්හාන කාලය මෙන්ම උණුසුම්ව හිරු පායා තිබුණා.

මිදුලේත්, පිට්ටනියේත් උණුසුම් ස්ථානවලට කුඩා කණ්ඩායම් ලෙස එක් රොක් වූ ඇරියෝ තැන තැන වැතිර හිරු රැස් නාන්නට වුණා. කරදර වීමට කරුණක් නොවූ හෙයින් ඔවුන්ගේ සිත් සතුටින් පිරී තිබුණා.

"ග්වේන් ද? ඔ, එයා අද තේ වේලාවේදි එනවා." ඩැරල් කිව්වා. "හුරතල් ගොන්ඩොලින් මේරි...! ඔයාලට හිතෙනවා ද කැතරින් එයාට 'හුරතල් බැටළු පැටියා' කියයි කියලා?"

"මට නම් ඊටත් වඩා හොඳ නම් කියන්න පුළුවන්." බෙලින්ඩා කීවේ මුව අයාගෙන නින්දට වැටී සිටි මෙල්විස්ගේ කාටූන් රූපයක් අඳින අතරයි.

"ගොන්ඩොලින් හොඳ කෙනෙක්ද?" මොරීන් ඇසුවා. "මට පෙනෙන්නේ නම් හුඟක් හොඳ කෙනෙක් වගෙයි."

ඩැරල් ඇලිසියාට ඇසක් ඉඟි මැරුවා.

"හොඳයි ද? අපොයි, ඔයාට හුඟක් ආසා හිතෙයි...!" ඩැරල් කිව්වා. "හුඟක් අනුකම්පාව දක්වලා අනිත් අයගේ දුකට ඇහුම්කන් දෙනවා. ඒ වගේම කතා කරන්නත් ආසයි. එයාලගේ පවුල ගැන, බල්ලෝ, පූසෝ ගැන, එයාගේ කාර් ගැන කියන කතා. හරි, ඔයාට පැය ගණනක් තිස්සේ අහගෙන ඉන්න පුළුවන්, මොරීන්"

"එයා ක්‍රීඩාවලටත් කැමතිද?" ක්‍රීඩාවලට කිසිම කැමැත්තක් නොදැක්වූ මොරීන් ඇසුවා. "මැසිලි මැනර්වලදි, අපිට වුවමනා නැතිනම් අපි ක්‍රීඩාවලට ගියේ නැහැ. මම කියන්නේ, මෙහේදි වගේ

එහේ ක්‍රීඩා අනිවාර්ය වුණේ නැහැ. මෙහේ ලොකු වැරැද්දක් වෙනවා, මම හිතන්නේ."

"ඕ, ග්වේන්ටත් ක්‍රීඩා පෙන්නන්ට බැහැ." ඇලිසියා කිව්වා. "ඒත්, එයා හුඟක් මහත නිසා එයාට පුළුවන් තරම් ක්‍රීඩා කරන්නයි, හැතැප්ම ගණනක් ඇවිදින්නයි සිද්ධ වෙලා."

"අසරණ ගොන්ඩොලින්...!" මොරීන් කීවේ තවමත් පන්තියට පැමිණ නොතිබුණ දැරිය කෙරෙහි දැඩි අනුකම්පාවෙන් යුතුවයි. "අපි දෙන්නාගේ හුඟක් සමානකම් තියෙනවා කියලා මට පෙනෙනවා. එයාට.... එයාට කවුරු හරි විශේෂ යාළුවෙක් ඉන්නවාද කියලා ඔයාලා දන්නවද? ඇත්තෙන්ම.... ඒක මෝඩ ප්‍රශ්නයක් කියලා මම දන්නවා. ඒ වගේ ළමයකුට අනිවාර්යෙන්ම විශේෂ යාළුවෙක් ඉන්න ඕනෑ. ඒත් මට නිකම් හිතුණා. ඔයාලා දන්නවා ඇති මමත් හුඟක් වෙලාවට තනියම ඉන්න නිසා මගේ තනි නොතනියට කතා කර කර ඇවිදින්න කෙනෙක් ඉන්නවා නම් ඒක හුඟක් හොඳයි. එයාටත් විශේෂ යාළුවෙක් නැති නම් ඒක හොඳයි."

"කෝ ඉන්න බලන්න." ඇලිසියා ඇසිපිය හෙළමින් අහස දෙස බලා කතා කළා. "ගොන්ඩොලින් මේරිට යාළුවෙක් ඉන්නවාද?"

සෑම කෙනෙක් ගැඹුරට කල්පනා කරන බවක් පෙනුණා.

"හොඳයි, විශේෂයෙන්ම යාළුවෙක් ඉන්නවා කියන්න බැහැ." මැඩගත් සිනාවෙන් යුතුව නාසයෙන් හඬක් පිට කරමින් අයිරින් කිව්වා. "එයා ලෝකයේම ඉන්න අය එක්ක ටික ටික යාළුයි කියලා අපිට කියන්න පුළුවන් නේද?"

"අන්න, ඔයා ඒක හරියටම තේරෙන විදිහට කිව්වා." සිනා නොවීමට වෑයම් කරමින් ඩැරල් කිව්වා. "එයා මොරීන්ට හුඟක් කැමති වෙයි නේද?"

"එයා හුඟක් කැමති වෙයි." අතිමහත් ස්ථිර විශ්වාසයකින් යුතුව බෙලින්ඩා කිව්වා. "නැඟිටින්න මෙල්විස්, බලන්න නින්ද ගිහින් ඉද්දි ඔයා මොන තරම් ලස්සනද කියලා."

"නපුරි...!" මෙල්විස් කීවේ ඇය මුව විවර කරගෙන නිඳා සිටින ආකාරය හාස්‍යජනක ලෙස බෙලින්ඩා ඇඳ තිබූ චිත්‍රය දෙස බලාගෙනයි.

මොරීන් ද එම කාටූන් චිත්‍රයට එබී බැලුවා.

"මේක නම් චිත්‍ර අඳින්න තියෙන හොඳ හැකියාවක්." ඇ කිව්වා. "මටත් ලස්සනට අඳින්න පුළුවන්.. මැසිලි මැනර්වලදී මමත් හොඳ දක්ෂ කෙනෙක්. මම මගේ චිත්‍ර, වෙලාවක පෙන්වන්නම්කෝ බෙලින්ඩා. ඒවා හුඟක් දුරට ඔයාගේ ඒවා වගේමයි."

කෙටියෙන් යමක් සැර පරුෂ ලෙස කියා ඇයව නිහඬ කිරීමට බෙලින්ඩාට සිතුණ ද අයිරින් රවා බැලීම නිසා බෙලින්ඩා අපහසුවෙන් ප්‍රියජනක ස්වරයක් ආරූඪ කර ගත්තා. මොරීන්ට කිසිම ැක සංකාවක් ඇනුණේ නැහැ.

"ඔයාට හොඳට සිංදු කියන්න පුළුවන් ඇති නේද? අනික කවි යන්නත් පුළුවන් ඇති."

"ඕ, මට ගායනා පුළුවන්." සියලු දෙනාගේ අවධානය ලැබීමෙන් තුටට පත් මොරීන් කිව්වා. "ඔව්, මැසිලි මැනර්වලදී මට විශේෂ න්තියක් තිබුණා. සංගීත මාස්ටර් කිව්වා මට තියෙන්නේ හරිම අමුතු ටහඬක් කියලා. තව මම හදපු සිංදු කීපයකුත් තියෙනවා. අනේ, නේ... ඔයාලා මා ගැන ඔහොම විස්තර අහන්න එපා...!"

ඇ සුපුරුදු මෝඩ සිනා හඬක් නැගුවා. සෑම කෙනෙකුටම ශ්‍යව තිබුණේ හඬ නගා සිනාසීමටයි. කෙනෙක් කෙසේ නම් වැනි ලෙස අඥාන වෙනවාද?

"හුඟක් ගැහැනු ළමයි හිටියාද ඔයාලගේ ඉස්කෝලේ?" සැලී සුවේ මොරීන් වැනි කෙනෙකු බිහි කළ හැක්කේ කුමන ආකාරයේ සලකින් ද යන්න කල්පනා කරමින්.

"අපොයි, නැහැ. ඒකට ගන්නේ හුඟක් හොයලා බලලා ර්රලා." මොරීන් කිව්වා. "හොඳම ළමයි විතරයි ගන්නේ."

"මේ හැම දෙයක්ම ග්වෙන් එක්ක කියන්න ඔයාට සිද්ධ නවා." ඇලිසියා උනන්දුවෙන් කිව්වා. "එහෙම නේද, ළමයි? ව්න් හුඟක් ආසාවෙන් අහගෙන ඉඳියි. අපේ ගොන්ඩොලිනුයි, රීන් වගේ කෙනෙකුයි හරිම හොඳ යාළුවෝ වෙයි කියලා ඔයාලට න්නේ නැද්ද? මම කියන්නේ එයා නම්, ආ..., ඔව්, අපිට වඩා දට හැඳුන කෙනෙක්. ඒ හින්දා මෙයා නම් අපේ ග්වෙන්ට ටම ගැලපෙනවා.

තමා ගැන කෙරෙන මෙම ප්‍රකාශන ගැන මොරීන්ට විශ්වාස කරන්න අපහසු වුණා. ඇය තරමක සැකයකින් ඔවුන් දෙස බැලුව ද ඔවුන්ගේ මුහුණුවල තිබුණේ ඍජු හා අවංක බවක්. හැමෝම ඇය දෙස එක එල්ලයේ බලා සිටියා. අයිරින්ට මුහුණ ඉවතට හරවා ගැනීමට අවශ්‍ය වුණා. තදකර ගත් සිනාවක් ඇගේ නාසයෙන් පිටතට පැනීමට ආසන්නව තිබුණා.

"ග්වේන්ට හරිම පාළුවක් දැනෙනවා එයා ගෙදර ඉඳලා ආපු මුල් දවසේ" ඇලිසියා නොනවත්වා කිව්වා. "අන්න එතකොට තමා එයාට කතා කරන්න ඕනෑ මොරීන්. අපිත් එයාට ඔයා ගැන කියන්නම්. ඔයාලට ලේසියෙන්ම යාළුවෝ වෙන්න පුලුවන්.

"ඔයාලට හුඟක් ස්තුතියි."මොරීන් කිව්වේ තමා පිළිබඳව කෙරෙන මෙම අනර්ඝ ඇගයීමේ සතුටින් නැහැවෙමිනුයි. "මම ඇත්තටම හිතන්නේ මැසිලි මැනර්වල ළමයින්ට වඩා ඔයාලා හුඟක් හොඳයි කියලයි."

තද කර ගත් සිනාව නාසයෙන් පිටවීමට ගිය ද අයිරින් එය කැස්සකට හරවා කිවිසුමක් පිට කළා.

07

**තේ** වේලාවට මඳකට පෙර මෝටර් රථයෙන් ගොන්ඩොලින් පැමිණියා. එම ආරංචිය පාසල පුරා වේගයෙන් ඉගිලුණා.

ආපසු ඒමට ලැබීම ගැන ගොන්ඩොලින් ඇඩි ලෙස සතුටට පත් වුණා. ඇත්තෙන්ම ගෙදර සිට සියලු දේ සඳහා අතට පයට වැඩ කර දෙන මව හා ආයා වන වින්ටර් මහත්මිය සමග ගෙදර විසීම හා ඔවුන් සමග සුළු සුළු දේ සඳහා දබර කර ගනිමින් කාලය ගත කිරීම ඉතා අපූරු දෙයක් වුව ද පාසලේ කාලය ගත කිරීම මහත් විනෝදයක් වුණා. මේ වාරයේදී සෑම දෙයක්ම සිහි කල්පනාවෙන් යුතුව උනන්දුවෙන් කිරීමට ඇය සිතට ගත්තා. එහෙයින් ඈ ඉතා මිත්‍රශීලී ලෙස සිනාමුසුව වටයක් කැරකී බැලුවා.

"හලෝ, ආයුබෝවන් හැමෝටම...! ආපහු ආවේ හරි සතුටින්. ඉතින් ඔයාලා මට හැමදෙයක්ම කියන්න ඕනෑ. ඊයේ තමයි මම ප්‍රංශයේ ඉඳලා ආපහු ආවේ."

"අහා... අපේ ප්‍රංශය...!" මම්සලී කතාවට මැදිහත් වුණා. "අපිට දැන් පපුවට එකඟව කතා කරන්න පුළුවන්, අපේ ප්‍රංශය ගැන."

ග්වේන් පුදුමයෙන් බැලුවා.

"ඕහ්...! පපුවට එකඟව නෙවෙයි මම්සලී. ඔයා කියන්නේ හිතට එකඟව නේද? ඔව්, ඒක නම් හරිම අපූරුයි."

"ගොන්ඩොලින්, අපි එක්ක අලුත් ළමයෙක් ඉන්නවා." ඇලිසියා ...ැක මුසු ස්වරයකින් කිව්වා. "මම එයාව ඔයාට හඳුන්වලා දෙන්නම්. ඔයා ...යාට හුඟක් කැමති වෙයි. මේ ඉන්නේ මොරීන්. මෙයා ගොන්ඩොලින් ...මරී. මේ දෙන්නාම ටිකක් එක වගේ නේද, මම්සලී?"

"ඇත්තමයි." මම්සලී එකඟ වුණා. "ඔව්, ඒක ඇත්ත තමා. ...දන්නම රන්වන් පාට. ලොකු නිල් ඇස්. අහා... ඔව්, මේ ළමයි ...දන්නම හරිම ලස්සනයි...!"

මෙය ග්වේන් හා මොරීන් දෙදෙනාටම මහත් හරසර දැක්වීමක් වූ අතර දෙදෙනා ඇඩී උනන්දුවෙන් එකිනෙකා දෙස බලා ගත්තා. අතට අත දී ගත් දෙදෙනා මඳ සිනා පෑවා.

"මම ඔයාට තැනක් තියා ගත්තා." ඇස් ලොකු කර ගෙන ග්වේන් දෙස බලන අතරම මොරීන් ලැජ්ජාවෙන් කිව්වා.

වාඩි වූ ග්වේන් තේ සඳහා ඇත්තේ මොනවා දැයි බැලුවා. දීර්ඝ මෝටර් රථ ගමනින් පසු ඇයට කුසගිනි වී තිබුණා.

"මගෙන් මී පැණි ටිකක් ගන්න." මොරීන් උනන්දුවෙන් කිව්වා. "දන්නවාද, අපි මී මැස්සෝ ඇති කරනවා. ඉතින් අපිට හුඟක් මී පැණි තියෙනවා. අපි කුකුල්ලුත් හදනවා. ඉතින් අපිට හුඟක් බිත්තරත් තියෙනවා. මම ටිකක් අරගෙන ආවා. මම හිතනවා ඔයා කැමති වෙයි මගෙත් එක්ක බෙදා ගන්න."

ගොන්ඩොලින් බොහෝ දුරට එයට මනාප වුණා. අපොයි, මේ දැන් පැමිණියා වුව ද ඈ අලුත් දැරියට තමාගේ තරම පෙන්විය යුතුයි...!

"අනිත් අය මට ඔයා ගැන හුඟක් දේවල් කිව්වා." මොරීන් ඉක්මනින් කිව්වා. "ඔයා මොන තරම් ජනප්‍රිය ද?"

ගොන්ඩොලින්ට එහි එතරම් සත්‍යයක් ඇති බව හැඟුණේ නැහැ. තමා එතරම් ජනප්‍රිය බවක් ඈ මින් පෙර අසා තිබුණේ නැහැ. ඇත්තෙන්ම ඇය අවංකවම පිළිගැනීමට අකමැති වුව ද පන්තියේ සිටින සියලු දැරියන්ගෙන් අඩුම ජනප්‍රිය කෙනා තමා බව ඈ දැන සිටියා.

මොරීන් මහත් සතුටින් කියවන්නට වූ අතර ගොන්ඩොලින් සවන් දුන්න ද ඇගේ සිත වාරයේ ඉදිරිය ගැන යුහුසුළුව සිතන්නට වුණා.

"අද හවස පහ හමාරට අපේ කමිටු රැස්වීම තියෙනවා." මොරියා නිවේදනය කළා. "හොඳම වෙලාව ඒකයි. ඔයත් එනවද, ගොන්ඩොලින්? නත්තල් ප්‍රසංග කමිටුව ගැන ඔයාට ආරංචිද?"

ගොන්ඩොලින් ඒ ගැන අසා නොතිබුණ නිසා සියලු විස්තර ඇයට සම්පූර්ණයෙන්ම ලැබුණා. ඈ මහත් සොම්නසට පත් වුණා.

හදිසියේම තමා ද තෝරා ගන්නා නාට්‍යයක හෝ ගීත නාටකයක ප්‍රධාන චරිතයක් බව ඇයට හැඟුණා.

මෙම අදහසම මොරීන්ගේ සිත හරහා ද ඇදී යමින් තිබුණා. ඇය ද ප්‍රධාන චරිතයක් රඟ පෑමට බලාපොරොත්තු වුණා. ඇය ද තම රන්වන් කෙස් කළඹ මුදා ගෙන රඟපානු ඇත. තමාගේ මෙම අදහස රහසේම ගොන්ඩොලින්ට පමණක් පැවසීමට ඈ කැමති වුණා.

"මම හිටපු ඉස්කෝලයේ අපි ගීත නාටකයක් කළා." මොරීන් කිව්වා. " ඒක 'නිඳි කුමාරි'. මම කොණ්ඩය කඩාගෙන රඟපෑවෙ. ඒ චරිතය රඟපාන්න ඕනෑ රන්වන් කොණ්ඩයක් තියෙන කෙනෙක් කියලා ඔයා දන්නවා නේද?"

මහත් ඕනෑකමින් ග්වේන් එකඟතාවය පළ කළා. තම රන්වන් කෙස් කළඹ ගැන ආඩම්බරයෙන් සිටි ග්වේන්, නිවසේ මෙන් පාසලේදී ද කෙස් කළඹ කඩා ගෙල වටා ඉහිරවා ගෙන සිටීමට අවසර ඇති නම් කොතරම් අපූරු දැයි සිතුවා.

"කුමාරයා තමයි ලස්සනම." මොරීන් නොනවත්වාම කියෙව්වා. "මම ඒ නාට්‍යය ගැන ඔයාට කියන්නම්. ඔයා නාට්‍ය ගැන හරිම උනන්දුයි නේද? හරි...."

නාටකය හා ඒ අතරතුර තම පරණ පාසලේ සිදුවීම් ගැන දීර්ඝ මෙන්ම නිරස විස්තර රාශියක් කීමට මොරීන්ට තිබුණා. මොරීන්ගේ මෙම හැල්ල නැවැත්වීමට හෝ ඇගෙන් ගැලවී යාමට ග්වේන්ට ඉඩක් තිබුණේ නැහැ. දැරියන්ගේ උසුළු විසුළු තේරුම් ගැනීමට නොහැකි තරමට ග්වේන් මෙන්ම මොරීන් ද හැඟීම් දැනීම් තොර අඥාන අය වුණා.

"අන්තිමට, ග්වේන්ට හරි යන කෙනා හම්බ වුණා." ඩැරල් සැලීට කිව්වා. "මේ... අර බලන්න. විල් - ක්ලැරිසා එක්ක අශ්වයො පදින ඇඳුම් ඇඳගෙන. තව විනාඩි දහයකින් තියෙන කම්වු රුස්වීම ගැන එයාලා දන්නේ නැද්ද?"

"හේයි, ඔය දෙන්නා, කොහේද මේ යන්න හිතාගෙන ඉන්නේ?" සැලී ඔවුන්ට කතා කළා.

"තන්ඩර්වයි, මෙරිලෙග්වයි බලලා එන්න." විල් කිව්වා.

"ඒත්, ඔයාලා දන්නෙ නැද්ද මේ දැන්ම අපිට කම්ටු රැස්වීමක් තියෙනවා කියලා?" ඩැරල් මඳක් කෝපයෙන් ඇසුවා.

"නැහැ. කවුරුත් අපිට කිව්වෙ නැහැ." විමතියක් පළ කරමින් ක්ලැරිසා කිව්වා. "එහෙම දෙයක් දැන්වීම් පුවරුවේ අලා තිබුණේ නැහැ."

"හරි, මේ තේ වේලාව ඉවර වෙනතුරු, රන්වත් කොණ්ඩෙ ගැන කතා කරපු ග්වේනුයි, මොරීනුයි හැරුණම අපි හැමෝම කතා කළේ මේ ගැන විතරයි. ඔයාලා අහගෙන හිටියෙ මොනවද?" ඩැරල් ඇසුවා. "ඇත්තටම අනිත් හැමෝම කියන දේවල් ටිකක් වත් ඔයාලට ඇහුණේ නැතිද?"

"වචනයක්වත් ඇහුණේ නැහැ." විල් බැරෑරුම් ලෙස කිව්වා. "මට ඒ ගැන කනගාටුයි. අපි ඉක්මනින්ම එනවා. අපිට තන්ඩර්වයි, මෙරිලෙග්වයි බලලා එන්න වෙලාව තියෙනවා නේද? අපි වෙන මොනව හරි කතා කර කර ඉන්න ඇති. ඒ නිසා අපිට ඔයාල කතා කරපු කිසිම දෙයක් ඇහුණේ නැහැ."

"ඔයාලා අශ්වයෝ වගේ කතා කර කර ඉන්න ඇති." සැලී කිව්වා. "මට පෙනෙන්නේ ආයෙත් අශ්වයෝ ඔයාලගේ ඔළුවලට රිංගලා වගේ. එපා, දැන් ඉස්තාලයට යන්න එපා. ඔයාලා ගියොත් කම්ටු රැස්වීම ඉවර වෙනතුරු ආපසු එන්නේ නැහැ. ඔයාලා ඉස්තාලයට රිංගුවාට පස්සේ වෙන්නේ මොකක්ද කියලා මම දන්නවා. ගියොත් ගියාමයි."

"එන්න." සැලී ඩැරල්ට කිව්වා. "අපි අනිත් අයව එකතු කරගෙන එමු. අපි ඉක්මනට මේ රැස්වීම තියාගන්න ඕනෑ."

# 08

ඊහ පන්තියේ සියලුම දෙනා උතුරු කුලුනේ පොදු කාමරයට එක් රැස් වුණා. දැරියෝ පුටු, බංකු හා ගෙබිම් බුමුතුරුණු මත වාඩි වුණා. ඔවුන් කතා කරන්නටත්, කෑ ගසන්නටත්, සිනාවෙන්නටත් වුණා. ඇතුළට පැමිණි මොරියා කෙළින්ම මේසය වෙතට ගියා. එය පිටුපස ලොකු පුටුවක් තබා තිබුණා.

මොරියා පොතකින් මේසයට තට්ටු කළා.



"නිශ්ශබ්ද වෙන්න...!" ඈ කිව්වා. "රැස්වීම ආරම්භ කරන්නයි යන්නේ. ඔයාලා හැමෝම දන්නවා මේ මොකක් ගැන ද කියලා. නත්තල් ප්‍රසංගය සංවිධානය කරන්න කමිටුවක් පත් කර ගන්නයි අපි සූදානම් වෙන්නේ. මේ කරන්න සිද්ධ වෙන්නේ පහේ පන්තියේ අයටයි."

"මේ අහන්න, මේ..." කටහඬක් නැගුණා.

ඒත් ඒ ගැන තැකීමක් නොකළ මොරියා දිගටම කතා කළා.

"මම හිතන්නේ මුළු පන්තියම එකතු වෙලා එදාට අපි කරන්න ඕනෑ මොන වගේ ප්‍රසංගයක් ද කියලා සාකච්ඡා කරන එක හොඳයි." ඈ කිව්වා.

"රූකඩ සංදර්ශනයක්." යමෙක් කෑ ගැසුවා.

"විකාර කතා කරන්න එපා." මොරියා කිව්වා. "දැන්, මුලින්ම අපි කමිටුව පත් කර ගන්න වැඩේට බහිමු. මම කැතරින්ට කිව්වා කුඩා කොළ කැබලි ටිකක් කපන්න කියලා. ඒවා කොහේද කැතරින්?"

මොරියා තමාට පසෙකින් වාඩි වී සිටි කැතරින් වෙත හැරුණා. කැතරින් ඇයට කුඩා කොළ කැබලි මිටියක් දුන්නා.

"මෙන්න තියෙනවා. ඔයා කියපු හැටියේම ඉක්මනින් ඕනෑ නිසා මම ඒවා ලෑස්ති කළා. මෙන්න පෙට්ටියක් තියෙනවා. පහේ පන්ති කාමරයේ කබඩ් එකකින් මම ඒක හොයා ගත්තා. හැම කෙනෙකුටම ඕනෑ වෙන හින්දා මම පැන්සල් කොට ටිකකුත් හොයා ගත්තා. ඇතිවෙයි. මේ බලන්න..."

"හරි... හරි...." මොරියා කිව්වා. "මේ ටික තමයි දැනට අපිට ඕනෑ වෙන්නේ. දැන් කවුද මේ තුණ්ඩු කෑලි බෙදලා දෙන්නේ? ඔයා, මේරි ලෝව්?"

මේරි ලෝව් කුඩා කබඩයක් උඩ වාඩි වී දෙකකුල් පද්දමින් සිටියා. ඈ ඉන් බැසීමට සූදානම් වුණා.

"නැහැ, නැහැ... ඔයා කරදර වෙන්න එපා, මේරි ලෝව්." එක්වරම කැතරින් කිව්වා.

"මම ඒවා බෙදලා දෙන්නම්." කී ඈ කිසිවෙක් ඇයව නැවැත්වීමට පෙර කාමරය වටා යමින් සෑම කෙනෙකුටම තුණ්ඩු කැබැල්ලක් හා පැන්සලක් බෙදා දෙන්නට පටන් ගත්තා.

"හැම කෙනෙකුටම තුණ්ඩු කෑල්ලක් ලැබුණාද?" මොරියා ඇහුවා. "අන්න... මෙල්විස්ට එකක් ලැබිලා නැහැ කැතරින්."

"ඔ... කනගාටුයි. මට ඔයාව මඟ හැරුණා." කැතරින් සමාව අයදින ස්වරයෙන් කිව්වා. "මෙන්න ඔයාටත් එකක්."

"දැන්..." මොරියා කතා කළා. "මට හිතෙන්නේ අපිට මේ කමිටුවට අට දෙනෙක් ඕනෑ. ඒ මොකද, වැඩ රාශියක් කරන්න තියෙනවා. මම උදාහරණයකට කියනවා නම්, අපිට චිත්‍රවලින් සැරසිලි පැත්තට කෙනෙක් ඕනෑ. සංගීතය පැත්තට කෙනෙක්, ඔන්න ඔය විදිහට. මම පන්ති නායිකාව නිසා, මම කමිටුවට ඉන්නවා. ඒ නිසා ඔයාලා මට ඡන්දය දෙන්න අවශ්‍ය නැහැ. එතකොට ඔයාලට සිද්ධ වෙන්නේ කැමති නම් හතක් තුණ්ඩුවල ලියන්නයි."

"හොඳයි. මොරියාට ඡන්දය දෙන්න ඕනෑ නැති කතාවක් මම දැනගෙන හිටියේ නැහැ." අයිරින් කෙඳිරිලි ස්වරයෙන් ඇලිසියාට කිව්වා. "එයාගේ හරිම ලොකුකමක් තියෙන්නේ. දකින දකින තැනදි අපිට සිද්ධ වෙන්නේ එයාට ඔළුව පහත් කරන්න...!"

සෑම කෙනෙක්ම ඉක්මනින් නම් ලියන්නට පටන් ගත්තා. මොරීන් දැන සිටියේ නම් කිහිපයක් නිසා ඇය කිසිවක් කර කියාගත නොහැකිව වටපිට බැලුවා. ගොන්ඩොලින් වහා ඇගේ උදව්වට ඉදිරිපත් වූ අතර මොරියා හදිසියේම එය දුටුවා.

"ගොන්ඩොලින්...! මොරීන්ට ලියන්න නම් කියන්න එපා. ඒකෙන් එක ඡන්දයක් එන්න ඕනෑ ඔයාට ඡන්ද දෙකක් වැටෙනවා. මොරීන් අලුත් කෙනෙක් කියලා මට අමතක වුණා. දැනට අපිට එයාව අත හරින්න සිද්ධ වෙනවා."

නම් ලියූ කොළ කෑබලි කැතරින් පන්තිය වටා ගෙන ගිය පෙට්ටියට දමනු ලැබුවා. ඉන්පසු අනෙක් දැරියන් කතාවට වැටුණ අතරේ මොරියා සහ කැතරින් තුණ්ඩු කෑබලි දිග හැර නම් ඉදිරියේ හරි ලකුණ යොදා ඒවා ගණන් කරන්නට පටන් ගත්තා. මේසයට තට්ටු කළ මොරියා කතා කළා.

"නිශ්ශබ්ද වෙන්න....! දැන් අපිට ප්‍රතිඵල ලැබිලා තියෙනවා. මෙන්න, වැඩිම ඡන්ද ලබාගත් ළමයි; ඇලිසියා, මෙල්විස්, අයිරින්, බෙලින්ඩා, ඩැරල්, ජෙනට් ඒ වගේම බෙටියි, සැලියි සම සමයි."

බෙටී හා ජෙනට් පහ පන්තියේ සිටිය ද වෙනත් කුලුනුවල සිටි දැරියන්ය. බෙටී ඇලිසියාගේ හොඳම යෙහෙළිය වූ අතර ඇය ද ඇලිසියා මෙන්ම දක්ෂ, මුබරි මෙන්ම ජනප්‍රිය දැරියක් වුණා.

"හොඳයි, එහෙමනම්..." මොරියා කතා කළා. "බෙට්යි, සැලියි සම සම නිසා අට දෙනෙක් වෙනුවට, මේ දෙන්නාම ඇතුළත්ව අපි නව දෙනෙකුගේ කමිටුවක් හදමු."

"මම සංගීත අංශය බලා ගන්නම්." අයිරින් කිව්වා.

"මම චිත්‍ර සැරසිලි පැත්ත ගන්න කැමතියි. අඳින්න තියෙන දේවල්." බෙලින්ඩා කිව්වා.

"මමත් ලස්සනට අඳිනවා." මොරීන් ග්වේන්ට කොඳුරා කිව්වා. "මට ඒකට උදව් කරන්න පුළුවන්. මම ඒක කියන්නද?"

"එපා." කිසිවක් ඇඳීමට නොහැකි ගොන්ඩොලින් අලුත් දැරිය කැපී පෙනෙන වැඩක් කරනු දැකීමට අකමැතිව කිව්වා.

"මම ඇඳුම් ගැන බලාගන්නම්." මැහුම් වැඩට ඉතා දක්ෂ, තම ඇඳුම් තමාම පිළියෙළ කර ගන්නා ජෙනට් ඉදිරිපත් වුණා.

"බොහොම හොඳයි." එය අනුමත කරමින් මොරියා කිව්වා.

"මට පුළුවන් ද? ඔයාලා හිතනවාද ගායනා තියෙනවා නම් මට ඒක කරන්න පුළුවන් කියලා?" මෙල්විස් පැකිළෙමින් ඇසුවා. "මට බලෙන් මොකවත් ගන්න අවශ්‍ය නැහැ. ඒත් ගායනා තියෙනවා නම්, දන්නවානේ අත්වැල් ගායනා වගේ දේවල්. මට පුහුණුවීම් කරන්නත් පුළුවන්. මටත් හුඟක් ගායනා පුහුණු පාඩම් තිබුණ නිසා මට පුළුවන් වෙයි ඒ පැත්තෙන් උදව් කරන්න."

"හරි, ඒක හොඳ අදහසක්." මොරියා කිව්වා.

"ඒ වගේම තනි ගායනාවක් තියෙනවා නම් ඔයාට ඒක තනියම කරන්න පුළුවන්." ඩැරල් කිව්වා. "දැන් ඔයාගේ කටහඬ හුඟක් ලස්සනයි."

මෙල්විස් සතුටින් රතු වුණා.

"ඕ... හොඳයි, මම කරන්නම්. සමහරවිට නොතියෙන්නත් පුළුවන්නෙ." ඈ කිව්වා. "අපි කරන දේවලට අනුව තමයි ගායනා ගැන හිතන්න වෙන්නේ, නේද?"

"එතකොට අනිත් සාමාන්‍ය දේවල් කරන්න ඉතුරු වෙන ඇලිසියා, මම, ඩැරල්, සැලී - සංවිධාන කටයුතු." රැස්වීමක් මෙහෙය වීමේ හැකියාවත්, වැඩ සැලසුම් කිරීමේ හැකියාවත් ඇති මොරියා කිව්වා. "අපි වැඩ කරන්න ඕනෑ එකමුතු වෙලා, කාර්යක්ෂමව වගේම මිත්‍රශීලීවයි."

කතා කරන අතරම ඈ කෝපය මුසු හදිසි බැල්මක් ඇලිසියා වෙත හෙළුවා. එම හදිසි බැල්මත් සමග ඇගේ දෑසේ වූ දිලිසුම දැක ගැනීමට ඇලිසියා සමත් වුණා. 'මිත්‍රශීලී' යන වචනය එල්ල කළේ ඇයට බව ඈ දැන සිටියා.

"හොඳයි, දැන් අපි කමිටු සාමාජිකයින් තෝරා ගෙන තියෙන නිසා, අපි ඊළඟ දෙය පටන් ගනිමු." මොරියා කිව්වා. "මොන වගේ ප්‍රසංගයක් ද අපි කරන්න යන්නේ?"

"ගීත නාටකයක්...!"

"නැහැ, නාට්‍යයක්. විහිළු නාට්‍යයක්. මම දන්නවා හොඳ නාට්‍යයක්."

"විවිධ ප්‍රසංගයක්...!"

"බැලේ එකක්...! ඕ.. අපි බැලේ එකක් කරමු...!"

අවසාන යෝජනාව පැමිණියේ ලස්සනට බැලේ නැටීමට හැකි දැරියකගෙනි.

"නැහැ... නැහැ... ඒක එක පැත්තකට ඇදීමක්. අපි හැමෝටම නටන්න බැහැ."

"හොඳයි, එහෙනම් මුද්‍රා නාට්‍යයක් තමයි හොඳ." මොරියා කිව්වා.

"එතකොට අපිට සින්දු, නැටුම්, රඟපෑම්, වේදිකා සැරසිලි වගේ හැමදෙයක්ම තියෙනවා. මුද්‍රා නාට්‍ය කතාවටම සීමා වෙන්නේ නැහැ. ඒක වෙනස් කර කර කරන්න පුළුවන්."

තවත් කෑ ගැසීම් සහිත සාකච්ඡාවලට පසුව මුද්‍රා නාට්‍යයක් කිරීමට තීරණය වූ අතර කුමන හේතුවක් නිසා හෝ අනෙක් මුද්‍රා නාට්‍යවලට වඩා සින්ඩෙරෙල්ලා නාට්‍යයට වැඩි කැමැත්තක් පළ වුණා.

ග්වේන් සහ මොරීන් හදිසියේම තමන් සින්ඩෙරෙල්ලා ලෙස කෙස් කළඹ විහිදා ගෙන සිටින අයුරු සිතේ මවා ගත් අතර තමා එම චරිතයට සම්පූර්ණ ලෙස ගැළපෙන බව සිතුවා. මොරීන්, ග්වේන් වෙතට හැරුණා.

"මගේ පරණ ඉස්කෝලයේදි මම එක සැරයක් සින්ඩෙරෙල්ලාගේ චරිතය කළා." ඈ කිව්වා. "මම ඒක හොඳට කළා. මම..."

ග්වේන් එවැනි දේවලට කිසිසේත් කැමති වුණේ නැහැ. මොරීන් පුහු ආඩම්බරකාරී, එපා වන සුලු කෙනෙකු බවට ඈ සිතන්නට පටන් ගත්තා. ඒ වන විට තමා කොතරම් අපූරුවට සින්ඩෙරෙල්ලාගේ චරිතයට ගැළපෙනවා දැයි කීමට ඈ සැරසී තිබුණා පමණයි. හාවෙකුගේ මුහුණක් සහිත මෝඩ, දුර්වල මොරීන් සුන්දර තරුණියකගේ චරිතයකට ඔබිනු ඇතැයි ඈ සිතුවේ නැහැ.

"එහෙමනම්, දැන් අපි සින්ඩෙරෙල්ලාගේ චරිතයට ගැළපෙන කෙනෙක් තෝර ගනිමු." මොරියා කිව්වා. "මුළු නාට්‍ය පිටපතම ලියන්නේ අපි. ඩැරල් ඔයා ලියන්න දක්ෂයි. ඔයාට පුළුවන් සැලසුමක් ඇතිව ඒක කරන්න."

ඩැරල් ඇඩි ලෙස විමතියට පත් බවක් පළ කළා.

"සම්පූර්ණ මුද්‍රා නාට්‍යය සැලසුමකට අනුව ලියන්න?" ඈ විමතියෙන් ඇසුවා. "ඕ.... පටන් ගන්නෙ කොහොමද කියලාවත් මට හිතාගන්න බැහැ."

"ඔයාට තියෙන්නේ පුස්තකාලයෙන් මුද්‍රා නාට්‍ය පිටපතක් දෙකක් අරගෙන කියවලා ලියන ක්‍රමය හොයා ගන්න." මොරියා කිව්වා. "ඔයාට සින්දු ලියන්න පුළුවන් නේද? අපිට ලස්සන සිංදු ටිකක් ඕනෑ."

තමා කමිටු සාමාජිකාවක් නොවුණා නම් හොඳ යැයි ඩැරල්ට සිතුණා. දැන් මෙය සැබෑ ලෙසම දුෂ්කර කාර්යයක් ලෙස පෙනුණා. ඇය සිතා සිටියේ මෙය සුව පහසුව කාලය ගෙවා දැමිය හැකි වාරයක් ලෙසයි. එම යෝජනාවට විරෝධය ප්‍රකාශ කිරීමට ඇය මුව විවර කිරීමට පෙර මොරියා එය සම්මත කර අවසාන කර තිබුණා. ඒ වන විට මොරියා කතා කරමින් සිටියේ අයිරින්ටයි.

"අපිට ගීතවල පද රචනය ලැබුණ වහාම ඔයාට පුළුවන්ද ඒවාට

තනු අල දෙන්න? එහෙම නැතිනම් ඔයා කැමති ද මුලින් තනු හද දීලා, ඒවට ගැළපෙන්න වචන ලියලා දෙනවට?"

"ඔයා එහෙම අහපු එකට ස්තුතියි. ඒත් මම මට හිතෙන විදිහට කරන්නම්." අයිරින් ඉතා විනීතව කීව ද, 'ඔයා පැත්තකට වෙලා ඉන්න' යන අදහස ඇගේ ස්වරයේ ගැබ්ව තිබුණ අතර ඇ එය පැහැදිලි කර කිව්වා.

"මම කැමති මට ඕනෑ විදිහට කරන්න." කී ඇ මොරියා දෙස සෘජුව බැලුවා. "බය නැතිව ඒ ටික මට භාර දෙන්න. සංගීතය මගේ වැඩක්. කවදටත් මම ඉන්නේ සංගීතය එක්කමයි."

"ඔව්, ඒත් මට දැනගන්න ඕනෑ ඔයා වැඩේට හරියට සූදානම් ද කියන එකයි. මොන වගේ තනු ද යොදා ගන්නේ වගේ දේවල්." මොරියා නොඉවසිල්ලෙන් ඇසුවා. "ඒ වගේ දේවල් ස්ථිර වෙලා තියෙන්න ඕනෑ."

"මගේ වැඩවලදී ඒ වගේ ස්ථිර බවක් ගැන කියන්න බැහැ," අයිරින් කිව්වා. "මම රචනා කරන්න යන්නේ මොන වගේ තනු ද කියන එක, ඒවා මගේ ඔළුවට වැටෙන තුරු කියන්න බැහැ. එක පාරටම ඔළුවට එන තනුවක් තමයි අල්ල ගන්නේ. මමවත් දන්නෙ නැහැ, කොයි මොහොතේ තනුවක් මට ඇහෙන්න පටන් ගනීවි ද කියලා. ඒ නිසා මට කියන්න එපා හැමදාම උදේ දහයට එක තැනක තනුවක් ඇහෙන තුරු බලා ඉන්න කියලා...!"

නැවත වතාවක් ඇවිලෙන ගින්නට පිදුරු දමන්නට කැතරින් උත්සාහ කළා. ඇ එවැනි දේවල්වලට ප්‍රියතාවයක් දැක්වූවා.

"හොඳයි, කොහොම වුණත් ප්‍රවීණ කෙනෙක් එක්ක වැඩ කරද්දී එයාලට නීති රීති ගාවන්න බැහැ නේද?" ඇ කිව්වා. "මොරියාට එක තේරෙන්නේ නැහැ, අයිරින්."

"වැරදි දෙයක් මම කිව්වේ නැහැ." මොරියා කැතරින් දෙස රවා බලමින් කීව්වා. "ඔයා මොනවද මේ කියන්නේ? මට තේරෙන්නේ නැහැ. මම මේ වගේ ප්‍රසංග කරලා තියෙනවා. ගිය සැරේ ප්‍රසංගය කළේ මම නොවෙයිද? ඊට ඉස්සර අවුරුද්දෙත් කළේ මම නේද?"

කැතරින් උපාසක පෙනුමක් ආරූඪ කර ගත්තා.

"ඇත්තෙන්ම ඔව්, මොරියා. ඔයාට වැඩ ටික හරියට ඕනෑ. මම ඒකේ වැරැද්දක් කියන්නේ නැහැ. මම හිතන්නේ අයිරින්ට ඒක තේරේවි."

ඇය අයිරින්ට ඉතා ප්‍රියමනාප සිනාවක් පෑ අතර සියලු දෙනාට එය දැඩි අපහසුතාවයක් වුණා. කැතරින් ඇයි ඒ තරමට නිහතමානී බවක් පළ කරන්නේ?

රාත්‍රී ආහාරය සඳහා සීනුව නාද වූ හෙයින් රැස්වීම හදිසියේම අවසන් වුණා.

"අපොයි දෙවියනේ, කාලය ඉගිලී ගිහින් තියෙන හැටි." මොරීන් කිව්වා.

"දැන් ඉතින් අපිට ඉස්තාලයට යන්න කාලයක් නැහැ." විල් කලකිරීමෙන් මැවිසිලි නැගුවා.

"හෙට මේ වෙලාවටම අපි කමිටු රැස්වීමක් කැඳවනවා." තමා ගෙන ආ දේ රැස් කර ගනිමින් මොරියා කිව්වා. "තීරණයක් ගන්න බැරි වුණ දේවල් ඒ වෙලාවේදී කතා කරමු."

ඇය කාමරයෙන් පිට වූයේ ඉතා කාර්යක්ෂම ගුරුතුමියක් පන්ති කාමරයෙන් පිටව යන විලාසයකින්.

"අපොයි, දැන්නම් අපිට හුඟක් කට පරිස්සම් කර ගන්න වෙනවා." ඩැෆ්නි හාස්‍යජනක හඬක් අනුකරණය කරමින් කිව්වා. "අපි මොනවා කළාට ද මේ වාරයේදී අපිට මොරියා එක්ක ඉන්න සිද්ධ වුණේ?"

## ෧෭

සැබැවින්ම පළමු සතිය ගෙවුණේ ඉතා සෙමින්. ඊළඟ සතිය ඉක්මනින් ගෙවුණු අතර ඉන්පසු සති ඉගිලී යන්නට පටන් ගත්තා. ඒ කාලය තුළදී බොහෝ සැලසුම් කිරීම්, කාල සටහන් සැකසීම් හා පිළිවෙළ කිරීම් බොහොමයක් කරන්නට තිබුණා.

ඩැරල් ඇත්තෙන්ම අධික ලෙස කාර්ය බහුලව සිටියා. ඇයට නත්තල් ප්‍රසංගය සඳහා කමිටු රැස්වීම්වලට සහභාගි වන්නට සිදු වුණා. මුද්‍රා නාට්‍ය කිහිපයක පිටපත් කියවීමෙන් පසුව සින්ඩෙරෙල්ලා නාට්‍යය සඳහා පිටපත ලිවීමට ඇයට තමාගේම සැලසුමක් ගැන සිතීමට සිදු වුණා. මෙහිදී සැලී ඇයට මහත් උපකාරයක් වූ අතර තනිවම කරනවාට වඩා දෙදෙනෙකු එකතුව වැඩ කිරීම කොතරම් ඵලදායක දැයි ඇයට වැටහුණා.

තවද ඇය ක්‍රීඩා නායිකාව නිසා පහළ පන්ති සඳහා පුහුණු වීම් කාල සටහන් සැකසීමට හා ක්‍රීඩා ගුරුවරියන්ට උදව්වක් ලෙස කුඩා අය ක්‍රීඩා සඳහා පුහුණු කිරීම ද ඇයට භාර වී තිබුණා. ක්‍රීඩා ගුරුවරියන් පහළ පන්ති කණ්ඩායම් සැකසීමේදී ක්‍රීඩිකාවන් තෝරා ගැනීමට ඇගේ උපදෙස් ද ලබා ගත් හෙයින් සමහර දැරියන් තෝරා ගැනීමේදී තම අදහස් පිළිගැනීම නිසා ඇයට ඉතා ආඩම්බරයක් දැනුණේ තමා ද වැදගත් අයෙකු ලෙස ඇයට හැඟුණු නිසයි.

පහළ පන්තිවල දැරියන් ඇයට ඉතා ආදරය කළ අතර ඇගෙන් ප්‍රශංසනාත්මක වචනයක් දිනා ගැනීමට තරග වැදුණා. පහ පන්තියේ සිටින තම වැඩිමහල් සොහොයුරිය ගැන ෆෙලිසිටි ද බොහෝ ආඩම්බර වුණා.

"හැම කෙනෙක්ම ඔයා හුඟක් උසස් කෙනෙක් කියලා හිතනවා." ඈ ඩැරල්ට කිව්වා. "බලන්න එපායැ, එයාල පුහුණුවීම්වලට එන්න පොරකන හැටි. අමාරු දවස්වල කියලා ගාණක්වත් නැහැ...! මේ, මටත් දවසක තරග කණ්ඩායමකට එන්න පුළුවන් වෙයිද ඩැරල්? ඔයාට ඒක කියන්න පුළුවන්නේ."

"මට කියන්න පුළුවන්. ඇත් කරගෙන යන විදිහට ඔයා දිගටම ගියොත් ඔයා අනිවාර්යයෙන්ම තේරේවි." ඩැරල් කී විට ෆෙලිසිටි ප්‍රීතිමත් හඬක් නැගුවා.

අසලින් ගමන් කරමින් සිටි ජූන් මුහුණ ඇද කර ඇය දෙස බැලුවා. ඇය සමග යමින් සිටි අනෙක් දැරිය, ග්වේනිට කතා කළා.

"අන්න... ඒකට තමයි ඥාති සංග්‍රහය කියන්නේ. බලන්නකෝ, ඩැරල් වෙන ඕනැම කෙනෙකුට ඉස්සර එයාගේ නංගිව තරග කණ්ඩායමකට තෝරා ගනිවි."

මෙය කනට වැටුණ ඩැරල් වහා ජූන් පසු කර ගොස් නැවතුණා.

"ජූන්, ඔයා පහේ පන්තියේ ළමයෙකුට ඒ වගේ දෙයක් කියන්න තරම් බයක් නැහැ. ටිකක් ඉන්න."

පහ පන්තියේ දැරියන්ට ළඟ තබා ගැනීමට අවසර දී තිබුණ දඬුවම් පොත සාක්කුවෙන් ඇද ගත් ඩැරල් එහි යමක් ලිව්වා. ඒ අසලම ජූන්ගේ නම ලියූ ඈ එය ඉරා ජූන්ගේ අතට දුන්නා.

"මෙන්න.... ටිකක් අමාරු වැඩක් තියෙනවා ඔයාට ඉඳගෙන කරන්න. මේක ඔයාගේ හැකර කට වහගෙන ඉන්න හොඳ පාඩමක් වෙයි."

ජූන් බුම්මා ගෙන කොළ කැබැල්ල අතට ගත්තා. ඈ ඒ වෙත බැල්මක් හෙළුවා. ඩැරල් එහි ලියා තිබුණේ මෙයයි.

*"ශේක්ස්පියර්ගේ කවි තුනක් පාඩම් කරන්න. අඟහරුවාදාට පෙර මට හෝ පහ පන්තියේ කෙනෙකුට ඒවා පාඩම් දෙන්න."*

ජූන් ඔරවා බැලුවා.

"මට මේක කරන්න බැහැ." ඈ කිව්වා. "මේ සතියේ ඇලිසියාට පාඩම් දෙන්න දෙයකුත් තියෙනවා. මට මේ දෙකම කරන්න බැහැ."

"මම දන්නේ නැහැ. ඔයාට මේක කරන්නම වෙනවා." ඩැරල් කිව්වා. "මම හිතන්නේ ඔයා ආයෙත් ඇලිසියාට කපටි වැඩක් කරලා ඇති. ඔයා දැන්වත් හැදෙන්න ඉගෙන ගන්නේ නැති නම්, වැඩිමහලු අයට ගරු කරන්න දන්නේ නැති නම් ආයෙත් ඒකට කාලයක් නැහැ.

ඔයා මේ කවි තුන අඟහරුවාදාට ඉස්සර මට පාඩම් දෙන්න ඕනෑ..!"

ඩැරල් ෆෙසිලිටි සමග ඉවතට ගියා.

"ජූන් හරිම නරකයි." එක්වරම ෆෙසිලිටි කිව්වා. "සමහර වෙලාවට එයා හරිම විහිළු වැඩ කරනවා. ඒ නිසා මිසක් නැති නම් මම කවදාවත් එයා එක්ක කතා කරන්නේ නැහැ. ඒත් එයා හරි මෝඩ විහිළුත් කරනවා. එයා හෙට මම්සලී ඩූපොන්ට්ට විහිළුවක් කරන්නයි යන්නේ."

"ඒ මොකක්ද?" ඩැරල් උනන්දුවෙන් ඇසුවා. "අපේ මම්සලීට කරන්න තරම් තවත් විහිළු වැඩ ඉතිරි වෙලා තියෙනවා කියලා මට නම් හිතන්නවත් බැහැ."

"හරි, තියෙනවා. ජූන්ට කරන්න තවත් දේවල් තියෙනවා." ෆෙලිසිටි කිව්වා. "මම්සලීගේ මුහුණ දකිද්දී මට නම් කඳුළු පතිත තුරු හිනා යනවා."

"ඔව්, ඒක නම් ඇත්ත. මමත් බඩ අල්ලගෙන හිනාවෙලා තියෙනවා." ඩැරල් කිව්වා.

ඇයත්, ඇගේ පන්තියේ අයත් කර තිබූ විහිළු වැඩ ගැන ඇයට සිහි වුණා.

"හෙට ජූන් කරන්න යන්නේ මොකක්ද?"

"ම්... ඩැරල්..." ඒ ගැන සිතා සිහින් සිනා හඬක් නගමින් ෆෙසිලිටි කතා කළා. "එයා ළඟ තියෙනවා හුළං බැහැපු බැලුම් වගයක්. හරි... හතරක් තියෙනවා හොඳද. එකක් බ්ලවුස් එකේ ඉස්සරහිනුයි තව එකක් පස්සෙනුයි ඇතුළට දානවා. අනිත් දෙක සාය යටින් ඉස්සරහිනුයි පස්සෙනුයි තියා ගන්නවා."

ඩැරල් සිනාවක් නැගුවා.

"එහෙනම් ඇත්තටම ඒක අලුත් විජ්ජාවක්. ඉතින් කියන්න. මට හිතාගන්න පුළුවන් වගේ සිද්ධ වෙන දේ."

"ඉතින්, ජූන් අපිට ඒක පෙන්නුවා. බැලුම් හැම එකක්ම කුඩා බටයකින් සම්බන්ධ වෙනවා. ඒකට සම්බන්ධ කුඩා හුළං පොම්පයක් තියෙනවා. ඒක තද කරද්දී බැලුම් පිම්බෙනවා. අත හරිද්දී හුළං

බහිනවා. තද කරද්දි එයා පිම්බෙනවා. බලන්නකෝ... එක පාරට ඕනෑම කෙනෙක් බය වෙනවා. අයියෝ, මට හිනා ගිය තරම කියන්නේ, මම පුටුවෙන් විසි වුණා."

ඩැරල්ට ද සිනා පහළ වුණා.

"අපි පළමු පන්තියේ ඉන්න කාලෙදි අපිට ඒ වගේ දෙයක් ලැබුණා නම්...! ජූන් කොහෙන්ද ඒ වගේ දේවල් හොයා ගන්නේ? ඇලිසියාට නම් එයාගේ අයියලාගෙන් හම්බ වෙනවා."

"ඕ... විජ්ජා උපකරණ හදන සමාගමක දැන්වීම් පොතක් ජූන්ට හම්බ වෙලා තියෙනවා." ෆෙසිලිටි කිව්වා. "මට හිතෙන්නේ එයාට ලැබෙන හැම මුදලක්ම ඒවාට වියදම් කරනවා වගේ."

"ඒ වගේ විජ්ජා වැඩක් අපේ නාට්‍යයට එකතු කර ගන්න එක නරක නැහැ කියලා මට හිතෙනවා." කල්පනාබරව ඩැරල් කිව්වා. "ඇලිසියා විහිළු වැඩවලට හරිම දක්ෂයි. ඔව්, මම විජ්ජා වැඩක් නාට්‍යයට ඇතුළු කරනවා. ඒක ඇලිසියා කරයි. ඔයාට ඒ පොත ජූන්ගෙන් ඉල්ලා ගන්න පුළුවන් නම්, එයා ළඟ තියෙන තව මොනවා හරි කමක් නැහැ, මට ඒවා ගැන හොයල බලන්න හිතෙනවා."

"හරි, මම ඒවා ඔයාට ඕනෑ බවක් නොකියා ඉල්ලන්නම්." ෆෙලිසිටි කිව්වා. "අර කවි පාඩම් කරන්න දුන්නාට පස්සේ එයාට ඔයාව වහ කදුරු වගේ පෙනෙනවා ඇති. ජූන් අර විජ්ජාව කරන්න යන්නේ හෙට දොළහට ප්‍රංශ පාඩම වෙලාවට. ඩැරල්, ඒ වෙලාවට ඔයාට අපේ පන්තිය පැත්තේ එන්න බැරි වෙයි නේද? හොඳයි, මම්සලීට පණිවිඩයක් අරගෙන එන විදිහට ඇවිදින් ජූන් පිම්බෙන හැටි බලන්න බැරි වෙයිද? අපි කෑ ගහලා හිනාවෙන සද්දේ ඇහෙද්දි, එන්න ඕනෑ වෙලාව ඔයාට දැන ගන්න පුළුවන් වෙයි."

ඩැරල් කල්පනාවට වැටුණා. ඇය එම කාලච්ඡේදය වෙන් කරගෙන සිටියේ නාට්‍යයේ පිටපත සැලසුම් කර ගැනීමටයි. අදාළ චරිතයන් සැලසුම් කරන තුරු ඔවුන්ට ඒවා සඳහා රඟපාන අය තෝරා ගැනීමට නොහැකි නිසා එම වැඩය අවසන් කිරීම ඉතා වැදගත් වුණා. එහෙත් මම්සලීගේ හාස්‍යජනක මුහුණ දැක ගැනීමට ඇති අවස්ථාවක් ඈ කෙසේ නම් මඟ හරින්නද?

"හොඳයි, මට පුළුවන් වුණොත් මම එනවා." ඈ පොරොන්දු වුණා.

එහෙත් පසුදින දොළහ වන විට නැති වූ මේස් වගයක් සම්බන්ධව කතා කිරීමට ඩැරල්ව නේවාසිකාගාර පාලිකාව වෙතට කැඳවනු ලැබුවා. පාලිකාව මෙවැනි සිද්ධීන් ඉතා බරපතළ ලෙස සැලකූ හෙයින් ඩැරල්ට ඇගෙන් බේරී ඒමට විනාඩි විස්සක් ගත වුණා.

'පළමු පන්තියේ මොනවා සිද්ධ වෙලා ද දන්නේ නැහැ.' කුඩා දැරියන්ගේ දඟකාරකම් ගැන එතරම් උනන්දුවක් දැක්වීම ගැන වරදකාරී හැඟීමකින් යුතුව ඩැරල් සිතුවා. 'විජ්ජාව කරන්න පුළුවන් වුණා ද දන්නෙත් නැහැ.'

එය සිදුව තිබුණා. නිතරම සෑම ගුරුවරියකගේම අවධානය ලැබෙන පරිදි පළමු පෙළේ වාඩි වී සිටීමට සිදුව තිබූ ජූන් ඇත්තෙන්ම සාර්ථක ලෙස පිම්බී තිබුණා. ඇය එය කළේ ක්‍රම ක්‍රමයෙන්. අසා ලිවීමේ අභ්‍යාසයක් කරමින් සිටි මම්සලී නිතර නිතර ජූන් නිසියාකාරව වැඩ කරනවා ඇයි බැලූ මුත් මුලදී ඇය කිසිම වෙනසක් දුටුවේ නැහැ.

කෙසේ වෙතත් ටික වේලාවක් ගත වන විට ජූන්ගේ තරමක ඉදිමීමක් ඇයට දැක ගැනීමට හැකි වුණා. මම්සලී ඒ ගැන කල්පනා කළා.

'මේ ළමයා - ජූන්. එයා මහත් වෙලා. ටිකක් මහත් වෙන එකත් හොඳයි. එයාගේ දඟකාරකම වැඩියි. හරි අමාරුකාර කෙල්ලක්. ඇත්තටම, ඒ මොකද? මහත කෙල්ලො ඒ තරම් දඟ නැහැ. මේක හොඳ දෙයක්.'

නැවත වතාවක් ජූන් දෙස බැල්මක් හෙළූ ඇ කම්පනයට පත් වුණා.

'අපොයි, මේ කෙල්ල ඇත්තටම ඉදිමිලා...!' ඇ නෙත් පිය නොසලා ජූන් දෙස බලා සිටියා.

තම මුහුණු වෙනස් නොකර, සිනා නොවී සිටීමට අපහසු වූ දැරියෝ කීප දෙනෙකුට සිනාව පිට කර ගැනීමට මහත් ආශාවක් ඇති වුණා. සිනාව තද කරගෙන සිටීම මහත් වේදනාවක් වුණා.

ජූන් ලිවීමේ කටයුත්ත වෙනසකින් තොරව කරගෙන ගියා.

"ජූන්...!" මම්සලී කතා කළා. "ඔයා හුස්ම ඉහළට ඇදගෙන ඉන්නෙ ඇයි?"

ජූන් අහිංසක ලෙස සිනාවක් පෑවා.

"මම හුස්ම ඉහළට ඇදගෙන ඉන්නවාද?" මහත් කරගත් දෙනෙතින් යුතුව ඈ ඇසුවා. "නැහැ, ඒ ඇයි? ඒත් එහෙම කරන්න කියලා කියනවා නම් මම හුස්ම ඉහළටම ඇදගෙන ඉන්නම්. මට හුඟක් වෙලාවක් හුස්ම අල්ලා ගෙන ඉන්න පුළුවන්."

තදින් හුස්මක් පිට කළ ඈ හුස්ම තද කර තියා ගත්තා. පිම්බෙන ක්‍රියාව ඉතා අපූරු ලෙස සිදු වූ අතර බලාගෙන සිටින අතරේදී ඇය ඉදිමෙන්නට වුණා. මම්සලී මවිතව දෑස නොසොල්වා බලා සිටියා.

"එපා... එපා.... හුස්ම ආපහු දාන්න, ජූන්. ඔයා පිපිරෙයි. මේ මොකද ඔයාට වෙන්නේ?"

ජූන් හුස්ම පිට කරන හඬ කාටත් ඇසෙන පරිදි හඬ නගා කරන අතරම බැලුම්වල හුළං පිට වෙන්නට ද සැලසුවා. ඇගේ හුළං බැස්සේ හරියටම ඇය හුස්ම පිට කළ නිසා ඇගේ පිම්බුන බව නැතිව ගියාක් වාගෙයි. ඇය නැවත ඇගේ ස්වභාවික ප්‍රමාණයට එනු දැක මම්සලීට මහත් සහනයක් දැනුණා.

"ඒ විදිහට හුස්ම අල්ලා ගෙන ඉන්න එක මට හරි විනෝදයක්." ජූන් ඉදිරියේදීත් හුස්ම ඉහළට ඇද සිටින බවක් පෙන්වා බැලුම්වලට හුළං පුරවා ගන්නත් හුස්ම පිට කරන බව පෙන්වා හුළං බැස්සවීමටත් සිතා එය අපූරු සෙල්ලමක් කර ගැනීමට සිතමින් කිව්වා.

මම්සලී මහත් බියට පත් කරමින්, ඇය නැවතත් දෙකම්මුල් පුම්බා හුස්ම ඉහළට ඇද ගත්තා. එවිට පැහැදිලි ලෙසම, මම්සලී බියපත් දෙනෙත් ඉදිරියේ ඇය බියකරු පෙනුමකින් යුතුව පිම්බුණා. මම්සලී පුටුවෙන් බිමට පැන්නා.

"කවදාවත් මම මෙහෙම දෙයක් දැකලා නැහැ." ඈ වියරු වැටී කිව්වා. "ජූන්, නවත්වන්න ඕක. අනේ, මම කියන දේ අහන්න. ඔය විදිහට ඉදිමුණොත් ඔයා පිපිරෙයි."

ඒ මොහොතේම මුළු පන්තියම කොක් හඬලා සිනාසුනා. ඔවුන්ට තව දුරටත් සිනාව තද කරගෙන සිටීමට අපහසු වුණා. ඉක්මනින් හුස්ම පහත හෙළූ ජූන් බැලුම්වල හුළං පිට කළා.

"එපා... එපා... ජූන්." තම පුටුවේ සිට ඒ මේ අත ඇඹෙරෙමින් ෆෙලිසිටි කිව්වා. "අනේ, ආයෙත් ඒක කරන්න එපා."

එහෙත් මම්සලීව නැවත වියරු වට්ටා ජූන් එයම නැවත කරද්දී මම්සලී බියෙන් කෑ ගැසුවා.

"භූතයෙක්...!" කී ඈ බැගෑපත් වුණා. "අනේ ළමයෝ, හුස්ම ඉහළට ඇදගෙන ඉන්න එපා. බලන්න මෙයා පිම්බෙන හැටි. අනේ, අහිංසක ළමයා."

එවිටම හුළං බසින උපක්‍රමයේ දෝෂයක් හට ගැනුණා. එය ක්‍රියා විරහිත වුණා. ජූන් උමතුවෙන් මෙන් එය එහේ මෙහේ ඇද්දද නමුත් එය වැඩ කළේ නැහැ. ඇගේ ඇඳුම් අස්සේ තිබූ බැලුම් එලෙසම පිම්බී තිබුණා. ඇය වාඩි වී බැලුම් එකිනෙකට සම්බන්ධ කුඩා බට අතපත ගා සොයමින් කලබලයෙන් ඒවා අදින්නට වුණා. කුඩා බට හුළං පොම්පයෙන් ගැලවුණා.

මම්සලීගේ දෙනෙත් කඳුළින් බරව තිබුණා.

"අනේ, අහිංසක ජූන්...! ළමයි... ළමයි, මොකද ඔහොම හිනා වෙන්නේ? මේක හිනා වෙන්න කාරණයක් ද? මම කාට හරි කියන්න ඕනෑ. මේට්‍රන් මේ වගේ දේවල් දන්නවා. ජූන්, හෙල්ලෙන්න එපා. අනේ, පුපුරන්න නම් එපා...!"

එක්කොට ගත් ඇත තදින් අඹරවමින් මම්සලී ඉක්මනින් කාමරයෙන් පිටව දුව යන්නට වුණා. ජූන් මේ වන විට සැබැවින්ම අමාරුවක වැටී තිබුණා.

'මේ... මේ යක්ෂ වැඩේ වරදින්නයි යන්නේ. හුළං බහින්නේ නැහැ. මේට්‍රන්ට මේක පෙන්වන්න බැහැ. මට හොඳටම බැණුම් අහන්න වෙයි. මොකද කරන්නේ?"

මම්සලී වියරුවෙන් මෙන් දොරෙන් පිට වන මොහොතේම ඩැරල් ද දොර වෙත පැමිණියා. ඇය නොදුටු කලක මෙන් මම්සලී ඇයව පසෙකට තල්ලු කරගෙන ගියා. විවෘත වූ දොරෙන් ඩැරල් ඇතුළට එබී බැලුවා.

ඈ දුටුවේ බියකරු වෙස් ගත් ජූන්වයි. ෆෙලිසිටි ඩැරල්ව දුටුවේ වෙස් වළාගෙන ආ සුරදූතියක ලෙසටයි.

"ඩැරල්, හුළං බහින පොම්පේ වැරැද්දක්...! මම්සලී මේට්‍රන්ව එක්ක එන්න ගියා. ඉක්මන් කරමු. අපි මොකද කරන්නේ?"

"අල්පෙනෙත්තක් ගන්නවා, මෝඩියේ." ඩැරල් කිව්වා. "ඒකෙන් ජූන්ට අනිනවා. එතකොට එකපාරට හුළං බැහැලා යයි. ඊට පස්සේ ඉක්මනට ඔය බැලුම් ගලවලා ආනවලා. මේට්‍රන් ඇඟ පුරාම පරීක්ෂා කරලා බලනවා කියන එක කියන්න ඕනැද?"

අල්පෙනෙත්තක් පැමිණුනා. ෆෙලිසිටි ඉන් ඉදිමුණ ස්ථාන හතරට ඇන්න අතර එක්වරම ඒවායේ හුළං බැස ගියා. ජූන් හදිසියේම ඇගේ සාමාන්‍ය හැඩයට හා ප්‍රමාණයට පත් වුණා. ඈ සෑම දෙයක්ම කලබලයෙන් ඉවතට අදින්නට වුණා. මේ වන විට ඈ මහත් ලෙස භීතියට පත්ව සිටියා.

කොරිඩෝව ඔස්සේ පැමිණෙන අඩි හඬ ඇසෙන්නට පටන් ගනිත් ම ඈ බැලුම් හා කුඩා බඩ සියල්ල ඩෙස්කයේ බක්කියට දමා වැසුවා. ඇරියන්ගේ සිනාව සමග එක් නොවී සිටීමට බැරි බව තේරුණ ඩැරල් වහාම කාමරයෙන් පිටතට පැන ගත්තා. ජූන් පළමුව පිම්බෙනු දැක්ක අවස්ථාවේ මම්සලීගේ මුහුණ කුමන ආකාරයක් වන්න ඇත් දැයි දැක ගැනීමට ඈ කොතරම් ආශා කළා ද?

මඳක් සන්සුන් පෙනුමක් ඉසිළූ මම්සලී පැමිණියේ තනිවමයි. ඩැරල්ව පසුකර ගිය ඈ පළමු පන්තියේ කාමරයට ඇතුළු වුණා. ඇතුළට ගිය ඈ ජූන් දෙස ඇසිපිය නොහෙළා බලා සිටියා.

"ඕහ්... දැන් ඔයාගේ හුළං බැහැලා. මම මේට්‍රන්ට ඔයා ගැන කියද්දී එයා මට හිනා වුණා. එයා කිව්වේ ඒක ඔයාලගේ විජ්ජාවක් කියලයි. විජ්ජාවක්...! මොකක්ද මේ නරක, යක්ෂ, එපා කරපු විජ්ජාව? මම හොයා ගන්නම්. මම ඒක හොයනවා. මේ පන්තියේ හැමතැනම මම හොයලා බලනවා. ආහ්හ්හ්....!"

මම්සලීට ඒවා හමු වුණා. ඇය ඩෙස්කයේ උඩ ලෑල්ල ඔසවා, එක්වරම හිල් වී හුළං බැස ගිය බැලුන දැක ගත්තා. ඒවා පිටතට ගත් ඈ ජූන්ගේ මුහුණ ඉදිරිපිට ඒවා ඒ මේ අත සෙලෙව්වා.

"ඕහ්... දැන් ඔයාට ඕනෑ තරම් වේලාවක් හුස්ම ඉහළට ඇදගෙන ඉන්න පුළුවන්. හරිම නරක කෙල්ල, ජූන්. දැන් හුස්ම අල්ලාගෙන ම කියන දේ හොඳට අහගන්න. අඟහරුවාදාට ඉස්සර ඔයා ප්‍රංශ කවි පේළි සීයක් කට පාඩම් දෙන්න ඕනෑ. ඔව්, පේළි සීයයි. ඔන්න එතකොට ඔයාගේ හුස්ම හිරවෙයි නේද, නරක කෙල්ලේ?"

එය සැබවින්ම සිද්ධ වුණා. ඒ වන විට ජූන්ට ඉංග්‍රීසි කවි දෙකක් ද කට පාඩම් දීමට සිදුව තිබුණා. දැන් ඒ ගොඩට ප්‍රංශ කවි පේළි සීයක් එකතු වෙලා. ඈ කෙඳිරි ගෑවා.

මම්සලී ඩෙස්කය තව දුරටත් අවුස්සා බැලුවා. කුඩා පොත් පිංචක් ඇස ගැටුණා. ඈ එය පිටතට ගෙන බැල්මක් හෙළුවා.

"අලුත් විජ්ජා, පරණ විජ්ජා. යාළුවන්ට විජ්ජා කර පෙන්වන්න, තරහාකාරයින්ට කරන විජ්ජා." ඈ කියෙව්වා. "අහා.... මම ඔයාගෙන්ම ඉගෙන ගන්නම් ජූන්. මේ වාරයේ ඔයාට තවත් විජ්ජා කරන්න ලැබෙන්නේ නැහැ, ජූන්. මම මේ පොත රාජසන්තක කරනවා. එතකොට ඔයාට මේක ආයෙ ලැබෙන්නේ නැහැ."

කුඩා පොත් පිංච මේසය මත වූ තම පොත් මත තබා ගත් මම්සලී මුහුණ අඳුරු කර ගත් නමුත් දැඩි අධිෂ්ඨානයෙන් යුතුව ප්‍රංශ පාඩමේ අසා ලිවීමේ ඉතිරිය පටන් ගත්තා. පන්තිය සන්සුන් වූ අතර ඔවුන් සීනුව නාද වන තුරු ආශාවෙන් බලා සිටියා. ඔවුන් බලා සිටියේ තද කර ගත් සිනාව ඇතිවන තුරු පිට කර ගැනීමටයි.

සීනුව නාද වන විටම ඉක්මනින් ඔවුන්ට සුබ පැතූ මම්සලී රබර් බැලූන හා කුඩා වයර ද පොත් පිංච ද රැස් කරගෙන පන්තියෙන් කඩිනමින් පිටව ගියා. තම පොත් සමග මෙම උපකරණ හා පොත් පිංච ගෙන ගිය ඈ පොට්ස් ගුරුතුමිය සමග ඇය සිටින කාමරයට ගොස් සියල්ල මේසය මත තබා මේසය අසල වූ පුටුවක වාඩි වුණා. පොට්ස් ගුරුතුමිය උතුරු කුලුන භාර ගුරුතුමියයි.

"ඔයාට හුඟක් මහන්සි නිසා ටිකක් තරහින් වගේ, මම්සලී." පොට්ස් ගුරුතුමිය අනුකම්පා සහගතව කිව්වා.

"ආහ්... මේ ජූන්, එයා ගෙම්බෙක් වගේ පිම්බුණා. මගේ ඇස් දෙකටම දැක්කා...!" මම්සලී තම සිරුර පුම්බමින් කතාව ආරම්භ කළා. එවිට පොට්ස් ගුරුතුමිය විමතියට පත් වනු දුටු ඈ මඳ සිනාවක් පා නැවත මුව විවර කර මහ හඬින් සිනාසුනා. තම අසුනේ ඒ මේ අත ඇඹරුණ ඈ ගෙරවිලි හඬින් සිනාසුනා.

"ඕ... මේ විජ්ජා...! දවසක, මමත් විජ්ජාවක් කරනවා. හොඳම, සුපිරිම, අනර්ඝ විජ්ජාවක්...! හා... දවසක මමත් එකක් කරන්නම්."

# 10

අඟහරුවාදා සන්ධ්‍යාවේ ජූන් පහ පන්තියේ පොදු කාමරයට පැමිණියා ඇය පාඩම් කළ දේවල් ඩැරල්ට හා ඇලිසියාට පාඩම් දීමට. ඇයට තිබුණේ බුම්බා ගත් පෙනුමක්. මැහුම් වැඩ, අභ්‍යාස නැවත ලිවීම, පාඩම් කිරීම හා නිවෙස්වලට ලියුම් ලිවීම වැනි තනියෙන් වැඩ කරමින් සිටි දැරියෝ ජූන් ඇතුළු වන විට හිස් ඔසවා බැලුවා.

"පොඩි පන්තිවල ළමයි ලොකු පන්තිවල කාමරවලට එද්දි දොරට තට්ටු කරලා එන්න ඕනෑ කියන එක දන්නේ නැද්ද?" මොරියා ඇසුවා.

කිසිත් නොකී ජූන් රවා බැලුවා.

"එළියට යන්න. ගිහින් දොරට තට්ටු කරලා ඔයාට ඇතුළට එන්න කියන තුරු බලා ඉන්න." මොරියා තම ඒකාධිපති හඬින් කිව්වා.

ජූන් තරමක් පැකිළුණා. ඈ අණ කිරීම්වලට එතරම් කැමැත්තක් දැක්වූවේ නැහැ.

මොරියා සාක්කුවට අත දමා තම කුඩා දණ්ඩ නීති සංග්‍රහ පොත සොයන්නට වුණා. ඒ අතර ජූන් පිටතට පැන දිව්වා. තවත් කට පාඩම් කිරීම් ඇයට අවශ්‍ය වුණේ නැහැ.

"මේ විදිහට බලෙන් හදන්න ඕනෑ ළමයෙක් නම් මම කවදාවත් දැකලා නැහැ." මුහුණ ඇද කර ගත් මොරියා කිව්වා. "ගෙඹි පැටියා...! මම දන්නවා එයා ඔයාගේ නෑදෑයෙක් කියලා, ඇලිසියා. ඒත් එයා ඔයාගේ නම්බුවත් නැති කරනවා...!"

"මටත් කියන්න අමාරුයි ඔයාගේ නංගි - බ්‍රිජට් වුණත් ඔයාගේ නම්බුව රකිනවාද කියන එක." ඇලිසියා එකට එක කිව්වා.

විශේෂයෙන් ඇයට ජූන්ව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වූයේ නැති වුව ද ඈ මොරියාගේ බල පුළුවන්කාර හැසිරීම ප්‍රතික්ෂේප කළා.

"එයා එයාගේම නැහැදිච්ච නංගිව මුලින් බලා ගන්න ඕනෑ."

මේ වන විට ජූන් දෙවරක් දොරට තට්ටු කර තිබුණා. එය කැතරින්ට ඇසී තිබුණා.

"අපි ඒ ළමයට දැන් එන්න කිව්වොත් නරකද?"

"මම යමක් කිව්වොත් කිව්වා...!" මොරියා කිව්වා. "එයා තව ටිකක් රස්තියාදු වුණාවේ."

ජූන් නැවත වතාවක් තට්ටු කළා.

"ඇතුළට එන්න." මොරියා කී අතර දැඩි ලෙස කෝප වී රත් පැහැ ගැන්වුණ ජූන් ඇතුළට පැමිණියා.

ඩැරල් වෙත නිහඬව පා නැගූ ඇ ඇයට පාඩම් දීමට තිබූ පොත ඩැරල්ට දුන්නා.

"දැන් කට පාඩම් දෙන්න." ඩැරල් කිව්වා.

කිසිදු වැරදීමකින් තොරව ජූන් එක දිගට ඇය පාඩම් කළ දේ මතුරාගෙන ගියා. ඇය ඇත්තෙන්ම ඇලිසියා වගේමයි. ඩැරල් ඇය දෙස බැලුවා. ඇලිසියා වගේම ඇයටත් තිබුණේ පුදුම මතකයක්. මෙම දිගු කවිය පාඩම් කිරීමට ඇයට විනාඩි පහක් නොගිය බව ඩැරල්ට පෙනුණා.

ඇලිසියා වෙත ගිය ජූන් ඇය වෙනුවෙන් කට පාඩම් කළ දෙය එක දිගට මතුරන්නට වුණා.

"හරි." ඇලිසියා කිව්වා. "දැන් ඔයාට යන්න පුළුවන්. මේ වාරය පුරාම කවි කට පාඩම් කර කර ඉන්න ඕනෑ නැති නම්, තමන්ගේ වැඩිමහල් අයට සලකන ක්‍රමය ඉගෙන ගන්න වෙනවා."

ජූන් ඔරවා බැලුවා. බෙලින්ඩා වහාම ඇගේ පැන්සල අතට ගත්තා.

"ඔහොම ඉන්න." පුදුම වී සිටින ජූන්ට බෙලින්ඩා කිව්වා. "අන්න හරි. කට පහළට, ඇහි බැමි උඩට ගිහින්. මූණ ඇඹුල් වෙන්න ඕනෑ. ඔහොම්ම ඉන්න. අන්න හරි... එහෙම ඔරවා ගෙන ඉන්න. මට මේ චිත්‍ර එකතුවට ඕනෑම දෙයක්. ඒකට කියන්නේ 'එරවිලි පොත' කියලා.

ඒක හරිම ලස්සනයි. මම ඇඳලා තියෙන ඔරවන මුහුණු ඔයා දකින්න වටිනවා."

මෙම විශේෂිත චිත්‍ර එකතුවට වැඩිපුර ආයක වී සිටි ගොන්ඩොලින් හා මොරියා හදිසියේම සිත පෑරී ඔරවා බලන්නට වූව ද බෙලින්ඩා එය දකිනු ඇතැයි බිය වී වහාම මුහුණු සෘජු කර ගත්තා. අපොයි බෙලින්ඩා, ඇය අහළ පහළ සිටින විටදී කෙනෙකුට නිදහසේ රවන්නවත් ඉඩක් නැති හැටි.

ජූන් තවත් නපුරු ලෙස රවා ගෙන නිසලව සිටගෙන සිටියා.

"ඇඳ ගත්තා ද?" අවසානයේ ඈ ඇසුවා. "හොඳයි, මම හිතන්නේ ඔයා එරවිලි පොත හුඟක් රස විඳිනව ඇති. මම කැමැත්තෙන් ඇවිත් තව එකක් දෙකක් දෙන්නම්. පහේ පන්තියේ අය වටපිටාවේ ඉන්නව නම් හරි ලේසියෙන් ඔරවලා බලන්න පුළුවන්...!"

ඇය කාමරයෙන් පිටතට ගියේ මම්සලීට පාඩම් දීමට ලියා ගෙන තිබූ කොළ කැබැල්ල සාක්කුවේ අතපත ගා සොයමිනුයි.

11

**මේ** වන විට දින ඉතා වේගයෙන් ගත වී යන්නට වුණා. සති දෙකක්, තුනක් ගතව දැන් හතර වන සතිය ගෙවෙමින් තිබුණා. සෑම දෙයක්ම යහපත්ව සිදුවෙමින් තිබුණා. කිසිවෙක් පාසල තුළදී අසනීප වුණේ නැහැ. කාලගුණය යහපත් වූ බැවින් සෑම දිනකම ක්‍රීඩා පිටි පාවිච්චි කෙරුණ අතර සෑම දෙනෙකුටම පුහුණුවීම් රාශියක් ලැබුණා.

ඉගෙනීම් වැඩ හොඳින් කෙරුණ අතර සැබෑ අඥාන අය හැර සෑම කෙනෙක්ම සාර්ථක ලෙස පාඩම් කටයුතු කළා. මේ වන විට, ලැක්රෝස් තරග පහක්ම පාසල දිනා තිබූ අතර ක්‍රීඩා නායිකාව ලෙස ඩැරල් සතුටින් කුල්මත් වී සිටියා.

ඇය තරග දෙකකට සහභාගී වී තිබූ අතර තරග දෙකේදීම ජයග්‍රාහී ගෝලයන් වාර්තා කර තිබුණේ ඇයයි. ෆෙලිසිටි සතුටින් උමතුව සිටියා. තරග දෙකේදීම ඇයට ඩැරල් ක්‍රීඩා කරන අයුරු දැක ගැනීමට හැකිව තිබුණේ ඒවා පාසල තුළ පැවැත්වූ තරග නිසයි. තම පුහුණු වීම් දෙගුණ කළ ෆෙලිසිටි හැකි සෑම අවස්ථාවකම තමාට පුහුණු වීම් ලබා දෙන ලෙස ඩැරල්ගෙන් අයැද සිටියා. ඇය පාසල් කණ්ඩායමේ හතර වන මට්ටමේ අතිරේක ක්‍රීඩිකාවක් ලෙස නම් කරනු ලැබ සිටි හෙයින් මෙම වාරය අවසාන වීමට පෙර නිත්‍ය ක්‍රීඩාවක වීමට අධිෂ්ඨාන කරගෙන තිබුණා.

නත්තල් ප්‍රසංගය සඳහා වූ සැලසුම් ද මනාව සැකසෙමින් තිබුණා. මේ වනතුරු ද සංගීත ආචාර්ය, යං මහතාගෙන් හෝ ගායනා ආචාරිණී ශ්‍රීනින්ගෙන් ඔවුන් උදව් ඉල්ලා තිබුණේ නැහැ. සියලුම දේ සැලසුම් කළේ ඇරියෝයි.

තමා හා සැලී එක්ව විශාල මුද්‍රා නාට්‍යයක් සැලසුම් කර තිබූ ආකාරය ගැන ඩැරල් තනියම පුදුමයට පත් වුණා. මුලදී එය අසාර්ථක කාර්යයක් ලෙස පෙනුණ අතර ඩැරල්ට එය කළ යුතු

ආකාරය ගැන කිසිදු අදහසක් තිබුණේ නැහැ. එහෙත් දැන්, සැලීගේ උදව් ද නාට්‍ය හා මුද්‍රා නාට්‍ය පිටපත් කියවා ලබා ගත් දැනුමෙන් ද ලබා ගත් සාමාන්‍ය දැනුමෙන් ද යුතු වූ ඇය තමන්ගේම නාට්‍යයක් නිර්මාණය කිරීමට හැකියාව ඇති බව වැටහුණා.

"මේක හරිම අපූරු වැඩක්...!" ඈ සැලීට කිව්වා. "මම දැනගෙන හිටියේ නැහැ මම මේ වැඩේට මේ තරම් ආසයි කියලා, සැලී. මේ... ඔයාට හිතෙනවාද, නිකම් හිතෙනවාද, මට මේ වගේ වැඩවලට හැකියාවක් තියෙනවා කියලා?"

"ඔව්." සැලී අවංකව කිව්වා.

ඩැරල් තම කඩදාසි ගොන්න අවුස්සා ඈ කුරුටු ගෑ කොළයක් අතට ගත්තා.

"මම මේ කවිය කියවන්නද, සැලී? මේක සින්ඩෙරෙල්ලා කුස්සියේ ඉඳගෙන තනියම කියන කවියක්. එයාගේ කුඩම්මායි, නංගිලයි රජ ගෙදර උත්සවයට ගියාට පස්සේ එයා මෙහෙමයි දුක් වෙන්නේ. අහගන්න...."

"ළිප් බොක්කේ වාඩි වෙලා සිහින දකිනවා
ගිනි දළු මැද මගේ හදේ සිහින මැවෙනවා
හද සනසන සොඳුරු දසුන් ළිපේ නටනවා
මට අහිමියි
මට අහිමියි
අනේ මම...!

මංගල ඇඳුමින්, රිය පෙරහැරකින්
පලඳා අභරණ රජ සිටු විලසින්
ගිනි දළු වියැකේ, සිහිනය බොඳ වේ
සිහිනය දුමකී - සිහිනය දුමකී
අහෝ දුම...!"

ඈ ගායනය නැවතුවා.

"ඔය තරමට තමයි මට ලියන්න පුළුවන් වුණේ. ඇත්තටම මම දන්නවා මේක ඒ තරම් හොඳ ගී පද රචනාවක් නොවෙයි කියලා. මට හරියටම තනුවකට හරි, එළිසමයට හරි ලියන්න බැහැ. ඒත් මේක මුමුණ මුමුණ ඉඳලා අයිරින් අපූරු තනුවක් හොයා ගත්තා."

"ඔව්, ඇත්තෙන්ම මෙක ලස්සනයි." සැලී කිව්වා. "ඔයත් මේක රස විඳිනවා නේද? මේ.... කොහොමද ඔයාගේ අම්මයි තාත්තයි ඇවිදින් මේ නාට්‍ය පිටපතයි, ගී පද රචනායි ඩැරල් රිවර්ස්ගේ කියලා දැන ගද්දී...?"

"අනේ, මම දන්නේ නැහැ. එයාලා විශ්වාස කරන එකක් නැහැ." ඩැරල් කිව්වා.

මුද්‍රා නාට්‍යය නිෂ්පාදනයේදී තමා ඉටු කරන කොටස ගැන මහත් සතුටට පත්ව සිටියේ ඩැරල් පමණක් නොවෙයි. පහ පන්තියේ අනෙක් සාමාජිකාවන් මෙන්ම අයිරින් ද සතුටට පත්ව සිටියා. ඇය ඩැරල්ගේ පද මාලාවලට සංගීතය රචනා කළේ තම ජීවිතය පුරාම තනු නිර්මාණය කළ කෙනෙකු පරිද්දෙනුයි. ඇත්තෙන්ම එය එසේයි. ඈ නොයෙක් තාල මුමුනන්නට පටන් ගෙන තිබුණේ වයස වසරක් පමණ වූ කාලයේ සිටයි.

කොරිඩෝව ඔස්සේ යන විටදී හෝ තරප්පු නැඟ යන විටදී ඔවුන්ගේ ඇඟේ හැපෙමින් අලුත් තාලයක් මුමුණමින් තනිව යන අයිරින්ව ඔවුන් කොතෙකුත් දැක තිබුණා.

"ටම්ට-ටි-ටා-ටම්-ටූ. ඕ... කනගාටුයි, මෙල්විස්. අවංකවම මම ඔයාව දැක්කේ නැහැ. ටම්ට-ටි-ටා-ටම්-ටූ. අයියෝ, ඔයාට රිදුණා ද කැතරින්? මම දැක්කේ නැහැ ඔයා එනවා."

"ඕ.... ඒකට කමක් නැහැ." කැතරින් ඇගේ අතට තට්ටු කර ලැජ්ජාවෙන් පසෙකට යමින් කිව්වා. "අපිට ඔයා වගේ දක්ෂ එක් කෙනෙක් මීට පෙර ලැබිලා නැහැ. මේ..."

එහෙත් ඒ වන විට අයිරින් බොහෝ ඈතට ගොස් තිබුණා. ඇය කැතරින්ගේ අනවශ්‍ය නිහතමානී ඇවතුම් පැවතුම් දැඩි ලෙස ප්‍රතික්ෂේප කළා. එමෙන්ම ඇගේ නිමක් නැති අනවශ්‍ය කැපවීම් අයිරින් නොරිස්සුවා.

නාට්‍ය පිටපත ලිවීමේ කටයුත්ත ඉතා කඩිනමින් කෙරුණ අතර සංගීතය ද එලෙසම සිදු වුණා. එය එසේ සිදුවිය යුතුව තිබුණේ ඒ කිසිවක් නොමැතිව ඔවුන්ට පුහුණුවීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකිව සිටි නිසයි.

දර්ශන තලය හා ඇඳුම් සැලසුම් කිරීම සඳහා බෙලින්ඩා

සුහුඹුළු වුණා. ඇය ද අධික සතුටට පත්ව සිටියා. සෑම සැන්දෑවකම හා නිදහස ලද සෑම මොහොතකම පිටු පුරා ඇගේ පැන්සල දිව්වා. සෑම දෙයක්ම, සින්ඩෙරෙල්ලාගේ ඇඳුමේ මෝස්තර පවා ඈ ඇන්දා.

මෝස්තර ඇඳීම අවසාන කර ඒවා තමාට ලැබෙන තුරු කුඩා ජෙනට් ඇඩි උවමනාවෙන් බලා සිටියා. ඇය ද ඇඩි උනන්දුවෙන් හා ආශාවෙන් යුතු වුණා. මීට ප්‍රථම වාරවල සිටි දැරියන් පාවිච්චි කර තිබූ ඇඳුම් හා ආභරණ පෙට්ටි පිරි ට්‍රන්ක පෙට්ටි රාශියක් ඈ සොයාගෙන තිබුණා.

'මෙය වෙනස් කළ යුත්තේ කෙසේද? එය පාවිච්චි කළ යුත්තේ කෙසේද? ඕ... මොන තරම් වටිනා නිල් විල්ලුද රෙදි කැල්ලක්ද? කුමාරයාට හරියටම ගැළපෙනවා.'

කුඩා ජෙනට් නිතරම ශූර දැරියක් වූ අතර මෙහිදී ඈ ඇගේ දස්කම් අභිබවා යමින් සිටියා. ඇයට අවශ්‍ය ඇඳුම් ආයිත්තම් සියල්ල ඈ තෝරා ගත්තා. වෙනස් කළ යුතු ඇඳුම් ආයිත්තම් ඈ නිවැරදි ඇනුමින් යුතුව වෙන් කර තැබුවා. මැහුම් වැඩවලට දක්ෂ අය සොයා ඔවුන්ගේ උදව් ලබා ගැනීමට ඈ පාසල පුරා දුව ගියා. ඇඳුම් මත මෝස්තර යෙදීමටත්, සමහර ඒවා වෙනස් කිරීමටත් අවසර දී උදව් කරන ලෙස ඈ කුඩා නිහඬ මැහුම් ගුරුතුමිය - ලෙනිත් මහත්මියගෙන් ඉල්ලා සිටියා.

"මී පැටියෙක් වගේ ශබ්ද නැතිව ඉන්න කුඩා ජෙනට් මලක් පිපුණා වගේ මෙහෙම වැඩ කරයි කියලා මම කවදාවත් හිතුවේ නැහැ." පොට්ස් ගුරුතුමිය මමසළී සමග කිව්වා. "මේ ළමයින්ට තනියම වැඩ කර ගන්න අවස්ථාව දෙනවා නම් ඒ අයට මොන තරම් දේවල් කරන්න පුළුවන්ද?"

වෙනස් ආකාරයකින් වුව ද, ඇඩි මහන්සියෙන් වැඩ කරන තවත් කෙනෙක් සිටියා. ඒ ඇලිසියා. ඉතා ඥානවන්ත වූ හෙයින් මහන්සි වී වැඩ කිරීමට අවශ්‍ය නොවූ ඇලිසියා කිසිදින වැඩ ගැන උනන්දුවක් දැක්වූයේ නැහැ. එහෙත් දැන් ඥානවන්ත වුව ද නැති වුව ද හොඳ පුහුණුවකින් යුතුව නිරන්තරයෙන් මහන්සි වී වැඩ කිරීමට ඇයට හැකියාව තිබුණා.

ඇලිසියා නාට්‍යයේ මායාකාර රජු වීමට සිටි අතර ඔහු වශී

ගුරුකම් කරන මැජික් දන්නා විජ්ජාකාරයෙක්. ලන්ඩනයේ පවත්වන මැජික් දර්ශනවල සිටින සැබෑ විජ්ජාකාරයෙකු ලෙස පාසල් වේදිකාවේ ද තම දස්කම් දක්වා සැබෑ මැජික් දර්ශනයක් ඉදිරිපත් කිරීමට ඇලිසියා සිතට ගත්තා.

"හොඳයි, යාළුවෝ හිනස්සවන්න පොඩි පොඩි මැජික් වැඩයි, මෝඩ විජ්ජා වැඩයි කරන්න ඇලිසියාට තියෙන හැකියාව මේ වගේ වැඩකට ප්‍රයෝජනයට ගනියි කියලා මම හිතුවේ නැහැ." සංගීත කාමරයේ දොරක් සෙමින් වසන අතරේ තුන පන්තිය භාර පීටර්ස් ගුරුතුමිය කිව්වා.

ඇයට එතුළින් අමුතු ශබ්ද ඇසුණා. හති දමන හඬ, යමක් වැටෙන හඬ, මොනවා හෝ පෙරළෙන හඬ. සිදුවන්නේ කුමක් දැයි දැක ගැනීමට ඈ එතුළට හිස පොවා බැලුවා.



ඇයට පසුපස හරවා සර්කස් අංගයක් ප්‍රගුණ කරමින් සිටියේ ඇලිසියායි. විජ්ජාවලට අමතරව ඇය සර්කස් අංගයක් ද ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටියා. වර්ණවත් රවුම් කිහිපයක් ඇය ළඟ තිබූ

අතර ඈ ඒවා ඉතා ඉක්මනින් අහසට විසි කරමින්, ඉතා විස්මිත ලෙස ඒවා එකිනෙක අල්ලමින් සිටියා.

එවිට ඇයට එකක් මඟ හැරුණ හෙයින් කේන්තියෙන් හඬක් පිට කළා. ඇයට මුල සිට ආරම්භ කිරීමට සිදු වුණා. ඔහ්.... ඇලිසියා සොයාගෙන තිබුණේ මොළය පමණක් වෙහෙසන වැඩක් නොවේ. එයට ඉවසීම, පුහුණුව හා දක්ෂකම අවශ්‍යව තිබුණා.

"මම මොන එකකට පොරොන්දු වුණා ද මම මායාකාර රජතුමා වෙන්නම් කියලා?" ඇලිසියා කෙඳිරි ගෑවා.

විසි දෙවැනි වතාවටත් රවුම් ඇහිඳ ගත් ඈ නැවත ආරම්භ කළා.

"මම මේ මොනවාට පොරොන්දු වුණා ද විජ්ජායි, සර්කස් කැල්ලකුයි කරන්න? මට පිස්සු හැදිලා තිබුණ ද?"

එහෙත් ඇගේ ආඩම්බරය ඇයට නැවතීමට ඉඩ දුන්නේ නැහැ. ඇලිසියා යමක් කරන්නේ නම් වෙනත් කිසිම කෙනෙකු කරනවාට වඩා හොඳින් එය කළ යුතුයි. ඇලිසියාගේ මෙම අලුත් උනන්දුව ගැන පහ පන්තියේ අනෙක් දැරියෝ කුතුහලයට පත්ව සිටියා. හදිසියේම අඩි රූලක්, මකනයක් හා පැන්සලක් ගන්නා ඇය ඒවා වේගයෙන් උඩ දමා එකින් එක ඉක්මනින් අල්ලා අවසානයේ සියල්ල වරින් වර එක් අතකට අල්ලා ගනිමින් කරන මෙම සෙල්ලම දැක දැරියෝ මහත් විනෝදයට පත් වුණා.

ඩැරල් නාට්‍ය පිටපත ලියා අවසාන කරන තුරු ඇරියෝ දෙදෙනෙක් නොඉවසිලිවන්ත වුණා. ඒ ගොන්ඩොලින් හා මොරීන්. ඔවුන් දෙදෙනාම තමන් සින්ඩෙරෙල්ලා චරිතයට රඟපාන සිහින දුටුවා. ඔවුන් දෙදෙනාම ඉඩ ලද සෑම විටකම නිඳන කාමරයට රිංගා තම කෙස් මුදා ගෙන කණ්ණාඩි මේසය ඉදිරිපිට සිට එක් එක් ඉරියව් රඟ දැක්වූවා.

'මම සින්ඩෙරෙල්ලාට හරියටම ගැළපෙනවා.' ගොන්ඩොලින් මේරි සිතුවා. 'මම තමයි හරිම. ළිප අයිනේ දුකෙන් ඉන්න කොට ලස්සනට පෙනෙයි. කුමාරිකාවක් වගේ සාදයට යද්දී පුදුම ලස්සනක් තියෙයි.'

ඉදිරියේ පැවැත්වෙන නාට්‍ය ගැන ඈ අම්මාට ලියා දැන්වූවා.

'අපි ඇත්තෙන්ම දන්නේ නැහැ චරිතවලට කවුරු තෝරා ගනීවිද කියලා?' ඈ ලිව්වා. 'හුඟක් ළමයි කැමතියි මම සින්ඩෙරෙල්ලාට රඟපානවාට. එයාලා කියන්නේ මම ඒ චරිතයට ගැළපෙනවා කියලයි. මම දන්නේ නැහැ ඔයා මොනවා හිතයිද කියලා, අම්මේ. ඔයා දන්නවානේ, මම අහංකාර නැහැ. ඒත් මට හිතෙනවා, මට ඒ චරිතය හුඟක් දුරට හොඳට කරන්න පුළුවන් කියලා. මිස් වින්ටර් මොනවා හිතයි ද?'

හදිසියේම ලිපි දෙකක් ආපසු පැමිණියා. එකක් ඇඩි සතුටට පත් මවගෙන් හා අනෙක නිතර වැඳ වැටෙන මහලු ආයා - වින්ටර් මහත්මියගෙන්.

*ග්වේන් දුවේ,*

*ඔයා සින්ඩෙරෙල්ලා වෙන්නම ඕනෑ. ඔයා හරියටම ගැළපෙයි. ගිනි දළුවල එළියට ඔයාගේ කොණ්ඩය හුඟක් ලස්සනට පෙනෙයි. ඔයා දුක්මුසු විදිහට ළිප ළඟ ඉඳගෙන ඉන්නවා දකින මට මොන තරම් ආඩම්බරයක් ද? ඒ දිගා බලාගෙන.......*

ලිපියේ තිබුණේ එවැනි දේවල්. වින්ටර් මහත්මියගේ ලිපිය ද එවැනිම වුණා. ගොන්ඩොලින්ට ප්‍රධාන චරිතය ලැබෙන බව ඔවුන් පිළිගෙන තිබූ බවක් ලිපි දෙකෙහිම තිබුණා.

දිනක් හදිසියේම නිදන කාමරයට පැමිණි මොරියා දැක්කේ කෙස් කළඹ කඩා ඉහිරවා ගෙන, සැඳෑ ගවුමක් ලෙස තුවායක් කර වටේ ගැට ගසාගෙන, තම කණ්ණාඩිය ඉදිරිපස සිට තිගැස්සී බලන ගොන්ඩොලින්වයි.

"අයියෝ, මොනවාද මේ කරන්නේ?" පුදුම වූ ඈ ඇසුවා. "කොණ්ඩය හෝදන්න වගේ වැඩකට ද? ඔයාට පිස්සුද, ග්වේන්? මේ වෙලාවේ ඔළුව තෙත් කර ගන්න එපා. තව විනාඩි පහකින් ප්‍රංශ පන්තියට යන්න තියෙනවා."

යමක් මිමිණූ ගොන්ඩොලින් තුවාය ඇඳුම් වැටට දමා ගැසුවා. ඈ ලැජ්ජාවෙන් රතු වුණා. මොරියාට මෙය ප්‍රහේලිකාවක් වුණා.

දින දෙකකට පසුව, මොරියා නැවතත් හදිසියේම නිදන කාමරයට දුව ආවේ ජනේල නිසි පරිදි වසා ඇති දැයි බැලීමටයි. මෙවර ඈ දුටුවේ නිදන ඇඳන් වෙන් කරන ලද ලොකු තිරයක් ඉණ වටා දවටාගෙන කෙස් කළඹ කඩා මුහුණ වටා විසිරුවා ගෙන කණ්ණාඩිය ඉදිරිපිට සිටින මොරීන්වයි.

මොරියා මුව අයා ගත්තා. හදිසියේ රතු වූ මොරීන් තිරයත් ඉණ වටා ගැට ගසාගෙන කොණ්ඩය පීරීම සාමාන්‍ය දෙයක් ලෙස පෙන්වීමට පනාව ගෙන පීරන්නට පටන් ගත්තා. මොරියා තම කට හඬ අවදි කළා.

"ඔයයි, ග්වේනුයි කරන මේ වැඩේ මොකක්ද? තිරයක් හරි තුවායක් හරි ඇගේ ඔතාගෙන, කොණ්ඩය කඩා ගෙන පිස්සුවෙන් වගේ කණ්ණාඩිය දිහා බලාගෙන ඉන්නේ. ඔයාලට මොකද වෙලා තියෙන්නේ?"

අත්දැකීම් සහිත, අවඥා සහගතව කතා කරන මොරියාට තමන් කරන්නේ කුමක් දැයි කීමට මොරීන්ට නොහැකි වුණා. දිගු රන්වන් වරලසක් හා මනස්කාන්ත දිගු ගවුමකින් සැරසුණ සින්ඩෙරෙල්ලා. මොරියාට හදිසියේම එය අනුමාන කළ හැකි වුණා. ඈ තම සුපුරුදු අවඥා සහගත සිනාවෙන් හඬ නැගුවා.

"ඔ.... මට හිතෙනවා මම දන්නවා කියලා...! ඔයා සින්ඩෙරෙල්ලාට රඟපානවා. ඔයාලා දෙන්නාම සින්ඩෙරෙල්ලා කියලා හිතාගෙනයි ඉන්නේ. පුදුම බලාපොරොත්තුවක් ඔයාලට තියෙන්නේ. හා දත් තියෙන කෙනෙක් කවදාවත් සින්ඩෙරෙල්ලාට තෝරා ගන්නේ නැහැ."

මෙම අධෛර්යමත් කිරීමේ ප්‍රකාශයත් සමග හඬ නගා සිනාසෙමින් මොරියා කාමරයෙන් පිටව ගියා. මොරීන් කණ්ණාඩියෙන් තමා දෙසම බලා සිටින අතරේ ඇගේ ඇසට කඳුළු පිරුණා.. මොන තරම් නපුරු කුරිරුකමක් ද? හා දත්...! මොරියාගේ බිහිසුණුකම. දත් එසේ වීම ගැන ඇට කළ හැකි දෙයක් තිබුණේ නැහැ. ඇත්තෙන්ම නැද්ද? වැරදිකාරී හැඟීමකින් යුතුව තමාට දත් පසුපසට තද කර යැවීමට කම්බියක් පලඳින ලෙස කියා තිබුණ බවත්, තමා එය ප්‍රතික්ෂේප කළ බවත්, එමෙන්ම එයට හුරු වීමට නොහැකි බව කියමින් එය ගලවා ලාච්චුවේ සඟවා ඇමූ බවත් මොරීන්ට සිහි වුණා. එය තවමත් මැසිලි මැනර් විදුහලේ ලාච්චුවේ ඇතැයි ඇයට සිතුණා.

එම පාසලේදී කිසිවෙකු ඇගේ දත් ගැන කිසිවක් කියා තිබුණේ නැහැ. කිසිවෙක් ඒ ගැන කරදර වූවේ නැහැ. මැසිලි මැනර් නිදහස්, සැහැල්ලු පාසලක් වූ අතර එය හා මැලෝරි ටවර්ස් සංසන්දනය කිරීමේදී ඇයට මැලෝරි ටවර්ස් වැඩදායක පාසලක් ලෙස පෙනුණා. දන්ත වෛද්‍යවරයා කම්බි පැලඳීම නිර්දේශ කරන විට තමා මේ පාසලේ සිටියේ නම් කොපමණ අකමැත්ත ප්‍රකාශ කළ ද පාලිකාව හා පොට්ස් ගුරුතුමිය තමාට ඒවා බලහත්කාරයෙන් හෝ පලඳවනු ඇතැයි ඈ සිතුවා.

'එහෙනම් මේ වෙනකොට මගේ දත් ටික ලස්සනයි. මේ විදිහට ඉස්සරහට එන්නේ නැහැ.'

මෙලෙස තම පළමු ආදරණීය පාසල - මැසිලි මැනර් ගැන පළමු වතාවට ඇගේ සිතට සැකයක් පහළ වන්නට වුණා. තමන්ට ඕනෑ දේ හිතුවක්කාරකමට කරන්න ඉඩ දෙන එක හොඳ දෙයක් ද? ක්‍රීඩා කරන හෝ නොකරන එක කැමති විදිහට. ඇවිදීමට යන හෝ නොයන එක කෙනෙක් තෝරා ගන්න විදිහට. ඔව්, සමහරවිට කෙනෙක් කැමති හෝ අකමැති වුණාට කළ යුතුම දේවල් තියෙනවා. එය කෙනෙකු මෝරා වයසට පත්ව වගකීම් දරන තුරු හා තෝරා ගැනීමේ අවධිය එළඹෙන තුරු කළ යුතු දෙයක්.

මොරීන් කම්බි පැලඳීම ප්‍රත්ක්ෂේප කර තිබුණේ ඇය එය කළ යුතුවම තිබූ අවධියේදීයි. දැන් ඇයට හා දත් කියමින් සරදම් කරන අතර තමාව සින්ඩෙරෙල්ලා චරිතයට තෝරා නොගන්නා බව ඇයට විශ්වාස ලෙස පෙනුණා. සිත එකලස් කරගෙන, කොණ්ඩය නැවත නිසි පරිදි සකසා ගත් ඈ තවත් කඳුළු කැට කීපයක් හෙළා තම ඉදිරියට නෙරූ ඉදිරි දත් දෙතොලින් වසා ගැනීමට උත්සාහ ගත්තා.

ඉණ වටා තිබූ තිරය ලිහා දැමීමට පවා අමතක වූ ඈ කාමරයෙන් පිට වූයේ තිරය තමා පසුපස ඇදෙන බව හෝ නොදැනෙන පරිදි ගැඹුරු සිතුවිල්ලෙන් යුතුවයි. ඇයට තරප්පු පෙළ මුදුනේ දී මම්සලී මුණ ගැසුණා.

"හපෝයි...!" මහත් පුදුමයෙන් නතර වූ මම්සලී කෑ ගැසුවා. "මොකද මේ ළමයා, මොරීන්? ඔය ජනෙල් තිරය එක්ක ඔයාගේ සෙල්ලම මොකක්ද?"

මොරීන් තමා පසුපස ඇදී එන තිරය දෙස ත්‍රාසයට පත්ව බලා නිඳන කාමරය වෙතට බැල්මක් හෙළුවා. කලබල වූ ඈ වහාම තිරය ලිහා දමා දුව ගොස් එය නිසි පරිදි එල්ලුවා. තරමක් සන්සුන් වූ ඈ පහත මාලයට බැස ග්වේන් සොයාගෙන ගියා.

ක්‍රීඩා කිරීමට පමණක් නොව මහත් සේ පුහුණු කටයුතු කරන ලෙසට ද ග්වේන්ට බල කෙරෙනු ලැබුණා. අසනීප ගැන පැමිණිලි කෙරුණ ද ඇයට ව්‍යායාම කිරීම හා පුහුණු වීම් අනිවාර්යයෙන්ම කිරීමට සිදු වූ අතර ඒවායින් මඟ හැරීමට අවසර ලැබුණේ නැහැ. මේවා කිරීමෙන් අනතුරුව ඇයට සනීපයක් දැනෙන බව සෑම තැනකින්ම ප්‍රකාශ වුණා. කෝපයෙන් හති දමමින් වුව ද සෑම පා ගමනකටම ඇයට සහභාගී වීමට සිදුව තිබුණා.

මෙලෙස ග්වේන් මහත් කැපවීමෙන් ක්‍රීඩා ව්‍යායාම, ඇවිදීම් හා ශාරීරික අභ්‍යාසවල නිරත වීමේ රහස ගැන මොරීන්ට හෙළි දරව් කළේ කුඩා ජූන්. පසුගිය වාරයේදී පපුවේ අමාරුවක් ගැන ග්වේන් කළ බොරු රඟපෑම ගැන ජූන් ඇයට කීවේ ඇඩි සන්තෝෂයකින්.

"ග්වේන්ට ඕනෑ වුණේ පාසල් සහතික පත්‍ර විභාගයෙන් බේරිලා ඉන්න. ඉතින් එයා පපුවේ අමාරුවක් අරගෙන පපුව ගැහෙනවා කියන්න පටන් ගත්තා." ජූන් සිනාවක් නැගුවා. "එයාගේ අම්මා එයාව ගෙදර අරන් ගියා. ඊට පස්සේ ග්වේන් බොරුවක් කරන බව

එළි වෙලා. හරියටම විභාගය පටන් ගන්න දවසේ එයාව ආපසු ඉස්කෝලයට එව්වා. එදා ඉඳලා එයාව ක්‍රීඩාවලටයි, ව්‍යායාමවලටයි හැමදේකටම අනිවාර්යයෙන්ම යවනවා. එයා කපටි හෙරක්...!"

මෙවැනි දේවල් උසස් පන්තියක දැරියක හා කීමට ජූන්ට කිසිම අයිතියක් නොතිබූ අතර පහළ පන්තියක දැරියකට සවන් දීමට මොරීන්ට ද අයිතියක් නැහැ. එහෙත් ග්වේන් මෙන්ම දුෂ්ට ඕපාදූප ඇසීමට ඇය කැමැත්තක් දැක්වූ අතර ග්වේන්ට ඒ ගැන කිසිවක් නොකියා එම තොරතුරු ඈ තම සිතෙහි තැන්පත් කර ගත්තා.

මෙම දැරියන් දෙදෙනාටම බොහෝ දුරට එක්ව සිටීමට සිදු වුණා. පන්තියේ සෑම දැරියකටම පාහේ තමන්ගේම මිතුරියක සිටියා. මොරියාට විශේෂ මිතුරියක නොසිටි නමුත් ඕනෑම කෙනෙකුගේ උවමනා පිරිමැසීමට නිතර ඉදිරිපත් වන කැතරින් සමග කාලය ගත කළා. එලෙස අනෙක් අයගේ සමාගමයෙන් ඉවත් කෙරුණ ග්වේන් හා මොරීන් එකට ඇවිද ගිය ද එක් අයෙක් යමක නිරත විට දෙදෙනා වෙන වෙනම තනිව කාලය ගත කළා.

ග්වේන් මොරීන්ව ප්‍රතික්ෂේප කරන්නට පටන් ගත්තා. වරදකාර, ආත්මාර්ථකාමී, පුහු අහංකාර කෙල්ලක්. ඈ මොරීන්ගේ කටහඬ පවා පිළිකුල් කළා. හැකි සෑමවිටම ඇයව මඟ හැර සිටීමට ඈ උත්සාහ කළා. ඇයව මඟ හැර යාමට නිතර ඈ සමාවට කාරණා සොයා ගත්තා.

එහෙත් මොරීන් ඇයට යාමට ඉඩ දුන්නේ නැහැ. කතා කිරීමට, පුරසාරම් දෙඩීමට හෝ වැරදි කර ජේම්ස් ගුරුතුමියට අසු වී බැණුම් ඇසූ සෑමවිටම දුක් ගැනවිලි කීමට ඇයට සිටියේ ග්වේන් පමණයි.

මොරීන් සිතා සිටියේ බෙලින්ඩාට මෙන්ම ඇයට ද චිත්‍ර ඇඳීමට හෝ ඊට වඩා හොඳට ඇඳීමට හැකියි කියායි. තමාට හොඳින් ගායනා කළ හැකි යැයි ඈ සිතුවා. එමෙන්ම ඇයට පුදුමාකාර බලවත් කටහඬක් තිබුණා. එහෙත් අවාසනාවට එය ස්වරයෙන් පිට යන කපුටු කටහඬක්. අයිරින්ට මෙන්ම තනු නිර්මාණය කිරීමට තමාට ද හැකි බව ඇයට විශ්වාසයක් තිබුණා. එමෙන්ම ගී පද රචනා කර දීමට ඉදිරිපත් වී ඈ ඩැරල්ගේ ඇහැන පවා බින්දා.

"මේ වදකාර මොරීන්ට අපි මොනවාද කරන්න ඕනෑ?" එක් සැඳෑවක ජෙනට් මැසිවිලි නැගුවා. "එයා නිතරම ඇවිදින් මට උදව්

කරන්නද අහනවා. ඉතින් මම පොඩි දෙයක් හරි මහන්න දුන්නොත් ඒක කැත කරනවා. එතකොට මට ඒක ලෙහලා ආයෙත් මහන්න සිද්ධ වෙනවා."

"එයා ලැජ්ජා නැතිව ඇවිදින් මට කියනවා සින්ඩෙරෙල්ලාගේ ආරම්භක ගායනයේ සමහර සංගීත කාණ්ඩවලට එයා කැමති නැහැ කියලා." අයිරින් අවඥා සහගත බැල්මක් නගමින් කිව්වා. "මම බැනලා එළෙව්වා. එයා තේරුම් ගන්නේ නැහැ, එයාව අපිට උවමනා නැහැ කියන එක. එයා තේරුම් ගන්නේ නැහැ, එයාට කරන්න බැරි දේවල්. එයාට ඇනුම් පදවලින් ඇඟ හිල්වෙන්න ඇන්නත් එයාට ලැජ්ජාවක් නැහැ."

"එයාට හොඳ පාඩමක් ඕනෑ." ඇලිසියා කිව්වා. "අනේ හැබෑටම, මට බඩු උඩ ආලා අල්ලන හැටි එයා උගන්වන්න ආවොත්, මම එයාව උඩ දානවා. එයාව කොරිඩෝවට වැටිලා ආපහු එන්න උඩ දානවා. ඊට පස්සේ මිදුලට වැටෙන්න, ඊට පස්සේ ගල් උඩට, ඊට පස්සේ තටාකයට වැටෙන්න."

"මේ දවස්වල ග්වේන් ටිකක් අමාරුවෙන් ඉන්නේ." බෙලින්ඩා කිව්වා. "එයාට මොරීන් කැමති වුණාට එයා ජෝඩු දාලා ඉන්න කැමති නැහැ වගේ. මට හිතෙන්නේ එයයි, මොරිනුයි මොන තරම් සමාන ද කියලා එයා දන්නේ නැතිව ඇති. මෝඩකමයි, එපාවෙන එකයි, අහංකාරකමයි, පුරසාරමයි, තව...."

"ඕ... මේ..." කැතරින් කතා කළා. "ඔයා නපුරු වෙලා බෙලින්ඩා."

බෙලින්ඩා කැතරින් දෙස බැලුවා.

"කරුණාවන්ත වෙන්නයි, අකරුණාවන්ත වෙන්නයි වෙලාවල් තියෙනවා, කැතරින් බබෝ." ඇ කිව්වා. "ඒත් ඔයා ඒවා දන්නේ නැහැ වගේ. මගේ පැන්සල හීනියට උල් කරලා දෙනකොට ඔයා හිතාගෙන ඉන්නේ ඔයා හරිම කරුණාවන්තයි කියලා. ඒත් ඒක ඇත්ත නොවෙයි. ඔයා ඒ වැඩේට ආසයි. පැන්සල් ඒ විදිහට උල් කරනවාට මම කැමති නැහැ. මට සමහර පැන්සල් මොටව තියෙන්න ඕනෑ මගේ වැඩවලට. අනික මොරීන්ට අකරුණාවන්ත වීමත් සමහර දේවල් හරි ගස්සාගන්න තියෙන කෙටි ක්‍රමයක්. මම හිතන්නේ මොරීන්ට අවශ්‍ය ඒක. තදින් තිත්ත බේත් වේලක් දෙන්න ඕනෑ ඔළුව පෑදෙන්න. එයා මේ මෝඩ විකාර වැඩ නවත්වන්නේ නැති නම් ඒක තමයි එයාට ලැබෙන්නේ."

අනෙක් අය වෙනුවෙන් දිවි පුදන ලීලාවට කැතරින් පැමිණුනා.

"ඔයා හැමදේම හොඳින් දන්නවා බෙලින්ඩා. මම ඔයා කියන දේට කවදාවත් විරුද්ධ නැහැ. මට ඔයාගේ පැන්සල් ගැන දුකයි. ඒත් මම හැම තිස්සේම කරන්නේ අනිත් අයට උදව් කරන එකයි."

"ඔයා කල්පනා කර කර ඉද්දි ඔයා කොයි වගේද කියලා පෙන්වන්නද, කැතරින්?" හදිසියේම බෙලින්ඩා හඬ නඟා කිව්වා.

බෙලින්ඩාගේ මෙම හදිසි හඬ නැගීම නිසා ඒ ගැන උනන්දු වූ හැමෝම ඉතා විනෝදයෙන් සවන් යොමු කළා. ඇය ඉතා යහපත් දැරියක වුව ද ග්වේන්, මොරීන් හා කැතරින් වැනි අය ඇගේ ඉලක්කයන් වුණා.

බෙලින්ඩාගේ පැන්සල විශාල කොළයක ඒ මේ අත දුවන්නට වුණා. විනාඩි පහක් පමණ ඇය චිත්‍රය ගැන වෙහෙසුණ අතර ඈ එක් වරම අල්පෙනෙත්තක් ද අතට ගත්තා.

"මම මේක බිත්තියේ ගහනවා, ළමයි." ඈ කිව්වා. "කැතරින්ට මේ ගැන හුඟක් ආසා හිතෙයි. එයා හිතාගෙන ඉන්න ජීවමාන රූපය තමයි මේ."

ලොකු කොළය අතට ගත් ඈ එය බිත්තියට සවි කළා. දැරියෝ ඒ වටා රොක් වුණා. කුතුහලයෙන් යුතු වුව ද කැතරින් ද ඔවුන්ට එකතු වුණා.

එය අඳුරු ජනේලයක් පසුබිම් කරගෙන කැතරින් සිටගෙන සිටින පින්තූරයක් වූ අතර විශේෂත්වය වූයේ ඇගේ හිස වටා දිදුලන රැස් වළල්ලක් තිබීමයි. ඊට පහතින්, ලොකු අකුරින් බෙලින්ඩා වචන කීපයක් ලියා තිබුණා.

**අප ආශිර්වාද ලත් සාන්ත කැතරින්**

දැරියන්ගේ කොක් හඬලා සිනාසෙන සෝෂාව මධ්‍යයේ කැතරින් කාමරයෙන් එළියට පැන දිව්වා.

"එයාට ඕන දේ ලැබුණා...!" ඩැරල් කිව්වා. "කැතරින්, එන්න...! කොහොමද ඔයා ජනේලයක සාන්තුවරියක් වුණොත් කියලා බලාගන්න."

# 13

එම සතිය අවසාන වීමට පෙර මුළු නාට්‍ය පිටපත දෙබස් ද සමග ඩැරල් සූදානම් කර ගත්තා. ඩැරල් ගී පද ලියූ වහාම අයිරින් ඒවා උදුරා ගන්නා නිසා සංගීතය සඳහා තනු රචනය ද බොහෝ දුරට අවසන් වී තිබුණා.

"හරියට සුලිවාන්, ගිල්බට් ජෝඩුව වගේ." මොරියා මඳක් සරදම් ලෙස ජනප්‍රිය විකට ඔපෙරා නළු-නිළි යුවළක් මතක් කරමින් කිව්වා.

ඒතාක් ඇයට වැඩක් පැවරී නොතිබුණ නිසා තරමක කුසීත බවක් දැනී තිබුණා. නාට්‍ය පිටපත අවසාන වන තුරු ඇයට එහි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකිව සිටියා. ඒ නිසාට ඇයට කිරීමට දෙයක් තිබුණේ නැහැ. යමක් නොකර සිටීම මොරියාට අපහසුවක් වුණා. ඇය කැමති වූවේ යම් යම් දේ පවත්වාගෙන යාම, ඒවා සංවිධානය කිරීම හා සෑම කෙනෙක්ම පාලනය කර ගනිමින් නීති රීති පැනවීමටයි.

ඈ එතරම් ජනප්‍රිය පන්ති නායිකාවක් වූවේ නැහැ. පහ පන්තියේ දැරියෝ ඇගේ ඒකාධිපති පැවැත්ම ගැන කේන්තියෙන් පසු වුණා. ඇගේ විනෝදකාමී බවක් නැති වීම ගැන ඔවුන් අමනාපයෙන් පසු වූ අතර හැකි සෑමවිටම ඇයව නොතකා සිටියා.

මොරියා හැමෝගේම තරහ ඇවිස්සුවා.

"මේක ඉක්මනට ලියලා දෙන්න ඔයාලට තිබුණා. ඩැරල්ටයි සැලීටයි දෙන්නටම." ඈ දොස් නැඟුවා. "ඔයාලා හරිම ප්‍රමාදයි. මට හිතෙනවා මේක මම තනිවම ලිව්වා නම් හොඳයි කියලා."

"ඔයාට ලියන්න බැහැ." ඩැරල් කිව්වා. "ඔයාම දන්නවා ඔයාට බැහැ කියලා. අපි දැකලා තියෙනවා රචනාවලදිත් ඔයා ගන්නේ අඩුම ලකුණු, නේද?"

මොරියා ලැජ්ජාවෙන් රතු වුණා.

"නපුරු වෙන්න එපා." ඈ කිව්වා.

කැතරින් ඉතා මෘදු හා මිහිරි හඬින් ඈ වෙනුවෙන් කතාවට ඉදිරිපත් වුණා.

"මම හොඳටම දන්නවා, ඔයාටයි, සැලීටයි අවස්ථාවක් දෙන්න ඕනෑ නිසා දයි මොරියා ඒක ලියන්න ඔයාලට භාර කළේ." ඈ කිව්වා. "මම හොඳටම දන්නවා එයාට ඒක තනියම හොඳට කරන්න තිබුණා."

"අන්න... අපේ කැතරින් සාන්තුවරිය පණ දෙන්න කතා කරනවා." ඇලිසියා අවඥා සහගතව කිව්වා. "අනේ, සාන්ත කැතරින්... බෙලින්ඩා දීලා තිබුණ රස් වළල්ල විතරයි මෙයාට අඩු. නේද, ළමයි?"

කැතරින් රවා බැලුවා. බෙලින්ඩා හදිසියේම හඬ නැගුවා.

"ඕ... අන්න එහෙම ඉන්න කැතරින්...! අර බොරු හිනාව නැතුව රවලා බලන හැටි එක සැරයක් මට බලාගන්න ඉඩ දෙන්න."

කැතරින් ඉවතට හැරුණා. තමා අනුන් වෙනුවෙන් මෙතරම් කැප වන විට, සියලු දෙනාට කරුණාවන්ත වීමට උත්සාහ කරන විට ඇයට සිනාසීම ඉතා නරක දෙයක් ලෙස කැතරින් සිතුවා. අහිංසක වූ ඈ වටපිට බැලුවා. අපොයි...! ඇගේ තවත් පින්තූරයක් බිත්තියේ එල්ලා තිබූ අතර එහි රස් වළල්ල පෙරට වඩා විශාල එකක් වුණා.

පොදු කාමරය හිස් වන අවස්ථා බලා කැතරින් එතුළට වැදීම පුරුද්දක් කර ගත්තා. බෙලින්ඩා නිතර නිතර ඇඳ බිත්තියේ එල්ලා තිබූ ඇගේ පින්තූර ඈ ගලවා දැමුවා. එහෙත් නිතර එහි අලුත් පින්තූරයක් තිබුණා. ඇත්තෙන්ම මෙය පිස්සු වැටෙන වැඩක්...! මෙවර ඇය පැන්සල් සිය ගණනක් උල් කරන පින්තූරයක් තිබූ අතර යමෙකු එය හොඳින් බැලුවේ නම් ඇගේ හිස වටා වූ රස් වළල්ල ඇඳ තිබුණේ උල් කරන ලද පැන්සල් එකිනෙකට සමීපව ඇඳීමෙනුයි.

'හැම කෙනෙක්වම තරහා ගස්සන එක ඇත් ඇති.' කැතරින් සිතුවා. 'මට පුදුම මට තරහා යන්නේ නැති එක ගැනයි, කෑ ගහලා නරක වචන කියන්න බැරි එක ගැනයි. හොඳයි, මම උනන්දු වෙන්නේ එයාලගේ හිත දිනා ගන්න. ඒත් ඒක හරි අමාරුයි.'

කැතරින්ව මෙල්ල කර ගන්නා ආකාරයටම මොරීන් ද මෙල්ල කළ යුතු යැයි පහ පන්තියේ දැරියෝ තීරණය කළා.

"අපේ පෙරහුරු පටන් ගන්න ඉස්සර ඒ දෙන්නාටම පෙන්වලා දෙන්න ඕනෑ එයාලා ඉන්නේ කොහේද කියලා." ඇලිසියා කිව්වා. "අපේ වැඩේ කරගෙන යන අතරේ නාහෙන් අඬන අයගෙනුයි, සාන්තුවරියන්ගෙනුයි කරදර එනවා නම් අපිට හරියට මොකවත් කරන්න බැහැ. දැන් අපි මොරීන්ට මොනවාද කරන්නේ?"

"එයාට තියෙන ප්‍රශ්නය තමයි එයා හිතාගෙන ඉන්නේ හැම දෙයක්ම කරන්න පුළුවන් එයාට විතරයි කියලයි. අනිත් හැමෝටම වැඩිය හොඳට කරන්න පුළුවන් කියලා. මුළු ප්‍රසංගයම තනියම කරන්න පුළුවන් කියලා එයාට විශ්වාසයක් තියෙනවා." ඩැරල් කිව්වා. "එයා මොන තරම් මෝඩ, ලැජ්ජා නැති එක්කෙනෙක්ද කියලා වචනවලින් කියන්න බැහැ."

"හරි...!" ඇලිසියා කතා කළා. "අපි එයාට ඇත්තටම අවස්ථාවක් දෙමු. අපි එයාට කියමු බෙලින්ඩාට උදව්වක් හැටියට මෝස්තර කිහිපයක් නිර්මාණය කරලා දෙන්න කියලා. මෙල්විස්ට උදව්වක් හැටියට සින්දුවක් දෙකක් කියන්න කියමු. අපි එයාට කියමු අයිරින්ට උදව්වක් හැටියට තනුවක් දෙකක් ආලා දෙන්න කියලා. ඒ වගේම සැලීට උදව්වක් විදිහට කවි කීපයක් ලියලා දෙන්න කියලා. ඊට පස්සේ මේ හැම එකක්ම හරි විදිහට විවේචනය කරමු. එතකොට එයා තේරුම් ගනියි එයාගේ තත්ත්වය."

"හරි... ඒත් ඒක ටිකක් සැර වැඩියි වගේ." මේරි ලෝව් කිව්වා.

"ඒ වගේ තමා." සැලී කිව්වා. "අපි එයාට වැඩේ කරන්න කියලා නරක විදිහට විවේචනය නොකර ඉඳිමුද?"

"ඔව්, අපිට පුළුවන් එයා කරන්නේ විහිළුවක් කියලා පෙන්වන්න. අපිට හිනා යන්න එයා මේවා කරනවා කියලා පෙන්වමු. එයාගේ තනුවලටයි, පද රචනාවලටයි අපි හිනා වුණාට පිටට තට්ටු කරලා කියමු 'ඒවා හොඳයි. ඒත් හිනා යනවා' කියලා. ඒවා ගැන අපි උනන්දු වෙන්නේ නැහැ කියලා පෙන්නුවොත්, එයාට ටිකක් හරි මොළයක් තියෙනවා නම් එයා කට වහගෙන ඉඳියි. එහෙම නොවුණොත් අපට තව ටිකක් තදේට ඉන්න වෙනවා. මේරි ලෝව් කියනවා වගේ සැරේට."

ග්වෙන් හා කැතරින් හැර සෙසු හැමෝම මෙම උපක්‍රමය දැන සිටියා. ඔවුන් දෙදෙනා මෙම රහස දැන ගත් විට මොරීන්ට කේලම් කියනු ඇතැයි ඇරියෝ බිය වූ නිසා ඔවුන් දෙදෙනාව මෙම

කටයුත්තට හවුල් කර ගත්තේ නැහැ. මෙය සිතට එතරම්ම එකඟ නොවන බව මොරියාට සිතුණ ද ඈ ඒ සඳහා එකඟ වුණා. 'ටිකක් සැරෙන් සිටිය යුතුයි' යන පළමු අදහස ඈ අනුමත කළා.

ගී පද, තනු හා ඇඳුම් විලාසිතා ඉදිරිපත් කරන ලෙස මොරීන්ට කියනු ලැබුවා. එමෙන්ම මෙල්විස්ගේ ගායනයට උදව් වීම පිණිස ගී දෙකක් ද පාඩම් කර පුහුණු වන ලෙස ඇයට කියනු ලැබුවා.

මෙය විශාල නම්බුවක් ලෙස සැලකූ ඈ ඇඩ් සතුටට පත් වුණා. ඈ ස්තුති කළේ ගොත ගසමින්. කෙසේ හෝ අවසානයේ ඇගේ කැමැත්ත ජය ගෙන තිබුණා. ඇගේ දස්කම් කාටත් හඳුනා ගන්න ලැබිලා...! මොන තරම් පුදුම ද?

මේ ගැන කීමට ඈ කෙළින්ම ග්වේන් වෙත දුව ගියා. ග්වේන්ට තම දෙසවන් ඇදහිය නොහැකි වුණා. වැඩෙන ඊර්ෂ්‍යාවෙන් යුතුව ඈ සවන් දී ගෙන සිටියා. මොරීන්ට මේ දේවල් කරන්න කියලාද? ඒක විශ්වාස කරන්නත් බැහැ.

"ඔයාට සතුටු නැද්ද ග්වේන්? මට මේවා අනිත් අය කරනවාට වඩා හොඳට කරන්න පුළුවන් නේද?" මොරීන් තම ළා නිල් දෙනෙත් බබළන අතරේ කෑ ගසා ඇසුවා. "අන්තිමේදී අනිත් අය තේරුම් ගන්න පටන් අරගෙන තියෙනවා මැසලි මැනර්වලදි මමත් මොනව හරි ඉගෙන ගෙන තියෙනවා කියලා."

සතුටින් කතාව පටන් ගත් ඇය ග්වේන්ගේ අත පටලවා ගත්තා. එහෙත් ග්වේන් අමුතු ලෙස අකරුණාවන්ත වුණා. ඇයට වචනයක් හෝ කියා ගැනීමට බැරි තරමට ඈ ඊර්ෂ්‍යා සහගත වුණා.

මොරීන් මහත්සි වී වැඩ කළා. කවි පන්ති දෙකක් ද තනු දෙකක් හා ඇඳුම් සඳහා මෝස්තර කීපයක් ඈ නිර්මාණය කළා. ඩැරල් ඇයට දී තිබූ ගීත දෙක ඈ පාඩම් කළා. පහ පන්තියේ සංගීත කාමරයකට වැදුණ ඇය එහි තනි වී කොතරම් හඬ නඟා කෑ ගසමින් ගායනා කළේ ද යත් තාලයෙන් පිට ගැයෙන මෙම බෙරිහන් දීමට යාබද කාමරයේ සිටි ඇරියෝ තුෂ්ණිම්භූතව සවන් දුන්නා.

එය උස් හඬක් පමණක් නොව තාලයක් නැතිව බෙරිහන් දීමක් වූ අතර නිසි ලෙස වැඩ නොකරන ග්‍රැමපෝනයක් හඬ නගා වාදනය කිරීමක් වැනි වුණා. යාබද කාමරයේ සිට පුදුමයට පත්

දැරියෝ හීන් ආඩිය දමා වෙවුලන්නට වුණා. කවුරු මෙසේ කෑ මොර දෙනවා ඇතිද?

මොරියාගේ හතර පන්තියේ සහෝදරිය - බ්‍රිජට් මෙය බලා ගැනීමට ගියා. දෙවියනේ, ඒ පහේ පන්තියේ දැරියක් කෑ ගසමින් ඉන්නේ. ඒ කවුද? මොරීන් ලිට්ල්...! බ්‍රිජට් සිනාවක් නගා ගෙන කොනිව සොයා ගියා. ඔවුන් දෙදෙනා මිතුරියන් වී සිටි අතර ක්‍රමයෙන් ඇය රූත්ගෙන් ඈත් වෙමින් ඇය නිතර සොයා යාම මඳින් මඳ අඩු කර තිබුණා.

හතර පන්තියේ දැරියෝ දෙදෙන සංගීත කාමරයේ දොරෙහි සවි කර ඇති හතරැස් වීදුරුවෙන් කාමරයට එබී බලා එතුළ පුහුණු වීමේ නිරතව සිටින මොරීන් දැක ගත්තා.

"ඇහෙනවා නේද?" බ්‍රිජට් උපහාසයෙන් ඇසුවා. "අගේ ඇති ගායනයක් නේද? අපි දෙන්නත් එහා කාමරයට ගිහින් කෑ ගහමුද? එන්න.... ඒකේ කවුරුවත් නැහැ. පහේ ළමයෙකුට එහෙම කෑ ගහන්න ඉඩ දෙනවා නම් අපිට බැරි ඇයි?"

එලෙස ඊළඟ යාබද කාමරයට වැදුන ඔවුන් දෙදෙනා, ඔපෙරා ගායිකාවන් දෙදෙනෙකු ලෙස රඟපෑමේ යෙදෙමින් මහා ඝෝෂාවක් ඇති කළ අතර කොරිඩෝවේ සිටි හැමෝම මහත් විමතියට පත් වුණා.

එන්න එන්නම උස් වන තම හඬට මැදිව සිටි මොරීන්ට පමණක් පිටත කලබල කිසිවක් ඇසුණේ නැහැ. හදිසියේම ඇගේ කාමරයේ දොර විවෘත වී මොරියා ඇතුළට පැමිණියා.

"මො...රී....න්....! කට වහනවා...! ඔයාගේ සද්දේ අපේ පොදු කාමරයට ඇහෙනවා...!"

මොරීන් හදිසියේම නැවතුණා. එවිට යාබද කාමරයෙන් ඊට වඩා ලොකු බෙරිහන් දීමක් ඇසුණා. මවිත වූ මොරියා එදෙසට දුව ගියා. මොකක්ද මේ සිද්ධ වෙන්නේ?

මොරියා දුටු වහාම කොනී කෑ ගැසීම නතර කළා. එහෙත් තම සහෝදරියගේ කේන්තිය ගැන කිසිදු තැකීමක් නොකළ බ්‍රිජට් තම ගීතයේ වචන වෙනස් කරමින් තවත් හඬ නඟා ගායනා කළා.

"ඕ...ඌ෴... හ්...හ්...හ්.. මේ... ඒ... මොරියා... මේ... ඊ...ඊ..."

"බ්‍රිජට්, නවත්වනවා ඕක." මොරියා කෝපයෙන් කී නමුත් බ්‍රිජට් නැවැත්වූවේ නැහැ.

"මේ...ඊ...ඊ... එයා..." බ්‍රිජට් නොනවත්වා ගැයුවා.

"මම කියන දේ ඇහුණා ද?" මොරියා කෑ ගසා ඇසුවා.

හුස්මක් ගැනීමට බ්‍රිජට් නැවතුණා.

"මම මොරීන් තරම් හයියෙන් සිංදු කියන්නේ නැහැ." ඈ කිව්වා. "අනික මම තාලෙට කිව්වාට එයා තාලයට කියන්නෙත් නැහැ. පහේ පන්තියේ කෙනෙකුට එහෙම බෙරිහන් දෙන්න පුළුවන් නම් අපි ටිකක් සද්දෙට සිංදු කිව්වාම මොකද?"

"ඔන්න, ආයෙත් කපටිකම්වලට ලෑස්ති වෙලා." කලකිරීමෙන් සුදුමැලි වූ මොරියා කිව්වා. "ඔයා දන්නවා මම ඒවාට කැමති නැහැ කියලා. කොනී, එළියට යන්න. ඔයා බ්‍රිජට් එක්ක ඒ තරම් යාළු වෙන්න එපා කියලා මම ඔයාට කියන්නේ හොඳටයි. අන්තිමේ ඔයත් කරදරවලට වැටෙනවා."

කොනී පිටව ගියා. ඈ මහත් බියට පත්ව සිටියා. ඇය සිටියේ රූත් සමග නම්, කරදරයකදී ඇයව අත් හැර නොගොස් ඇය සමග එකට සිටීමට ඇයට හැකියි. එහෙත් බ්‍රිජට් වෙනස් කෙනෙක්. ඇය නිතර තමාව පමණක් ආරක්ෂා කර ගන්නා කෙනෙක්. ඇය දැන් මොරියාට මුහුණ දී සිටිනවා.

"තමන්ගේ නංගි ගැන හරි අපූරු දෙයක් කිව්වේ, නේද මොරියා?" බ්‍රිජට් කෑ ගැසුවා. "උඩ බලාගෙන මුහුණට කෙළ ගහ ගන්නවා. තව ළමයෙකුට කියනවා මම යාළුවෙකුට ගන්න එපා කියලා."

"මම එහෙම කිව්වේ නැහැ." මොරියා කිව්වා. "ඇයි ඔයාට හැදෙන්න බැරි, බ්‍රිජට්? මට ඔයා ගැන ලැජ්ජයි. මට අහන්න ලැබෙන්නේම ඔයාගේ නරක වැඩ ගැන."

"හොඳයි, ඔයා ගැනත් මට අහන්න ලැබෙන්නේ එහෙම." බ්‍රිජට් කිව්වා. "කවුද පහේ පන්තියේ නායිකාව විදිහට ලොකුකම් පෙන්වන්නේ? ඔයා...! එයාලට හිටිය නරකම පන්ති නායිකාව කවුද? ඔයා...! කවුරුවත් කැමති නැති නිසා අනිත් අයත් එක්ක ඉහළ පන්තියට දැම්මේ නැත්තේ කවුද? ඒත් ඔයා...!"

"ඔහ්...!" ඇඩී කෝපයට පත්ව මොරියා කෑ ගැසුවා. "ඔයා වැඩකට නැහැ. මම ඔයා ගැන මිස් විලියම්ස්ට කියනවා. ඔයා ගැනත් කියනවා. ඕන නැති වැඩ කරලා මට අහුවෙන හැම සැරේම මම ඔයාව අල්ලලා දෙනවා."

"කේලම්කාරී...!" බ්‍රිජට් කිව්වා.

එකිනෙකාට කෑ ගසා ගනිමින් එතැන සිටින සහෝදරියන් දෙදෙනා අශෝභන දර්ශනයක් වුණා.

"මේ සිද්ධිය ගැන ඔයා මාව අල්ලා දුන්නොත් දුක් වෙන්න වෙයි." බ්‍රිජට් අවසානයේ කිව්වා.

"හරි... බලමු. මම කියනවා." මොරියා කිව්වා. "ඒක මගේ යුතුකම. හතර ළමයින්ට මේ කාමරවලට එන්න තහනම්. ඔයා ඒක දන්නවා."

ආපසු හැරුණු ඈ තවමත් වෙවුලමින් පිටව ගියා. ඈ හතර පන්ති භාර විලියම්ස් ගුරුතුමිය සොයා ගියා. තමා කෝප වී සිටින අතරේම මේ දෙදෙනා ගැන පැමිණිලි නොකළහොත් කෝපය පහව ගිය පසු එය නොකෙරෙන බව ඈ දැන සිටියා.

විලියම්ස් ගුරුතුමිය සිද්ධිය ගැන එතරම් කලබල වූ බවක් පෙන්වූයේ නැහැ. මොරියා සඳහන් කළ හතර පන්තියේ ඇරියන් දෙදෙනාගේ නම් ලියා ගත් ඈ හිස සැලුවා.

"හරි, මම එයාලට කතා කරන්නම්."

එය එතැනින් අවසන් වුණා. තමා කිසිවක් නොකියා සිටියේ නම් හොඳ යැයි මොරියාට සිතුණා. මේ වන විට බ්‍රිජට්ගේ තර්ජන ගැන මොරියාට යම් අපහසුවක් දැනුණා. බ්‍රිජට් ඇයව කනගාටුවට පත් කරන්නේ කෙසේද? සමහර විට බ්‍රිජට් ඉතා බිහිසුණු වන අතර ඈ ඉතා අමිහිරි දේ කරනවා. මීට වසර කීපයකට පෙර මොරියා බ්‍රිජට්ගේ සෙල්ලම් බඩුවක් ජනේලයෙන් පිටතට විසි කළ නිසා බ්‍රිජට් වරින් වර මොරියාගේ බෝනික්කන් සියල්ල කඩා ඇමුවා.

ඔව්, පොදු කාමරයට ආපසු යන අතරේ මොරියාට මහත් අපහසුවක් දැනෙන්නට වුණා. හැකි විටෙක බ්‍රිජට් එකට එක කර පළි ගනු ඇත.

## 14

සංගීත කාමරයට හදිසියේම මොරියා කඩා වැදීම ගැන මොරීන් තරමක් බියට පත්ව සිටියා. මොරියා පිටව ගිය පසු යාබද කාමරයෙන් ඇසුණ කෝපයෙන් කෑ ගසන දබරය ඇසුණාට පසුව ඇ තවත් බියට පත් වුණා. මොරීන් ඉතා සුළු දේවලින් පවා භීතියට පත් වුණා. සංගීත කාමරයෙන් එළියට පැන ගත් ඈ ඇඳුම් මෝස්තරවල අවසාන නිර්මාණයන් කිරීමට පන්ති කාමරයට ගියා. එම හැන්දෑවේ ඈ ඒවා අනෙක් අයට පෙන්වීමට සූදානම්ව සිටියා.

පද රචනා හා තනු රචනා කොළ රාශියක් හා මෝස්තර නිර්මාණ රාශියක් ද සමග ඇය පොදු කාමරයට එන විට ග්වේන්ගේ ඇඹුල් වූ මුහුණ ඈ දුටුවා. ඔහ්, මොරීන් හුඟක් මහන්සි වෙලා. මම්සලී හෝ ජේම්ස් ගුරුතුමිය ඇය කොතරම් වෙහෙසී වැඩ කර තිබුණේ ද දැක්කේ නම් ඔවුන් මවිතයට පත් වන්නට ඉඩ තිබුණා. ඒ දෙදෙනාම මොරීන්ට උනන්දුවෙන් වැඩ කිරීමට උනන්දුවක් ඇති බව දැක තිබුණේ නැහැ.

"මැසිලි මැනර්වල මොනවා උගන්වනවාද කියලා මට නම් හිතාගන්න බැහැ." ජේම්ස් ගුරුතුමිය මොරීන්ගේ වැඩවල හරි වැරදි බලන අතරම අනෙක් ගුරුවරියන් සමග කිව්වා.

'ස්වයං අගය කිරීම, ස්වයං උත්සාහය, ස්වයං වැලපීම' පහ පන්තියට එක් පාඩමක් පමණක් කරන විලියම්ස් ගුරුතුමිය මොරීන්ගේ වැඩ ගැන ඇඩිව කලකිරී මුමුණන්නට වුණා.

"ඒත් ස්වයං පාලනයක් නැහැ." ජේම්ස් ගුරුතුමිය කිව්වා. "මොන ඉස්කෝලයක්ද? ඒක වහපු එකමයි හොඳ...!"

ග්වේන් හා කැතරින් අනෙක් අය සැලසුම් කර තිබූ කුමන්ත්‍රණය ගැන දැන නොතිබූ නිසා තැකීමකින් තොරව සිටි අතර අනෙක් ඇරියෝ තැති ගැනීමක් නොපෙන්වුව ද ඔවුන් මොරීන්ගේ පැමිණීම උනන්දුවෙන් බලා සිටියා. මොරීන් සතුටින් ඉපිලී වටපිට බැලුවා.

"ඇන් ඔයාලට යමක් බලා ගන්න පුළුවන්." සතුටින් කී ඈ ඇගේ සුපුරුදු අනුවණ සිනාව නැඟුවා. "මැසිලි මැනර්වලදී නිතර කියපු දෙයක් තමයි මම හැමදේකටම දක්ෂ කෙනෙක් කියලා. මම කයිවාරු ගහනවා කියලා හිතන්න එපා, හොඳද? ඒත් අවංකවම, මම එහෙම කිව්වාට මට හුඟක් දේවල් කරන්න පුළුවන්."

සමහර දැරියන් ඉතා විනෝදයෙන් සිනාසෙනු අසා මොරීන් පුදුමයට පත් වුණා.

"ඔයා හරි විහිළුකාරියක්, මොරීන්." ඇලිසියා ප්‍රශංසනාත්මක ස්වරයකින් කිව්වා. "හැම තිස්සෙම හිනා යන දේවල් කියනවා."

මෙය මොරීන්ට අලුත් අදහසක් වුණා. කිසිවෙක් මින් පෙර ඇය හාස්‍යජනක බව කියා තිබුණේ නැහැ. ඈ එක්වරම ඇගේ පුරාජේරුව පටන් ගත්තා.

"ඇන්, මුලින්ම මම ඔයාලට මෝස්තර ටිකක් පෙන්වන්නම්. මේක සින්ඩෙරෙල්ලා සාදයට අඳින ඇඳුම. ඔයාලට පෙනෙනවා ඇති, මට දාසය වෙනි ශත වර්ෂයට යන්න සිද්ධ වුණා."



සෑම කෙනෙක්ම යටිගිරියෙන් සිනාසෙන හඬක් ඇසුණා.

"මිල කරන්න බැහැ." ඩැරල් කඳුළු පිස දමන බවක් බොරුවට අඟවමින් කිව්වා. "ඔයා කොහොමද මේ වගේ දෙයක් හිතුවේ, මොරීන්?"

"හිනා යන වැඩක්." මෙල්විස් කිව්වේ දුර්වල ලෙස වර්ණ ගැන්වූ දළ රූප සටහන ඔසවා පෙන්වමින්. "හරිම විහිළුවක්...! මම දැනගෙන හිටියේ නැහැ ඔයා මේ වගේ විකට වැඩවලට දක්ෂයි කියලා, මොරීන්."

මොරීන්ට මෙය ප්‍රහේලිකාවක් වුණා. මෙම නිර්මාණ හාස්‍යජනක වනු ඇතැයි ඇයට සියුම් අදහසක් හෝ තිබුණේ නැහැ. ඒවා ඉතා ලස්සන යැයි ඇය සිතා සිටියා. ඇ වහාම ඊළඟ පින්තූරය ගත්තා. එහෙත් ඇයට වඩා ඉක්මන් වූ දැරියෝ එය උදුරා ගත්තා. අනෙකුත් කොළ ද ඒ සමග ඇද ගත් දැරියෝ එකිනෙකා ඒවා දෙස බලමින් පොළොවේ අඩි හප්පමින් මොර දී සිනාසෙන්නට වුණා.

"මේ බලන්නකෝ මේක...! මේ වගේ විකට රූපයක් මම ජීවිතේ කවදාවත් දැකලා නැහැ."

"මේක නම් හිතට කාවදිනවා. මේ... මේ.. බලන්න. ආදිපාදවරයාගේ මුහුණ...! මොකක්ද එයා මේ ඇඳගෙන ඉන්න ඇඳුම?"

"මේකත් මිල කරන්න බැහැ. අපොයි.... මොරීන්, මේ තරම් විහිළුකාරියක් වුණේ කොහොමද?"

ඉන් අනතුරුව අයිරින් අතට ගත්තේ තනු ලියා තිබුණු කොළ කීපයක්.

"බලාගන්න....! මෙන්න තනු තියෙනවා. මොරීන් ලියපු මේවාත් මිල කරන්න බැරිව ඇති. මම ඒවා වාදනය කරලා පෙන්වන්නම්."

පොදු කාමරයේ පියානෝව වෙත ගිය ඇ විකට පෙනුමක් මවා ගෙන එම තනු වාදනය කළේ ඒවා රචනා කර තිබූ ආකාරයටත් වඩා ඉතා අනුවණ තාලයක් වන අයුරිනුයි. සෑම දෙනාම සිනාසෙමින් පියානෝව වටා රොක් වුණා.

"මොරීන් හරිම විකට වැඩ කරන ළමයෙක් නේද? විකාර පින්තූර අඳිනවා වගේම හිනා යන තනුත් හදන්න පුළුවන්."

මොරීන්ට මහත් භීතියක් ඇතෙන්නට වුණා. ඇරියෝ සියලු දෙනා මේ ගැන උනන්දුවක් දක්වනවාද? ඒ වගේ තමයි පෙනෙන්නේ. ඇත්තටම... ඇත්තටම... මේ වටිනා නිර්මාණ හාස්‍යජනක වන තරම්ම නරක ද? හිතාමතා මේවා හාස්‍යජනක ලෙස නිර්මාණය කර ඇති බව ඔවුන් සිතනවා විය හැකි බව ඈ අවසානයේ තීරණය කළා.

ඈ ග්වේන් දැක ගැනීමට වටපිට බැලුවා. ග්වේන් මෙය තේරුම් ගනු ඇත. තමා ඇඳීමට, සංගීතයට හා ගායනයට කොතරම් දක්ෂ ඇයි යන්න හා මේවා නිර්මාණය කිරීමට කොතරම් මහන්සි වූවේ ඇයි යන්න ග්වේන් දැන සිටියා.

ග්වේන් ඇය දෙස බලා සිටිය ද එම බැල්ම ප්‍රියජනක බැල්මක් වුණේ නැහැ. එය ජයග්‍රාහී බැල්මක් වූ අතර ඉන් යමක් කියවෙන බව පෙනුණා.

'අහා... උඩඟුකම විනාශයට මුලයි. ළමයා... ලොකු විනාශයක්...!' එය කතා කරන බැල්මක් වුණා. 'මේ ගැන මට හුඟක් සතුටුයි. උඹට හොඳ වැඩේ.'

මොරීන් කම්පනයට පත් වුණා. හඬ නගා සිනාසුන ග්වේන් අනෙක් අය සමග එකතු වුණා.

"හරිම විහිළුවක්...! මිල කරන්න බැහැ මොරීන්. කවුද හිතුවේ ඔයා ඒ තරම් විහිළුකාරියක් කියලා?"

"දැන් ගායනා කරන්න." කී මෙල්විස් ඇගේ අතට ගීතයක් දුන්නා. "අපි අහලා බලමු. ඔයාට තියෙන්නේ පුදුමාකාර කටහඬක් නේද? හොඳට පුහුණු කරපු කටහඬක්. මම හිතන්නේ ඒක ඔයාට ලොකු සතුටක්. ඔය සිංදුව කියන්න."

මොරීන් එය ප්‍රතික්ෂේප කරන්නට තරම් එඩිතර වුණේ නැහැ. බොඳ වූ දෙනෙතින් සංගීත තනුව දෙස බැලූ ඈ ගායනය ආරම්භ කළා. ඇගේ උස් හඬ සුපුරුදු ලෙසටත් වඩා තාලයෙන් පිට ගියා. එමෙන්ම නැවතත් ඇරියෝ සතුටින් කෑ ගසන්නටත්, සිනාසෙන්නටත් වූ නිසා ඇගේ කටහඬ වෙවුලුවා.

"හා...! හා...! අහගන්න. එයාට දෙන්න නාට්‍යයේ විකට චරිතයක් නැද්ද, ඩැරල්? ගායනා කරන කොටසක්? වහලයේ උළු බිමට වැටෙයි. මේ වගේ කටහඬක් ඔයාලා අහලා තියෙනවාද?"

මොරීන් ගායනය නැවැත්වූවා. ඇගේ දෙකම්මුල් දිගේ කඳුළු රූරා වැටුණා. ඈ ග්වේන් වෙත බැල්මක් හෙළුවා. ප්‍රශංසනාත්මක වචනයක් හෝ අයදින අවාසනාවන්ත බැල්මක්. එහෙත් කිසිදු වචනයක් පිට වූවේ නැහැ.

කාමරයෙන් පිටව යාමට ඈ හැරුණා. කැතරින් ඇය පසුපසින් දුව ගියා.

"මොරීන්, ඔයා ඒක ගණන් ගන්න එපා. ළමයි හිතලා නෙමෙයි එහෙම කළේ...?"

"හිතලාමයි කළේ." ඩැරල් හුස්මක් පිට කරන අතරේ සෙමින් කිව්වා. "අපි කරුණාවන්ත වෙන්නේ නැති නපුරු අය කියලා කැතරින් කියයි."

"මාව අල්ලන්න එපා...!" මොරීන් කෑ ගැසුවා. "කැතරින් සාන්තුවරිය... අනිත් අය එක්ක මට හිනාවෙලා දැන් එනවා බොරු සාන්තකම් පෙන්වන්න...! හෝ... සාන්තුවරිය...!"

කැතරින් ආපසු ඇකිළී ගියේ ඇගේ කම්මුල හරහා පාරක් වැදුණ කලක මෙන්නුයි. ග්වේන් හැර කිසිවෙක් සිනාවක් පෑවේ නැහැ. මේරි ලේව් දුකට පත් බවක් පළ කළා. ඇයට මෙවැනි සිද්ධීන් දරාගත නොහැකි වුණා. විල් උනන්දුවකින් තොරව බලා සිටියා. ඈ නැගී සිටියා.

"හොඳයි, මම අශ්වයා පදින්න යනවා." ඈ කිව්වා. "හවස් වරුවේ තවත් පැය භාගයක් ඉතිරිවෙලා තියෙනවා. එනවාද ක්ලැරිසා?"

විල්ගේ දරදඬු මෙන්ම බැරෑරුම් කටහඬ ඇසුණ අනෙක් දැරියන්ට වඩාත් සාමාන්‍ය බවක් දැනුණා. විල් හා ක්ලැරිසා කාමරයෙන් පිටව යනු ඔවුන් බලා සිටියා.

"හොඳයි, මම හිතන්නේ නැහැ අපි බලාපොරොත්තු වුණ තරමට ඒක ඒ තරම් සාර්ථකයි කියලා." සැලී කිව්වා. "ඇත්තටම මට ටිකක් පහත් බවක් දැනෙනවා."

"ඒකෙන් එයාට ලොකු හානියක් වෙන්නේ නැහැ." ග්වේන් ආඩම්බර ස්වරයකින් කිව්වා. "එයා හුඟක් ලොකුවට හිතාගෙන ඉන්නේ. මට හිතාගෙන ඉන්න බැහැ එයා පසුගිය දවස්වල මගේ ඇගේම එල්ලිලා හිටියේ ඇයි කියලා."

ඇලිසියාට මෙය රිස්සුවේ නැහැ.

"එක ජාතියේ අය එකට එකතු වෙනවා, ග්වේන් බබෝ." ඈ කිව්වා. "ඔයයි මොරිනුයි හරියටම එක නැට්ටේ ගෙඩි දෙකක් වගේ. ඔයාලා දෙන්නා එකට ඉන්නවා දකිද්දි ඒක හරි ලස්සනයි."

"ඔයා කියන්නේ බොරු, ඇලිසියා." සිත රිදී මොහොතක් නිහඬව සිටි ග්වේන් කිව්වා. "අපි එක වාගේ නැහැ. ඔයා වෙනදා වගේ බොරුවට කියවනවා."

"හිතලා බලන්න, හුරතල් ගොන්ඩොලින් මේරි." ඇලිසියා ඇයට අවවාද කළා. "ඔයා ඔයාලගේ වැඩකට නැති පවුල ගැනයි, එයාලගේ දේවල් ගැනයි දොඩවනවාද? මොරිනුත් කරන්නේ ඒකමයි. නාට්‍යයේ සින්ඩෙරෙල්ලාට ඔයා හැර මේ ලෝකයේ වෙන කෙනෙක් ගැළපෙන්නේ නැහැ කියලා ඔයා හිතනවාද? මොරිනුත් හිතන්නේ එහෙම...!"

දුන්නක් මෙන් හදිසියේම නැගිට ගත් ග්වේන් මොරියා වෙතට ඇඟිල්ල දිගු කළා.

"ඔහ්...! දවසක් මම කොණ්ඩය කඩා ගෙන තුවායක් ඉණ වටේ ඔතාගෙන නිදන කාමරයේ ඉන්නව දැක්ක හින්දා ඔයා ඒක හැමතැනම කිය කියා ගියා, මම සින්ඩෙරෙල්ලා වෙන්න හදනවා කියලා...!"

"හරි, මට ඒක තේරුම් ගන්න බැරි වුණා, දවසක් මම මොරිනුත් ඒකම කරනවා අල්ලා ගන්නා තුරු." මොරියා කිව්වා. "ඔයාලා දෙන්නාම කර කර හිටියේ එකම දේ. කොණ්ඩෙ කඩාගෙන, රෙදි පටලවා ගෙන පිස්සුවෙන් වගේ...! ඇලිසියා හරියටම හරි. ඔයාලා දෙන්නාම එක නැට්ටේ ගෙඩි වගේ. ඔයාලා යාළුවෝ වෙන්නම ඕනෑ. ඔයාලා හරියට අක්කයි, නංගියි වගේ. තවත් කියනවා නම් නිවුන්නියෝ වගේ."

"ඒත්, මම මොරීන්ට කැමති නැහැ." ග්වේන් තරහින් කෑ ගසා කිව්වා.

"ඒ ගැන මම පුදුම වෙන්නේ නැහැ." සම්පූර්ණ තේරුම අඩංගු වූ ඉතා මෘදු ස්වරයකින් ඇලිසියා කිව්වා. "ඔයා දන්නවා එයා

කොයි වගේ ද කියලා, නේද? ඔයාලා පෙනෙන්නේ නිවුන්නියෝ වගේමයි...!"

ග්වේන් නාසයෙන් පිඹිමින් බර අඩි තබා පිටතට ගියා. ඩැරල් පැන්සලෙන් මේසයට තට්ටු කළා.

"මම මේ දේවල් ගැන ඒ තරම් සතුටු වෙන්නේ නැහැ." ඈ සිහින් හඬින් කිව්වා. "හුඟක් කුඩුකේඩුකම්, නපුරුකම්...!"

ග්වේන් හදිසියේම දොරින් හිස පොවා මොරියාව ඇමතුවා.

"මා ගැනයි, මොරීන් ගැනයි පන්තිය ඉස්සරහා කියපු දේවලට මම එකට එක කරනවා." ඈ කිව්වා. "බලාගන්න... පන්ති නායිකාව වුණත් නැතත් මම පළිය ගන්නවා...!"

මොරියා රවා බැලූ අතර බෙලින්ඩාගේ අත ඉබේටම පැන්සල වෙත ගියා. හරිම අපූරු එරවිල්ලක්...! එහෙත් අවවාදාත්මක බැල්මක් හෙළූ ඩැරල් පැන්සල උදුරා ගත්තා.

"දැන් නොවෙයි." ඈ කිව්වා. "අද හවස මේ කාමරයේ සිද්ධ වුණ දේවල් හොඳටම ඇති."

"හා... හොඳයි, ඩැරල් සාන්තුවරිය...!" බෙලින්ඩා කී අතර ඩැරල්ට සිනා පහළ වුණා.

මොරියා ඇය වෙතට ආවා.

"අපි මාතෘකාව වෙනස් කරමු." ඈ කිව්වා. "කොහොමද ක්‍රීඩා තරග? ඔයා තෝරා ගත්ත පොඩි අය ගැන බලමු...!"

ඩැරල් ලැයිස්තුව පිටතට ගත්තා. පන්ති නායිකාව ලෙස පහ පන්තිය ක්‍රීඩා තරග සඳහා උනන්දු වූවා මෙන්ම ඇය ක්‍රීඩාවලට ඇලුම් කළ නිසා පහළ පන්තිවල තරග ගැන ද ඈ උනන්දුවක් දැක්වූවා. බොහෝ විට ඩැරල් හා ඇය එකඟතාවයට පැමිණි එකම දෙය එය වුණා. එක් එක් ක්‍රීඩිකාව අනෙක් අය සමග සසඳමින් ඔවුන් ඉක්මනින් ගැඹුරු සාකච්ඡාවකට වැටුණා.

"මේක වෙල්ස්බරෝ එක්ක තියෙන තරගය." ඩැරල් කිව්වා. "මේ සතියේ තරගය. මම කියන්නේ, අපේ හතර පන්තිය, වෙල්ස්බරෝ හතර පන්ති එක්ක සෙල්ලම් කරනවා. මෙම පොඩි සූසන්ව තෝරා

ගත්තා. ඒ වගේම මම කැමතියි අපේ නංගිවත් ගන්න. මොනවාද ඔයා හිතන්නේ, මොරියා?"

"දෙවියනේ... ඒක හරි." මොරියා කිව්වා. "එයා ඇත්තටම නොම්මර එකයි. සුපිරි...! එයා දුවන්නේ හුළඟ වගේ. එක බෝලයක් අත හරින්නේ නැහැ. එයා හොඳටම පුහුණුවීම් කරනවා...!"

"ඒක ඇත්ත." ඩැරල් කිව්වා. "මම ටිකක් අදිමදි කළේ මොකද, එයා මගේ නංගී. මට ටිකක් සැක හිතුණා ඒක පැත්තකට ඇද්දා වගේ පෙනෙයිද කියලා. දන්නවානේ..."

"විකාර...!" මොරියා කිව්වා. "කණ්ඩායමට හොඳම ළමයි තෝරා ගත්තේ නැති නම් ඔයා වැඩකට නැති නායිකාවක් කියලා පෙනෙයි. අනික ෆෙලිසිටිව දාන්න කියලා මමත් බල කරනවා."

ඩැරල් සිනාසුනා. ඈ සතුටට පත් වුණා.

"ඕ... ඒක හරි. එහෙනම් ඔයාගේ බල කිරීම හින්දා." කී ඈ ෆෙලිසිටිගේ නම ද ලිව්වා. "අපොයි... එයා සතුටු වෙයි."

"කොහොමද ජූන්, හැඩ ගැහෙනවාද?" ඇලිසියා හඬ නගා ඇසුවා. "මම මේ ළඟදී දවසක දැක්කා එයා පුහුණු වෙනවා. වෙනස් වෙන්න හදනවා කියලා ඔයාට හිතෙනවාද?"

"හොඳයි, ඒ තරම්ම නැහැ." ඩැරල් කිව්වා. "මම කියන්නේ, එයා හුඟක් පුහුණු වෙනවා. ඒත් මම එයාව පුහුණු කරද්දී කිසිම ගණනකට ගන්නේ නැහැ. ස්තුතියි කියන්නේවත් නැති වුණාට එකට එක කියන්න එනවා. මට තවම එයාව කණ්ඩායමට දාන්න බැහැ. එයාට තවම කණ්ඩායම් හැඟීම ගැන තේරුමක් නැහැ. දන්නවානේ, තනි ඕනෑකමට සෙල්ලම් කළාට, කණ්ඩායම ගැන හිතලා නොවෙයි."

"ඔව්, ඔයා හරි." මොරියා කිව්වා. "මමත් ඒක දැක්කා. තමන්ගේ ආත්මාර්ථකාමී බව අතහැර ගන්න බැරි කෙනෙක්ව කණ්ඩායමට ගන්න බැහැ."

ඩැරල් කුතුහලයෙන් මොරියා දෙස හදිසි බැල්මක් හෙළුවා. අනෙකුත් කටයුතුවලදී මෙන් නොව මෙම ක්‍රීඩා සම්බන්ධ ප්‍රශ්නයේදී මොරියා කොතරම් අපූරු ද? අනෙක් දේවලට වඩා බොහෝ වෙනස් ලෙස ඇය සාධාරණව හා උනන්දුවෙන් මෙහිදී කටයුතු කළා. අන් අය

පාලනය කිරීම අමතක වූ ඈ අදහස් දක්වන්නට වුණා. ඇය පන්තිනායිකාව නොවී, එය වෙන කෙනෙකුට පැවරුවා නම්, ඇයට අනෙක් දේවල් ගැන කොතරම් උනන්දුවෙන් වැඩ කරන්න තිබුණාද?

"ඔයාට පුළුවන්ද මේ ලැයිස්තුව ක්‍රීඩා දැන්වීම් පුවරුවට දාන්න." ඈ මොරියාගෙන් ඇසුවා. "මට කරන්න තව වැඩ හුඟක් ගොඩ ගැහිලා."

මොරියා ලැයිස්තුව ගනිත්ම කැතරින් එය ගැනීමට පැනගෙන දුව ආවා.

"මම ඒක කරන්නම්." නිතර අනුන්ගේ සේවයට කැප වූ කෙනා තමා බව සිතමින් දුව ආ කැතරින් කිව්වා.

"නැහැ, එපා කැතරින් සාන්තුවරිය." මොරියා කී අතර කැතරින් ලද අවමානයෙන් රතු වුණා.

ඇය මොරියා වෙනුවෙන් කොතරම් වැඩ කර තිබුණ ද, ඇයට කොතරම් හිතවත්ව ඉඳ තිබුණ ද, ඇගේ උරහිස මත තිබූ බූරු වැඩ කොතරම් සැහැල්ලු කර තිබුණ ද මොකද්ද අවසානයේ ලැබුණේ? අවඥා සහගත පිළිකුල් නමක් 'කැතරින් සාන්තුවරිය'. ඈ හදිසියේම මොරියා දෙස නපුරු බැල්මක් හෙළුවා.

ලැයිස්තුව ද සමග මොරියා පිටව ගියා. හතර පන්තියේ ක්‍රීඩිකාවන්ගේ නම් ලැයිස්තුව ඈ දැන්වීම් පුවරුවේ අමුණන විටම කුතුහලයට පත් පළමු පන්තියේ දැරියෝ එය දැක බලා ගැනීමට දුව විත් ඇයව වට කර ගත්තා. ඔවුන් එහි සඳහන් දේ කියවන්නට වුණා. 'වෙල්ස්බරෝ පාසල හා තරගය' මුලින්ම එහි සඳහන් වුණා.

"ෆෙලිසිටි....! ඔයා ඉන්නවා. ඔයාගේ නම තියෙනවා."

කවුරුන් හෝ කෑ ගැසුවා. ෆෙලිසිටිගේ මුහුණ සතුටින් බැබළුණා.

"සූසන්ගේ නමත් තියෙනවා. ඒත්... ජූන්, ඔයාගේ නම නැහැ." තවත් කෙනෙක් කිව්වා. "බලන්නකෝ, ඔයා මේ දවස්වල හුඟක් මහන්සිවෙලා පුහුණු වෙනවා. හරිම ලැජ්ජාවක්...!"

"ඉතින්, ඒක පුදුම වෙන්න දෙයක් නොවෙයි. ඩැරල් අනිවාර්යයෙන්ම එයාගේ නංගිව දා ගන්නවා." ජූන්ගේ කටහඬ ඇසුණා.

ඇය තදින් කලකිරීමට පත්ව සිටිය ද ඈ තම සුපුරුදු විනෝදාත්මක ස්වරයෙන් කතා කළා. මොරියාට මෙය ඇසුණා.

"ජූන්...! ඇත්මම සමාව ගන්න ඕනෑ. ඩැරල් කොහෙත්ම පැත්තකට ඇදලා නැහැ. එයා ෆෙලිසිටි නොදා ඉන්න වගේ හිටියේ. මමයි බල කළේ එයාව දාන්න කියලා. ඇත්ම සමාව ගන්න...!"

"හරි..." ජූන් දඹරකාරී ලෙස වාද කරන්න පටන් ගත් නමුත් මොරියා බල කළා.

"මම කිව්වේ සමාව ගන්න....! තේරුණා ද...? මම කියපු දේ කරන්න."

"මම සමාව ඉල්ලනවා." ජූන් බුම්මාගෙන කිව්වා. "ඒත්, ඕනෑම ඔට්ටුවක්, ඔයා තමයි මාව ඉවත් කරන්න ඇත්තේ...!"

"මම කිව්වා ඩැරල්ට, කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා නොකරන ඕනෑම කෙනෙක් අයින් කරන්න කියලා. ඔයා හැඩ ගැහෙන්නේ නැහැ. ඔයා පුහුණු වෙනවා, පුහුණු වෙනවා. ඒත් තරගයකදී ඔයා කරන්නේ ඔයාට ඕනෑ විදිහට සෙල්ලම් කරන එක. ඒකෙන් අනිත් අය අමාරුවේ වැටෙනවා...! හොඳ ක්‍රීඩිකාවක් එහෙම නැහැ. ඒ ගැන හිතන්න ජූන්...!"

තමා අවංකව කතා කිරීම ගැන පළමු පන්තියේ දැරියන් කුමක් සිතනු ඇතිදැයි නොතකා ඈ එතැනින් යන්නට ගියා. ජූන් කිසිවක් කිව්වේ නැහැ. ඇය තරමක් අසාමාන්‍ය බැල්මෙන් යුතු බව සූසන්ට සිතුණා. ඈ ජූන් වෙතට ගියා.

"අපි ඉස්සරහා එහෙම කතා කළ එක නරකයි." ඈ පටන් ගත්තා. "එයාට තිබුණේ...."

"ඒකට මොකද...?" නැවතත් විනෝදකාමී බවක් පෙන්වමින් ජූන් කිව්වා. "ඔයා හිතනවාද මම මොරියාවත්, ඩැරල්වත් නැතිනම් ඇලිසියාවත් තුට්ටුවකට ගණන් ගන්නවා කියලා? උඩගු, පහේ පන්තියේ අය කියන කිසිම දෙයක්...?"

## 15

**නා**ට්‍යයේ චරිත බෙදා දීමට හා පුහුණු වීම් සඳහා වේලාව යොදා ගැනීම සඳහා සාකච්ඡාවකට මහා සභාවක් කැඳවා තිබුණා. පහ පන්තියේ සියලු දෙනා උතුරු කුලුනේ පොදු කාමරයේ රැස්වීමට සහභාගී වුණා.

රැස්වීම ආරම්භ වුණා. නාට්‍ය හා එහි චරිත පිළිබඳ විස්තරයක් ගෙන ඒමට ඩැරල්ට ආරාධනා කෙරුණා. එමෙන්ම ඇයට පළමු දර්ශනය කියවන ලෙස ද ඉල්ලීමක් කෙරුණා.

තරමක් ආවේගයෙන් හා චකිතයෙන් යුතුව ඈ අසා සිටින පහ පන්තියට මුද්‍රා නාට්‍යයක් යනු කුමක් දැයි ලුහුඬුව පැහැදිලි කළා. ඔවුන් මහත් ඕනෑකමින් සවන් දී සිටියා. එය ඉතා හොඳ දෙයක් ලෙස පෙනුණා.

අනතුරුව මඳක් ගොත ගසමින් ඩැරල් මුද්‍රා නාට්‍යයේ පළමු දර්ශනය කියෙව්වා. පළමුව වේදිකා පසුබිම හා දෙබස් ද ගීත ද ඇය ලියා තිබූ පරිදිම ඈ කියෙව්වා. ඇය කියවාගෙන යන විට ඇඩි නිහඬතාවයක් ඇති වුණා.

"ඒක පළමු දර්ශනයේ අවසානය." තම අසන්නන්ගේ සිත් ඇද බැඳ ගත්තේ දැයි සැකයෙන් යුතුව මඳක් ලැජ්ජාශීලීව අඩක් දෙනෙත් විවර කර ඔවුන් දෙස බලමින් ඇය කිව්වා.

තත්පරයක් ගත වන්නට පෙර ඇගේ සැක දුරු කරමින් ප්‍රතිචාර නැගුණා. පොළොවේ අඩි හප්පා අත්පොළසන් දුන් දැරියෝ එකිනෙකා සමග කතා කරමින් සතුට පළ කළා. ඇඩි සතුටට පත් ඩැරල් රත් වූ අතර නළලට ඉනූ දහදිය පිස ගැනීමට ඇයට සිදු වුණා.

මොරියා නිශ්ශබ්දතාවය ඉල්ලා මේසයට තඩි බෑවා.

"හොඳයි, ඔයාලට පෙනෙනවා ඩැරල් හා සැලී එකතුව මොන තරම් හොඳ නාට්‍යයක් නිර්මාණය කරලා තියෙනවාද කියලා." මොරියා කිව්වා. "හුඟක් හරිය කළේ ඩැරල්. ඒත් සැලී අපූරු

සහයෝගයක් දුන්නා. මේක අපි හරියට ඉදිරිපත් කළොත්, ඔයාලට පෙනෙනවා අපිට ඉස්කෝලය හොල්ලන්න පුළුවන්."

"කවුද මේක මෙහෙයවන්නේ?" බෙටී හඬ නගා ඇසුවා.

"මම..." ක්ෂණයෙන් මොරියා කිව්වා. "විරෝධයක් තියෙනවද?"

සැක මුසු බැල්මෙන් යුතු මුහුණු රාශියක් තිබුණා. කිසිවෙක් මුද්‍රා නාට්‍යයක් නිපදවීමේ මොරියාට ඇති හැකියාව සැකයට භාජනය කළේ නැහැ. එහෙත් ඔවුන්ට තිබුණේ ඇය අනෙක් අයගෙන් කොතරම් සාර්ථකව වැඩ ගනිවිද යන සැකයයි. දක්ෂ අයගෙන් වැඩ ගැනීමට ඇයට දක්ෂතාවයක් තිබුණේ නැති බව කාටත් පැහැදිලිව පෙනුණා. ඇය නිතරම කර තිබුණේ දක්ෂතාවයක් ඇති අය ඇයට එරෙහි කර ගැනීමයි.

"මම හිතන්නේ මේ වැඩේට දෙන්නෙක් හිටියොත් හොඳයි කියලා." කවුරු හෝ කිව්වා.

"ඒක හරි." මොරියා ක්ෂණිකව කිව්වා.

ඒ අතර තමා සිටින තාක් කල් තව කොතරම් පිරිසක් පැමිණිය ද ඇයට එය බාධාවක් ලෙස පෙනුණේ නැහැ. මෙය මෙහෙය වන එකම කෙනා තමා යන සිතුවිල්ල ඈ සතු වුණා. ඒ කෙසේ වෙතත් ඈ කතා කළා.

"කවුද තව ඔයාලට ඕනෑ...?"

"බෙටී...! බෙටී...!" පස්වන පන්තියේ හැමෝම වගේ හඬ නැගුවා.

පැහැදිලි ලෙසම එය සැලසුම් කර තිබූ බව පෙනුණා. මොරියා නළල රැළි ගැන්වූවා. ඇලිසියාගේ නිතර සිනාසෙන, සැලකිල්ලක් නැති දක්ෂ මිතුරිය.

"ඔව්... බෙටීවත් ගන්න." ඇලිසියා හදිසියේම කිව්වා.

බෙටී සමග පමණක් තමාට කටයුතු කිරීමට අපහසු වනු ඇතැයි ඇයට හැඟුණා. එහෙත් නාට්‍ය නිෂ්පාදිකාවන් දෙදෙනෙකු සිටී නම් එය පහසු වනු ඇතැයි ඈ සිතුවා. එවිට සතුටින් වැඩ කර ගැනීමට හැකි වනු ඇත. ගැටලුවක් ඇති වූ විට පහසුවෙන් ඇයට නිතර බෙටීගෙන් උපදෙස් ගත හැක.

සිනාමුසුව වටයක් කැරකී බැලූ බෙටී කමිටුව සඳහා අසුනකට පැමිණ වාඩි වුණා.

“ස්තුතියි...!” ඈ කිව්වා. “මම හොඳින් වැඩ කරන්න පොරොන්දු වෙනවා.”

“දැන් තියෙන්නේ චරිත තෝරා ගැනීම.” මොරියා කිව්වා. “අපි දැනටමත් ඒ සම්බන්ධව කටයුතු සෑහෙන දුරට කරලයි තියෙන්නේ. මම ඒක කියවන්නම්.”

ගොන්ඩොලින් හා මොරීන් හුස්ම ඉහළට ඇද ගත්තා. සින්ඩෙරෙල්ලා වීමේ අවස්ථාවක් තියේවි ද? එහෙම නැති නම් සුරංගනා දේව මාතාව හෝ කුමාරයාගේ චරිතය?

මොරියා චරිත ඇතුළත් ලැයිස්තුව කියෙව්වා.

“සින්ඩෙරෙල්ලා - මේරි ලෝව්...”

මේරි ලෝව් මුව අයා තද හුස්මක් ඉහළට ඇද්දා. එමෙන්ම ග්වේන් හා මොරීන් ද එයම කළා. මේරි ලෝව් පුදුමයෙන් ද අනෙක් දෙදෙනා කලකිරී, බලාපොරොත්තු කඩවීමෙන් ද එසේ කළා.

“අනේ, මට නම් බැහැ.” මේරි ලෝව් කිව්වා.

“ඔයාට පුළුවන්.” ඩැරල් කිව්වා. “අපට අවශ්‍ය දුක් මුසු පෙනුමක් තියෙන කෙනෙක්. ටිකක් බය වෙලා වගේ ඉන්න කෙනෙක්. ටිකක් බය වෙද්දී ඇස් ලොකු වෙන කෙනෙක්. ඒ වගේම එයාට රඟපාන්නත්, ටිකක් හොඳට ගීත ගයන්නත් පුළුවන් වෙන්න ඕනෑ.”

“එහෙනම් ඔයා ඒ චරිතයට හරියටම ගැළපෙනවා.” සැලී කිව්වා.

“කුමාරයා - මෙල්විස්.” මොරියා කිව්වා.

ඒ ගැන ඒ වන විට සෑම කෙනෙක්ම දැන සිටියා. කුමාරයාට ගායනා බොහොමයක් තිබූ අතර මෙල්විස් එය ඉතා අගනා ලෙස කරන බවට කා හටත් විශ්වාසයක් තිබුණා. ඇගේ කටහඬ නැවතත් ඉතා මිහිරිව තිබූ අතර ඩැරල්ගේ පද මාලාවලට අනුව මෙල්විස්ට ගැළපෙන පරිදි අයිරින් ඉතා කදිම තනු රචනා කර තිබුණා. සෑම කෙනෙක්ම අත්පොළසන් දුන්නා.

“ආදිපාදවරයා - විල්.” මොරියා ප්‍රකාශ කරද්දී සතුටු සිනාහඬක් පැතිරුණා.

“අන්න හරි...! කොට කලිසම ඇඳගෙන අශ්වයින්ට කෑ ගහන විල් හරියටම ගැළපෙනවා.” ක්ලැරිසා මහත් සතුටින් කෑ ගැසුවා.

"සුරංගනා දේව මාතාව - ලොයලා." මොරියා කිව්වා.

දකුණු කුලුනේ සිටින සිහින් උස් සිරුරක් ඇති රත්වන් රළි කොණ්ඩයකින් යුතු පැහැදිලි කටහඬක් ඇති ලොයලා දෙස හැමෝම බැලුවා.

"හුරේ...!" තම කුලුනේ කෙනෙකු වැදගත් චරිතයකට තෝරා ගැනීම ගැන ඔවුන් සතුටුව කෑ ගැසුවා.

"කවුද නපුරු සහෝදරියෝ...?" කටහඬක් නැගුණා.

හදිසියේම ගැහෙන්න ගත් ග්වේන්ගේ හදවත කඩා වැටුණා. නපුරු සහෝදරියෝ...! ඒත් සහෝදරියකට ඇයවත් තෝරාගෙන තිබුණොත්? ඇයට කොහෙත්ම එය ඉවසිය නොහැකි වුණා. ඇලිසියා නපුරු ලෙස අවඥා සහගතව තමා දෙස බලා සිටිනු දුටු ඇයට තමාව නිසැකවම තෝරාගෙන ඇතැයි සිතුණා.

ඇයට එය දැරිය නොහැකි වුණා. තමාට එතරම් සනීපයක් නැති බව කියමින් නැගිට ගත් ඈ දොර වෙත ගියා. රැස්වීම අවසාන වන තුරුම ආපසු නොඒමට ඈ හිත හදා ගත්තා.

මොරීන් ද මෙම කාරණය නිසාම තැවුලට පත්වී සිටියා. අවලක්ෂණ, නපුරු සහෝදරියකට තමාව තෝරාගෙන ඇති බව ඇයට සිතුණා. මොරියා ඇගේ හා දත්වලට මීට පෙර ද සිනාසී තිබුණා. අපොයි, ඇයි දත් සකස් කර ගැනීමට ඇයට අවස්ථාවක් පහළ නොවුණේ? තම උඩුතොල පහළට ඇද ගත් ඈ දත් වසා ගැනීමට උත්සාහ කළා.

"නපුරු සහෝදරියෝ - පැටී හා රීටා." මොරියා කියද්දී එය අනුමත කරමින් හදිසි ඝෝෂාවක් ඇති වුණා.

පැටී හා රීටා හාස්‍යජනක ලෙස කැරකී වටපිට බැලුවා. නිවුන්නියන් වූ ඔවුන් සැබවින්ම අවලක්ෂණ අය නොවෙයි. එහෙත් නාසය අකුළා ඇස් විශාල කර කරකවා ඔවුන් නිතර හාස්‍ය ඇති කළා. සැබවින්ම විහිළුකාරියන් වූ ඔවුන්ට හොඳින් රඟපෑමට හැකි නිසා කදිම නපුරු සහෝදරියන් යුවළක් ලෙස දක්ෂකම් දැක්වීමට හැකිවනු ඇත.

"ස්තූතියි, මොරියා...!" රීට හඬ නගා කිව්වා. "ඒක අපිට හරියටම ගැළපෙනවා."

"මායාකාර රජතුමා - ඇලිසියා" මොරියා කී අතර බෙටීගේ

මෙහෙය වීමෙන් නැවතත් එය අනුමත කරමින් සෝෂාවක් නැඟුණා.

ඔවුන් මහත් සේ සතුටට පත් වුණා. සතුටින් ඉපිළුණු මොරියා ප්‍රසන්න බැල්මක් හෙළුවා.

"ඇත්තටම මායාකාරයෙක් වගේ ඇලිසියා වේදිකාවේ විජ්ජා වැඩයි, සර්කස් වැඩයි කරන්නයි යන්නේ." ඈ කිව්වා. "ඒතරම් සාර්ථකව මායාකාර චරිතය කරන්න පුළුවන් වෙන කෙනෙක් ගැන මට හිතාගන්න බැහැ."

නැවතත් අනුමැතිය පළ කරන සෝෂාවක් නැඟුණා. වැඩි ඈතක නොසිටි ජේම්ස් ගුරුතුමිය කුමන දෙයක් සිදුවන්නේ දැයි සැක මුසුව කල්පනා කළා. එය පනස් දහසක් පමණ ප්‍රේක්ෂකයින් පාපන්දු තරගයක් නරඹන කලෙක එන සෝෂාවක් බඳු වුණා.

"හොඳම පිරිසක්...!" කෙනෙක් හඬ නගා කිව්වා. "ඉතිරි ටිකත් කියන්න...!"

"හරි, දැන් අපි එන්නේ සේවක පිරිස සහ රාජ සභාවේ පිරිස තෝරා ගන්න." මොරියා කිව්වා. "ඒ කියන්නේ ඉතිරි අයට. සුළු කොටසක් වුණත් හැම කෙනෙකුටම කරන්න දෙයක් තියෙනවා."

"එතකොට ඩැරල්...?" කටහඬක් නැඟුණා.

"ඩැරල් නාට්‍ය පිටපත ලියලා තියෙනවා. ඒ වගේම එයා නාට්‍ය නිෂ්පාදනයට හවුල් වෙනවා." මොරියා කිව්වා. "සැලීත් උදව් කරනවා. එයාලා නාට්‍යයට නැත්තේ එයාලට හුඟක් වැඩ පැවරෙන නිසයි. අපි විදුලිය සම්බන්ධ දේවල් පොප්ට කියන්නයි යන්නේ. එයා ඒකට හුඟක් කැමති වෙයි."

පාසලේ සෑම ආකාරයකම නඩත්තු කටයුතු භාරව සිටි පුද්ගලයා පොප් වූ අතර මෙවැනි අවස්ථාවකදී ඔහුගේ සේවය මිල කළ නොහැකි වුණා.

"හැමදේම සාර්ථක වෙන පාටයි." විනී හඬ නැගුවා. "කවුරුත් පොප්ට ආදරේ නිසා එයා ඒ වැඩ ටික හරියට කරයි. හොඳයි, කොහොමද පුහුණුවීම?"

"සෑම අඟහරුවාදා හැන්දෑවකම. වැඩිපුර පුහුණුවීම් අවශ්‍ය අයට හැම සිකුරාදා හැන්දෑවකම කරන්න පුළුවන්." මොරියා කිව්වා. "ඒ වගේම තම තමන්ගේ කොටස් හෙට වෙද්දී හැම කෙනෙකුටම

ලැබෙනවා. දෙවියන්ගේ නාමයට, හැම කෙනෙක්ම තමන්ගේ කොටස් හොඳින් කට පාඩම් කර ගන්න. පුළුවන් තරම් ඉක්මනට. පුහුණුවීම් කරන අතරේ කියව කියවා ඉන්න බැහැ. එහෙම වුණොත් හරියට රඟපාන්න ලැබෙන්නේ නැහැ."

"ඔයාට කියන්න අමතක වුණා, අයිරින් සංගීතයත්, බෙලින්ඩා වේදිකා සැරසිලිත්, ජෙනට් ඇඳුම් නිර්මාණයත් කරනවා කියලා." ඩැරල් කිව්වා.

"නැහැ, අමතක වුණේ නැහැ." මොරියා ඉක්මනින් කිව්වා. "මම ඒකට තමයි එන්නේ. කොහොම වුණත් ඒක හැම කෙනෙක්ම දන්නවා. හොඳයි, ඇඳුම් සකස් කර ගන්න එකට කවුරු හරි ජෙනට්ට උදව් කරනවා නම් අපි ඒකට සතුටුයි. මැහුම් වැඩ පුළුවන් ඕනෑම කෙනෙක්ව අපි සාදරයෙන් පිළිගන්නවා. ජෙනට් කියන විදිහට වැඩ කරන්න පුළුවන් නම් එයා එක එක වැඩ කොටස් පවරයි."

අත්පොළොසන් හඬක් නැගුණා. අනතුරුව චකිතයෙන් යුතුව තවත් කතා බහක් ඇති වුණා. මෙය මෙතෙක් කලකට තිබූ හොඳම නාට්‍යය වන්නට යනවා. මෙය මුළු පාසලම කලඹන ආකාරයේ එකක්. මෙය පාසලේ වහල ගැලවී යන තරමට කළ හැකි දෙයක්.

"ළමයිම නාට්‍ය පිටපත, සිංදු, දෙබස් ලියපු නාට්‍යයක් මීට ඉස්සර මේ ඉස්කෝලයේ තිබිලා නැහැ." විනී කිව්වා. "අපොයි... මිස් ග්‍රේලින්ගෙ ඇස් දැන්වත් ඇරෙයි...!"

සීනුවක නාදයක් නැගුණ අතර හැමෝම නිහඬව සිට ගත්තා.

"අපි පුහුණුවීම්වලට එනවා. අපි අපේ කොටස් පාඩම් කරගන්නම්. මෙල්විස්, ගායනා කොහොමද? අත්වැල් ගායනාවලට ඔයා අනිත් අය පුහුණු කරනවද?"

කතා බහ කරමින් හා සිනාසෙමින් සියල්ලෝම තම තමන්ගේ කුලුනු බලා ගියා. සතුටින් සුසුමක් හෙළූ ඩැරල්, සැලී සමග අතිනත පටලවා ගත්තා.

"මේ මගේ ජීවිතේදි කරපු ලොකුම වැඩය, සැලී." ඈ කිව්වා. "ඔයා දන්නවානේ, කවදා හරි දවසක මමත් හොඳ ලේඛිකාවක් වෙයි කියලා මට හිතෙනවා."

# 16

වෙල්ස්බරෝ පාසල සමග පැවැත්වෙන තරගය සඳහා දිනය එළඹි අතර එය ඔක්තෝබර් මාසයේ දීප්තිමත් පැහැදිලි දවසක් වුණා. ක්‍රීඩා පිටිය වටා ගස් රතු, කහ හා දුඹුරු වැනි ග්‍රීස්ම සෘතුවේ පැහැයන්ගෙන් බැබළුණා. මුහුදින් හමා ආ මඳ සුළඟ ලුණු මිශ්‍ර නැවුම් බවක් ගත්තා. එදින උදේම නැගිට ගත් දැරියෝ ජනේලවලින් පිටත බලා සතුටට පත් වුණා. මෙවැනි දිනයක මැලෝරි ටවර්ස් කදිම තැනක් වුණා.

දෙක පසු වී විනාඩි විස්සකින් වෙල්ස්බරෝ දැරියෝ ඔවුන්ගේ විශාල බස් රථයෙන් පැමිණියා. ඔවුන් මැලෝරි ටවර්ස් දැරියන්ට වඩා තරමක් වැඩිමහලු බවක් පෙනුණ අතර උසින් මහතින් ද වැඩි ඇති බව පෙනුණා. මැලෝරි ටවර්ස් දැරියන්ට තරමක චකිතයක් දැනුණා. කණ්ඩායම් නායිකාවෝ දෙදෙන අතර කණ්ඩායම් දෙකම හිස සලා මඳ සිනා පෑවා.

ක්‍රීඩා ගුරුතුමිය නළාව පිම්බ අතර, ක්‍රීඩිකාවෝ ඇය වටා රොක් වුණා. නායිකාවෝ කාසියේ වාසිය උරගා බැලුවා. කණ්ඩායම් දෙකම පිටියේ ස්ථාන ගත වුණා. ෆෙලිසිටි ලැක්රෝස් පිත්ත ඇඩ්ව අල්ලා ගත්තේ එසේ නොකළහොත් එය ඇගේ අතින් ගිලිහී යනු ඇතැයි සිතූ කලක මෙනි. ඇගේ මුහුණට ආ බැල්ම තරමක භයානක බැරෑරුම් බවක් ගත් අතර එය දුටු අයට සිනා පහළ වුණා.

ඇගේ දණහිස් මඳක් සලිත වුණා. අනෙක් අයට එය නොපෙනේවා යැයි ඇ ප්‍රාර්ථනා කළා. මෙවැනි තරගයකදී එතරම් සසල වීම ඉතා අනුචණ දෙයක්. මේ නොසැලී සිටිය යුතු වේලාවයි.

"මගේ සුබ පැතුම්." වැඩි දුරක නොසිටි සූසන් කිව්වා. "ගෝලයක් ගන්න."

ෆෙලිසිටි කිසිවක් නොකීව ද තවමත් ඇගේ මුහුණේ තිබුණේ බියට පත් වූ පෙනුමක්.

ඩැරල්, මොරියා හා සැලී එක්ව වාඩි වී තරගය නරඹමින් සිටියා. මෙම තරගය ගැන උනන්දු වූ හා ක්‍රීඩිකාවන් පුහුණුවට සහාය වූ බොහෝ දැරියන් සමග පහ පන්තියේ බොහෝ දැරියෝ එහි සිටියා. අනෙක් පන්තිවලින් පැමිණි ඉතා සුළු පිරිසක දැරියෝ ද එහි සිටියා. වෙල්ස්බරෝ ක්‍රීඩිකාවෝ ඕනෑම පාසලක කණ්ඩායම් පිටියෙන් ඉවතට යවන ඉතා අගනා කණ්ඩායමක් බවට ප්‍රකටව තිබුණා.

"ඔයාගේ නංගී නම් තරහින් ඉන්නවා වගේ." සැලී ඩැරල්ට කිව්වා. "අර... එයා දිහා බලන්න. එයා දිනන්නම ලෑස්ති වෙලා ඉන්නේ."

තරගය ආරම්භ වුණා. බෝලය වේගයෙන් පිටිය හරහා ඇදී යද්දී දැරියෝ ඒ පසුපස දිව ගියා. ඔවුන් බෝලය තම ඇල් සහිත පිතිවලින් ඔසවා උඩ දමමින්, වීසි කරමින්, එකිනෙකා හා හැපෙමින් එකම පොරයක වැටී සිටිද්දී නරඹන පිරිස යටිගිරියෙන් කෑ ගසමින් තැති ගැනීමෙන් යුතුව ක්‍රීඩිකාවන් තව තවත් දිරිමත් කරන්නට වුණා.

පළමු ගෝලය ලබා ගත්තේ වෙල්ස්බරෝ කණ්ඩායමයි. කිසිසේත් නවතා ගත නොහැකි ලෙස පන්දුව කෙළින්ම ගෝලය වෙත ඇදී ගියා. දොළොස් වියැති වූ ගෝල රකින්නිය හිස පහත කර පරාජය බාර ගත්තා. වෙල්ස්බරෝලට එකක්...!

ෆෙලිසිටි දත්මිටි කෑවා. දැන් ඉදිරියෙන් සිටින්නේ වෙල්ස්බරෝ. ඈ ඩැරල් දෙස ඉක්මන් බැල්මක් හෙළුවා. ඔව්, බෝලය දෙස හැර වෙනත් කිසිවක් දෙස නොබලමින් ඈ එහි සිටියා. ඩැරල්ව නැගිට්ටවා ආඩම්බරයෙන් උඩ පැන්න වීමට තමා යමක් කළ යුතු බව ෆෙලිසිටි තරයේ සිතට ගත්තා. එහෙත් වෙල්ස්බරෝ කණ්ඩායම ඉතා දැඩි වූ බැවින් නරඹන්නන්ගේ උද්‍යෝගය වැඩි කිරීමට කිසිවක් කිරීමට කිසිවෙකුට හැකි වුණේ නැහැ. ඒ පන්දුව පිටියට පිවිසි විගස එය මැලෝරි ටවර්ස් කණ්ඩායමේ ඇල් පිතිවලින් බේරා ගෙන තම ගෝලය වෙත ගෙන යාමට නිතරම වෙල්ස්බරෝ කණ්ඩායමේ ක්‍රීඩිකාවන් සැරසී සිටි නිසයි.

එමෙන්ම සෑම විටකම මැලෝරි ටවර්ස් කණ්ඩායම පරයා දිව යෑමට වෙල්ස්බරෝ ක්‍රීඩිකාවන් සිටි බව ද පෙනෙන්නට තිබුණා. එය මැලෝරි ටවර්ස් කණ්ඩායම උමතුවට පත් කරන්නට සමත් කරුණක් වුණා. පිටිය හරහා එහා මෙහා දිවීම නිසා ෆෙලිසිටි සහ සූසන්

වෙහෙසට පත්ව සිටියා. එහෙත් මේ අතරතුර සූසන්ට ගෝලයක් ලබා ගැනීමට හැකි වුණා. එය ඉතාම අනපේක්ෂිත දෙයක්.

වෙල්ස්බරෝ ක්‍රීඩිකාවන් දෙදෙනෙකු පසුපසින් හඹා යද්දී ඇය පිටියේ ඈත කෙළවරක දුවමින් සිටි අතර ඇය පන්දුව යොමු කළොත් එය රැක ගැනීමට ෆෙලිසිටි ඇය වෙත දුව ගියා.

පන්දුව රැක ගැනීමට අසලක ෆෙලිසිටි සිටීදැයි දැක ගැනීමට සූසන් හදිසි බැල්මක් හෙළුවා. තරමක් උස් මහත් වෙල්ස්බරෝ ක්‍රීඩිකාවන් ෆෙලිසිටිව ආවරණය කරගෙන ඇය පසුපසින් හඹා එමින් සිටි හෙයින් තමා පන්දුව යොමු කළහොත් නිසැකවම වෙල්ස්බරෝ ක්‍රීඩිකාව එය රැක ගන්නා බව සූසන් දුටුවා. පන්දුව ඩැහැ ගැනීමට ක්‍රීඩිකාවන් දෙදෙනෙකු තමා පසුපස හඹා එද්දී එය ෆෙලිසිටිට යොමු කළ ද ප්‍රතිවාදී ක්‍රීඩිකාවන් එය රැක ගැනීමට සිටින අවස්ථාවක ඇයට හදිසි තීරණයක් ගැනීමට සිද්ධ වුණා.

මෙම තීරණාත්මක මොහොතේ ආවේගයට පත් සූසන් ඈත කෙළවරෙහි වූ ගෝලය වෙත පන්දුව හැකි වෙර යොදා දමා ගැසුවා. එය බලවත් වීසි කිරීමක් වූ හෙයින් පන්දුව කෙළින්ම ගෝලය කරා ඇදී ගියා. ප්‍රතිවාදී පිලේ ගෝල් රකින්නිය වහාම එය රැක ගැනීමට වේගයෙන් ඉදිරියට පැන්න නමුත් ඇයට මඟ හැරුණු පන්දුව ඉපිළී ගොස් නිවැරදිව ගෝල දැලේ මැද පතිත වුණා.

නරඹන්නන්ගේ ප්‍රීති ඝෝෂා රැව් දුන්නා. ඩැරල් ද බෙරිහන් දුන්නා. ඉන්පසු ඈ මොරියා වෙත හැරුණා.

"හරිම වාසනාවන්ත ගෝලයක්. ඒ තරම් ඈතක ඉඳලා විදින බෝලයක් හරියට ගෝලයට එන්නේ නැහැ. ඒත් මේක කෙළින්ම ආවා. දෙපැත්තම එකයි...!"

තරග වේලාවේ අර්ධය ආසන්නව තිබුණා. ඒ සඳහා තවත් විනාඩියක් ඉතිරිව තිබුණා. පන්දුව ෆෙලිසිටි වෙතට යොමු වූ අතර අහසට පියැඹූ ඈ දෑල් පිත්ත දිගු කර දක්ෂ ලෙස එය රැක ගත්තා.

"ෂා...! හොඳයි...!" එවැනි රැක ගැනීමක් දැක ගත් සෑම කෙනෙක්ම සතුටින් කෑ ගැසුවා.

ෆෙලිසිටි පන්දුව රැගෙන දිව ගොස් එය රීටාට යොමු කළා. උස් මහත් වෙල්ස්බරෝ ඇරියක් තමා වෙත දිව එනු නොදුටු ඈ

තදින් එම ක්‍රීඩිකාවගේ සිරුරේ ගැටුණා. විසිවී උඩින් වැටුණු ඇයට තම වළලුකරින් මහත් වේදනාවක් පැන නගිනු දැනුණා. බිම වැටී වේදනාවෙන් සිටි ඇයට නැගිට ගැනීමට නොහැකි වුණා. ඇය වටා ඇති සියලු දේ අඳුරු වන්නට පටන් ගත්තා. ගැටීමේ දරුණුකම නිසාම ඇයට කිසිවක් කරකියා ගත නොහැකි වුණා. අසරණ ෆෙලිසිටිට මහත් බියක් දැනුණා.

තරග මැද විවේකය සඳහා තළාව නාද වුණා. ෆෙලිසිටි පපුව පුරවා සැනසුම් සුසුමක් ඇද ආපසු හෙළුවා. විනාඩි පහක විවේකයක්. ඒ අතරතුරේ ඇගේ පාදයේ ආබාධය සුව වෙයිද?

තණ පිටිය මත එසේම වාඩි වූ ඇ තම ක්‍රීඩා සපත්තුව නැවත සකස් කර ගන්නා බව බොරුවට අඟවමින් තරමක සහනයක් ලැබෙන තුරු මොහොතක් ගත කළා. සූසන් ඇය වෙතට දිව ආවා.

"මේ... ඔයා පුදුම උඩක් පැන්නේ. ඔයාට තුවාල වුණාද?"

"වළලුකර ටිකක් ඇඹරුණා වගේ." කී ෆෙලිසිටි තරමක් සුදුමැලි වී සිටිනු දුටු සූසන් බියට පත් වුණා.

"වළලුකර ඇඹරුණා....? කෝ අපි බලමු."



සූසන් වහාම ෆෙලිසිටිගේ සපත්තුව ලිහා එය ගලවා ඇගේ විළුඹ අල්වා පාදය තද කරන්නට හා දෙපැත්තට කරකවා පරීක්ෂා කරන්නට වුණා.

"සාමාන්‍ය පොඩි පෙරළීමක්." ඈ කිව්වා. "හරියට කකුළ පෙරළුනා නම් මම දන්නවා ඒකේ වේදනාව. අපොයි, මෙහෙම ඉන්න බැහැ. ඔයා ඉන්නකෝ. ඔයාට බැරි නම් අපි අතිරේක ක්‍රීඩිකාව ආ ගනිමු."

ෆෙලිසිටිගේ ඇසට කඳුළු ඉනුවා. ඩැරල් හනි හනිකට දුව ආවා.

"මෙයාගේ කකුල අමාරුද? මෙයාගේ මේ කකුලේ පොඩි අමාරුවක් තියෙන නිසා, තාත්තා නිතරම කියනවා කකුල ටිකක් වෙලාගෙන ඉන්න කියලා. මෙන්න මෙහෙම කකුල වටේට. තාත්තා කියන්නේ කකුල බර කරලා ඇවිදින්න කියලයි."

ඒ වන විට ක්‍රීඩා ගුරුතුමිය ද එතැනට පැමිණ සිටියා. මේ අතර සූසන් ක්‍රීඩාගාරයට දිව ගිය අතර ක්‍රීඩා ගුරුතුමිය ඩැරල් සමග කතා කළා.

"ෆෙලිසිටිට අමාරුවක් නැතිව දුවන්න පුළුවන් නම් විතරක් මම කැමතියි එයා ආයෙත් සෙල්ලම් කරන එකට. එහෙම නැතිනම් අතිරේක කෙනෙක්ව ආගන්න වෙනවා." ගුරුතුමිය කිව්වා. "එයාම ඒක තීරණය කරන්න ඕනෑ."

මේ අතරේ සූසන් ඇයට දෙහි බීම වීදුරුවක් රැගෙන දිව ආවා. එය සෙමින් තොල ගාන අතරේ ඇගේ මුහුණේ සුදුමැලි බව පහව යමින් ස්වභාවිකව සුපුරුදු ජීවමාන ස්වරූපය මතුවන්නට පටන් ගත්තා. දෙකම්මුල්වල සාමාන්‍ය පැහැය ඇතිවන අතරේ නැගිට ගත් ෆෙලිසිටි ප්‍රවේසමෙන් පය තද කර තම වළලුකර පරීක්ෂා කර බැලුවා. අනතුරුව ඈ මඳ සිනාවක් පෑවා.

"දැන් හරි, ඒත් ලොකු අමාරුවක් නැහැ. ටික වේලාවක් යද්දී හොඳටම සනීප වෙයි."

ක්‍රීඩා ගුරුතුමිය තරමක් තදින් ඇගේ කකුලට වෙළුමක් යෙදූ අතර ෆෙලිසිටි නැවත පාවහන් පැලඳ ගත්තා. කකුල දරුණු ලෙස නොව තරමක් දුරට ඉදිමුණා. නාරන් බීකක් හපමින් ෆෙලිසිටි කොර ගසමින්, තරමක සනීපයක් දැනෙන තුරු ඒ මේ අත ඇවිද්දා. විනාඩි කිහිපයකදී එය සුව අතට හැරෙනු ඇත.

"ඒ තරම් අමාරුවක් නැහැ." ක්‍රීඩා ගුරුතුමිය වාර්තා කළා.

"ටිකක් දරුණු ඇඹරීමක්. වෙන ළමයෙක් නම් කෑ ගහලා අඬ අඬා පිට්ටනියෙන් යනවා. ඒත් ෆෙලිසිටිගේ තියෙන ලොකු අධිෂ්ඨානය නිසාම එයා ආයෙත් සෙල්ලම් කරන්නයි හදන්නේ. ඒකෙන් කකුලට ලොකු හානියක් වෙන්නේ නැහැ. හුඟක් දුරට ඒක හොඳයි."

ෆෙලිසිටිට සුව වීමට තරමක දිගු විවේකයක් ලබා දීමෙන් අනතුරුව තරගයේ පළමු අර්ධය අවසාන කරමින් නැවතත් නළාව නාද වුණා. ක්‍රීඩිකාවෝ තම තමන්ගේ ස්ථානවලට ගියා. මෙවර ඔවුන්ට හිමිව තිබුණේ පිටියේ විරුද්ධ දෙකෙළවරයි.

දෙවන භාගයේදී සූසන් කාටත් පුදුමයක් වුණා. ඈ ෆෙලිසිටි බේරා ගනිමින් ඇය වෙත එන පන්දුවලට පිස්සුවෙන් හාවෙකු මෙන් කඩා වදිමින් පිටිය පුරා දුවද්දී හැමෝම ඇය දිරිමත් කිරීමට ප්‍රීති ඝෝෂා නැගුවා. ෆෙලිසිටිගේ කකුලේ වේදනාව නැවතී තිබුණා. ඇයට එය අමතක වුණා. නැවත දිවීම ආරම්භ කළ ඈ නැවතත් අහසේ පියාඹා ආ පන්දුවක් ඉතා දර්ශනීය ලෙස රැක ගනිද්දී නරඹන පිරිස මහත් හඬක් නගමින් ඇයට සුබපතා කෑ ගැසුවා. වෙල්ස්බරෝ දැරියක මග හැර ගත් ඈ ගෝලය කරා වේගයෙන් දිව යන්නට වුණා. ඇගේ අරමුණ වූයේ පන්දුව කෙළින්ම ගෝලය කරා යැවීමයි.

"ගෝලයක්...." හැමෝම කෑ ගැසුවා. "ගෝ-ලයක්...!"

එහෙත් ඇය පන්දුව ගෝලය වෙතට යැවීමට පෙර වෙල්ස්බරෝ ක්‍රීඩිකාවක් ඇගේ දැල් පිත්තට පහරක් දී පන්දුව මුදවා ගෙන එය ද රැගෙන ආපසු පිටිය හරහා වේගයෙන් දිව්වා. එලෙස පන්දුව තවත් ක්‍රීඩිකාවකට යොමු වී රැක ගැනීමෙන් පසුව එය වේගයෙන් ගෝල දැල වෙතට ඇදී ගියා.

"රැක ගන්න....! රැක ගන්න...!" සෑම කෙනෙක්ම කලබලයෙන් කෑ ගැසුවා.

ගෝල රකින්නිය නොසැලී සිටගෙන සිටියා. එක්වරම තම ලැක්රෝස් පිත්ත වියරුවෙන් මෙන් දිගු කළ ඈ තද රබර් බෝලය දැල් පිත්තෙන් රැක ගෙන එය මැලෝරි ටවර්ස් ක්‍රීඩිකාවන් වෙතට දමා ගැසුවා.

"ගෝලයක් නැහැ...! ගෝලයක් නැහැ...!" දැරියෝ සතුටින් ගයන්නට වුණා. "එහෙම තමයි හිල්ඩා, එහෙම තමයි...!"

"තව විනාඩි දෙකයි තියෙන්නේ. ෆෙලිසිටි ආයෙත් ටිකක් කොර ගහනවා. එයා දුවපු විදිහට පුදුම දක්ෂ කෙල්ලෙක්." මොරියා කිව්වා.

"එයාට බෝලය ලැබුණා...!" සතුටින් කුල්මත් වූ ඩැරල් මොරියාව අල්ලාගෙන කිව්වා. "තවත් අපූරු රැක ගැනීමක්. අපොයි, පුහුණුව වැඩ කරනවා. එයා හොඳින් රකිනවා. අන්න... එයා ආයෙත් දුවනවා."

පන්දුව රැක ගත් ෆෙලිසිටි පිටිය හරහා දුවන්නට වුණා. වෙල්ස්බරෝ දැරියක් ඇයට බාධා කිරීමට පැන්න ද වටයක් කැරකුණ ඈ ඉක්මනින් පන්දුව සූසන්ට යොමු කළා. එය රැක ගත් සූසන් ප්‍රතිවාදී ක්‍රීඩිකාවන් දෙදෙනකු තමා වෙතට දිව එනු දැක වහාම පන්දුව නැවත ෆෙලිසිටිට යැව්වා. එය ඉතා ඉහලින් එවන ලද එල්ල කිරීමක් නිසා එළුවෙකු මෙන් උඩ පැන පන්දුව රැක ගත් ෆෙලිසිටි පිත්තේ රඳවා ගත් පන්දුව සමග වේගයෙන් දුවන්නට වුණා.

මුහුණ ඇඩි කරගෙන වේගයෙන් පිටිය හරහා දුවන ඇයට බාධාවක් පැමිණුනේ නැහැ.

"ගෝලයක්...!" ඇරියෝ කෑ මොර දුන්නා. "ගෝ-ල-යක්...!"

ප්‍රතිවාදී ක්‍රීඩිකාවකගේ පිත්ත පන්දුවට එල්ල වීමට ආසන්න වත්ම ඈ පන්දුව ගෝලය වෙතට විද්දා. පන්දුව වේගයෙන් අහසට පියඹා ගියා. ගෝල රකින්නිය එය අල්ලා ගැනීමට කඩා පැන්නා.

ඇයට එය මඟ හැරුණා. පන්දුව බිම කෙටී සෙමින් තිවැරදිව ගෝල ඇල කෙළවරට රෝල් වුණා. ක්‍රීඩාව නිසා වෙහෙසට පත් බවක් පළ කරන කලෙක මෙන් එය එතුළ නිසල වුණා.

"ගෝලයක්...!" කී සෑම දෙනාම උමතුවෙන් මෙන් උඩ පනින්නට වුණා.

මොරියා, ඩැරල් හා සැලී එකිනෙකා වැලඳ ගෙන උඩ පැන්නේ පහේ පන්තියේ වැඩිහිටි දැරියන්ට සුදුසු නොවන ආකාරයකින්. ක්ලැරිසා හා බිල් එකිනෙකා අල්ලාගෙන කැරකෙමින් නැටුවා. පහළ පන්තිවල දැරියන්ගේ හඬ කන් බිහිරි කරවන තරම් වූ අතර සෝෂාව ඉසිලිය නොහැකි වූ මම්සලී බලමින් සිටි පොත පසෙකින් තැබුවා.

"අන්න හරි, ෆෙලිසිටි...! අන්න හරි, ෆෙලිසිටි...!"

කාලය අවසන් වූ බව දැනුම් දෙමින් නළාව නාද වූ අතර රතු වූ මුහුණින් යුතු ක්‍රීඩිකාවෝ හති දමමින්, සතුටින් සිනාසෙමින්, පෙළ ගැසී පිටියෙන් ඉවතට ඇදුණා. ෆෙලිසිටි මඳක් කොර ගසමින් ගිය අතර ඇය කොතරම් ප්‍රීතියට හා ආඩම්බරයට පත්ව සිටියේ ද යත් ඇගේ පාද දෙකම ආබාධ වී තිබුණ ද ඇයට ඒ ගැන හැඟීමක් තිබුණේ නෑ.

“ඔයයි ජයග්‍රාහී ගෝලය ගත්තේ, කෙල්ලේ...! ඔයා හරියට වැඩ කළා. අපොයි, මට ඔයා ගැන ආඩම්බරයි.” ඩැරල් ඇගේ පිටට තට්ටු කළා.

“අපි ඔයාව කණ්ඩායමට තෝරා ගත්ත එක ගැන සතුටුයි, ෆෙලිසිටි. ඔයාට දිගටම කණ්ඩායමේ ඉන්න පුළුවන්. ඔයාට කණ්ඩායම් හැඟීම තියෙනවා, හොඳටම. ඔයා නිතරම සෙල්ලම් කරන්නේ පිල වෙනුවෙන්.” මොරියා ද ඇගේ පිටට තට්ටු කළා.

ජූන් ඒ අසල සිටියා. මොරියා කී දේ ඇයට ඇසුණ අතර මොරියා එසේ කීවේ තමාට ඇසෙන්නට බව ඇයට හොඳින්ම විශ්වාසයි. දුකට පත් ඈ ඉවතට හැරුණා. ඇයට තරගය සඳහා ක්‍රීඩා කරන්නට පුළුවන්කම තිබුණා. ජයග්‍රාහී ගෝලය ලබා ගන්නේ ඇය වෙන්නට තිබුණා. එහෙත් ඒ තැන ගත්තේ ෆෙලිසිටියි. ජූන්ට ගොස්, ෆෙලිසිටිට පිටට තට්ටු කරන්නට හෝ ඇයට සුබ පතන්නට හෝ නොහැකි වුණා. ඇය ඊර්ෂ්‍යා සහගත වුණා.

ෆෙලිසිටිගේ වළලුකර ඇත්තෙන්ම ඊළඟ දිනයේදී තද නිල් පැහැ ගැන්වී කළු තලා වුණා. ඈ එය තම පන්තියේ දැරියන්ට පෙන්වූයේ ආඩම්බරයෙන්. එවැනි ආබාධිත වූ වළලුකරක් තිබියදීත් ගෝලයක් විදීම කොතරම් පුදුම සහගත දෙයක් ද? පහළ පන්තිවල දැරියන්ගේ වීරවරිය වූයේ ෆෙලිසිටියි.

වාර මැද නිවාඩුව පැමිණ ඉක්මනින් ගත වී ගියා. ඩැරල්ගේ මව සහ පියා පැමිණි අතර උද්දාමයට පත් දැරියන් දෙදෙනා එකවර නාට්‍යයක් හා තරගයක් ගැන කතා කරන විටදී ඔවුන්ට එකවර ඒවාට සවන් දෙන්නට සිදු වුණා.

"අපි දැන් හොඳින් පුහුණු වෙනවා. මගේ දෙබස් ලස්සනයි වගේ. මේරි ලෝව් සින්ඩෙරෙල්ලා විදිහට රඟපාන හැටි ඔයාලා බලන්න එන්න ඕනෑ." ඩැරල් ඉතා උස් හඬින් කිව්වා.

"ඉතින් මම අවසාන ගෝලය විදිද්දී මටම අදහා ගන්න බැරි වුණා. ඒත් ළමයි කෑ ගහපු විදිහට මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ." ෆෙලිසිටි කෑ ගැසුවේ ඩැරල් හඬ නඟන අතරේදීමයි.

"පුදුම දෙන්නෙක්...!" ඔවුන්ගේ මව සිනාමුසු වුණා.

විල්ගේ සහෝදරයන් හතර දෙනෙක් හා ඇගේ මව ඇයව බලන්න පැමිණියා. සියලු දෙනා පැමිණියේ අසුන් පිට...! එය පිරිමි දරුවන්ගේ ද වාර මැද නිවාඩුව වුණා. විල්, ක්ලැරිසා ද කැටුව ඔවුන් සමඟ අසුන් පිට නැඟී පාසලින් පිටත දවස ගත කිරීමට පිටව ගියා.

'නිවාඩුවක් ගත කරන්න හරිම අපූරු විදිහක්.' ක්ලැරිසා කල්පනා කළා. 'දවසේම අශ්වයෝ පැදලා දවල් කෑමයි, තේ බීමයි එළිමහනේ.'

පිටව යන ක්ලැරිසා දෙස ගොන්ඩොලින් ඊර්ෂ්‍යාවෙන් බලා සිටියා. පසුගිය වාරයේ ඇය බුද්ධිමත්ව කටයුතු කළා නම් ක්ලැරිසාගේ

යෙහෙළිය වීමට ඇයට හැකිවන්නට තිබුණා. එහෙත් ඈ අනුවණ වුණා. එහෙයින් දැන් ඈ උඩඟු මොරීන්ගේ ඇසුරට වැටිලා.

අවාසනාවන්ත දෙය වුණේ අවසාන මොහොතේයි. මොරීන්ගේ දෙමව්පියන්ට ඇය බැලීමට පැමිණීමට නොහැකි වූ නිසා ඇයට නිවාඩුව ගත කිරීමට කෙනෙකු නොමැති වීමයි. එහෙයින් ඈ ග්වේන් හමුවීමට ගියා.

"අනේ, ග්වේන්... ඔයා වෙන කවුරුහරි එක්ක එළියට යනවද? අපේ අම්මාටයි, තාත්තාටයි එන්න ලැබෙන්නේ නැහැ. මම හොඳටම අසරණ වුණා."

ග්වේන් කේන්තියෙන් ඇය දෙස බැලුවා. ඇත්තෙන්ම මෙහෙම සිද්ධ විය යුතුයි. දැන් මුළු දවස පුරාම මොරීන් ඇගේ පසුපස වැටෙනු ඇත. ඈ තම මවට හා මහලු ආයා - වින්ටර් මහත්මියට මොරීන්ව එතරම් ගරුසරුවක් නැතිව හඳුන්වා දුන්නා.

"අම්මා, මේ මොරීන්. එයාගේ ගෙදරින් කවුරුවත් ඇවිදින් නැහැ. ඉතින් මම කිව්වා අපිත් එක්ක එන්න කියලා."

"බොහොම හොඳයි, බොහොම හොඳයි...!" ලැසී මහත්මිය එක්වරම කිව්වා.

සුපුරුදු පරිදි සුළඟේ පාවෙන කැලි සහිතව ඈ සැරසී සිටියේ සේද හා පට ලේන්සු හා ලොකු වේලයකින්.

"අහිංසක දරුවා - අපරාදේ...!"

මොරීන් ලැසී මහත්මිය දැක ඇඩි සොම්නසට පත් වුණා. මේ ඉන්නේ ඇයට පහසුවෙන් කතා කිරීමට හැකි කෙනෙක්. ඈ ඇගේ අනුවණ සිනා හඬ නැගුවා.

"අනේ ලැසී නෝනා, මට එන්න කියපු එක ඔයාගේ හරිම කරුණාවන්තකමක්. මේ මගේ පළමු වාරය, දන්නවනේ. ගොන්ඩොලින් නාහිටිය නම් මම දන්නේ නැහැ මොනව කරන්නද කියලා. එයා ඇත්තටම අවශ්‍යතාවයේදී ඉන්න නියම යාළුවෙක්."

"ඒ ගැන මට විශ්වාසයි." සැලී මහත්මිය කිව්වා. "ගොන්ඩොලින් එතරම කරුණාවන්තයි. එයා මේ තරම් ජනප්‍රියයි කියන එක පුදුම වෙන්න දෙයක් නෙමෙයි."

"අනික දන්නවද, අපි දෙන්නම එක වගේ නිසා ළමයි කියනවා අපි නිවුන්නියෝ වෙන්න ඕනෑ කියලා." ලොකු ලේන්සුව සිරුවටේ ඔතමින් මොරීන් දොඩමළු වුණා. "අපි දෙන්නටම තියෙන්නේ රන්වන් හිසකෙස්, නිල් ඇස්. ඉතින්, ඒ අය කියනවා අපි කතා බහ කරන්නේ, හැසිරෙන්නෙත් එක වගේලු. මම වගේම නිවුන්නියක් ලැබෙන්න මම වාසනාවන්ත නැද්ද?"

මෙවැනි කතා බහකට තමයි ලැසී මහත්මිය හා වින්ටර් මහත්මිය යන දෙදෙනාම ප්‍රිය කළේ හා හොඳින් තේරුම් ගත්තේ. වින්ටර් මහත්මිය මොරීන් ගැන තරමක උනන්දුවට පත් වූ අතර ග්වේන් එයට කැමති වූයේ නැහැ.

මොරීන්ව පිටත කැඳවාගෙන ඒමට කෘතගුණ සැලකීමක් ලෙස ඇය ග්වේන් පිළිබඳව වර්ණනාවන් ගෙන එනු ඇතැයි ග්වේන් බලාපොරොත්තු වුව ද එය එසේ සිදු වූයේ නැහැ. මොරීන් ග්වේන් ගැන කිසිවක් කතා කළේ නැහැ. එහෙත් මොරීන් තම නිවස, පවුල, බල්ලන්, ඇගේ ගෙවත්ත, මින් පෙර නිවාඩු දින ගත කළ ආකාරයත් හා ඇයට වැලඳුන අසනීප ගැන දීර්ඝව විස්තර කරන්නට වුණා. ග්වේන්ට මෙම කතා බහට වචනයක් හෝ එක්කර ගැනීමට නොහැකි වූ අතර ටික වේලාවකට පසු ඇ බුම්මාගෙන නිහඬ වුණා.

'මොන කරදරයක් ද? පුදුම මෝඩකමක්...! මොන තරම් ආත්මාර්ථකාමී උඩඟුකමක් ද?' ග්වේන් අසතුටින් මුහුණ දික් කරගෙන සිතුවා. 'හිනාවෙන්නේ මෝඩ බූරු දෙනෙක් වගේ.'

දිවා ආහාර වේලාවේදී ඇගේ මව මෙවැනි ප්‍රකාශයක් කළා. ඇඩ් සතුටින් ඉපිළ ඇ දෙදෙනා දෙසම බැලුවා.

"ජේනවානේ, මේ මොරීන්ගේ දත් ටික ටිකක් ඉස්සරහට නාවා නම් ඔයාලා දෙන්නම හරියට එක වගේ. ඔයත් ග්වේන් වගේම ඉවරයක් නැතිව කතා කරන්නේ ඔයාගේ දේවල් ගැනමයි. ග්වේනුත් හරි ලස්සනට ඒ දේවල් කියනවා, මොරීන්. අනික ඔයා හිනා වෙන්නෙත් ඒ වගේ. එහෙම නේද, මිස් වින්ටර්?"

"ඔව්, ඔයාලා දෙන්නා නම් සහෝදරියො තමයි." වින්ටර් මහත්මිය කාරුණිකව මොරීන් වෙත සිනාවක් පාමින් එයට එකඟ වුණා. "මෙයාලා හැසිරෙන්නෙත් එකම විදිහට තමා. බලන්නකෝ, කටහඬවල් එක වගේමයි."

ග්වේන්ට ඇඩ් අපහසුවක් දැනුණා. ඇයට කෑම කිසිවක් ගිල දැමීමට පවා අපහසු වුණා. ඇයට සැබවින්ම හා අවංකව ආදරය කරන තම මව හා වින්ටර් මහත්මිය නිසැකවම තමා ද මෙම පුහු අහංකාර, පළකට නැති, කටමැත දොඩවන මොරීන් වැනිම අයෙකු ලෙස දකින්නේ නම් සැබවින්ම තමා ද ඉතා අප්‍රියජනක මෙන්ම මොරීන් මෙන් කාටත් රුස්සන්නේ නැති දුර්වල චරිතයක් විය යුතු යැයි ග්වේන්ට සිතුණා. තමා දැරියන් අතර ජනප්‍රිය නොවීම පුදුමයක් නොවන බව ඇයට සිතුණා. දැරියන් ඇයට සිනාසීම ගැන පුදුමයක් නැහැ.

එදා දිනය ග්වේන්ට ඉතා අමිහිරි දිනයක් වුණා. ඇ වාඩි වී සිටියේ කවුරුත් ඇය වැනිම යැයි සිතූ කෙනෙක් අසල. තමාගේම මෝඩ හිනාව මොරීන් වෙතින් නැගී එනු ඇට ඇසුණා. තම පම්පෝරිය පමණක් කතා කරන නීරස කතා මොරීන්ගේ මුවින් නැගෙන ආකාරය ඇයට ඇසුණා. තමාගේම වංක, නොගැඹුරු හා කවුරුත් ප්‍රිය නොකරන සිනාව මොරීන්ගේ මුව පුරා ඇඳී තිබෙනු ඈ දුටුවා. මේ සියල්ල ග්වේන්ට කනගාටුදායක අත්දැකීම් වුණා.

'මට මේක කවදාවත් අමතක වෙන්නේ නැහැ.' අසරණ ග්වේන් සිතුවා. 'කවදාවත් නැහැ. මම ආයෙත් කවදාවත් මේ විදිහට හැසිරෙන්නේ නැහැ. මම දැන් ඉඳලාම මම හිනාවෙන විදිහ වෙනස් කර ගන්නවා. ඇත්තටම, මම හිනාවෙන්නේ මේ විදිහට ද? ඕ... ඔව්. ඒ විදිහටම තමා. දැන්නම් මටත් හරිම ලැජ්ජා හිතෙනවා.'

"ග්වේන් හරිම නිහඬයි." අවසානයේ වින්ටර් මහත්මිය කිව්වා. "මොනවා හරි ප්‍රශ්නයක් ද, ග්වේන්?"

"අනේ, අපේ ග්වේන්...... එයා දුකින් ඉන්නේ එයාව සින්ඩෙරෙල්ලාගේ චරිතයට තෝරා ගත්තෙ නැති නිසා වෙන්න ඇති." මොරීන් ඉක්මනින්ම කිව්වා.

"ඉතින්, ඔයාව තෝරා ගත්තෙත් නැහැනේ." ග්වේන් එකට එක කිව්වා.

"ඔයා හිතාගෙන හිටියේ ඔයාව තෝරා ගනියි කියලයි. මට මොරියා කිව්වා."

"ළමයි...! ළමයි...! එක එක්කෙනාට ඔය විදිහට කතා කරගන්න

එපා." ලැසී මහත්මිය කම්පනයට පත්ව කිව්වා. "අයියෝ, මම හිතුවා ග්වේන් සින්ඩෙරෙල්ලා චරිතයට තේරෙයි කියලා...!"

"ඔව්, ඔයාගේ ලියුම්වල කියලා තිබුණේ, හුඟක් ළමයි ඔයාවම තෝරා ගනියි කියලා." වින්ටර් මහත්මිය කිව්වා. "ඇයි එයාලා ඔයාව තෝරගත්තේ නැත්තේ, ග්වේන්? ඔයාට අපූරුවට සින්ඩෙරෙල්ලාට රඟපාන්න තිබුණා. හරිම අපරාධයක් නේ...!"

"මොරීන් තේරුණේ නැත්තෙත් ඒ වගේම දෙයක් හින්ද තමයි මම හිතන්නේ." ග්වේන් බුම්මාගෙන කිව්වා. "අපි ඒ තරම් හොඳට රඟපාන්නේ නැහැ කියලයි එයාලා හිතන්නේ."

"ඔව්, ඇත්තටම මාව තෝරා ගනියි කියලා නම් කොහොමවත් බලාපොරොත්තු වුණේ නැහැ. ඒ මොකද මේක මගේ පළමු වෙනි වාරය." මොරීන් කඩිනමින් කිව්වා.

"ඇයි නැත්තේ...? ඔයත් බලාගෙන හිටියේ." ග්වේන් කිව්වා.

"ඕ... නැහැ, ග්වේන් බබෝ." කී මොරීන් ඇගේ මෝඩ හිනාව හඬ නැගුවා.

එයින් ග්වේන්ගේ කෝපය ඇවිස්සුණා.

"ඔයා මේ වගේ මෝඩ විදිහට හිනා වුණොත් මට පිස්සු හැදෙයි." ඈ ඇඩි කෝපයෙන් නපුරු ලෙස කිව්වා.

පුදුමයෙන් යුතු නිහඬ බවක් ඇති වුණා. නැවත සිනා හඬ නගමින් මොරීන් නිශ්ශබ්දතාවය බින්ද අතර ග්වේන් ඇත් මිට මොළවා ගත්තා.

"අහිංසක ග්වේන්." මොරීන් කිව්වා. "අවංකවම ලැසී නෝනා, එයාලා මෙයාව තෝරා ගත්තෙ නැති එක නම් හරිම ලැජ්ජාවක්. ඇත්තටම මෙයා ඒ ගැන දුක් වුණා. අපි පුහුණුවීම්වලට යද්දී මේරි ලෝව් සින්ඩෙරෙල්ලාගේ චරිතය කරනවා ඇකලා ග්වේන්ට හුඟක් ..ක හිතෙනවා. මෙයාට දීලා තියෙන්නේ සේවිකාවකගේ චරිතයක්. ..තා කරන කිසිම දෙයක් නැහැ. මුළු නාට්‍යයේම එක වචනයක් ..ත් කතා කරන්න නැහැ."

"දුව...!" ලැසී මහත්මිය ඔරවාගෙන සිටින ග්වේන්ව සනසන

පරිදි කතා කළා. "මට කනගාටුයි...! මගේ දුව දුකින් ඉන්නවා දකින්න මම කැමති නැහැ."

"නවත්වා ගන්න අම්මා." ග්වේන් කිව්වා. "අපි වෙන දෙයක් කතා කරමු."

ලැසී මහත්මියගේ සිත හොඳටම රිදුණා. තමා ග්වේන් ගැන ඉතා නොසතුටට පත් වූ බව පෙන්වීමට මොරීන්ට වැඩිපුර ආදරයක් දක්වමින් කතා කරන්නට වූ ඈ මෙම අසාමාන්‍ය ලෙස රළු වූ ග්වේන්ගෙන් ඉවතට හැරුණා. වින්ටර් මහත්මිය ද එයම අනුගමනය කළ අතර මෙම බොරු වර්ණනා හා ප්‍රමෝදජනක ආකර්ෂණීය කතා බහ මැද තව තවත් පිබිදුන මොරීන් උපරිම ලෙස සතුටින් යුතු වුණා. අසරණ වූ ග්වේන්ට සිදු වූයේ මොරීන්ගේ ජීවිතය පිළිබඳ තව තවත් පුරාජේරු හා ඇගේ මෝඩ සිනා හඬ තව තවත් අසා සිටීමටයි.

අවසානයේ දවස හමාර වුණා. මොරීන් ලැසී මහත්මියට හා වින්ටර් මහත්මියට ස්තුති කර ග්වේන්ගේ අතිනත පටළවාගෙන ඔවුන්ට අත වනමින් පිටව ගියා.

"මම ග්වේන්ව බලාගන්නම්." ඈ ආපසු හැරී කෑ ගැසුවා.

මෝටර් රථය දර්ශන පථයෙන් නොපෙනී ගිය වහාම ඈ තම අත මොරීන් වෙතින් ඉවතට ඇද ගත්තා. ඈ මොරීන් වෙතට හැරුණා.

"හොඳයි, මගේ සම්පූර්ණ දවසම විනාශ කරපු එක ඔයාට සතුටක් වෙන්න ඇති. නපුරි...! තමන්ගේ පම්පෝරිය කියවන්නයි, මෝඩ විදිහට හිනා වෙන්නයි, රැවටිලිකාර මායම්. හහ්...!"

"ඒත් ග්වේන්, එයාලා කිව්වේ මම හරියට ඔයා වගේමයි කියලා." ව්‍යාකූල වූ මොරීන් කිව්වා. "එයාලා මට කැමතියි. මම ඔයා වගේම නම් මම ඒතරම් නරක වෙන්නේ කොහොමද?"

ග්වේන් ඒ ගැන ඇයට කිව්වේ නැහැ. ඇත්තෙන්ම එය ඇයට හිතා ගන්නටත් බැරි තරම් අපහසු දෙයක්.

වාර මැද නිවාඩුවෙන් පසුව දවස් ඉගිලී යන්නට වුණා. නාට්‍යය ගැන සිතෙන හැම මොහොතකම ඩැරල් සහ සැලී කලබල වන්නට වුණා. එය දෙමව්පියන් ඉදිරියේ රඟ දක්වන හෙයින් එහි විශාල වගකීමක් හා වැදගත්කමක් තිබුණා. වාර අවසානයේ එය වේදිකා ගත වීමට නියමිතව තිබුණා.

තවත් සති දෙකක් ගෙවී ගිය අතර හදිසියේම දබරයක් ඇවිළුණා. එය සිදු වූයේ නාට්‍ය පුහුණුවීම් අතරතුරදීයි. ලොකු ආරවුල් ඇති වෙන සුපුරුදු ස්වභාවයට අනුවම මෙය ද ඇති වූයේ ඉතා සුළු අනුවණ සිදුවීමකින්.

ඇලිසියා වේදිකාවට පිවිසෙන හා ඉන් පිටවන සෑම විටකම මායාකාර රජු ලෙස යම් අද්භූත මන්ත්‍රයක් ජප කරමින් එසේ කළ යුතු යැයි යන කාරණය හොඳින් සිතා මතා සිතට ගත්තා. ඇය එම තීරණයට එළඹුණේ පුහුණුවීම් ආරම්භ කිරීමට විනාඩි කිහිපයකට පෙරාතුව වූ අතර මේ ගැන ඩැරල්ව දැනුවත් කිරීමට ඇයට කාලයක් තිබුණේ නැහැ. සැලීට හෝ මේ ගැන කීමට කාලයක් නොතිබුණ ඈ අද්භූත මන්ත්‍ර ජප කිරීම ඒ මොහොතේම රඟ දක්වා හඳුන්වා දීමට තීරණය කළා.

ඈ එසේ කළා. ඈ සුපුරුදු පරිදි හදිස්සියේම ඇගේ පුදුම එළවනසුලු පැනීමකින් වේදිකාවේ දර්ශනය වූයේ බිහිසුණු හඬකින් මන්ත්‍රයක් ජප කරමින්.

"ඕං - ග්‍රීං, කට්ටු, කට්ටු - වර, වර - ඒස්වා හඃ...!"

මොරියා තදින් මේසයට තඩි බෑවා. පුහුණුවීම් නතර වුණා.

"ඇලිසියා, මොකක්ද ඒ වැඩේ? නාට්‍ය පිටපතේ එහෙම එකක් නැහැ. ඔයා ඒක හොඳටම දන්නවා."

"ඔව්, මම දන්නවා." ඇලිසියා මොරියාගේ නිතර අනවශ්‍ය

නපුරු කඩා පැනීම ගැන සිත් රිදීමෙන් යුතුව කිව්වා. "මේ කොටස දාන්න කියලා ඩැරල්ට කියන්න මට වේලාවක් තිබුණේ නැහැ. ඒක මට හිතුණේ මේ දැන්."

"හොඳයි, ඒ වුණාට දැන් අපිට අලුත් දේවල් ඇතුළු කරන්න බැහැ." මොරියා කේන්තියෙන් කිව්වා. "ඒ කොහොම වුණත්. ඒ වගේ අමුතු මන්ත්‍ර ගැන යෝජනා කරන්න ඔයාට අයිතියක් නැහැ. අපිට ඕනෑ වුණා නම් අපිට කියන්න තිබුණා ඩැරල්ට ඒක ලියන්න කියලා."

"මේ බලන්න, මොරියා." ඇලිසියා තම ඉවසීම වේගයෙන් ඉක්මවා යමින් කතා කළා. "මම හෝඩියේ පන්තියේ ළමයෙක් නොවෙයි. මම..."

"මොරියා මට හිතෙන්නේ ඒක ඇලිසියාගේ හොඳ අදහසක්. ඔයාට මොකද හිතෙන්නේ, බෙටී? මායාකාරයාට එහෙම මන්ත්‍රයක් ලියන්න මට හිතුණේ වත් නැහැ. ඒත් ඒක හරිම අපූරු මායාකාරී බවක් පේනවා වගේම...." ඩැරල් කඩිමුඩියේ මැදිහත් වුණා.

"ඔව්." විරුද්ධ වීමට මහත් උවමනාවක් පළ කළ බෙටී කිව්වා.

ඇයට අවශ්‍ය වූයේ මොරියාට විරුද්ධව තම යෙහෙළිය දිරිමත් කිරීමයි.

"ඔව්, ඒක හුඟක් අපූරු අදහසක්. අපි ඒක ඇතුළු කර ගනිමු."

මන්ත්‍රකාරයා ඇයට සැබවින්ම හූනියමක් කළ විටක මෙන් මොරියා ඊර්ෂ්‍යාවෙන් උඩ ගියා. ඔරවා ගත් ඈ නැගිට ගත්තා.

"ඔයා එහෙම කියන්නේ බෙටී, ඇලිසියා ඔයාගේ යාළුවා නිසා වගේම...."

"කට වහනවා...!" බෙටී නපුරු ලෙස කිව්වා.

මොරියා නැවතීමකින් තොරව කතා කළා.

"අනික, ඩැරල් එහෙම කියන්නේ එයත් හැමතිස්සෙම ඇලිසියාගේ පැත්ත ගන්න නිසා. හරි, මම ප්‍රධාන නිෂ්පාදකවරිය.

මම මට ඕනෑ විදිහටයි මේක කරන්නේ. මන්ත්‍ර ජප කිරීමක් නැහැ. පුහුණුවීම් කරන්න ගන්න."

ඇලිසියා සුදුමැලි වුණා.

"අද මම තවත් මොකවත් කරන්නේ නැහැ." ඈ කෝප වූ හඬින් කිව්වා. "ඔයා තනියම රඟපාන්න හදනවා වගේ, නේද මොරියා? ඔයාගේ මුහුණේ තියෙන පෙනුමේ හැටියට ඔයාට නම් හරි ලස්සනට මායාකාර රැජිනක් වෙන්න පුළුවන්."

ඇත්තෙන්ම මොරියාට ඒ අවස්ථාවේ මායාකාරියකගේ නපුරු පෙනුමක් ආරූඪ වී තිබුණ නිසා තැනින් තැනින් කොක් හඬලා සිනාසීම් නැගුණා. ඇලිසියා වේදිකාවෙන් පිටතට යන්නට වූ අතර ඩැරල් කරකියා ගත නොහැකි තත්ත්වයට පත් වුණා. සැලී වහාම තත්ත්වය පාලනය කර ගැනීමට ඉදිරිපත් වුණා.

"ඊළඟට කවුද? විල්, එන්න."

මොරියාව තවත් කුපිත කරවීමට මාන බලා සිටි විල් ද වැරදි පැත්තෙන් වේදිකාවට පැමිණියා. තම කලිසම් සාක්කුවට අත් ඔබාගෙන ඈ ඒ මේ අත ඇවිද්දා. සෑම පුහුණුවීමකදීම ඈ අසුන් පදින ඇඳුමින් සැරසී සිටීම පුරුද්දක් වුණා. එය වංශක්කාර බවක් පෙන්නුම් කරන බව ඈ නිතරම කිව්වා.

"විල්...! ඔයා දැන් හොඳටම දන්නවා ඔයා එන්න ඕනෑ මොන පැත්තෙන් ද කියලා." මොරියා කෑ ගැසුවේ විල් එසේ කරන්නේ ඇලිසියාගේ පැත්ත ගෙන ඇයට රිදවීමට සිතාමතාම කරන දෙයක් බව දැනගෙනයි.

විල් රූකඩයක් ලෙස නැවතී සිටගෙන සිටියා.

"ආපහු ගිහින් හරි පැත්තෙන් එන්න." නපුරු හඬින් මොරියා කිව්වා.

"බැහැ, මම අශ්වයෝ පදින්න යනවා." විල් කිව්වා.

ඉතා සරලව හා මෘදු ලෙස කතා කළ ඈ ගීතයක් මුමුණමින් පිටව ගියා. ඊට මොහොතකට පසු ඇය ක්ලැරිසාට අඬ ගසනු මොරියාට ඇසුණා.

"ක්ලැරිසා, එන්න...! අද මට රඟපාන්න හිතක් නැහැ. මට ඕනෑ ටිකක් මහන්සි වෙන වැඩක්."

"මේක මහ මෝඩ වැඩක්." බෙටී කිව්වා. "හැම කෙනාම දමලා ගහලා යනවා. මම මේ වැඩේ භාර ගන්නම් මොරියා. ඔයා එයාලට බලපෑම් කරන්නේ වැරදි විදිහට."

මොරියා ඇයව නපුරු ලෙස පසෙකට තල්ලු කළා. කේන්ති ගිය විට ඇය හැසිරුණේ ඉතා දරුණු ලෙසයි. ඇගේ සොහොයුරිය බ්‍රිජට් ද කිපුණ විට ඉතා දරුණු අන්දමින් බඩු මුට්ටු පවා කඩා බිඳ දමන ප්‍රචණ්ඩකාරී බවක් ආරූඪ කර ගන්නවා.

"මම කරගෙන යන්නම්." තද කර ගත් දත් අතරින් ඈ කිව්වා. "එක සැරයක් හරි බුරුලක් දුන්නොත්, පාලනයක් නැතුව ගිහින් අපි ඉවර වෙනවා. දැන් අපි සේවිකාවන්ගේ සමූහ ගායනය අරඹමු."

සමූහ ගායනයට අවස්ථාව පැමිණි අතර හැකි තරම් මොරියාව ඇවිස්සීමට සිතමින් ඔවුන් අනවශ්‍ය ලෙස සිනා හඬ නැගුවා. හැකි උපරිම පරිදි ඇයට වැඩ ගැනීමේ හැකියාව හා සංවිධාන ශක්තිය තිබුණ ද ඔවුන් හැමෝම ඇය සමග උරණ වී සිටියා. ඔවුන් ඇගේ හැකියාව අගය කළ නමුත් ඇගේ පාලනය අනුමත කළේ නැහැ.

එක්වරම මොරියා ග්වේන් හා මොරීන් වෙතට අවධානය යොමු කළා.

"ඔය දෙන්නා...! ඔයාලා ගායනය කරන්නේ නැහැ. ඕ... දන්නේ නැද්ද? මේ, දැන් නැහැ කියන්න එපා. ඔයාලා හැමතිස්සෙම විකාර කරන්නේ. අන්න, අවබෝධයක් නැහැ. දැන් ටිකක් මහන්සියෙන් වැඩ කරන්න හිතට ගන්න. නැතිනම් කිසිම දෙයකට ඔයාලව ගන්න බැරි වෙයි. නැතිනම් මම මේකට තුනේ පන්තියේ ළමයි ටිකක් ගන්නවා."

"මේ, කෑ ගහන්න එපා මොරියා." බෙටී සෙමින් කිව්වා. "ඔයාම දන්නවානේ මේ දෙන්නාගෙන්ම හරියට දෙයක් කරවා ගන්න බැහැ කියලා. මේ විදිහට එයාලට කඩා පැන්නොත් කිසිම දෙයක් කරවා ගන්න බැරි වෙයි."

මොරියා කිසිම දෙයක් මඳකට හෝ තැකුවේ නැහැ.

"මම කිව්වේ මොකක්ද කියලා ඔයාලට ඇහුණාද ග්වේන්, මොරීන්?" ඈ ඇසුවා. "දැන්, ඉස්සරහට ඇවිදින් ඔයාලා දෙන්නා

විතරක් සිංදුව කියන්න. එතකොට මට දැනගන්න පුළුවන් අඩුම ගණනේ ඔයාලට වචන ටිකවත් මතකද කියලා බලා ගන්න."

ග්වේන් පැකිළුණා. මොරියාව රැවටීමට හෝ විල් කළ ලෙස පිටව යාමට ඈ ඉතා දැඩි කැමැත්තක් දැක්වූවා. එහෙත් මොරියාගේ සැර පරුෂ වචනවලට ඈ මහත් බියක් දැක්වූවා.

"කමක් නෑ. ඔය ඉන්න තැනම ඉඳගෙන ගායනය පටන් ගන්න. ඒක හොඳයි." ග්වේන් හා මොරීන් ඉදිරියට ගැනීමට අපහසු බව හදිසියේම වැටහුණු මොරියා, බලපෑම් කිරීම අනුවණකමක් බව අවබෝධ කර ගනිමින් කතා කළා. "අයිරින්, සංගීතය දෙන්න."

අයිරින් ඉතා නොසතුටු මුහුණින් යුතුව පිළිකුල පළ කරමින් සේවිකාවන්ගේ ගීතය සඳහා වූ සංගීතය ආරම්භ කළා. ග්වේන් ඇගේ අමිහිරි හඬින් ගායනය පටන් ගත් අතර මොරීන් ද දෙඩවිලි හඬින් සහාය ගායනයට එක් වුණා.

"නවත්වනවා....!" මොරියා කී අතර සංගීතය නැවතුණා. "ඔයාලා වචනවත්, තාලයවත් දන්නේ නැහැ. මේක දැන් හත්වැනි පුහුණුවීම. ඔයාලා දෙන්න තමයි මේ නාට්‍යයේ ඉන්න නරකම දෙන්නා."

සෑම කෙනෙක් ඉදිරියේම එසේ අවමානයට ලක් කිරීම ගැන ග්වේන් සහ මොරීන් දැඩි ලෙස කෝපයට පත් වුණා. එහෙත් ඔවුන් මොරියාට එරෙහිව පිළිතුරු දීමට තරම් නිර්භීත වුණේ නැහැ. මෙවැනි අවස්ථාවකට මුහුණ දීමට නොහැකි පරිදි ඔවුන් බියගුල්ලියන් වුණා. දෙදෙනාම ගොළුව සිටගෙන සිටින අතරේ සුපුරුදු පරිදි පහසුවෙන් උණන කඳුළු ග්වේන්ගේ කම්මුල් හරහා ඇදී යන බව ඈට දැනුණා.

කිසිවෙකු කතා නොකළාට එම පුහුණුවීම ඉතා අසාර්ථක එකක්. රාත්‍රී ආහාරය සඳහා සීනුව නාද වන විටම සෑම කෙනෙකුටම ඉමහත් සහනයක් දැනුණා. මොරියා රවා ගත් මුහුණින් යුතුව පිටතට ගියා. එම එරවිල්ලම අනුකරණය කරමින් බොහොමයක් ඇරියෝ ඇගේ පසුපස සිට ඇයට විහිළු කරන අයුරින් ඔරවා බැලුවා.

"නපුරියක්." ඩැෆනි කිව්වා. "එයා තවත් නරක් වෙන්න යන්නේ."

"එයාට හුඟාක් වැඩ. තව කරන්න පුහුණුවීම් හුඟාක් තියෙනවා. ඒකයි එයා මේ තරම් කලබල." පොදුවේ නැගෙන මැසිවිලි නැවැත්වීමට උත්සාහ කරමින් ඩැරල් කිව්වා.

දැරියන් ස්ව කැමැත්තෙන් පුහුණුවීම්වලට නොපැමිණෙන්නේ නම් සියලු දේ අපහසු වන බව ඩැරල්ට පෙනුණා. එය ඇගේ නාට්‍යය මෙන්ම ඇගේ අනර්ඝතම කෘතිය ද වුණා. දැරියන්ගේ කෝපාකාරී හැඟීම්වලට හෝ එහි ප්‍රතිඵලයක් ලෙස මොරියාගේ මුරණ්ඩුකමට හෝ තමාගේ නාට්‍යය විනාශ වීමට ඩැරල්ට ඉඩ දීමට නොහැකි වුණා.

"ඩැරල් සාන්තුවරිය...!" සතුටට පත් බෙටී කිව්වා.

"මම සාන්තුවරියක් නෙමෙයි." සිනාසෙමින් ඩැරල් කිව්වා. "අනිත් අය වගේම මමත් රත් වෙලා කලබලයෙන් ඉන්නේ. ඒත් නාට්‍ය නිෂ්පාදනය හරියට කරන්න දන්නේ නැති කෙනෙක් තරහින් දඟලනවා කියලා අපිත් වැඩ අවුල් කර ගන්න එකේ තේරුමක් නැහැ නේද?"

"අපි එයාව කපලා දාමු." කෙනෙක් යෝජනා කළා. "අපිට බෙටී ඉන්නවා. තව ඔයයි, සැලීයි, ඕනෑම උදව්වකට ඇලිසියයි ඉන්නවා. අපිට තවත් මොරියාව ඕනෙ නැහැ. බූරු වැඩ ඉවරයි."

"අපිට එහෙම මොරියාව කපලා දාන්න බැහැ." තීරණාත්මක ලෙස ඩැරල් කිව්වා. "මොන විදිහකින් හරි එයා මේ තරම් මහන්සි වුණාට පස්සේ එහෙම කරන එක හුඟක් නරක දෙයක්. මම අවංකවම හිතනවා එයා මේ ගැන හුඟක් දුරට උනන්දුවක් දක්වන එකයි, මේක හරියට කර ගන්න එකයි ගැන කරදර වෙලා ඉන්න නිසා තමයි එයාට තරහා යන්නේ. හැමදෙයක් ගැනම එයා ඕනෑවට වඩා හිතනවා. අපි එයාට තව අවස්ථාවක් දෙමු."

"හොඳයි." සෑම කෙනෙක්ම එකඟ වුණා. 'ඒත්, එකම එක අවස්ථාවක් විතරයි, ඩැරල්...!"

# 19

පසුගිය පුහුණුවීමේ අසාර්ථකත්වය ගැන ඩැරල් තරමක් නොසන්සුන්ව මොරියා සමග කතා කළා.

"අපි කවුරුත් දන්නවා ඔයා මේ වෙනකොටත් ප්‍රසංගය ගැන හුඟක් උනන්දුවෙන් වැඩ කරලා ඉන්න නිසා හුඟක් මහන්සියි කියලා." ඈ පටන් ගත්තා.

"අනේ, මේ.... නවත්වා ගන්න. ඔයත් කැතරින් සාන්තුවරිය වගේ." මොරියා අසල සිටි කැතරින් වෙත බැල්මක් හෙළමින් කිව්වා. "එයත් ඔයා වගේ දාහක් විතර සමාවට කරුණු මා එක්ක කිව්වා. රවට්ටිලි කරන අයට මම කැමති නැහැ. මට තරහා මට මහන්සි නිසාවත්, ඕනෑවට වැඩිය වැඩ කරලා තියෙන නිසාවත් නොවෙයි. ඇලිසියා, විල්, ග්වේන්, මොරීන් වගේ අය නරක, මෝඩ විදිහට නිතර දබර කරගන්න වගේ ඇවිදින් මට නිතරම සහයෝගය නොදී ඉන්නවා. දැන් ඔයාම දැක්කනේ."

"හොඳයි, මේ බලන්න මොරියා. දෙවියන්ගේ නාමෙට ඊළඟ වතාවේ තවත් ඉවසිලිවන්තව තේරුම් අරගෙන වැඩ කරන්න." ඩැරල් හැකි පමණ තමාගේ කෝපය පාලනය කරගෙන කිව්වා.

ඇයට ඇගේ කෝපය හදිසියේ නැඟ එනු දැනුණා. අපොයි... එකවර දෙදෙනෙකු තරහින් පිපිරිය යුතු නැහැ.

"ඔයා මගේ මේ ප්‍රංශ පාඩම කරගෙන යන්න දෙනවාද? නැතිද?" මොරියා බිහිසුණු හඬින් ඇසුවා.

ඩැරල් තම ප්‍රයත්නය අත් හැරියා.

ඊළඟ පුහුණුව ඉතාම නොව මඳක් සාර්ථක වුණා. ඇලිසියාගේ ජප ...රීම ඇතුළත් කළ යුතු බවට ඩැරල් තදින් කියා සිටි අතර නළල රැළි කර ...ත් මොරියා වැඩි යමක් කිව්වේ නැහැ. ඒ මන්ද යත් නාට්‍ය පිටපත ලිවීම ...නු ඩැරල්ගේ වැඩක් නිසාවෙනි. විල්ගේ හෝ ඇලිසියාගේ වැරැද්දක් අල්ලා

ගැනීමට මෙවර මොරියාට නොහැකි වුණා. දෙදෙනාගේම රංගනය අගය කළ යුතු මට්ටමක තිබූ අතර ඔවුන්ට දෙබස් ද හොඳින් මතක තිබුණා. ඩැරල්ගේ ඉල්ලීම මත විල් මෙවර නිවැරදි පසින් වේදිකාවට පිවිසුණ අතර සියල්ල හොඳින් සිදු වුණා.

එහෙත් අනෙක් දේවල් වැරදි ලෙස සිදු වුණා. අනෙක් අයගේ ඉදිරිපත්වීම් විවේචනයට හා දෝෂ දර්ශනයට ලක්වුණ අතර රාජ සභාවේ පිරිසට තම ගීතය සිව් වතාවක් ගායනා කිරීමට ද සේවිකාවන්ට නිවැරදි ලෙස ආචාර කිරීම ද ඉගැන්වීමට සිදු වුණා. කිපදෙනෙක් අනවශ්‍ය අවස්ථාවලදී කතා කර බැණුම් ඇසුවා.

මොරියා කෝපකාරී ලෙස හැසිරුණේ නැති වුව ද ඈ ඇඩි හා අප්‍රසන්න බවකින් යුතු වුණා. ඈ තමාව පාලනය කර ගැනීමට ඇඩි වෙහෙසක් ගත්තා. ඈ පහ පන්තියේ නායිකාවයි. ඈ ප්‍රසංගයේ නිෂ්පාදිකාවයි.

බර වැඩ සියල්ලටම කර ගැසූ ඈ සෑම දෙයක්ම යම් පිළිවෙළ කට පත් කරගෙන තිබුණා. තමාට කැමති පරිදි තමාගේම ක්‍රමයකට වැඩ කිරීමට ඈ අදහස් කරගෙන සිටියා. එහෙත් මෝඩ බෙටී කරන කියන පරිදි ස්තුති කරන්නට හෝ පිටට තට්ටු කර අගය කරන්නට හෝ මඳ සිනා නගමින් අන් අය දිරිමත් කරන්නට හෝ ඇගේ සූදානමක් තිබුණේ නැහැ.

කල් යත්ම වැඩි වැඩියෙන් කත් කෙඳිරිගෑම් නැගෙන්නට වුණා. ඩැරල්ට හා සැලීට මහත් බියක් දැනුණා. සාර්ථක වනවා වෙනුවට ඔවුන්ගේ නාට්‍යය සුණු විසුණු වී ගියහොත්?

ඉත් අනතුරුව තවත් බිහිසුණු දෙයක් ආරම්භ වුණා. ඒ නිර්නාමික ලියුම් පැමිණීමයි. අවසානයේ නමක් සඳහන් නොවූ කුඩුකේඩු පිළිකුල් සහගත ලියුම්. මෙම ලිපි ලැබුණේ පන්තියේ එක් දැරියකට පමණයි. ඒ මොරියා. ඇයට පළමු ලිපිය ලැබුණේ පුහුණුවීම් දිනයකදීයි. පොදු කාමරයේදී ලිපිය විවෘත කළ ඈ එය කියෙව්වා. පිළිකුළෙන් යුතුව ඈ හදිසියේම හඬක් නැගුවා.

"මේ මොකද?" ඩැරල් ඇසුවා.

මොරියා ලිපිය ඇය වෙතට විසි කළා.

"ඕක කියවලා බලන්න." ඈ කිව්වා.

එය කියවූ ඩැරල් කම්පනයට පත් වුණා. එහි මෙසේ සඳහන් වුණා.

*"පහ පන්තියේ නායිකාව ගැන අනෙක් අය කියන දේවල් ඔබ දන්නවාද? ඉක්මන් කේන්තිකාර, අසාධාරණ, ලොකුකම් හිතට ගත්ත, වැඩකට නැති කෙනෙක්. මේ වාරය අවසානයේදී ඉස්කෝලෙන් අස්වෙලා යනවා නම් තවම ප්‍රමාද වැඩි නැහැ.*

*මේ,*

*............"*

"හරිම පිළිකුල් සහගත දෙයක්." කලකිරීමෙන් යුතුව ඩැරල් කිව්වා. "කවුද මේ වගේ දෙයක් ලියන්න ඇත්තේ? අත් අකුරු හඳුනා ගනියි කියලා ලියලා තියෙන්නේ ඇදවෙච්ච අකුරුවලින්. ගණන් ගන්න එපා, මොරියා. නිර්ණාමික ලිපිවලට හිමි තැන ගිනි උඳුන."

මොරියා ලිපි කැබැල්ල ගිනි උඳුනට විසි කර දමා තමාගේ වැඩය පටන් ගත්තා. ඇය සිත රිදවා ගත්තා දැයි කීමට කිසිවෙකුට හැකි වුණේ නැහැ. එහෙත් එවැනි ලිපියක් ලිව්වේ කවුද යන්න ගැන සෑම දෙනාම පුදුමයෙන් කල්පනා කරන්නට වුණා.

ඊළඟ ලිපිය පසුදා පැමිනුණා. එය මොරියාගේ නම, පෙර පරිදිම ලොකු අකුරින් ලියා, මොරියාගේ පොත් ගොඩ මත තිබුණා. කිසිවක් නොසිතා ඇය එය දිග හැරියා.

***"ඔබට මගේ පළමු ලිපිය ලැබුණා. මම හිතන්නේ සතුටු ඇති. ළමයි ඔබ ගැන කියන දේවල් දැන ගන්න ආස ඇති නේද? එතකොට ඔයාගේ කන් දෙක රත් වෙයි. මේ පාසලේ ජනප්‍රිය නැතිම කෙනා ඔබයි. ඒක විශේෂ සම්මානයක්. ඒත් කාටද ඒ සම්මානය අවශ්‍ය? ඔබටමයි...!***

***මේ,***

***............"***

"මෙන්න තවත් එකක්." කී මොරියා විශේෂයකින් තොරව එය ඩැරල්ට හා සැලීට දුන්නා.

ඔවුන් එය කියෙව්වේ එය පසුපස තිබූ දුෂ්ට හා පිළිකුල් සහගත දේවල් ගැන කලකිරීමෙන් යුතුවයි. කුඩා පේළි කීපයක් වුව ද මෙම

ලියන කෙනාගේ යටි අරමුණ ඉතා නපුරු එකක් විය හැක.

"හොඳයි, මොරියා. මේ කවුරු වෙන්න පුළුවන් ද?" ඩැරල් ඇසුවා. "අපොයි, මහා කරදරයක්. මේ වගේ නිර්නාමික ලියුම් ලියන්නේ පහත්ම පහත් අය. මේ වගේ කෙනෙක් මැලෝරි ටවර්ස්වල ඉන්නවද කියලාවත් හිතාගන්න බැහැ."

"මම ඕවා ගණන් ගන්නේ නැහැ." මොරියා කිව්වා.

එහෙත් ඈ එය තදින් හිතට ගෙන තිබුණා. එම නපුරු වචන ගැන නිදි යහනේ සිට සිහිපත් කළ ඇයට එම වචන ගැන තදින් කලකිරුණා. ඇයට පුහුණුවීම් කටයුතු කිරීම ද එපා වුණා. පළමුව කරගෙන ආ පරිදිම ඉදිරියට යාමට ඇයට අවශ්‍ය වුණා. එහෙත් අසරණ මොරියාට තමාගේ ගති සිරිත් අතහැර වෙනස් වීම මහත් අපහසු කටයුත්තක් වුණා. ඇයට වෙනස් වීමට නොහැකි වුණා. ඈ සියලු දෙනාම ඇයට නතුවන පරිදි සකසා තිබුණා. එහෙත් ඔවුන් වෙනස් නොවීම තවත් කාරණයක්.

"ආයෙත් ඔය වගේ ලියුම් දිග හරින්නවත් එපා." සැලී ඊළඟ දිනයේ දුකට පත්ව සිටින මොරියාගේ පෙනුම දැක කිව්වා. "ඔයා දන්නවනේ ඒවායේ මොනවද තියෙන්නේ කියලා. ගින්දරට විසි කරන්න. ලියුමේ පිට පැත්ත බලපු ගමන්ම ඔයාට කියන්න පුළුවන් ඒකේ ඇතුළේ තියෙන දේවල්."

එහෙත් ඊළඟ ලියුම පැමිණියේ නිසියාකාර ලිපියක් ලෙස නොවෙයි. එය මොරියාගේ ලැක්රෝස් භාණ්ඩ තුළට ගුලි කර ඔබා තිබුණා. ඇත්තෙන්ම එය මොරියාගේ ක්‍රීඩා භාණ්ඩ තිබූ කොටස තුළ වූ බූට් සපත්තුවකට ගුලි කර දමා තිබුණා. එය පිටතට ගත් ඈ එහි තිබුණේ කුමක් දැයි වහා කියවා බැලුවේ එය විවෘතව තිබූ නිසයි.

***"ඒකාධිපති කියන්නේ කාට ද? මොරියාගෙන් අහන්න. මගෙන් අහන්න එපා.***

***මේ***

***.............."***

එහි තිබුණේ එපමණයි. මොරියා කෝපයෙන් ලිපිය පොඩි කර ැමුවා. මේවා ලියන්නේ යකාගේ එකියක්...! මොරියා රිදවීමට ලිවිය ුතු දේ හරියටම දන්නවා.

ඈ ඒ ගැන ඩැරල්ට කිව්වා. ඒ ගැන කිසිවෙකු හා කීමට ඇයට අවශ්‍ය නොවූව ද කෙසේ හෝ තමා මෙම සිද්ධියට නිර්භීත ලෙස මුහුණ දෙන බව පෙන්වීමට පියවරක් ගැනීමට ඇයට සිදුව තිබුණා. මේවා අන් අයට පත් වීමෙන් හා ඒ ගැන නොසලකා ඒ ගැන අන් අය සමග කතා කර තමා මේවා නොතකන බව මේවා ලියන කෙනාට පෙන්වීමෙන් තමා නිර්භීතව ඒවාට මුහුණ දෙන බව පෙන්වීමට ඇයට අවශ්‍ය වුණා.

ඩැරල්ට ලිපි කැබැල්ල පෙන්වන අතරේ අය හඬ නගා සිනා නැඟුවා.

"මේ සැරේ, ටිකක් කෙටි එකක්." ඈ කිව්වා. "ඒත් ඒ තරම් දෙයක් නැහැ."

"ඕ, මේක හරිම පිළිකුල් සහගතයි...!" ඩැරල් කිව්වා.

"මේ කවුද කියලා අපි හොයන්න ඕනෑ. අපි මේක නවත්වන්න ඕනෑ. මැලෝරි ටවර්ස්වල හිටිය කාලයට මම නම් කවදාවත් මේ වගේ දෙයක් දිගටම සිද්ධ වෙනවා අහලා දැකලා නැහැ. නරකම කුඩුකේඩු ලියුම්...! මොරියා, ඇයි ඔයා මේ ගැන හොයන්නේ නැත්තේ? මට මේ වගේ ලියුම් ලැබුණොත් මම නම් හුඟක් දුකට පත් වෙනවා. මේ කතා ඇත්ත නොවුණත්." ඈ හදිසියේ වැඩිදුරටත් කිව්වා.

"ඔයා ඇත්ත, නැත්ත කතාවක් කියන්න ඕනෙ නැහැ." මොරියා ශාන්තමට මඳ සිනහවක් මවා ගෙන කිව්වා. "ඒවා ඇත්ත. ඔයාලා හැම කෙනෙක්ම වගේ මට ඒකාධිපතියා කියලා කිව්වේ නැද්ද?"

ඩැරල් බියපත්ව ඇය දෙස බලා සිටියා.

"මොරියා, ඔයා හිතනවාද මේවා කරන්නේ මම කියලා? නැතිනම් සැලී හරි, ඇලිසියා හරි...."

දෙවුර ගැස්සූ මොරියා පසෙකට හැරුණා. කලකිරීමෙන් යුතුව ඩැරල් ඈ දෙස බලා සිටියා. ඈ සැලී වෙතට හැරුණා.

"මේ කවුද කියලා අපි හොයන්නම ඕනෑ. මොරියාට අපි හැම කෙනෙක්ම සැක කරන්න ඉඩ දෙන්න බැහැ. මේ වගේ දේවල් දිගටම සිද්ධ වෙනවා නම් අපගේ පුහුණුවීම්වලට මොනවා වෙයිද?"

හතරවන ලිපි කැබැල්ල එය යොමු කරන ලද කෙනාට ලැබුණේ නැහැ. ඇත්තෙන්ම එය නැමීමකින් තොරව මොරියාගේ පොත් ගොඩ උඩ තිබූ පොතක් තුළට රිංගවා තිබුණා. එහෙත් එම පොත නාට්‍ය හා රංග කලාව සම්බන්ධ පොතක් වූ අතර එය මොරියාට බලා ගැනීමට දී තිබුණේ පොට්ස් ගුරුතුමියයි. එය කියවා අවසාන කර තිබූ නිසා නැවත එය පෙරළා බැලීමකින් තොරව මොරියා එය පොට්ස් ගුරුතුමියට ආපසු භාර දී තිබුණා. නිර්ණාමික ලිපිය පොත තුළම තිබුණා.

මෙලෙස එය ලැබුණේ පොට්ස් ගුරතුමියටයි. ඇය මම්සළී සමඟ එකට සිටි කාමරයේ ගෙබිම මත එය වැටුණා. එය අහුලා ගත් ඈ එය කියෙව්වා.

***"මේ ලියුම ගැන ඔබට දුක ද? තව බොහොමයක් ලැබෙයි. මට තව ඔබට කීමට දේවල් හා විශේෂණ තියෙනවා. ඔබට මන්ත්‍ර රැජින, බටකොළ ආච්චි කිව්වොත් කොහොම ද? ඔබ කොහොමත් නපුරු මන්ත්‍රකාරියක් වගේ රවන, ගොරවන, විරිත්තාගෙන කඩා පනින කෙනෙක්. ඔබේ පෙනුම ඒ වගේමයි.***

***මේ,***

***..............."***

මෙම ලිපිය දැක පොට්ස් ගුරුතුමිය විමතියට පත් වුණා. ඈ නැවතත් එය කියෙව්වා. මේක එවා ඇත්තේ කාට ද? ලිපිය අනෙක් පස බැලූ ඇයට ඈද වූ අකුරින් ලියා තිබූ නම දැක ගත හැකි වුණා.

*'මොරියා'*

'මොරියා...!' ඈ තමාටම කියා ගත්තා. 'එහෙමනම් මම එයාට දුන්න පොත ඇතුළට කවුරු හරි මේක ඇලා. නිර්ණාමික ලියුමක්. ඒ වගේම හරිම කැත එකක්. මේ වගේ පහත් වැඩක් කරන්න කවුරු නම් හිතුවා වෙන්න පුළුවන් ද?'

ඈ අත් අකුරු පරීක්ෂා කර බැලුවා. සියලුම අකුරු ප්‍රවේසමෙන් ඇද කර ලියා තිබූ නිසා ඇයට හෝඩුවාවක් අල්ලා ගැනීමට නොහැකි වුණා. එතැන සිට ගත් පොට්ස් ගුරුතුමිය ලිපිය දෙස බලාගෙන සිටියා. සෑම වැදගත් කෙනෙක්ම සිතන පරිදි නිර්ණාමික ලිපි ලිවීම

උමතු හෝ බියගුලු කෙනෙකුගේ වැඩක් ලෙසයි ඈ දුටුවේ. තමන්ට සිතෙන දේ නිර්භීතව, විවෘතව කීමට ඔවුනට නොහැකියි. ඔවුන් එය රහසිගතව, පිළිකුල් සහගත ආකාරයට කරනවා.

ඈ මොරියාව කැඳෙව්වා. මොරියා අනෙක් ලිපි ගැන ද ඇයට කිව්වා.

"කවුද මේවා එවන්නේ කියලා ඔයාට අදහසක් තියෙනවද?" පොට්ස් ගුරුතුමිය ඇසුවා.

මොරියා මඳක් පැකිළුණා.

"ඔව්, ඒත් මට ඒ ගැන හරි විශ්වාසයක් නැහැ. ඒ නිසා මට කියන්න බැහැ."

"ගිහින් ඩැරල්වයි, සැලීවයි එක්ක එන්න." පොට්ස් ගුරුතුමිය ඔවුන්ගෙන් යමක් දැන ගැනීමට හැකි වනු ඇතැයි සිතා කිව්වා. "මේ වැඩය නවත්වන්න ඕනෑ. මේ වගේ වැඩ කරන කෙනෙක් එක සැරයක් බේරිලා ගියොත් ඊළඟ සැරේ මොනවා කරයිද කියන්න බැහැ."

ඩැරල් සහ සැලී පැමිණුනා. ඔවුන් ලිපිය කියෙව්වා. ඩැරල් මහත් අපහසුතාවයට පත් වුණා.



"හරිම නපුරුයි." ඈ කිව්වා.

"කවුද මේ ලිපි ලියන්නේ?" පොට්ස් ගුරුතුමිය තදින් ඇසුවා.

දැරියෝ තිදෙනාම ඉවත බලා ගත්තා.

"හරි." පොට්ස් ගුරුතුමිය නොඉවසිල්ලෙන් කතා කළා. "මේක පස්ස ගහන වැඩක් නොවෙයි නේද? ඔයාලා හිතන්නේ නැද්ද මේ වැඩය නවත්වන්න ඕනෑ කියලා?"

"ම.... ඔව්." ඩැරල් කතා කළා.

"හරි, එහෙනම් මේවා ලියන්නේ කවුද කියලා මොනවා හරි අදහසක් තියෙනවා නම් මට කියන්න." පොට්ස් ගුරුතුමිය කිව්වා. "එතකොට මට පුළුවන් කෙළින්ම මේ ගැන විසඳන්න."

"හරි, බලන්න හුඟක් අය ඉන්නවා. එයාලගෙන් කෙනෙක් තමයි..." ඩැරල් කිව්වා.

"හුඟක් අය...?" පොට්ස් ගුරුතුමිය විශ්වාස කළ නොහැකිව කිව්වා. "ඔයා කියන්නේ මේ වගේ පහත් වැඩක් කරලා මොරියාට රිදවන්න තරම් මොරියාට කැමති නැති හුඟ දෙනෙක් ඉන්නවා කියලද?"

නිහැඬියාවක් ඇති වුණා. පොට්ස් ගුරුතුමිය කේන්තියෙන් කතා කළා.

"මොරියාට ඒ තරම් හතුරෝ ඉන්නවාද? ඒ ඇයි? පන්ති නායිකාව හැටියට එයාට විරුද්ධව මට කිසිම පැමිණිල්ලක් ලැබිලා නැහැ. හුඟක් අය මොරියාට කැමති නැහැ කියලා ඔයාලා කියන්නේ ඇයි?"

මෙය ඉතා අපහසුවට පත්වන, කර කියාගත නොහැකි අවස්ථාවක්. මොනවා කරන්න ඇයි ඩැරල්ට හෝ සැලීට සිතාගත නොහැකි වුණා. ඔවුන් බේරා ගැනීමට මොරියා ඉදිරිපත් වුණා. සුදුමැලි වූ ඈ ඇඩි වෙහෙසක් ගන්නා බව පෙනුණා.

"මම කියන්නම් කවුරු වෙන්න පුළුවන්ද කියලා, මිස් පොට්ස්." ඈ කිව්වා. "ග්වෙන් වෙන්න පුළුවන්. මොරීන් වෙන්න පුළුවන්. නැතිනම් ඇලිසියා."

"නැහැ....!" ඩැරල් සහ සැලී දෙදෙනාම එකවිට කිව්වා.

"කැතරින් වෙන්න පුළුවන්. තව බ්‍රිජට් වෙන්න පුළුවන්." මොරියා කියාගෙන ගියා.

"බ්‍රිජට්....! ඔයා කියන්නේ හතරේ ඉන්න ඔයාගේම නංගී." විමතියට පත් පොට්ස් ගුරුතුමිය ඇසුවා.

දුකට පත් මොරියා හිස සැලුවා. ඇයට ඩැරල් හෝ සැලී දෙස එක එල්ලේ බැලීමට නොහැකි වුණා. පොට්ස් ගුරුතුමිය ඔවුන් වෙතට හැරුණා.

"මේ අය ගැන ඔයාලා මොනවද හිතන්නේ?" ඇ විමසුවා.

"හොඳයි, ඒ අයගෙන් ඕනෑම කෙනෙක් වෙන්න පුළුවන්. ඒත් ඇලිසියා හැර." ඩැරල් කිව්වා. "පුහුණුවකදී වුණ සිදුවීමක් නිසා ඇලිසියා මොරියා එක්ක තරහින් ඉන්න බව ඇත්ත. ඒත් ඇලිසියාගේ හොර වැඩ නැහැ. මේ හැම දෙයක්ම කියලා එයාට මොරියාට බනින්න උවමනා වුණා නම් එයා හැම කෙනෙක්ම ඉස්සරහා ඉද්දි කෑ ගහලා කියනවා. මේක කරන්නේ කොහොමවත් ඇලිසියා වෙන්න බැහැ."

"මම ඔයා කියන එක පිළිගන්නවා." පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඇත්තටම අපිට ඇලිසියාව අතහරින්න පුළුවන්. ඒත් මේ වගේ දෙයක් කරන්න තරම් මොරියා එක්ක තරහා අය හතර දෙනෙක් තවත් ඉන්නවා කියලයි මොරියා කියන්නේ. මොරියා, ඔයා ගැන මේ තරම් තරහා අය ඔයා වටේ ඉන්නවා කියන එක හරිම භයානක දෙයක් නේද? එයාලව තරහා කර ගන්න ඔයා මොනවද කරලා තියෙන්නේ?"

මොරියා කිසිවක් කීවේ නැහැ. මේ හතර දෙනා තමාව එසේ පිළිකුල් කරන්නේ මන්දැයි ඇ හොඳින් දැන සිටියා. පසුගිය සතියේ පුහුණුවීම් අතරේදී වේදිකාව මතදී හැමෝම ඉදිරියේ ඇ ග්වේන්ට හා මොරීන්ට අනුකම්පා විරහිත ලෙස බැණ වැදී ඔවුන් ලැජ්ජාවට පත් කර තිබුණා. කැතරින් තමා වෙනුවෙන් කළ දහසකුත් දේවල් පසෙක ලා ඇගේ අනවශ්‍ය කැපවීම් හාස්‍යයට ලක් කොට ඇගේ සිත රිදවා ඇය පාපිස්සක් තරම්වත් නොවටිනා බව කියා මොරියා ඇයට අපහාස කර තිබුණා.

බ්‍රිජට් සම්බන්ධයෙන් ගත් කල, මේ සහෝදරියන් අතර කිසිම සෙනෙහසක් පැවතුණේ නැහැ. බ්‍රිජට් තමාව පිළිකුල් කරන බව මොරියා දැන සිටියා. එමෙන්ම බ්‍රිජට් තමාගෙන් පළිගන්නා බවට දිවුරා නොතිබුණ ද, ඒ මේ මෑතකදී සිදු වූ දෙයක්. ඇය කියා තිබුණේ 'මම නොකිව්වා කියන්න එපා, මොරියා. ඔයාට මේ ගැන දුක් වෙන්න වෙයි. මෙම නොකිව්වායි කියන්න එපා...!'

හොඳයි, ඒ කැතරින් හෝ ග්වේන් හෝ මොරීන් හෝ නැතහොත් බ්‍රිජට් හෝ විය හැකියි. කෙසේත් ඒ ඇලිසියා විය නොහැකියි. ඒ මෙම ලිපි පැමිණිය යුත්තේ බියගුල්ලියකගෙන් විය යුතු අතර කිසිවෙක් ඇලිසියාට බියගුල්ලියක් නොකියයි.

මේ නපුරු ලියුම් ලියන්නේ කවුද? ඔවුන්ට කවදා හෝ එය සොයා ගැනීමට හැකි වෙයිද?

20

නොයෙක් ආකාරයේ දේවල් එම සතිය පුරා සිදු වුණා. ඊළඟ පුහුණුවීමේදී ද මොරියා හා ඇලිසියා අතර ගැටුමක් ඇති වුණා. එය ඉතා දරුණු එකක් වූ අතර අවසන් වුණේ ඇලිසියා සන්දර්ශනයෙන් ඉල්ලා අස්වීමෙනුයි. බෙටී ද ඒ වහාම සම නිෂ්පාදිකා තනතුරින් ඉල්ලා අස් වුණා. එය සැලීට හා ඩැරල්ට දරුණු පහරක් වුණා.

"ඔයා නැතිව අපිට මේක කරන්න බැහැ, ඇලිසියා." ඩැරල් බැගෑපත් වුණා. "ඔයා වගේ මායාකාර රජ කෙනෙකු අපට කොහොමවත් හොයා ගන්න බැහැ. ඔයාගේ විජ්ජා වැඩ, සර්කස් වැඩ වගේ හුඟක් දේවල් කරන්න. ඔයා අස් වුණොත් ඔයා සම්පූර්ණයෙන්ම මේ වැඩය විනාශ කරනවා."

"අස් වුණොත්....! මම අස්වෙලා ඉවරයි...!" ශාන්ත වූ ඇලිසියා කලබලයකින් තොරව කිව ද ඩැරල් අපහසුවට පත්ව සිටිනු දැන ඇය කලකිරීමෙන්, දුකින් හා අවාසනාවන්ත බව නිසා හට ගත් කෝපයෙන් ද ඉහවහා යන්නට වුණා. "ඔයාටත් මේක බලපාන එක ගැන මට කනගාටුයි. ඒත් මම තව දුරටත් මොරියා එක්ක වැඩ කරන්නේ නැහැ. මේ ලෝකේ කිසිම කෙනෙක් නිසා මම ආයෙත් නාට්‍යයට සම්බන්ධ වෙන්නෙ නැහැ, නැහැමයි. මොරියා ඉල්ලා අස්වෙලා සමාව ගත්තත් මම එන්නේ නැහැ."

මොරියා එය කිසිදින නොකරන බව ඩැරල් දැන සිටියා. ඇලිසියාගේ මුරණ්ඩුකම තරමටම ඇය ද හිතුවක්කාර වුණා.

"ඕ... ඇලිසියා, මා ගැන හිතලා ආයෙත් එන්න." ඩැරල් කෙඳිරි ගෑවා. "අනේ, නාට්‍යය පෙන්වන්න තව තියෙන්නේ සති තුනයි. ඔයාගේ කොටස් අඩු කරලා මට පිටපත ආයෙත් ලියන්න බැහැ. ඔයාගේ චරිතය නිතරම යෙදෙනවා."

"ඩැරල්, අවංකවම මට කනගාටුයි." හිරිහැරයට පත් වූ බැල්මකින් ඇලිසියා කිව්වා. "ඒත් ඔයා දන්නවා, මම කවදාවත් කියපු

වචනෙ වෙනස් කරන්නේ නැහැ. ඒක මගේ ආඩම්බරකම වෙන්න ඇති. මට බැහැ ආයෙත් මොරියාගේ අණසකට යටත් වෙන්න. මම ආයෙත් ආවොත් වෙන්නෙ ඒක. මේ ලෝකයේ කිසිම දෙයකට බැහැ මාව එතෙනට තල්ලු කරන්න."

ඩැරල් බලාපොරොත්තු සුන්ව ඇලිසියා දෙස බලා සිටියා. දඬරකාරී, මුරණ්ඩු, හිතුවක්කාර ඇලිසියා. ඇගේ අලංකාර නාට්‍යය, එමෙන්ම ඉතා අගනා මායාකාර රජුගේ චරිතය, විජ්ජා හා සර්කස් නැතිව යනු ඇත. ඇලිසියා හැර අන් අයෙකුට එය කළ නොහැකියි.

ඩැරල්ව සැනසීමට උත්සාහ කරමින් සැලී ද ඇය හා පිටව ගියා.

මොරියා තවත් මුරණ්ඩු වුණා. ඈ එම කාරණය ගැන කිසිසේත්ම කතා කරන්නේ නැහැ. ඈ ඉල්ලා අස්වන්නේ ද නැහැ.

"මම කියන්නේ මෙච්චරයි. සිද්ධ වුණ දේ ගැන මට කනගාටුයි. මම මේක පටන් ගත්තේ නැහැ. ඇලිසියා තමයි තරහා ගිහින් අස් වුණේ." ඈ කිව්වා. "ඒ ගැන ඊට වඩා වචනයක් හෝ ඇය කතා කරන්නේ නැහැ."

ඊළඟ අපූරු සිද්ධියට ආරම්භයක් දුන්නේ මම්සලීයි. දිනක් පොට්ස් ගුරුතුමියගේ කාමරයේ වාඩි වී සිටි ඈ කාමරය අස්පස් කිරීමට ඇයට අදහසක් ඇති බව ප්‍රකාශ කළා.

"දැන් කාලය පහුවෙලාත් එක්ක." පොට්ස් ගුරුතුමිය අමනාපයෙන් කිව්වා. "ගිය අවුරුද්දට එපිට අවුරුද්දේ ප්‍රශ්න පත්‍රත් ඔයාට හම්බ වෙයි. මම හිතන්නේ, මගේ ජීවිතේට කාගේවත් මේසයක් උඩ මේ තරම් කසල ගොඩවල් මම දැකලා නැහැ."

"හා... මිස් පොට්ස්....! විහිළු කරනවාද?" මම්සලී කේන්තියෙන් කිව්වා.

"නැහැ." පොට්ස් ගුරුතුමිය කිව්වා. "නිකම්ම ඇත්ත."

නාසයෙන් පිම්බ මම්සලී, අපිළිවෙළකට තිබූ පිටු සියයක පමණ කාළ ගොන්නක් අතට ගත්තා. ඇය එය ඔසවන විටම බුරුල්ව ගිය කාළ ලිස්සා වැටී ගෙබිම පුරා විසිරුණා. කුඩා පොත් පිංචක් පාවී

ගොස් පොට්ස් ගුරුතුමියගේ දෙපා මුල නැවතුණා. එහි පිට කවරයේ මැජික්කරුවෙකු විජ්ජාවක් පෙන්වන ඉතා සිත් ඇද ගන්නා වර්ණවත් පින්තූරයක් වූ නිසා ඈ ඒ දෙස උනන්දුවෙන් බැලුවා.

"අලුත් විජ්ජා, පරණ විජ්ජා, සතුරන්ට කරන ඇස්බැන්දුම්, මිතුරන්ට කරන ඇස්බැන්දුම්." ඈ හඬ නගා කියෙව්වා.

ඈ පුදුමයෙන් මම්සලී වෙත බැල්මක් හෙළුවා.

"කවදා ඉඳලාද ඔයා විජ්ජා වැඩ කරන්න හිතුවේ?" ඈ විමසුවා.

"මම තවම හිතලා නැහැ." තවත් පිටු සීයක් පමණ ගෙබිම මත අත හරිමින් මම්සලී කිව්වා. "අපොයි...! මෙන්න මීට අවුරුදු හයකට ඉස්සර තුනේ පන්තියේ ළමයි කරපු සංදර්ශනයක වැඩසටහන...!"

"මම කිව්වේ නැද්ද?" පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඔයාගේ මේසයේ තව ටිකක් ඇදලා බැලුවොත් මැලෝරි ටවර්ස් පළමු වාරය ආරම්භ කළ දවසේ කළ පළමු කතාවත් හම්බ වෙන්න ඉඩ තියෙනවා."

"ඔච්චම් කරන්න එපා." මම්සලී කිව්වා. "මම කැමති නැහැ මට හිනා වෙනවාට."

"මම හිනා වෙනවා නොවෙයි." පොට්ස් ගුරුතුමිය කිව්වා. "මම ඇත්තටමයි කතා කරන්නේ. මේ.... කොහෙන්ද ඔයාට මේ විජ්ජා - ඇස්බැන්දුම් වැඩ පොත? බලන්න මේක දිහා, මම හිතන්නේ ඇලිසියායි, බෙටීයි ඔයාට කරන හැම විහිළුවක්ම මේකේ තියෙනවා කියලා."

මම්සලී පොත් පිංච අතට ගත්තා. ඉක්මනින්ම ඇගේ සම්පූර්ණ අවධානය එතුළ ගිලී ගියා. ඈ මුවින් හඬක් නැගුවා. ඈ හඬ නගා හිනාසුණා.

"අපොයි....!" ඇයට කියැවුණා.

"ඕ - ල - ලා" දස වතාවක් පමණ කියැවුණා.

පොට්ස් ගුරුතුමිය තමාගේ වැඩයෙහි නියැළී සිටියා. මම්සලීගේ මෙවැනි විකාර වැඩ ඇයට හුරුයි.

සෑම වර්ගයකම ඇස්බැන්දුම් උපක්‍රම සහිත මෙම පොත වැනි වෙනත් කිසිම දෙයක් මම්සලීගේ ජීවිතයට ඇය මෙතරම් රසවත්ව කියවා තිබුණේ නැහැ. ඈ සම්පූර්ණයෙන්ම පිටු අතර මංමුළා වුණා. ඈ කියවූ දේ අතර මිනිසුන්ට හානියක් නොවී තම අතේ ඇඟිලිවල භාගයක් කැපුණ බව පෙන්වන උපකරණ ද නොඇල් වූ නමුත් ඇල් වී දිලිසෙන දුම්වැටි ද සැබෑ නොවන නමුත් අම්මාවරුන් හා ගුරුවරුන් හිරිහැරයට පත් කරවන ලෙස මේස රෙදි මත ඉහිරවිය හැකි තීන්ත හා හොදි පැල්ලම් ද ආදී වශයෙන් නොයෙක් දේ තිබුණා.

මේවා පිළිබඳ ඉතා පැහැදිලි විස්තර පොත් පිංචේ අඩංගු වුණා. මම්සලී සම්පූර්ණයෙන්ම කුල්මත් වුණා. ඇයට තදින් සිනා පහළ වන ආකාරයෙන් ඇස්බැන්දුමක් ඇයට කියවන්නට ලැබුණා.

"ඕන්, දැන් අහගන්න මිස් පොට්ස්." ඈ පටන් ගත්තා.

"බැහැ, මම්සලී." පොට්ස් ගුරුතුමිය තදින් කිව්වා. "පළමු පන්තියේ ප්‍රශ්න පත්‍ර විසි තුනක් බලන්න තියෙනවා. ඒවා අදම ඉවරයක් නොකොළොත් ආයෙත් වෙලාවක් නැහැ. මට ඔයාගේ ළමා විජ්ජා ගැන අහන්න වෙලාවක් නැහැ."

සුසුමක් හෙළූ මම්සලී නැවත තම කියවීම ආරම්භ කළා. ඇගේ සිත ඇද බැඳ ගත් විජ්ජාව ගැන ඇය නැවතත් කියවන්නට වුණා. විස්තරය සමග ඡායාරූප දෙකක් ද තිබුණා. එකකින් සිනාමුසුව සිටින සාමාන්‍ය දත් සහිත පුද්ගලයකු පෙන්නුම් කෙරුණ අතර අනෙකෙහි ද එම පුද්ගලයාම පෙනී සිටි අතර, ඒ මැජික් දත් සමග ඔහුට තිබුණේ බිහිසුණු පෙනුමක්.

මම්සලී විස්තරය නැවතත් කියෙව්වා.

*'මේ දත් රබර් හා ප්ලාස්ටික්වලින් නිම වී ඇති අතර පලඳින්නාගේ දත් සම්පූර්ණයෙන් වැසෙන පරිදි දක්ෂ ලෙස සකසා ඇත. පලඳින්නා සිනාසෙන විට ඒවා පහළටත් ඉදිරියටත් ඇදී ඉතා අසාමාන්‍ය බිහිසුණු පෙනුමක් ගෙන දෙයි.'*

මම්සලී ඡායාරූප දෙස හොඳින් බැලුවා. එවැනි දත් පැලඳ සිටින ආකාරය ඇගේ සිතේ මැවුණා. එමෙන්ම හදිසියේම දැරියන්ට ඳ සිනාවක් පා ඒවා විලිස්සා පෙන්වන ආකාරය. හා... ඔවුන් විජ්ජාවක් කරන මෙන් ඇයට අභියෝග කර තිබුණා. මෙම විජ්ජා

දත් තැපැල් මගින් ගෙන්වා ගැනීමට මම්සලීට හොඳ අදහසක් පහළ වුණා. සමහර වෙලෙක ලැක්රෝස් තරගයක් පැවැත්වෙන විටකදී පිටියේදී හෝ නැතහොත් දැරියන්ට පා ගමනක් කැඳවා ගෙන ගොස් ඒ අතරතුර දී ඇයට විජ්ජා දත් පෙන්වීමට හැකිවනු ඇත.

විසිරුණු කොළ කැබලි ඇවිස්සූ මම්සලී ඇගේ ලියුම් ලියන කොළ සහිත පොත සොයා ගත්තා. ඇගේ ප්‍රංශ අත් අකුරින් මැජික් ආයතනයට ලිපියක් ලියූ ඈ විජ්ජා දත් කුට්ටමක් ඉල්ලා ඇණවුමක් ද චෙක්පතක් ද සකස් කළා. ඈ ඇඩ් සතුටට පත් වුණා. ඈ මේ ගැන අඩුම තරමේ පොට්ස් ගුරුතුමියට හෝ කිව්වේ නැහැ.

ඇණවුම් ලිපිය හා චෙක්පත ලියා අවසන් කළ මම්සලී පොත් පිංච පසෙකට විසි කිරීමට පෙර උනන්දුවකින් තොරව අනෙක් පිටු ද පෙරලා බැලුවා. එවිටයි ඇයට ලිපි කැබැල්ලක් හමුවූවේ. එය ඉතා ප්‍රවේශමෙන් ඇද අකුරින් ලියා තිබුණා. එය ආමන්ත්‍රණය කර තිබුණේ,

*ෂෙලිසිට්ට,*

*ඔබ සිතා සිටින්නේ ඔබ ක්‍රීඩාවලට දක්ෂයි කියා නේද? හරි, ඔබව තරග කණ්ඩායම්වලට තෝරා ගන්නේ ඩැරල් ඔබට වැඩි සැලකිලි දක්වන නිසයි. කවුරුත් එය දන්නවා.*

එහි කිසිදු අත්සනක් තිබුණේ නැහැ.

“මෙන්න මහා කැත ලියුමක්.” මම්සලී පිළිකුලෙන් කිව්වා.

ඈ එය පොට්ස් ගුරුතුමියට දුන්නා. පොට්ස් ගුරුතුමිය එක්වරම අකුරු හඳුනා ගත්තා. ඒ මොරියාට එවා තිබූ නිර්ණාමික ලිපියේ තිබූ අකුරුමයි.

“ඔයාට කොහෙන්ද මේක ලැබුණේ?” ඈ තියුණු හඬින් ඇසුවා.

“මට මේක ලැබුණේ මේ විජ්ජා පොතේ තිබිලා.” විමතියට පත් මම්සලී කිව්වා.

“කාගේද ඔය පොත? කොහෙන්ද ඔයාට ලැබුණේ?” පොට්ස් ගුරුතුමිය තදින් ඇසුවා.

"මම ඒක ගත්තේ අර පොඩි හෙර කෙල්ල ජූන්ගේ ඩෙස් එකෙන්." මම්සලී කිව්වා.

"හරිම අපූරුයි." පොට්ස් ගුරුතුමිය කිව්වා.

නැගිට ගත් ඈ දොර වෙතට ගියා. ඈ ඩැරල්, සැලී හා මොරියාට දැරියක අත පණිවිඩයක් යැව්වා. ඔවුන් පුදුමයට පත් පෙනුමින් යුතුව පැමිණුනා.

"මම හිතන්නේ ලියුම් ලියන කෙනා මට අහු වුණා." පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඒත් එයා එක්ක කතා කරන්න ඉස්සර මට දැන ගන්න ඕනෑ එයා ඔයා එක්ක තරහා වෙන්න හේතුවක් තියෙනවාද කියලා මොරියා. එයා පළමු පන්තියේ ජූන්."

"ජූන්....!" සෑම කෙනෙක්ම විමතියෙන් හඬ නැගුවා.

මොරියා පොට්ස් ගුරුතුමිය දෙස බැලුවා.

"ඔව්, මම හිතනවා එයාට මා එක්ක තරහා වෙන්න හේතුවක් තියෙනවා කියලා. වෙල්ස්බරෝ එක්ක තරගයේදී එයා කපටි විදිහට හැසිරුණ නිසා මම එයාගේ නම ලැයිස්තුවට දුන්නේ නැහැ කියලා බැන්නා. එයාට කණ්ඩායම් හැඟීමක් නැහැ කිව්වා. අනික ඩැරල් ෆෙලිසිටිව තෝරා ගත්තේ එයාගේ සහෝදරිය නිසයි, එයා පැත්තක් ගන්නවයි කියලා මා ඉදිරියේම චෝදනා කළ එකට මම එයාට කිව්වා සමාව ගන්න කියලා."

පොට්ස් ගුරුතුමිය හිස සැලුවා.

"හරි, එහෙමනම්, ඒ ජූන්ම තමයි. මට තේරෙන්නේ නැහැ. මට එයා දැන්ම හමුවෙන්න ඕනෑ. එයාව මා ළඟට එවන්න. මම හිතන්නේ මේක මිස් ග්‍රේලින්ම විසඳන්න ඕනෑ කාරණයක් කියලයි. ජූන්ගේ වැඩ ගැන සතුටු වෙන්න බැරි නිසා එයාව මෙහෙන් අස් කරලා යවන්න මේකත් සෑහෙයි. එයාව අයින් කරන්න සුළු කාරණයක් තිබුණ නම් ඇති. මේක එයාගේ ඉතාම පිළිකුල් සහගත වැඩක්. නිර්නාමික ලියුම් යැවීම."

ජූන් පැමිණියේ දබරයට බර වුව ද බියපත් පෙනුමකින්. ඇයව කැඳවා ඇත්තේ කුමක් නිසා දැයි ඇයට පවසා තිබුණේ නැහැ.

"ජූන්, මම ඔයාව මෙහාට කැඳෙව්වේ බොහොම බරපතළ කාරණයක් ගැන කතා කරන්න." පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඔයා නරක විදිහේ නිර්නාමික ලියුම් ලියනවා කියලා මට දැනගන්න ලැබුණා. නැහැයි කියන්න සූදානම් වෙන්න එපා. ඒකෙන් වැඩේ තවත් නරක් වෙනවා. ඔයාට කරන්න තියෙන්නේ අවංකවම ඇත්ත කියන්න විතරයි. ඇයි ඔයා එහෙම කළේ?"

පොට්ස් ගුරුතුමිය මේ සියල්ල සොයා ගත්තේ කෙසේ දැයි කීමට ජූන්ට අදහසක් තිබුණේ නැහැ. ඇය සුදුමැලි වුව ද නිර්භීත බවක් පළ කළා.

"ඔය කියන්නේ මොරියාට යවපු ඒවා නේද? ඉතින් එයාට එහෙම වෙන්න ඕනෑ. හැම කෙනෙක්ම එයා එක්ක තරහයි."

"ඒක මෙතෙන්ට අදාළ නැහැ." පොට්ස් ගුරුතුමිය කිව්වා. "අපි කතා කළ යුතු කාරණය මේ ඉස්කෝලයේ පළමු පන්තියේ ඉන්නවා දවසක බරපතළ වැරදි කරලා හිරේ ලගින්න පුළුවන් විදිහේ වැරදි වැඩ කරන ළමයෙක්. මේ වැඩය බියගුල්ලෝ විතරක් කරන ඔයා වගේ හුඟක් ලොකු ළමයෙක් කරයි කියලා හිතන්න බැරි, හොර වැඩ නැති නම් පස්සෙන් ඉඳලා පිහියෙන් අනින චරිත විතරක් කරන චරිතයකට ගැළපෙන දෙයක්."

ඈ මඳක් නැවතුණා. ඇගේ දෙනෙතේ බැල්ම රත් වූ යකඩ කූරු දෙකක් මෙන් බියපත් ජූන්ගේ සිරුර තුළට විනිවිද ගියා.

"අපි මේ වගේ දේවලට කියන්නේ නිහීන වැඩ කියලා." ඈ කියාගෙන ගියා. "මේ වගේ අය සදාතනික පිළිකුලටත්, වෛරයටත් භාජනය වෙනවා වගේම පහත් අයගෙත් පහත් අය විදිහටයි සලකන්නේ. ඔයා ඒක දැනගෙන හිටියාද?"

"නැහැ." පිට කරන සුසුමක් සමග ජූන් කිව්වා.

"මේ කාරණය මිස් ග්‍රේලින් ළඟට යවන්න ඕනෑ." ඈ කිව්වා. "මා එක්ක එන්න. ෆෙලිසිටිට ලිව්ව මෙන්න මේ ලියුම මම්සළිට ලැබුණා කියලා දැන ගන්න ඔයා කැමති ඇති. මේකෙන් තමයි මම හොයා ගත්තේ මේ ලියුම් ලියන්නේ කවුද කියලා."

ෆෙලිසිටිට තමා ලිවූ ලිපි කැබැල්ල දෙස ජූන් හදිසි බැල්මක් හෙළුවා.

"මම ඒක එයාට දුන්නේ නැහැ." ඈ කිව්වා. "මම දෙන්න හිටියේ. ඒත්, මම දුන්නේ නැහැ. මම ඒක කොහේ හරි පොතක් අස්සේ දාන්න ඇති."

"අපි කරන පව් අපි පස්සේම එනවා." පොට්ස් ගුරුතුමිය දැඩි ස්වරයෙන් කිව්වා. "හැම තිස්සේම ඒක එහෙමයි. එන්න මා එක්ක."

"මිස් පොට්ස්, මාව.... මාව.... අස් කරයි ද?" ජූන් ඇසුවා.

ඒ නිර්භීත, මුරණ්ඩු ජූන් නොව, ඒ හදිසියේම උලකින් අනිනු ලැබූ හුළං බැස ගිය බැලුමක් බඳු වූ ජූන්.

"ඒක තියෙන්නේ මිස් ශ්‍රේලින් අතේ." කී පොට්ස් ගුරුතුමිය නැඟී සිටියා. "යමු මා එක්ක."

ටික වේලාවකින් මේ ආරංචිය පාසල පුරා පැතිරුණා.

"එයාව මිස් ශ්‍රේලින් ළඟට යවලා. ඕනෑම ඔට්ටුවක්, එයාව ඉස්කෝලයෙන් අස් කරනවා. කොහොම වුණත් එයාගෙන් වැඩක් නැහැ."

ඇලිසියා භීතියෙන් සවන් දුන්නා. ඇගේම ඥාති සහෝදරිය. අනෙක් අය වගේම ඇය ද ජූන්ට මනාප වූයේ නැහැ. එහෙත් මෙලෙස කරදරයට පත්ව, අවමානයට ලක්ව ඇත්තේ ඇගේම ඥාති සොහොයුරියකි. ඇගේ සිත බොහෝ සේ පෑරුණා.

'මේක අපේ පවුලට ලොකු අවමානයක්.' ඈට සිතුණා. 'ජූන්ගේ ගෙදර උදවිය මොනවා කියයිද? එයාව අස් කළොත් එයාලට ඒක දරා ගන්න බැරි වෙයි. එයාලා හිතයි මට මීට වඩා ජූන් ගැන ඇහැ ගහගෙන ඉන්න තිබුණා කියලා. ඇත්තටම මම ඒක කළ යුතුව තිබුණා. ඒත් එයා කුඩා, කපටි හෙරක්.'

එදින සැඳෑවේ ෆෙලිසිටි කඩා බිඳගෙන පහ පන්තියේ පොදු කාමරයට දුව ආවා. ඇගේ දෙනෙතේ කඳුළු පිරී තිබුණා.

"ඩැරල්....!" දොරට තට්ටු කිරීමටවත් කල් නොගත් ඈ ඉක්මනින් කතා කළා. "ඕහ්...! ඩැරල්, ජූන් ඉස්කෝලයෙන් අස් කරන්න යන්නේ. ඇත්තමයි....! මිස් ශ්‍රේලින් එහෙම කිව්වා. අනේ, ඩැරල්.... මම එයාට කැමති නැහැ තමා. ඒත් එයාව අස් කරන එක මට ඉවසන්න බැහැ. ඇත්තටම එයා ඒ තරම්ම නරක නැහැ."

පහ පන්තියේ පොදු කාමරයේ සිටි සියලු දෙනා මෙම ප්‍රවෘත්තියෙන් ගල් ගැසී හුන් තැන්වලම වාඩි වුණා. අස් කරන්න...! මැලෝරි ටවර්ස්වලින් අවමානයට ලක්ව පාසලින් කෙනෙකුව නෙරපා ඇමූ කාලයක් කිසිවෙකුට මතක නැති තරම්. එමෙන්ම පළමු පන්තියේදීම එය සිදුවන දෙයක් නොවෙයි. ඇලිසියා තොල් සපමින් නිහඬව වාඩි වී සිටියා. ඇගේම ඥාති සහෝදරිය. කොතරම් අපහාසයක්ද?

අසරණ ෆෙලිසිටි ඉකිබිඳින්න පටන් ගත්තා.

"ජූන් හෙට යන්න ඉන්නේ. මිස් ග්‍රේලින් එයාගේ ගෙදර උද-වියට අද රෑට ටෙලිෆෝන් කරන්න යන්නේ. එයා දැන් මේ වෙලාවේ බඩු අසුරනවා. එයාට හොඳටම දුකයි. එයා නිතරම කියනවා එයා බය ගුල්ලියක් නොවෙයි, මේක ඒ තරම් නරක දෙයක් කියලා දැනගෙන හිටියේ නැහැ කියලා. ඩැරල්, මේකට ඔයාට මොකවත් කරන්න බැරිද? හිතන්න, මේක මට වුණා නම් ඩැරල්? ඔයා මොනවා හරි කරන්නේ නැද්ද?"

මේ සියල්ලෙන් පහ පන්තියේ දැරියෝ මහත් විස්මයට පත් වුණා. බියට හා වික්ෂිප්ත බවට පත්ව ජූන් බඩු අසුරණ අයුරු ඔවුන්ගේ සිත්වල මැවී පෙනුණා. මේ කාරණය මේ තරම් දුර යාමට ග්‍රේලින් මහත්මියට ඇය ගැන ඉතා නරක දේවල් වාර්තා වී තිබෙනවා විය හැක. ඇයට තවත් එක් අවස්ථාවක් දීමෙන් යහපතක් සිදු නොවන බව විදුහල්පතිනියම සිතනවා විය හැකි.

"ඩැරල්, සැලී, ඇලිසියා...! ඔයාලට බැරි ද මිස් ග්‍රේලින්ව හම්බ වෙලා එයාට තව එක අවස්ථාවක් දෙන්න කියලා ඉල්ලන්න...!" ෆෙලිසිටි කෑ ගසන අතරේ ලොකු කඳුළු බිඳුවක් ඇගේ නාසය මතින් රූරා විත් පා පිස්නාව මතට වැටුණා. "මම කියන්නේ, එයා හරිම දුකින් ඉන්නේ."

මොරියා අනෙක් අය සමග සියල්ල අසා සිටියා. එසේ නම් ජූන්ට වැරදි පිළිගන්නට සිද්ධ වෙලා. ඇය සැක කර තිබූ ග්වෙන්, මොරීන් හා කැතරින් යන දැරියන් තිදෙනා දෙස ඈ කැරකී බැලුවා. ඒ ඔවුන්ගෙන් කෙනෙකු නොවීම නිසා ඇගේ හදවතේ විශාල බරක් සැහැල්ලු වුණා. ඒ ඇගේ සහෝදරිය බ්‍රිජට් නොවීම ගැන ද ඇයට මහත් සහනයක් දැනුණා.

එහෙත් එය එසේ වුණා නම් යැයි සිතමු. මේ අවස්ථාවේ බඩු අසුරමින් සිටින්නේ බ්‍රිජට් වූයේ නම්, එතරම් දුකකට පැමිණ තිබුණේ බ්‍රිජට් වූයේ නම්, තම දරුවෙකු පාසලෙන් නෙරපීම ගැන දුකටත් අවාසනාවටත් පත් වන්නේ තමාගේම දෙමව්පියන් වන්නට තිබුණා.

මොරියා නැගී සිටියා.

"මම ගිහින් මිස් ශ්‍රේලින්ව හම්බ වෙන්නම්." ඈ කිව්වා. "මම එයාට ජූන්ව අස් කරන්න ඉඩ දෙන්නේ නැහැ. මම එයාට කියන්නම් ජූන්ට තව අවස්ථාවක් දෙන්න කියලා. කොහොම වුණත්, මමත් මේ වාරයේ ඒ තරම් හොඳ කෙනෙක් නොවුණ හින්දා පළමු පන්තියේ පොඩි කෙනෙක් මගෙත් එක්ක තරහා වෙන එක ලොකු පුදුමයක් නොවෙයි. එහෙම ලියුම් ලියන්න තරම් පහළට ආ එකත් පුදුමයක් නොවෙයි. ඒවායේ හුඟක් ඇත්ත තිබුණේ. ජූන්ට දඬුවම් ලැබෙන්න ඕනෑ. ඒත් ඒ තරම් බරපතළ විදිහට නොවෙයි."

ඈ කාමරයෙන් ඉවතට ගියා. ගැඹුරු නිහඬ බවක් ඇති වුණා. ඇය පසුපසින් දිව ගිය ෆෙලිසිටි ඇගේ අතේ එල්ලුණා. මොරියා ඇගේ අත මිරිකුවා.

"ඕ... මොරියා, අනිත් අය කියන්නේ ඔයා වස, නරක එක්කෙනෙක් කියලා. ඒත් ඔයා එහෙම නැහැ. ඔයා එහෙම නැහැ...!" කුඩා ෆෙලිසිටි කිව්වා. "ඔයා හොඳ කරුණාවන්ත කෙනෙක්. මම ඒක පළමු ශ්‍රේණියේ හැමකෙනා එක්කම කියනවා."

ශ්‍රේලින් මහත්මිය, මොරියා හා ජූන් අතර ඉන්පසුව සිදු වූයේ කුමක් දැයි කිසිවෙකුට දැන ගැනීමට ලැබුණේ නැහැ. මේ තිදෙනාගෙන් කිසිම අයෙක් ඒ ගැන නැවත කතා කළේ නැහැ. බොහෝ සේ යටහත් පහත්ව මෙල්ල වී කෘතගුණ පූර්වක වූ ජූන්ව නැවත තම භාණ්ඩ පිළිවෙළකට ආපසු තබා ගැනීමට ආපසු යැවීම එහි ප්‍රතිඵලය වූ අතර තමා වෙතට ගලා එන හොඳ හිත හා අගය කිරීම්වලින් උණුසුම් වූ පොදු කාමරය සොයා මොරියා ආපසු ගියා.

"ඒක හරි ගියා." කී මොරියා මඳ ලැජ්ජාවකින් යුතු මඳ සිනාවකින් යුතුව කාමරය වටා බැලුවා. "ජූන්ව බේරුවා. එයා දැන් බඩු ආපසු තියනවා. එයාට මේ පාඩම කවදාවත් අමතක වෙන එකක් නැහැ."

"ඔයාට හුඟක් ස්තුතියි, මොරියා. ඔයා මෙතැනදී හුඟක් යහපත් විදිහට වැඩ කළා. මට කවදාවත් ඒකට ණය ගෙවන්න බැහැ. මගේ නෑදෑ නංගි කෙනෙක් අස් කරන්නෙ නැහැ කියලා දැන ගන්න ලැබුණ එක මට හුඟක් වැදගත්. මම... ඔව්, මම නාට්‍යයේ අස්වීම ගැන සමාව ගන්නවා. ඔයා... ඔයා ඒකට කැමති නම් මම ආපසු එනවා." ඇලිසියා තරමක් වෙව්ලුම් ස්වරයකින් කතා කළා.

මෙය ඇලිසියාට කරන්න බැරි තරම් අපහසු දෙයක් වුණා. ඈ මේ ලොව කිසිම කෙනෙකුට තම තීරණය වෙනස් කළ නොහැකි බව කියා තිබුණා. හොඳයි, ඇයට එසේ කිරීමට තරම් යමක් සිදුව තිබුණා. එහෙයින් ප්‍රසිද්ධියේ එය කියා තම තීරණය වෙනස් කර ගැනීමට තරම් හා එහි දුෂ්කරභාවයට හා අපහසුවට මුහුණ දීමට තරම් ඇයට ඍජු, අවංක බවක් හා නිර්භීත බවක් තිබුණා. ඇයට තිබුණේ ඒ තරම් ප්‍රබල යහපත් ගතිගුණ.

සෑම කෙනෙක්ම හදිසි උද්දාමයෙන් උමතු වුණා. මහත් සතුටින් ඉපිළී කෑ ගැසූ ඩැරල් ඇය වෙතට කඩා පැන්නා. සැලී ඇගේ පිටට තට්ටු කළා. මෙල්විස් මහා හඬින් ගායනා කළා. පියානෝව වෙතට දුව ගිය අයිරීන් නාට්‍යයේ පෙරහැරේ එන හොරණෑ සංගීතය වාදනය කළා. විල් හා ක්ලැරිසා අසුන් පදින කලක මෙන් කාමරය වටා හැල්මේ දුවන්නට වූ අතර කුඩා මේරි ලෝව් තාලයට මේසයට තට්ටු කළා. මොරියා හදිසියේ හඬ නගා සිනාසුනා.

සියලු දුෂ්ටකම්, කුඩුකේඩුකම් හා දඩබ්බරකම්වලට හදිසියේ කුමක් සිදුව තිබුණා ද? සණ්ඩු සරුවල්, බැණ වැදීම් හා රැවුම් ගෙරවුම්වලට කුමක් සිදුව තිබුණා ද? සියල්ල පසෙක ලා ජූන්ව බේරා ගැනීමට ඥානවන්ත ලෙස හා ත්‍යාගශීලී ලෙස මොරියාගේ ඉදිරිපත් වීම හමුවේ, එක් මොහොතකින් සියල්ල සුනු විසුනු වී අතුරුදහන්ව තිබුණා.

"හැම දෙයක්ම ආයෙත් හරි ගියා." මෙල්විස් ගායනා කළ අතර මේරි ලෝව් තාලයට මේසයට තට්ටු කළා. "හැම දෙයක්ම හරි, හැම දෙයක්ම හරි.... හුරේ...!"

# 21

සැබැවින්ම මේ වන විට සෑම දෙයක්ම යහපත් අතට හැරී තිබුණා. ඒ වන විට බොහෝ දුරට මෙල්ල වී, හික්මී සිටි ජූන් සොයා ගිය ඇලිසියා යහපත් ඥානාන්විත වචනවලින් ඇයට තව දුරටත් සිහි කල්පනාවෙන් වැඩ කිරීමට උපදෙස් දුන්නා.

තමා අලුතින් ලද ඇගයීම් හා පැසසුම්වලින් නැහැවී සිටි මොරියාට පුහුණුවීම්වලදී අනෙක් අයගේ යෝජනා හා චෝදනා පිළිගැනීම මෙන්ම මිත්‍රශීලීව වැඩ කිරීම මහත් සතුටක් වුණා. බුම්මා ගෙන සිටි බ්‍රිජට් පවා පහ පන්තියේ පොදු කාමරයට ආවේ සිනහ මුසු මුහුණකින් යුතුවයි. මොරියා ජූන්ව බේරා ගැනීම ගැන ඇය සතුටු වූ බව ඈ කිව්වා.

“මට හිතෙනවා, මා වෙනුවෙන් වුණත් ඔයා ඒ වගේ දෙයක් කරනවා කියලා, මොරියා.” ඈ කිව්වා.

සෑම දෙයක් ගැනම මම්සලී දුකටත්, කම්පනයටත් පත්ව සිටියා.

“හරිම නරකයි...! ජූන් එහෙම දෙයක් කළේ කොහොමද? අනික මොරියා...! මොරියා, අර හිතුවක්කාර කෙල්ල ගිහින් බේරා ගත්තා...! මිස් පොට්ස්, මම කවදාවත් හිතුවේ නැහැ ඒ කෙල්ල ළඟ කිසිම කරුණාවක් ඇති කියලා. මිස් පොට්ස්, මට දුක මම මේ ළමයි ගැන හරියට දන්නේ නැති එක ගැනයි.”

“ඕ... ඔයාගේ දුක නැතිවෙලා යයි.” ඇඩි සතුටක් මවමින් පොට්ස් ගුරුතුමිය කිව්වා. “ඔයා හුඟක් හිනා වෙයි. හොඳයි, හොඳයි... දැනටමත් ළමයි ඉන්නේ සන්තෝෂයෙන්. මම කියන්නේ පහ පන්තියේ ළමයි හිටියේ දුකට පත්වෙලා, කලකිරිලා, දඩබ්බර විදිහට. පසුගිය සතියෙම එකම ගාලගෝට්ටියක්. මම බැරෑරුම්ව කල්පනා කළා උපායකින් එයාලව සතුටු කරන්න.”

මම්සලී පොට්ස් ගුරුතුමිය දෙස බැලුවා. එදින උදයේ තැපෑලෙන්

පැම්ණි විජ්ජා දත් තිබුණේ ඇගේ මේස ලාච්චුවේයි. පොට්ස් ගුරුතුමිය උපායක් කරන්න අවශ්‍ය නැහැ. උපායකින් දැරියන් සතුටු කිරීමට සිටින්නේ පොට්ස් ගුරුතුමිය නොව, ඒ මම්සලීයි. අහා... අහිංසක ළමයින්ව සතුටු කරන්න. ඒක මොන තරම් කරුණාවන්ත ක්‍රියාවක්ද?

එදින සවස, පාසලේ තරගයක් සූදානම්ව තිබුණා, උතුරු කුලුනේ සහ බටහිර කුලුනේ දැරියන් අතර. තමාද නරඹන්නියක ලෙස තරග වේලාවේ පිටියේ සිටිය යුතු යැයි මම්සලී තීරණය කළා. ඇගේ විජ්ජා දත් ද පැලඳ ගෙන...!

අහා... ඒ දත්...! මම්සලී ඒවා පැලඳ බලා තිබුණා. ඒවා ඇයටම සෑදූ බවක් පෙනුණා. ඒවා ඇගේ දත්වලට හොඳින් ගැළපුණ නමුත් දිගින් වැඩි වුණා. ඉදිරියට නෙරා තිබුණා. කට වසාගෙන සිටින තාක් කල් ඇත්තෙන්ම ඒවා පෙනුණේ නැහැ. එහෙත් ඇය මඳක් හෝ සිනා පෑවහොත් ඒවා දික් වී ඉදිරියට ඇදී එනවා. ඕ... මොන තරම් බියකරු හා අද්භූත පෙනුමක් ද ඇයට ලැබෙන්නේ. ඕ... යක්ෂයෙක්ම තමා.

මෙම අද්භූත දත් පැලඳ මුහුණ බලන කණ්ණාඩිය ඉදිරියට ගොස් සිනාසී තමා දෙසම බැලූ මම්සලී තමාගේම බිහිසුණු පෙනුමට කොතරම් බිය වී තිබුණාද?

'අපොයි' කී ඈ තම කණ්ණාඩි මේසය බදා ගත්තා. 'මම යක්ෂයෙක්...! මම මේ දත් දාපුවහම තියෙන්නේ භයානක පෙනුමක්.'

එදින සවස, මැජික් දත් පෙළ තම දත්වලට උඩින් පැලඳ ගත් ඈ පහළ මාලයට බැස ක්‍රීඩා පිටිය වෙත ගියා. උඩු කබායකින් සිරුර වසාගෙන තිබූ ඈ ලොකු ලේන්සුවකින් හිස වසා ගෙන ජටාවක් පැලඳ සිටියා. මුලින්ම ඇය දුටු ඩැරල් තම පන්තිය සමග අසුන් ගැනීමට ඇයට ඉඩ සැලසුවා.

"ස්තුතියි." කී මම්සලී මඳ සිනාවක් පෑවා.

ඩැරල් භයානක ලෙස කම්පනයට පත් වුණා. මම්සලී හදිසියේම සම්පූර්ණ ලෙස වෙනස් පෙනුමකින් යුතු වෙලා. බොහොම භයානක පෙනුමක්. ඩැරල් මහත් වූ දෙනෙතින් ඇය දෙස බැලුවා. එහෙත් මම්සලී ඉක්මනින් ඇගේ දෙතොල් පියවා ගත්තා.

ඊළඟට එම මඳ සිනහව දැක ගත්තේ සූසන් සමග පැම්ණි කුඩා ෆෙලිසිටි. මම්සලී ෆෙලිසිටිට මඳ සිනාවක් පෑවා.

"ඔහ්...!" හදිසියේ භීතියට පත් ෆෙලිසිටි හඬ නැගූ අතර සූසන් විමතියෙන් බැලුවා.

මම්සලී කට වසා ගත්තා. හඬ නගා සිනාසීමේ ආශාවක් ක්‍රමයෙන් ඈ තුළ වර්ධනය වන්නට වුණා. නැහැ, නැහැ... ඇය හඬ නගා සිනාසීම නොකළ යුතුයි. සිනාවෙන් උපාය හෙළිදරව් වනු ඇත.

තම සිනාසීමේ බලවත් හැඟීම යටපත් කර ගැනීමට වෙහෙසෙමින් ඈ සෑහෙන වේලාවක් මඳ සිනාවක් හෝ නොපාමින් සිටියා. මැහුම් ගුරුතුමිය - ලෙනී මහත්මිය ඇය පසුකර යන අතරේ ඇයට හිස සැලුවා. මම්සලීට තම දත් නොපෙන්වා සිටීමට බැරි තරමට බලවත් හැඟීමක් ආවා. ඈ මඳ සිනාවක් පෑවා.

ලෙනී ගුරුතුමිය විමතියටත්, භීතියටත් පත් බවක් පෙනුණා. ඈ ඉක්මනින් ඉවතට පා තබා ගියා.

'ඒ ඇත්තටම මම්සලී ද?' ඈ කල්පනා කළා. 'නැහැ, ඒ වෙන කවුරු හරි කෙනෙක්. අපොයි, ඒ දත්...!'

නැගිට මඳක් ඇවිදීමට මම්සලීට සිතුණා. වාඩි වී සිටීම කම්මැළි වැඩක්. ඊටත් වැඩියෙන් ඇයට හඬ නගා සිනාසීමට ඇඩි ලෙස උවමනා වී තිබුණා. අහා... දැන් ඇය දන්නවා කෙල්ලෝ විහිළුවක් කර එය සඟවා ගැනීමට මහත් වෙහෙසක් දරන්නේ හා සුළු දේවලට පවා අනවශ්‍ය ලෙස හඬ නගා සිනාසෙන්නේ ඇයි කියලා. ඔවුන් මෙය කී වතාවක් ඇයට කර තිබුණා ද?

නැගිට පිටිය හරහා යන ඇයට විල් හා ක්ලැරිසා මුණ ගැසුණා. ඔවුන් ඇයට මඳ සිනාවක් පෑ අතර ඇය ද ප්‍රති සිනා පෑවා. විල් හදිසියේ ගල් ගැසුණා. හදිසි අකුණු පහරක් වැදුණා වගේ...! ක්ලැරිසා එය හරියටම දුටුවේ නැහැ.

"ක්ලැරිසා...!" විල් කතා කළේ මම්සලී ඉවතට ගිය පසුවයි. "අද හවස මම්සලීට මොනවා වෙලා ද? එයාගේ පෙනුම හරිම බිහිසුණුයි."

"බිහිසුණුයි...! ඒ කොහොමද?" ක්ලැරිසා මහත් විමතියට පත්ව ඇසුවා.

"අර, එයාගේ දත්...! ඔයා එයාගේ දත් දැක්කේ නැද්ද?" විල්

ඇසුවා. "ඒවා වෙනස් වෙලා හරි නැතිනම් මොනවා හරි දෙයක් වෙලා. හරිම අමුතු දත් එයාට තියෙන්නේ. දිග, එළියට නෙරපු දත් එයාට තිබුණේ."

ක්ලැරිසා මහත් විමතියට පත් වුණා.

"අපි ආපහු ගිහින් එයා එක්ක හිනා වෙමු." ඈ කිව්වා.

එලෙස ඔවුන් ආපසු ගියා. එහෙත් ඔවුන්ගේ ඇඩි අවධානයෙන් යුතු බැල්ම දුටු මම්සලී නැගී එන මහත් සිනා හඬ නවතා ගැනීමට තමා සමගම පොර බැදුවා. කිසිසේත්ම, මඳ සිනාවක් හෝ පෑමට ඇය මුව විවර නොකර සිටියා. ඈ ඇගේ හිස පැලඳි ලොකු සිල්ක් ලේන්සුව මුහුණ වැසෙන පරිද පහතට ඇද්දා. නැග එන සිනහව මැඩ ගැනීමට ඈ මහත් වෙහෙසක් ගත්තා.

නේවාසිකාගාර පාලිකාව දුව අවා.

"ඕ.... මම්සලී, ග්වේන් ඉන්නේ කොහේද කියලා ඔයා දැක්කාද? එයා නිල් පාට යට කලිසම් අළු පාට නූල්වලින් අණ්ඩ ආලා. මට එයාව ආපසු එක්ක යන්න ඕනෑ."

පාලිකාවට සිනාවක් නොපා සිටීමට මම්සලීට නොහැකි වුණා. නේවාසිකාගාර පාලිකාව තම දෑස් ඇදහිය නොහැකි ලෙස ගල් ගැසී මොහොතක් බලා සිටින අතරේ මම්සලී දෙතොල් තද කර ගත්තා.



පාලිකාව අසලක යමෙකු සිටී දැයි දැක ගැනීමට මෙන් කැරකී බැලුවා. ඇය තැතිගත් බවක් පෙනුණා.

"ග්වේන්, අන්න අතන හිටියා." දිගු දත් නිසා හිර වී එන කටහඬකින් මම්සලී කිව්වා.

එම අසාමාන්‍ය කටහඬ ඇසුණ පාලිකාව තවත් භීතියට පත්වී එක්වරම අතුරුදහන් වුණා. පාලිකාව යමක් පොට්ස් ගුරුතුමිය සමග කියන අයුරු මම්සලී දැක ගත්තා. ඊට පසු පොට්ස් ගුරුතුමිය මම්සලී සොයා වටපිට බලන බව ද ඈ දැක ගත්තා.

'අහා....!' මම්සලීට සිතුණා. 'මගේ පෙනුම භයානකයි කියලා මේට්‍රන් එයාට කියලා. මිස් පොට්ස් ඉක්මනින්ම එයි. මගේ හිනාව දැක ගන්න. මට හිනා යයි. හයියෝ... හිනා යයි කියලා මට හිතෙනවා. නවත්වා ගන්න බැරි වෙයි.'

මම්සලී වෙත දෑස යොමු කරගෙන පොට්ස් ගුරුතුමිය ප්‍රවේශමෙන් පැමිණියා. ඇයට පුළුවන් වුණා ප්‍රසිද්ධ දත්වල යන්තම් ඡායාවක් දැක ගන්න. ඒ සමගම මම්සලී තදින් මුව වසා ගත්තා. එසේ මුව තද කර වසා නොගත්තේ නම් ඇයට තදින් සිනහ පහළ වන්නට තිබුණා.

"ඔයාට අද ශීතල ද මම්සලී?" පොට්ස් ගුරුතුමිය කුතුහලයෙන් යුතුව ඇසුවා. "ඔයාට... මේ... ඔයාට දත් අමාරුවක් තියෙනවාද?"

අසාමාන්‍ය ගැඹුරු හඬක් මම්සලීගේ මුවින් නැගුණා. ඉන් පොට්ස් ගුරුතුමිය සෑහෙන දුරකට තැති ගත්තා. ඇත්තෙන්ම ඒ මම්සලී පිපිරෙන්නට එන සිනාවක් යටපත් කර ගන්නට ගත් උත්සාහයේදී නැගුණ හඬයි. ඈ කඩිනමින් ඉවතට දුව ගියා. මහත් අපහසුවෙන් පොට්ස් ගුරුතුමිය ඇය දෙස බලා සිටියා. මොකක්ද මම්සලීට සිද්ධ වෙලා තියෙන්නේ?

මින් මිදීමට උත්සාහ කරමින් මම්සලී හුදෙකලාව පිටිය හරහා සෙමින් ඇවිදින්නට වුණා. ඈ මහත් හඬින් නැගී ආ සිනාව දෙවරක් හඬ නගා ගිල ගන්නා ශබ්දය ඇසුණ දෙවැනි පන්තියේ ඇරියෝ දෙදෙනෙක් ඇයට අසනීපයක් දැයි සැකයෙන් බැලුවා.

තව බොහෝ වේලාවක් යන තුරු කිසිවෙකුට දත් පෙන්වා සිනාසිය යුතු නැති බව අසරණ මම්සලී තීරණය කළේ ඇය එසේ

කළහොත් අයිරින් මෙන් තමා ද පෙරළී පෙරළී සිනාසෙනු ඇතැයි ඇය බිය වූ නිසයි. ඈ පාසල වෙත යාමට තීරණය කළා. ඈ එදෙසට හැරී ඇවිද ගියා. එවිට ඇගේ මහත් භීතියට මෙන් විදුහල්පතිනිය, ශ්‍රේලින් මහත්මිය, තවත් මව්වරුන් දෙදෙනෙකු සමග ඇයව සොයා එදෙසට එමින් සිටියා.

බලවත් සේ කලබල වී බැල්මක් හෙළූ මම්සලී හැකි තරම් ඉක්මනින් මඟ හැර යාමට පියවර තබා ගියා.

"ඔහ්...! අන්න මම්සලී." ශ්‍රේලින් මහත්මියගේ පියකරු කටහඬ ඇසුණා. "මම්සලී, මේ මිසිස් ජෙනින්ස්, මිසිස් පැටර්න් දෙන්නා ඔයාට හමුවෙන්න ඇවිදින්."

මම්සලීට ඔවුන්ට මුහුණ දීමට යාමට සිදු වුණා. සිනා නැගීමට තිබූ ආශාව හදිසියේම ඇය කෙරෙන් තුරන් වුණා. විජ්ජා දත් තවදුරටත් විනෝදයක් නොවූ අතර ඒවා භීතිය උපදවන දෙයක් වුණා. ඉක්මනින් ඒවා ගලවා දැමිය යුතුයි. එහෙත් කෙසේද? මව්වරුන් දෙදෙන ඇයට අතට අත දීමට ආසන්නව සිටින මොහොතේ ඇයට ඒවා ලේන්සුවෙන් වසා ගෙන ගළවා ගැනීමට අවස්ථාවක් තිබුණේ නැහැ.

ජෙනින්ස් මහත්මිය ඇගේ අත දිගු කළා.

"මම හුඟක් දේවල් ඔයා ගැන අහලා තියෙනවා, මම්සලී ඩූපොන්ට්." ඈ කිව්වා. "මේ දඟකාර ළමයි ඔයාට කරන විහිළු ගැනත් දන්නවා...!"

දෙතොල් විවර නොකර මඳ සිනාවක් පෑමට මම්සලී උත්සාහ කළ අතර එහි ප්‍රතිඵලය අසාමාන්‍ය බවක් ගත්තා. තද කර ගත් සිනා හඬක් නාසයෙන් පිට වුණා. ජෙනින්ස් මහත්මිය පුදුමයට පත් බවක් පළ කළා. සිනාවේ අඩුව පිරිමැසීමට මෙන් මම්සලී ජෙනින්ස් මහත්මියගේ අත වැඩිපුර තදින් මිරිකා සෙලෙව්වා.

පැටර්න් මහත්මිය සඳහා ද ඈ කළේ එම දෙයමයි. ඉතා කටකාර මවක් වූ පැටර්න් මහත්මියට තුන පන්තියේ සිටින තම දියණිය - තෙරේසා ප්‍රංශ පාඩම්වලදී කොතරම් දක්ෂ දැයි හරියටම දැන ගැනීමට අවශ්‍ය වුණා. මම්සලී සමග කතා කරන අතරේ ඇය ඉතා සුන්දර ලෙස සිනාසුන අතර එලෙස ප්‍රතිසිනා දැක්වීමට

නොහැකි වීම මම්සලීට මහත් වේදනාවක් ගෙන දුන්නා. දෙතොල් තද කර දත් නොපෙන්වා සිනාසීමට ගිය ඇයට නැවතත් අසාමාන්‍ය ලෙස නාසයෙන් පිඹීමට සිදු වුණා.

මෙම අසාමාන්‍ය සිනාව දුටු ශ්‍රේලින් මහත්මිය මහත් විමතියට පත් වුණා. ඈ මම්සලී දෙස සුපරික්ෂාකාරීව බැලුවා. මම්සලීගේ කටහඬ ද වෙනදා මෙන් සුපුරුදු බවක් ගත්තේ නැහැ. අමුතු ගොරෝසු බවක්. හරියට එයාගේ කටේ දත් පිරිලා වගේ. තමා නිවැරදි ලෙසම කාරණය සොයා ගත් බව නොදැන ශ්‍රේලින් මහත්මිය සිතුවා.

අවසානයේ මව්වරු ආපසු ගියා. මම්සලී ඉතා තදින් ඔවුන්ට අතට අත දුන්නා. ඔවුන් වෙන්ව යාම මහත් සහනයක් ලෙස දැනුණ මම්සලී සියල්ල අමතක වී ඔවුන්ට පුළුල් සිනාවක් පෑවා.

ඔවුන් සම්පූර්ණ ලෙස බිහිසුණු දත්වල දර්ශනය දැක ගත්තා. ශ්‍රේලින් මහත්මිය ද මෙය දුටුවා. විදුහල්පතිනිය මහත් ලෙස ත්‍රස්තව බැලුවා. මම්සලීගේ දත්වලට මොනවා සිද්ධ වෙලා ද? එයා පරණ දත් ගලවා දාල ද? මේ අලුත් බොරු දත් ඇන්දක් ද? ඒත් මොන තරම් භයානක දත් ද? රතු තොප්පිකාරී කතන්දරයේ ඉන්න වෘකයාගේ දිග දත් වගේ.

දත්වල දර්ශනය දැක ගත් වහාම මව්වරු දෙදෙනා හිස් පසෙකට හරවා ඉවත බලා ගත්තා. ඔවුන් ශ්‍රේලින් මහත්මිය සමග ඉක්මනින් ඉවතට පා තබන අතරේ මම්සලීගේ දත් ගැන මහත් සේ කල්පනාවට වැටී සිටි ශ්‍රේලින් මහත්මියට ඔවුන් කියමින් සිටි කිසිදෙයක් ඇසුණේ නැහැ. එදින සැඳෑවේ මම්සලීව කාර්යාලයට කැඳවා ඒ පිළිබඳව ඇසීමට ඈ තීරණය කළා. ඇත්තෙන්ම එවැනි දත් ඇති කෙනෙකුට තම ගුරු මණ්ඩලයේ සිටීම ඇයට ඉවසිය නොහැකියි. ඒවා ඉතා බිහිසුණු ලෙස භීතිය උපදවන දත්.

ඉක්මනින්ම ඉවතට යන මව්වරු දැක ස්තුති පූර්වකව සහනයට පත් මම්සලී පාසල කරා ආපසු යන පහ පන්තියේ දැරියන් පිරිසකට එක් වීමට ඉක්මනින් පියවර තැබුවා. ඔවුන් සමහරෙකු පියානෝ පුහුණුව සඳහාත්, සමහරෙක් භාෂා පාඩම් සඳහාත් යමින් සිටියා.

"හලෝ, මම්සලී." මෙල්විස් කතා කළා. "ඔයා ආපහු ඉස්කෝලයට යනව ද?"

මම්සලී සිනාවක් පෑවා. පහ පන්තියේ ඇරියෝ බිහිසුණු ලෙස කම්පනයට පත් වුණා. ඔවුන් භීතියට පත් නිහඬ බවකින් දෙනෙත් මහත් කර බලා සිටියා. දත් මඳක් පහතට නැමී තිබූ නිසා මේ වන විට ඒවා දිගු උල් දත් ලෙස පෙනුණා. එයින් මම්සලීට ඉතා භයංකර විශාල දරුණු වෘකයෙකුගේ පෙනුමක් ලැබී තිබුණා. ඔවුන්ගේ තැති ගැනීම හා මවිත වීම මම්සලී දුටුවා. ඇයට තදින් සිනහ පහළ වන්නට වුණා.

මම්සලීගේ දත් ඇන්ද එකවර පහළට ලිස්සා විත් ඇගේ උකුලට වැටී ඉන්පසුව බිමට වැටුණා. මහත් විමතියට පත් ඇරියෝ එදෙස බැලුවා. නැවත මම්සලී දෙස බැලූ ඔවුන්ට ඇය නැවත සම්පූර්ණ ලෙස ඇගේ නියම ස්වරූපය දැක ගත හැකි වුණා. ඇය ඉදිරිපිට බිම වැටී ඇති බොරු දත් ඇන්ද දකින හැමවිටම ඈ තව තවත් සිනාසුනා.

"ඒක විජ්ජාවක්...!" ලේන්සුවෙන් කඳුළු පිසිමින් සිනා හඬ අතරින් ඈ කිව්වා. "මට අභියෝග කෙරුවා නේද? ඔයාලට විහිළුවක් කරන්න කියලා මට කිව්වේ නැද්ද? මම මේ දත්වලින් මැජික් එකක් කෙරුවා. ඒවා විජ්ජා දත්. ඕ... ලලා... මට ආයෙත් හිනා යනවා. ඕ... මගේ බඩ.... ඕ... මගේ කොන්ද...!"

සිනා හඬ දෙමින් ඈ ඉදිරියටත් පසුපසටත් වැනුණා. ඇරියෝ ද හඬ නඟා සිනාසුනා.

මම්සලීට එය ඉතා සාර්ථක දවසක් වූ අතර ඇගේ විජ්ජාව පිළිබඳ කතන්දරය ඉතා ඉක්මනින් පාසල පුරා ඉගිලී ගියා.

# 22

වාර අවසානය ආසන්න වෙමින් තිබුණා. නාට්‍යයේ වැඩ කටයුතු බොහෝ දුරට අවසන් වී තිබුණා. කලබල සියල්ල අවසන් වූ දා සිට සියල්ල යහපත්ව සිදු වී තිබුණා.

මේ වන විට ඉතා ඉක්මනින් දින ගත වී යන්නට වුණා. සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා.... තව දින දෙකයි. තව ඇත්තේ එක දිනයයි.

"ඔන්න අදයි දවස...!" ඩැරල් ඊළඟ දින උදයේ ජනේලය වෙතට දිව යමින් කෑ ගැසුවා. "අද හරිම ලස්සන දවසක්. කිසිම කරදරයක් නැතිව දෙමව්පියෝ හැමෝම එයි. අපොයි.... මම කරන්න ඕනෑ මොනවාද කියලාවත් මට හිතාගන්න බැරි තරමට සතුටුයි."

"හරි, ඔයා ඇත්තටම දන්නේ නැහැ වගේ මගේ පනාවෙයි ඔයාගෙ පනාවෙයි තියෙන වෙනස." කී සැලී තම පනාව කලබල වී සිටින ඩැරල්ගේ අතින් උදුරා ගත්තා. "මෙහේ එන්න. ඇඳුම් දාගන්න. මෝඩි, අද අපිට වැඩ ගොඩක් තියෙනවා."

දෙමව්පියෝ පැමිණියේ තේ වේලාවේදීයි. ඒ සවස හතරට. නාට්‍යය පටන් ගැනීමට නියමිතව තිබුණේ පහ හමාරටයි. හතයි තිහ වන තුරු පැය දෙකක් එය පෙන්වීමට නියමිතව තිබුණා. ඉන් අනතුරු මහා රාත්‍රී භෝජනය පැවැත්වෙනවා. ඉන්පසු දෙමව්පියෝ පිටව යනවා. සමහරෙක් නිවෙස්වලට. රාත්‍රියේ යා හැකි දුරක සිටින දෙමව්පියෝ එසේ නිවාස බලා යන අතර සෙසු පිරිස් හෝටල බලා යනවා.

තේ පැන් සංග්‍රහය ඉතා උසස් මට්ටමින් පැවැත්වුණ අතර පළමු හා දෙවන පන්ති දැරියෝ පිඟන් හා දීසි ගෙන හැකි සෑමවිටම රසකැවිල්ලක් ගනිමින් ඒ මේ අත කලබලයෙන් දිව්වා. හතර හමාර වන විට පිටතට පැමිණි පහ පන්තිය දැරියෝ ඇඳුම් ඇඳ ගැනීමට ගියා. ඩැරල් වේදිකාවට එබී බැලුවා.

එය කොතරම් විශාලව පෙනුණා ද? කොතරම් දර්ශනීය

ද? ඒ වන විට එය පළමු දර්ශනය සඳහා සූදානම්ව තිබූ අතර සින්ඩෙරෙල්ලා හිඳගෙන සිටිය යුතු තැන ළිපක් සකස් වී තිබුණා. ඩැරල්ට ආඩම්බරයක් දැනුණා. මේ මුද්‍රා නාට්‍යය ලියා තිබුණේ ඇයයි. එය අසාර්ථක වුවහොත් ඇය කිසිම කිසි දිනක නැවතත් කිසිම දෙයක් ලියන්නේ නැහැ. කෙනෙකුට ඒ ගැන කිසිසේත් දැන ගන්න බැහැ. සමහර විට එය අතිසාර්ථක එකක් වනු ඇත.

සැලී පැමිණුනා. ඩැරල්ගේ ඇඩි වූ මුහුණ දැක ඈ මඳ සිනාවක් පෑවා.

"මේක ඉතාම සාර්ථක එකක් වෙන්නයි යන්නේ." ඈ කිව්වා. "ඔයා බලන්නකෝ...! ඔයාට ලොකු නම්බුවක් ලැබෙයි, ඩැරල්. ඔයා ඇත්තටම හුඟක් මහන්සි වුණා."

"ඔයත් මහන්සි වුණා." ඩැරල් හිතවත්කමින් කිව්වා.

එහෙත් නිර්මාණශීලී කොටස කර තිබුණේ ඩැරල් බව සැලී දැන සිටියා. දෙබස් හා ගී පද රචනා සියල්ල බිහි වී තිබුණේ ඩැරල්ගේ සිතේ මැවුණ ආකාරයටයි. ඇය සිහි බුද්ධියෙන් යුතු වූ අතර ඇඩි ගතිගුණ ඇති කෙනෙක්. ඈ ඊර්ෂ්‍යාවෙන් තොරව ඩැරල්ගේ ක්ෂණික නිර්මාණශීලීත්වය අගය කළා.

පාසල් වාදක කණ්ඩායම තම ස්ථානවලට පැමිණ ඔවුන්ගේ වාදන භාණ්ඩ සුසර කරමින් සිටියා. අයිරින්ගේ සංගීත රචනා සියල්ල හොඳින් දැන සිටි ඔවුන්ට වාදනය කිරීමට සිදුව තිබුණේ අයිරින්ගේ මෙහෙයවීම යටතේයි. මඳක් රතු වුව ද ඇය සතුටින් ඉපිළී සිටින බවක් පෙනුණා.

"ඔයා බය වෙලා ද?" බෙලින්ඩා ඇසුවා.

"ඔව්, දැන් ටිකක් බයයි. ඒත් මගේ බැටන් එක, එක සැරයක් වනලා පළමු වාදනය පටන් ගතිද්දිම මට ලැජ්ජාව, බය අමතක වෙනවා." අයිරින් කිව්වා.

බෙලින්ඩාට එම වැදගත් ප්‍රකාශය තේරුම් ගත හැකි වූ අතර ඈ බැරෑරුම් බවක් පාමින් හිස සැලුවා.

රඟපාන හැමෝම ඔවුන්ගේ ඇඳුම් ආයිත්තම්වලින් සැරසී සිටියා. වැරැහැලි වූ සින්ඩෙරෙල්ලා ගවුමින් සැරසී සිටි මේරි ලෝව් බියපත් බවක් පළ කළා.

"ඔයා දුකින්, බය වෙලා වගේ බලාගෙන ඉන්නවා පෙනුණට කමක් නැහැ." මොරියා ඇයට කිව්වා. "ඔයා හරියට ඒ වගේ. සින්ඩෙරෙල්ලා පණ පිටින් ඉන්නවා වගේ."

ඇලිසියාට තිබුණේ අද්විතීය පෙනුමක්. ඇය හැඳ සිටියේ ඇගේ උස් සිහින් සිරුරට තද වූ රතු පාටින් දිලිසෙන ඇඳුමක්. ඇගේ ඇඳුමේ ද දිලිසෙන මල් මසා තිබුණා. ඇගේ දෑස ද දිලිසුණා. ඈ උල් හිස් වැස්මක් පැලඳ සිටියා.

"නියම මන්ත්‍රකාරයෙක්...!" බෙටී කිව්වා.

"ඔයාගේ අතේ තියෙන දේවල් වැටෙන්නේ නැද්ද? අන්තිමේදී තොප්පිය අස්සේ ඉන්න හාවා නැතිවෙලා තියෙන්නේ නැද්ද? අන්තිමේදී මොනවා හරි එහාට මෙහාට වෙලා තියෙයිද?" ඈ ඇලිසියාගෙන් ඇසුවා.

එහෙත් කිසිවක් නොවරදින බව ඇලිසියා දැන සිටියා. ඇලිසියාට චකිතයක් තිබුණේ නැහැ. ඇයට මහත් විශ්වාසයක් තිබූ අතර බබළන දෑසින් යුතුව, දෙකකුල්වල දුනු සවි කරනු ලැබූ කලක මෙන් ඈ ඒ මේ අත පැන්නා.

"ෂ්.... ෂ්...." කෙනෙකු හඬ නැගුවා. "සංගීතය පටන් ගන්න යන්නේ. නරඹන්නෝ ඇවිදින්. ෂ්.... ෂ්...."

සංගීත කණ්ඩායම් ප්‍රාණවත්ව පිබිදෙන ආකාරයේ තාලයක් වාදනය කළා. හරිම මධුරයි...! තිර අතරින් හිස පොවා බැලූ ඩැරල් අයිරින් යුහුසුලුව සංගීතය මෙහෙයවනු දුටුවා. තමාගේම සංගීත රචනා වාදනය කිරීමට වාදක මණ්ඩලය මෙහෙය වීමට ලැබීම මොන තරම් සතුටක් ද? සැකයක් නැහැ. තමාගේම නාට්‍යය රඟ දැක්වෙනු දැකීම ද එවැනිම සතුටක්. බලවත් හැඟීමෙන් යුතුව ඇගේ සිරුර සැලුණා.

වේදිකාවේ පිටුපසින් සීනුවක් නාද වුණා. තිර රෙදි ඉගිලී විවෘත වීමට ආසන්න වුණා. අත්වැල් ගායනා කණ්ඩායම ගීතය ආරම්භ කිරීමට සූදානම් වුණා. මුද්‍රා නාට්‍යය ඇරඹුණා....!

ගායනා කණ්ඩායම නැටුමකින් යුතුව වේදිකාවෙන් පිටව යද්දී මේරි ලෝව් සින්ඩෙරෙල්ලා ලෙස වේදිකාවේ ළිප අසල හුදෙකලා වුණා. ඈ ගායනා කළා. ඇගේ සිහින් මිහිරි හඬ අයිරින්ගේ තනුවට

අනුව නින්නාද දුන් අතර සෑම කෙනෙක්ම සාවධානව කන් දීගෙන සිටියා.

ආදිපාදවරයා පැමිණියා. අසුන් පදින කලිසම සහිත ඇඳුම් කට්ටලයෙන් සැරසුණ විල් වේදිකාවේ කැරකෙමින් ඒ අතටත් මේ අතටත් ගෝරණාඩු කරන්නට වුණා.

"ඒ විල්....!" ඇරියන් කෑ ගසා අත්පුඩි තලන්නට වූ අතර ඔවුන්ගේ ඝෝෂාව නිසා නාට්‍යය මඳකට නැවතුණා.

විරූපී සහෝදරියන් දෙදෙනාට ද වහලයේ උළු ගැලවෙන තරමට අත්පොළසන් හඬ ලබා ගැනීමට හැකි වුණා. ඔවුන්ගේ නපුරුකම් හා අනුවණකම් සම්පූර්ණ, සාර්ථක රඟපෑමක් එකතු කළා. ඔවුන් කොතරම් නම් විනෝදයට පත් වුණාද? තමාට ද එවැනි එක් අයෙක් වීමට තිබුණා නම් යැයි සිතමින් ග්වේන් පසුපසට වී ළතැවෙන්නට වුණා. විරූපී හෝ මොනයම් හෝ එවැනි විකට චරිතයක් රඟපාන්නට ලැබීම හරිම රසවත් දෙයක්. එහෙත් ග්වේන් ගායක කණ්ඩායමේ සිටින සේවිකාවක් පමණක් වූ අතර ඇයව කාටවත් විශේෂයෙන් පෙනුණේ හෝ ඇසුණේ නැහැ.

ලැසී මහත්මියට ඇයව කෙසේවත් පෙනුණේ නැහැ. එහෙත් ඈ එය එතරම් තැකුවේ නැහැ. ඇය ඒ තරමටම නාට්‍යය නිසා විනෝදයට පත් වී සිටියා.

අනතුරුව කුමාරයා පැමිණුනා. උස, සිහින් මෙල්විස් පැමිණුනේ තම ගායනා පටන් ගන්නා තුරු ලැජ්ජාශීලීව චකිතයෙන් යුතුවයි. ඉන්පසුව සිදුවූයේ ආශ්චර්යයක්...! ප්‍රාතිහාර්යයක් මෙන් ඇගේ කටහඬ මවිත වූ නරඹන්නන් වෙතට වැදී, කිසිදු ශබ්දයක් නොනැගෙන මහත් වූ නිශ්ශබ්දතාවයක් ඇති කළා.

මව්වරුන්ගේ දෙනෙත්වලට කඳුළු පිරුණා. මොන තරම් අපූරු වූ කටහඬක් ද? එම කටහඬ නැවත මෙල්විස්ට ලැබීම මොන තරම් වාසනාවක් ද? දිනෙක ඇය ප්‍රසිද්ධ ඔපෙරා ගායිකාවක වනු ඇත. සමහර විට මේතාක් කලකට බිහි වූ හොඳම ගායිකාව විය හැකියි. කුරුල්ලෙකු සේ මෙල්විස් දිගින් දිගටම ගායනා කළා. තමා ඇගේ කටහඬටම උචිත පරිදි තනු ලිවීම ගැන මෙල්විස් ඇඩි සතුටට පත් වුණා.

කුණාටුවක් බඳු මහත් ඔල්වරසන් හඬක් නැඟුණ අතර නාට්‍යය මැදකට නැවතුණා. සෑම කෙනෙක්ම සතුටින් කෑ ගසමින් සිටියා.

ඩැරල් සතුටින් නැගුණ ආවේගයෙන් යුතුව වෙවුලන්නට වුණා. එය ඉතා උසස් ජයග්‍රහණයක්. ඇත්තෙන්ම, එය අති සාර්ථක ජයග්‍රහණයක් ලෙස පෙනුණා. ඇයට සන්සුන්ව සිටීමට නොහැකි වුණා.

ඇලිසියා අද්විතීය ලෙස රංගනයේ යෙදුණා. ඇය අනර්ඝ ලෙස මන්ත්‍ර ජප කරමින් වේදිකාවට පනිද්දී පහළ පන්තිවල ඇරියෝ මහත් විනෝදයෙන් කෑ ගැසුවා.

"මායාකාර රජතුමා.... ඒ ඇලිසියා....!"

කිසිම වැරදීමකින් තොරව ඇලිසියා වළලු උඩ දමා එක්වර අල්ලමින් මැජික් වැඩ ඉදිරිපත් කරන අතරේ ඇයට වෙනත් කිසිවක් ගැන කල්පනාවක් තිබුණේ නැහැ. එකිනෙකා වෙතට හැරුණ පියවරු මහත් ප්‍රමෝදයෙන් යුතුව පුදුම සහගත ඇගයීමකින් කතා කළා.

"මේ ළමයා ලන්ඩනයේ වේදිකාවකට ගෙනියන්න තරම් වටිනවා. කොහොමද එයා ඒ ඇස්බැන්දුම් වැඩ පුරුදු වුණේ?"

මෙසේ සංදර්ශනය කෙරීගෙන ගිය අතර පළමු දර්ශනය අවසානයේ සෑම කෙනෙක්ම ප්‍රීතියෙන් උමතුව අත්පොළසන් හඬ හා ඔල්වරසන් හඬ දෙන්නට වුණා. පළමු දර්ශනයට පසු තිරය වැසුණ පසු නිළියෝ ඩැරල් හා මොරියා සොයා දුව ගියා.

"අපි හොඳයි නේද? මට මගේ දෙබස් අමතක වෙන්න ගියා. බලන අය හුඟක් හොඳයි නේද? ඕ... ඩැරල්, ඔයාට ආඩම්බර නැද්ද? මොරියා, අපි හුඟක් හොඳට රඟපානවා නේද?"

දෙවැනි දර්ශනය ඉදිරිපත් කෙරුණා. නරඹන්නන්ට මෙය ඇඳුම් ආයිත්තම් අගය කරන්නට හා ඒ ගැන පුදුම වන්නට අවස්ථාවක් වුණා. දර්ශන තල ගැන ද ඔවුන් විස්මය ඇක්වූවා. එමෙන්ම රන් ආලේපිත අශ්ව රථය දැක මහත් අත්පොළසන් හඬක් නැගුණ අතර විශේෂයෙන්ම එය සැකසීමේදී උදව් කළ පහළ පන්තිවල සිසුවියන්ට එය මහත් විනෝදයක් වූ අතර ඔවුන් උමතුවෙන් මෙන් ඝෝෂා කළා.

ඉන් අනතුරුව අවසානය එළඹුණා. අවසාන ගීතය ගායනා

කර හමාර වූ පසු හිස නමා ආචාර කිරීම සිදු වුණා. වරින් වර තිරය වැසීම හා ඇරීම සිදු වුණා. නැගිට ගත් නරඹන්නෝ ප්‍රීතියෙන් ඝෝෂා කළා. එය උසස් සාර්ථකත්වයක් ගත්තා. එය මැලෝරි ටවර්ස් කිසි කලෙක අත්විඳි එකක් නොවෙයි.

නරඹන්නෝ වාඩි වුණා. එක් නමක් පුන පුනා කියමින් නිවේදනය වුණා.

"රචිකාව...! රචිකාව...! රචිකාව...!"

"යනවා, මෝඩි. ඔයාට කතා කරන්නේ. ඔයයි රචිකාවි...! ඔයයි රචිකාවි...! ඔයයි ලිව්වේ...!" යමෙක් ඩැරල්ව තල්ලු කළා.

අන්ධයෙකු ලෙස ඩැරල් තිර රෙදිවලින් ඉදිරියට පා තැබුවා. ෆෙලිසිටිගේ උද්‍යෝගිමත් මුහුණ කොහේ හෝ තිබෙනු ඈ දුටුවා. ඈ තම මව හා පියා කොහේ දැයි බැලුවා. වියරුවෙන් මෙන් අත්පුඩි ගසමින් ඔවුන් එහි සිටියා. තම කම්මුල් දිගේ කඳුළු රූරා වැටෙනු රිවර්ස් මහත්මියට දැනුණා. ඩැරල්...! ඇගේ ඩැරල්...! තමන්ට ආඩම්බරයක් විය හැකි දරුවෙකු සිටීම කොතරම් අපූරු දෙයක් ද? සුබ පැතුම්...! ඩැරල්. සුභ පැතුම්...!

"කතාවක්...!" හඬක් නැගුණා. "කතාවක්...! ක - තා - වක්...!"

"මොනවා හරි කියන්න, මෝඩියේ...!" වාදක මණ්ඩලය අසල සිටි අයිරින් කිව්වා.

හදිසියේම නිහැඬියාවක් ඇති වුණා. ඩැරල් පැකිළුණා. ඇය කුමක් කියනු ඇති ද?

"ස්තුතියි." ඈ අවසානයේ කිව්වා. "අපි.... අපි හුඟක් ආසාවෙන් මේක කළේ. මේක මට තනියම කරන්න පුළුවන් වුණ දෙයක් නෙමෙයි. ඇත්තෙන්ම, ලස්සන සංගීත තනු රචනයෙන් අයිරින් එකතු වුණා. මෙතෙන්ට එන්න අයිරින්...!"

අයිරින් පැමිණ ඇගේ පසෙකින් සිට හිස නමා ආචාර කළා. ඇයට සුබ පැතුම් හා අත්පොළසන් නැගුණා.

"ඒ වගේම බෙලින්ඩා එකතු වුණා සෑම සැරසිලි වැඩක්ම සැලසුම් කරමින්." ඩැරල් කියද්දී බෙලින්ඩාව කවුරුන් හෝ ඉදිරියට

තල්ලු කළ අතර තිර රෙදි අතරින් ඈ ඉදිරියට ආවා. " ඒ වගේම සැලී, මට හැම දෙයකටම උදව් වුණා."

ලැජ්ජාවෙන් යුතුව සැලී ඉදිරියට ආවා.

"මොරියා හා බෙට් සම නිෂ්පාදිකාවන්." මඳක් උණුසුම්ව ඩැරල් කිව්වා. "මෙන්න ඔවුන්...! ඒ වගේම ජෙනට්, සියලුම ඇඳුම් ආයිත්තම් සැකසුවා...!"

ඔවුන් සතුටින් නරඹන්නන්ට මුහුණ දී සිටි අතර විශාල ප්‍රීති ඝෝෂා හඬක් නැගුණා.

"මෙතෙන්ට මෙල්විස් ද පැමිණිය යුතුයි. ඒ ඇය ඇගේ ගායනයෙන් බොහෝ දායක වූ නිසයි. ඒ වගේම ගායනා කණ්ඩායම පුහුණු කළා." ඩැරල් කිව්වා.

ලැජ්ජාශීලී මෙල්විස් පැමිණි අතර විශාල හරසර ඇක්වීමක් ඇයට ලැබුණා.

"ඕ... ඒ වගේම මම පොප්ව අමතක කළ යුතු නැහැ...!" ඩැරල් කී අතර කාගේත් මහත් ප්‍රීතියට මෙන් ගෙවතු හා නඩත්තු කටයුතු භාර සේවකයා කොට කබායකින් සැරසී මහත් සතුටු මුහුණකින් යුතුව වේදිකාව මතට පැමිණුනා. ආඩම්බර ලෙස හිස නමා ආචාර කළ ඔහු නැවත වහා වේදිකාව පසුපසින් නොපෙනී ගියා.

ඉන්පසුව සියල්ල අවසන් වුණා. දිගු අත්පොළසන් හඬක්, දිගු ඝෝෂාවක්....! සියල්ල හමාර වුණා.

'මට මේ මොහොත සදහටම නවත්වා ගන්න පුළුවන් නම්.' ඩැරල් සිතුවා.

ඇය නැවත වතාවක් තිර අතරින් එබී බැලුවා.

'මගේ පළමු නාට්‍යය. මගේ පළමු ජයග්‍රහණය...! මට මේ මොහොත අමතක කරන්න බැහැ...!'

'අපි නැවත හමුවන තුරු ඒ මතකය රඳවා ගන්න, ඩැරල්. මේ වගේ මොහොතක් නැවත එළඹෙන්නේ නැති වේවි.'

**මීළඟට....**

**මැලෝරි ටවර්ස් පාසල - 6**

***'අවසන් වාරය'*** තුළින් හමුවෙමු.